# ලුම්බිනී වංශය

NIBU


**ප්‍රකාශනය**

ආචාර්ය පූජ්‍ය බෝදාගම චන්දිම හිමි,
උප කුලපති
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ
විශ්ව විද්‍යාලය

**Published by**

**Nãgãnanda International Buddhist University**

Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org



**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# ලුම්බිණි වංශය

LUMBINI VANSHAYA

ආචාර්ය
ගාමිණී කාරියවසම්



ලුම්බිණි වංශය

ප්‍රථම මුද්‍රණය : 2017

ප්‍රකාශනය :
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ
විශ්ව විද්‍යාලය (2 වන ප්‍රකාශනය )

ISBN : 978-955-41416-0-5

අක්ෂර සංයෝජනය :
කරුණාරත්න කුමාරපේලි-
සුදර්ශිකා සිරිවර්ධන

පරිඝණක සැකසුම :
ඩබ්.එම්.ආශා ලක්මාලි

කවර නිර්මාණය :
හේමචන්ද්‍ර රණතුංග -
අනූෂා ශ්‍යාමලී පෙරේරා

මුද්‍රණය :

සමාධි පදනම
තායිවානය

# <u>පිළිගැන්</u>වීම

2017 වසරේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර වෙසක් මහෝත්සවය නිමිති කර ගෙන නාගානන්ද ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය මගින් ප්‍රකාශයට පත් කෙරෙන......

ලුම්බිණී වංශය

යන හිසින්

මා විසින්

ලියන ලද

මේ ගත්

රුවන

**මෛත්‍රීපාල සිරිසේන**

**ගරු ජනපතිඳුන්**

සුරත් ගන්වමි

මහත්ම

සොම්නසින්.......

**ආචාර්ය ගාමිණී කාරියවසම්**



# 'නිරාමිස සුව'

දෙව් බඹ සුරන් කැළ
සමග සරණා නරන් පෙළ
කයෙන් කය අත් හරිමින
බවයෙන් බවය මිදෙමින
දෙව් දනන් මිහි දනන්
අප එක්වැ වෙසෙන නන්
තුසිත බෝසත් දෙව් වැ
පෙර පිරුම් සහිත වැ
මතු බුදු පදවි ලබනා
මෙත් බුදුන් යන නමිනා
ඔබ පා සිරස් ගෙනැ
සිව් සස් දහම් දනැ
අවසනැ බවය උදුරා
නිරාමිස සුවය නිති දරා
සිටිමින් පතන දන
අමතමින් මේ ලෙදින
තබමි ඔබ අත මෙ ගත රන්
ඉපිළ යන සොම්නසින්.....



කතෘ

# පෙරවදන

ලුම්බිණිය යන්න සුරම්‍ය වූ වදනකි. එමගින් අසිරිමත් සොඳුරු අපූර්ව දසුනක් අප මනසේ සිත්තම් වේ. එම වදන පූජනීය පදයක් ලෙසින් ගෙන දෝත නගා, දෙදන නමා, හදවතින් අප ලුම්බිණි සාලවනය නැමදීමට පුරුදුව සිටිමු. ලුම්බිණිය පිළිබඳ අතීත තොරතුරු වර්තමානය තුළදී සජීවමත් කිරීමට අපි උත්සාහ ගනිමින් සිටිමු. මන්ද? ලුම්බිණි සාල වනයේ දිවමන් ව විසීමට අපේ ඇති ආසක්තතාව නිසා යැයි මට සිතේ. එහෙයින් ලුම්බිණි ගවේශනය සමස්ත බෞද්ධ ලෝකයේ ම සිත් සැදැහැ මලින් සනහන මහත් මැ පෙළහැරක් වනු නියති.

ඉතිහාසයෙන් වැසී ගිය ඉතිහාසය, ඉතිහාසය විසින් ම යළි මතු කරමින් සිටීම කෙතරම් අසිරිමත් භාග්‍යක්ද? ඒ අතීතය ජීවත් කරවීමට මතු නොව වර්තමානයේ දිවි සැකැස්මට මෙන්ම අනාගතයේ ලෙව් ලොව්තුරු සුබ සාධනය සඳහා ද එය හේතු වෙයි.

දැනට වසර දෙදහස් හයසියයකට පෙර අසිරිමත් ලුම්බිණිය ආශ්‍රේයව සියලුම ඓතිහාසික තොරතුරු මූලාශ්‍ර ග්‍රන්ථ හා දේශාටන වාර්තා ඇසුරින් වඩාත් නිවැරදිව ඉදිරිපත් කිරීමට කළ හැකි සෑම උත්සාහයක් ම ගතිමි. ඒ අතීතයේ ලුම්බිණියෙහි සිදුවූ බුදු සිරිත ආශ්‍රිත අභිමානවත් සංසිද්ධීන් තත් ආකාරීය ව පාඨක ඔබ හමුවේ තැබීමේ පරමාධ්‍යශයෙනි. නිරවද්‍යතාවය වූ කලී යථාර්ථය සමග සබැඳේ. යථාර්ථයට සමීපව තොරතුරු ගවේෂණයේදී ලුම්බිණියේ මනබන්දනීය අතීත සංසිද්ධීන් අප මනසේ මතුවන්නේ ශ්‍රද්ධා භක්තිය ද දල්වමිනි.

යථාර්ථය දුටු කල, එහි ආලෝකය හෙවත් නිරාමිස වින්දනයකින් ඔබට සජීව ව ලුම්බිණිය පැදකුණු කරලන්නට අවකාශය සැලසෙනු නිසැක. මෙහිදී විශේෂයෙන් ම මූලාශ්‍ර කෘති ග්‍රන්ථ පරිශීලනයේදී ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදු වූ බව මෙහි ලා සඳහන් කිරීමට රිසියෙමි. මන්ද බුදුසිරිත මතු කර ගැනීමේ දී එම ග්‍රන්ථ රත්නයන් ලබාදෙන තොරතුරු වල විශ්වාසනීය භාවය හා නිවැරදිතාවය උපරිම තලයක පවත්නා හෙයිනි. එවන් උපකල්පනයක එල්බ ගැනීමට රුකුල් දුන් හේතු සාධක කීපයකි. ත්‍රිපිටකයට බුදු සිරිත හා බුදුදහම පිළිබඳ තොරතුරු එක්රැස් වන්නේ ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් දින 90 ක් ගත වූ ඉතා කෙටි කාලයක් තුළ වීමයි. ඒ ප්‍රථම ධර්ම සංගායනාවේ දී බව ඔබ ද දනී. එම සදහම් සංගායනාවට සහභාගී වූ මහරහතුන් වහන්සේලා 500 නම අතුරින් බහුතරයක් බුදුන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලයේ ජීවත් වූ ආර්යාත්මක පිරිසක් බව මෙහිදී අප සිහි කර ගැනීම වැදගති. හුදෙක් ම සිදුහත් කුමරු උපත ලද දින ම මෙලොවට බිහි වූ ආනන්ද මහ තෙරුන් වැළිකෙළියේ පටන් ම හැදී වැඩුණේ සිදුහත් කුමරුන් ඇසුරේ වීම තවදුරටත් වටී. අනඳ මහ තෙරණුවෝ නන්වන් කුසුම් සුවඳ විහිද ගෙනෑ බුදු මුවින් දේශිත සියළු සූත්‍ර ධර්ම දේශනා, නිති තම සවන්පත් කර, සිය සුපහන් පිවිතුරු සිත් හි ධාරණය කර ගැනීමේ අසම සම ස්මරණ ශක්තියකින් හෙබියෝ වූහ. ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගී වූ මහා කාශ්‍යප, උපාලි, භද්දිය, භගු, අනුරුද්ධ, බිම්බල, වන් බුදුන් වහන්සේ ජීවමාන කළ වැඩ විසූ වයෝ වෘද්ධ, තපෝ වෘද්ධ හා ඥාන වෘද්ධ යනු විසින් තෙයාකාර වෘද්ධ වූ මහා තෙරණුවන් ද බුදු සිරිත ආශ්‍රේයව තම දිවමන් නන් අයුරින් නිමැසි (නිරාමිස) සුව සදන අත්දැකීම් ත්‍රිපිටකයෙහි පෙළ ගස්වන්නට මූලික වූහ. එය ද එහි තොරතුරු වල විශ්වාසනීයත්වය තහවුරු කරන්නක් ම විය.

මහ බෝසතාණන් වහන්සේ සාර සංඛ්‍ය කප් කෙළක් සසර සරමින් සව් භවය උදුරා දමනු රිසින් බුදකුරු දහම් වූ දස පෙරුම් දම් සපිරීමේ පටන් අවසන් අත් බව සිදුහත් උපතේ සිට මහා අභිනිෂ්ක්‍රමණය දක්වා ද බුද්ධත්වයෙන් පසුව කිඹුල්වත්පුරට වැඩී අවස්ථාව දක්වා බෝධිසත්ව හා බුද්ධ චරිතය ද "**ලුම්බිණි වංශය**" කෘතියේ ප්‍රථම භාගය තුළින් මැනවින් ප්‍රතිනිර්මාණය කිරීමේ ප්‍රයත්නයක යෙදුනෙමි. ආකෘතිය වූ කලී අන්තර්ගතීය කලාත්මක බව හැඩගස්වනු ලබන රාමුවකි. ඒ හෙයින් පූර්වෝක්ත කථනයෙන් අනතුරුව සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව වර්තමානය දක්වා ලුම්බිණිය ප්‍රතිනිමැවුම් වීම, පුරාවිද්‍යාත්මක ගවේෂණ, සංවර්ධනාත්මක යත්න, ප්‍රයත්නයන් ග්‍රන්ථයේ මධ්‍යම භාගයේ සැකෙවින් ගෙන හැර දැක්වේ. සංක්ෂිප්තවීම යනු කරුණු තුළ කෙටි වීම බව සිහිපත් කරගැනීම යෙහෙකි. **භාරතය බුද්ධභූමි වන අතර ශ්‍රී ලංකාව ධර්මභූමි ලෙසින් සැලකිය හැකි බව නිසැක ය.** එහෙයින් කෘතිය අවසාන භාගයෙහි පරිච්ඡේද කිහිපය වෙන් වන්නේ ශ්‍රී ලංකාවේ දායකත්වයෙන් ලුම්බිණියේ ශ්‍රී ලංකාරාමය හා ලුම්බිණි ශ්‍රී ලංකා වන්දනා නිකේතනය ඉදිකිරීමත්, එම මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් භික්ෂු පුහුණු ආර්ය අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කර එමඟින් ජාත්‍යන්තර ආර්ය ධර්මදූත සේවාවක් ආරම්භ කිරීමත් පිළිබඳව පුරෝකතනයක් කිරීම වෙනුවෙනි. හැඩති, පැහැති, රුවැති, වර්ණැති, නෙක මල් ගෙන රමණීය මල් දමක් ගොතන මාලාකරුවෙකු මල් මාලාවෙහි ආකර්ෂණය මතුකරලීම පිණිසත්, මලෙහි නියත සුවඳ වහනය වීම උදෙසාත්, වනයෙන් නෙලූ නන්වන් සුගන්ධනීය පුෂ්පයන් යොදාගන්නා විලසින් මෙම කෘතිය

නිර්මාණය කිරීමේ වෑයමක යෙදුණු සෙයක් මට හැඟේ. හැඟීම් වූ කලී, චිත්ත සම්ප්‍රදායක චෛතසික සම්පිණ්ඩනයකි. එවන් සද්කාර්යකදී සුපහන් සිත්හි නැගෙන සුපිරිසුදු හැඟුම නිමැසි (නිරාමිස) සුව විඳුමකට මා කැඳවන සෙයකි. එහෙත් එය මට තනිව වැළඳ ගත හැක්කක් නොවේ. තවත් හිමිකරුවන් එහි වෙති. ඒ අය ද මම මෙම "ලුම්බිණි වංශ දමෙහි" දවටා ගතිමි.

මවිසින් එසේ සඳහන් කළේ මන්ද යත්, සිදුහත් චරිතය හා භාග්‍යවතුන් වහන්සේගේ අතිපූජනීය ජීවන වෘතාන්තය පෙළගැස්වීමේදී ත්‍රිපිටකාචාර්යවරුන් මෙන්ම භාරතීය හා දේශීය සම්භාව්‍ය ගත්කතුවරුන් බුද්ධ චරිතය උද්දීපනය කිරීමට යොදාගත් භාවපූර්ණ, ධ්වනිපූර්, සජීව, රූපන ශක්තියෙන් පිරිපුන් හෙළ පෙළ සකු මගධයෙන් පෝෂිත නිර්මාණයන්ගේ උදෘතයෙන් ඒ අයුරින් ම ගෙනහැර දැක්වීමේ උත්සාහයක මා නිමග්න වීමයි.

බුදුන් වහන්සේගේ නිර්වාණගාමි වූ ඒ ශ්‍රේෂ්ඨ චින්තනය හා පරමෝත්තම වූ චරණය විනිවිද දකින සුළු වූ එම උපුටනයන් තුළින් බුද්ධ චරිතයේ තත්‍ය ස්වභාවය සිය මනසේ චිත්‍රණය කරගැනීමෙහිලා සහෘද පාඨකයින්ට ලැබෙන පිටිවහල සුළු පටු නොවේ.

පෙර සඳහන් කරන ලද එම උද්ධෘතයන් වත්මන් බස්වහරට ගැලපෙන අයුරින්ම සකස් කිරීමට අවකාශයක් නොතිබුණා නොවේ. එහෙත් පැරණි සම්භාව්‍ය ගත්කරුවන් යොදාගත් භාවපූර්ණ සවන්පත් පිරි යන රිද්මයානුකූල හද සනහන සජීව කාව්‍යවෝක්ති ගහණ භාෂාලංකාර තුළින් මතුවන ලිවිසැරියේ පෙළහර නැතහොත් වදන් සිත්තම ඒ ආකාරීයව ම මතුකරලන්නට නූතන බස්වහර ප්‍රමාණවත් නොවන බව මගේ හැඟීමයි. එහෙයින් මම ඒ ආර්ය විද්වත් පිරිස වෙත මගේ හෘදයාංගම භක්ති ප්‍රණාමය පුද කරමි.

ලුම්බිණි වංශයේ පෙරවදන නිම කරන්නට පෙර මෙම සත් කාර්යයේදී මා පෙළඹ වූ නන් අයුරීයව අවශ්‍ය අනුග්‍රහය ලබාදුන් ගුණෝත්තම පිරිසට කෘතවේදීත්වය පළකිරීමට ද මෙය අවස්ථාවක් කරගනිමි.

සිදුහත් උපත සිදුවූ ලුම්බිණිය රැක ගන්නට, සංරක්ෂණය කරන්නට පුරෝගාමී වූ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, උඩුනුවර ශ්‍රී සාරානන්ද නාහිමි වන් සදා වන්දනීය උතුමන්ගෙන් ලද අනුග්‍රහය, අනුබලය සුළුපටු නොවේ. ලුම්බිණිය පින් බිම ආශ්‍රිතව



ශ්‍රී ලංකාරාමය හා දුටුගැමුණු විශ්‍රාම ශාලාව ගොඩනගාලන්නට විවිධ යුගවල පහළ වූ ශ්‍රී ලාංකික රාජ්‍ය නායකයින්ගෙන් ලද අනුග්‍රහය ද මෙහිදී සිහිපත් කරන්නේ ඉමහත් කෘතවේදීත්වයෙනි. **හිටපු ජනාධිපතිවරුන් වූ ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, චන්ද්‍රිකා බණ්ඩාරනායක, මහින්ද රාජපක්ෂ** වැනි රාජ්‍ය නායකයින් අපට මෙහිදී නිතැතින්ම සිහිපත් වේ.

2017 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් පැවැත්වෙන ජාත්‍යන්තර වෙසක් මහොත්සවය නිමිති කර ගෙන "ලුම්බිණි වංශය" නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලය මගින් මුද්‍රණය කර ප්‍රකශෙයට පත්කිරීමට පුරෝගාමී වූ එම සරසවියේ **උප කුලපති ආචාර්ය බෝදාගම චන්දිම හිමිපාණන්** මහත් ම කෘතවේදීත්වයෙන් සිහිපත් කරමි. මානෙල් වත්ත විහාරස්ථානයේ වැඩ වසන **ආචාර්ය පූජ්‍ය පල්ලෙවෙල සාරද නේපාලයේ කුසල, ඇකිරියගල ඉන්ද්‍රරතන, අම්බලන්ගොඩ භද්දික** යන ස්වාමීන් වහන්සේලා ගෙන් මෙම සත් කාර්යයේදී ලද අනුග්‍රහය ද බෙහෙවින් අගයමි.

මෙම ග්‍රන්ථය සම්පාදනයේදී අවශ්‍ය උපදෙස් ලබාදීමෙන්, අතිරේක තොරතුරු සම්පාදනයෙන් සුවිශේෂිත අනුග්‍රහයක් දැක්වූ **ගලලැහෑ පිටියේ පේමරතන හිමි, මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා, බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රප්‍රේම ගමගේ මහතා සහ හිටපු ලේකම් එම්.බී.කේ. දිසානායක මහතා, අධ්‍යාපන මාධ්‍ය උපදේශක කරුණාරත්න කුමාරපේලී සූරින්, ත්‍රිපිටක කමිටුවේ ලේකම්, කේ.කේ. සුගතපාල මහතා හා බෞද්ධ විශ්වකෝෂයේ හිටපු සහකාර කර්තෘ ඩී. සද්ධාසේන මහතා සහ හේමචන්ද්‍ර රණතුංග මහතා** වෙත මගේ ගෞරවනීය ස්තුතිය පිරිනැමීමට මම නොපැකිල වෙමි. **මෙම සත්කාරයට මා මෙහෙය වූයේ ආචාර්ය අනුරාධ වික්‍රමසිංහයන්ය.**

ඉතාමත් දුර්ලභ මුලාශ්‍ර පුස්තක ගණනාවක්ම සපයාදීමෙන් දැක්වූ මහත් අනුග්‍රහශීලිත්වය පිළිබඳව **කුඩගම්මන හෙට්ටිආරච්චිගේ පියසෝමා සීලවතී මැතිණිය** හා **සුදර්ශිකා සිරිවර්ධන මහත්මියද** කෘතවේදීව සොම්නසින් සිහිපත් කරමි.

ඡායාරූප සපයා දීමෙන් අනුග්‍රහය දක්වූ ත්‍රිත්ව විද්‍යාලයේ **ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ** නන් අයුරින් සිය අනුග්‍රහය ලබාදුන් බුද්ධශාසන අමාත්‍යාංශයේ සේවයේ නියුක්තව සිටි **ගංගා රාජිනී දිසානායක, රන්දිමා දිල්හාරි, මධුෂානි සමුද්‍රිකා මහත්මියන්ටත්,** මා ප්‍රිය බිරිඳ

**භද්‍රාවන්** හා දුවනී **තර්ෂනාවන්ටත්** මගේ හෘදයාංගම කෘතවේදීත්වය හිමිවේ.

ආකර්ශණීයය නිමාවකින් තායිවානයේදී මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමට පුරෝගාමී වූ **ආචාර්ය පූජ්‍ය හේනේගම ධම්මරත්න හිමිපාණන්** මෙහිදී අසීමිත ගෞරවයෙන් සිහිපත් කරමි.

සිදුහත් උපතේ සිට, ලුම්බිණිය සංවර්ධනය කිරීමේ වත්මන දක්වා තොරතුරු මතු පරපුරේ පරිශීලනය පිණිස පෙළගස්වා මෙම ග්‍රන්ථයට අවැසි තොරතුරු සපයා ගැනීම පිණිස ලුම්බිණි සංචාරයට අප හා එක්වූ ප්‍රවීන ගීත රචක **සුනිල් සරත් පෙරේරා** ශූරීන්, කපිලවස්තු වන පියසේදී එහි අසිරිය මූර්තිමත් කරමින් නිර්මාණය කළ ගී පද පෙළකින් මෙම පෙරවදන සමාප්ත කිරීමට අදහස් කළෙමි.

නිදිගත් විට මුළු නුවරු
සිරි සිද්ධත් රජ කුමරු
අභිනික්මන් කළ අයුරු
පෙන්වයි නටඹුන් පවුරු

පසෙක පෙනේ හිමව් කුළු
විසල් සාල වන මඩුලු
ගලන නදී දිය කඳුරු
කපිල වස්තු සිරි මෙයුරු

පුෂ්කරණී පියුම් දුටිමි
මගද කෙතේ නිල්ල දුටිමි
මනකල් දියතලා දුටිමි
සාදු සාදු බුදුන් දුටිමි

ආචාර්ය ගාමිණී කාරියවසම්

2017 මැයි 12

විද්‍යුත් තැපැල : gaminee@gmail.com

# පටුන


පිටුව

**පරිච්ඡේදය - 01**
**ප්‍රවේශනය**

01. හිමවතේ ආර්ය නිම්නය - නේපාලය 01
02. නේපාලයේ අනන්‍යතාව - නොසැළෙන හිම පියස 07
03. කත්මණ්ඩු පුරවර අතීත අභිමන්. 11
ලලිත්පූර්, භක්තිපූර්, පොක්රා

**පරිච්ඡේද - 02**
**බුදු සිරිත මූර්තිමත් කෙරෙන ඉපැරණි මූලාශ්‍ර**

04. ඉතිහාසය වෙනස් කළ පසුබිමක අනන්‍යතාව 15
i. ත්‍රිපිටකය
ii. පාලි අටුවා හා හෙළ අටුවා කළ දම් අටුවා
iii. අසිරිමත් බුදු සිරිත ඉපැරණි දේශීය කෘතීන් තුළින්
iv. සංස්කෘත ග්‍රන්ථ කළ දහම් විවරණ
v. චීන, බුරුම, තිබ්බතීය ග්‍රන්ථ
vi. දේශාටන වාර්තා - බුදු සිරිත ආශ්‍රිත මැවූ රටා
vii. භාරතීය කැටයම්, බිතුසිතුවම් හා සෙල් ලිපි

**පරිච්ඡේදය - 03**
**බුදුකුරු දම් පෙළ**

05. බුදුරජාණන් වහන්සේලාගේ වංශ පරම්පරාව 31
06. දස පාරමීදම් පිරීම 35
07. නියත විවරණ ලැබීම 40
08. බුද්ධාංකුරය ලොව පහළ වන කල්හි සක්‍රිය මහා ධර්මතා 44
i. උපතේදී සිදුවන අසිරිමත් ධර්මතා
ii. සක්විති රජුන් වෙත පහළවන සත් රුවන
iii. මහා පුරුෂ ලක්ෂණ

**පරිච්ඡේදය - 04**
**අතීතාවලෝකන පෙළගැස්ම**

09. ශාක්‍ය වංශයෙහි සම්භවය හා ශාක්‍ය පෙළපත 55
i. ගෞතම නාමය ආදේශ වීම.
ii. ශාක්‍ය ජනපදය හා කපිලවස්තු රාජධානිය
10. පස් මහ බැලුම් හා මහා මයා දේවිය දුටු ස්වප්නය 61

**පරිච්ඡේදය - 05**
**සුනිර්මිත බුදු උපත**

11. අසිරිමත් උපත 65
12. සිදුහත් කුමර - ඉසිවර හමුව 70
නම් තැබීම
වප් මගුල
13. සිදුහත් උපත හා පහළ වූ සප්ත සම්පත් 74
i. ආනන්ද හිමි
ii. යශෝධරා දේවිය
iii. කාළුදායි අමාත්‍ය
iv. ඡන්න අමාත්‍ය
v. කන්ථක අශ්වයා
vi. ජය ශ්‍රී මහා බෝධිය
vii. සතර මහා නිධානය

**පරිච්ඡේදය - 06**
**සිදුහත් ගිහිවත**

14. කුමරු උගනී අකුරු සොඳවා 87
තරුණ විය
සරණ මංගල්‍යය
15. පෙර මග සඳසි, සතර පෙර නිමිති හා ඒ ආශ්‍රිතව දුටු සිහින 93
16. මහබිනික්මන 99
i. සිදුහත් කුමරුන් සොයා රාජ දූතයන් පිටත් කිරීම

**පරිච්ඡේදය - 07**
**සම්බුද්ධත්වයෙන් පසු**

17. බුදුරජාණන් වහන්සේ පළමුවරට කපිලවස්තුවට
(කිඹුල්වතට) වැඩම කිරීම. 105
i. ශාක්‍යවරුන්ගේ මානය බිඳීම.
ii. භාග්‍යවතුන් වහන්සේ සුදොවුන් රජමැඳුරට වැඩමවීම.
iii. යශෝධරා දේවියගේ වැළපීම.
iv. නන්ද කුමරුන්ට පැවිද්ද ලබාදීම.
v. නන්දා ජනපද කල්‍යාණිය අපදානය.
vi. සාමණේර පැවිද්ද ලද රාහුල කුමරු
18. දෙවැනි හා තෙවැනි වර කපිලවස්තු නුවරට වැඩම කරවීම. 124
i. ශාක්‍ය කෝලිය වංශ ගැටුම සමථයකට පත්කිරීම.
ii. ගිලන්වූ සුදොවුන් නිරිඳුට පිළිසරණය
iii. මහා ප්‍රජාපතී ගෝතමී කාන්තා පැවිද්ද ලබා ගන්නට
ගත් උත්සාහය
iv. මහා ප්‍රජාපතී ගෝතමියගේ පිරිනිවීම.

19. කිඹුල්වතට වැඩි අවසන් ගමන 133
   i. නිග්‍රෝධාරාමයේ වැඩ විසීම.
   ii. සුප්පබුද්ධ රජුගේ මරණය
   iii. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම චිත්‍රය නිර්මාණය වීම.

20. කපිලවස්තුවේ පැවැත්වූ සූත්‍ර දේශනා 138
   i. මහා සමය සූත්‍රය
   ii. සර්කානි සූත්‍රය
   iii. මධු පිණ්ඩික සූත්‍රය

**පරිජ්ඡේදය - 08**
**බුදු සිරිත හා සබැඳි ප්‍රධාන චරිත**

21. මහා තෙරවරු හා අග්‍ර උපස්ථායකයෝ 149
   i. සැරියුත් තෙරුණුවෝ - සාරිපුත්ත (උපතිස්ස)
   ii. මුගලන් තෙරුණුවෝ - මොග්ගල්ලාන (කෝලිත)
   iii. මහා කාශ්‍යප තෙරුණුවෝ
   iv. චිත්ත ගෘහපති
   v. හත්ථාලවක

22. මහා තෙරණියෝ හා අග්‍ර උවැසියෝ 161
   i. ඛේමා තෙරණිය
   ii. උත්පලවණ්ණා තෙරණිය
   iii. උත්තරා තෙරණිය
   iv. නන්දමාතා

23. නේපාලයේ ත්‍රිවිධ පළාත්හි ඓතිහාසික උරුමය 166
   i. කපිල වස්තු
   ii. රූපන්දෙහි
   iii. නාවල් පරාසි

**පරිච්ඡේදය - 09**
**සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ලුම්බිණිය**

24. ලුම්බිණිය ලොවට හෙළි කළ අශෝක අධිරාජ්‍යයා 171
   i. අශෝක නිරිඳුන්ගේ පූර්ව භවය
   ii. උපගුප්ත තෙරුණ් සිදුහත් උත්පත්ති ස්ථානය දැක්වීම.

**පරිච්ඡේදය - 10**
**අශෝකාගමනයෙන් පසු ලුම්බිණිය**

25. දේශාටකයින් හා ප්‍රභූන් ගේ ආගමනය 185
   i. චීන දේශාටකයින් දුටු ලුම්බිණිය
   ii. රිපු මල්ල රජු හා අනගාරික ධර්මපාලතුමා ලුම්බිණිය පැදකුණු කිරීම
   iii. වනයේ සැඟව ගිය ලුම්බිණිය





**පරිච්චේදය - 11**
**ලුම්බිණිය ආශ්‍රිත ගවේෂණ**

26. පූර්ව පුරාවිද්‍යා ගවේෂණ 193

**පරිච්ඡේදය - 12**
**ලුම්බිණිය ප්‍රතිනිර්මාණය වීම.**

27. ලුම්බිණියේ නවමු යශෝරාවය 199
   i. ලුම්බිණිය මිහිපිට ඉපැරණි ම බොදු උරුමය බැව් තහවුරු වෙයි.
   ii. ඉපැරණි කපිලවස්තු පුරය, වත්මන් කපිලවස්තු පුරය යටින් මතුකර ගනී.

28. කෙන්සෝ ටැන්ගේ ලුම්බිණිය සංවර්ධන සැලැස්ම. 207
   i. නව ලුම්බිණි ග්‍රාමය
   ii. ලුම්බිණි පූජනීය පුදබිම
   iii. ආශ්‍රමික කලාපය

**පරිච්ඡේදය - 13**
**ලුම්බිණිය ශ්‍රී ලංකා විහාරය ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය**

29. ලුම්බිණි ශ්‍රී ලංකාරාමයේ හා විශ්‍රාම ශාලාවේ විකාශනය 213
   i. ආරම්භය
   ii. නවෝදය
   iii. සමාධිය කුළුගන්වන ශ්‍රී ලංකාරාමයේ සැලැස්ම
   iv. ලුම්බිණි ශ්‍රී ලංකා විශ්‍රාම නිකේතනය

30. ලුම්බිණි සංවර්ධන භාරය මගින් ස්ථාපිත භික්ෂු පුහුණු ආර්ය අධ්‍යයන ආයතනය හා ධර්මදූත සේවාව. 222

**පරිච්ඡේදය - 14**
**සමාප්තිය**


31. නව ඇරඹුමක සටහනක් 227

32. අපර කථනය 233

   i. ආශ්‍රේය ග්‍රන්ථ

# ඡායාරූප හා සටහන්


01. නේපාල සිතියම
02. හිමාල කන්ද
03. ලලිත්පූර්, භක්තිපූර්, පොක්රා
04. සිදුහත් උපත - අමරාවතී
05. බෝසත් උපත - නාගර්ජුණ කොණ්ඩ
06. අජන්තා කැටයම්
07. මායා දේවිය දුටු සිහිනය
08. අසිරිමත් උපත - අශෝක ස්තූපයෙන්
09. Nativity - උපත කැටයම
10. ශිෂ්‍ය සිදුහත්/තරුණ සිදුහත්
11. සිදුහත් වීදි සැරිසැරීම
12. සතර පෙරනිමිති - ගන්ධාර
13. අබිනික්මන - බොරෝබුදූර්
14. නේපාලයේ ත්‍රිවිධ පළාත්හි ඓතිහාසික උරුමය (සිතියම)
15. කපිල වස්තු (සුදොවුන්, මායා ස්තූප, අබිනික්මන් කළ දොරටුව, තිග්ලිහවා පොකුණේ පිහිටි ස්ථම්භය, කනකමුනි උපත දක්වෙන ස්ථම්භය, රෝහිනී නදිය, නිග්‍රෝධාරාමය)
16. රූපන්දෙහි (ලුම්බිණි නටබුන්)
17. නාවල් පරාසි (රාම ග්‍රාම ස්තූපය)
18. අසෝක ස්ථම්භය පැරණි / නව
19. අසෝක සෙල් ලිපිය
20. ලුම්බිණි නටබුන්, මායා අරම පිටත / ඇතුළත
21. ලුම්බිණිය මිහිපිට ඉපැරණිම බොදු උරුමය බැව් තහවුරු වෙයි. (කැනීම්)
22. ඉපැරණි කපිලවස්තු පුරය, වත්මන් කපිලවස්තු පුරය යටින් මතුකර ගනී. (නටබුන් කැනීම්)
23. කෙන්සෝ ටැන්ගේ ලුම්බිණිය සංවර්ධනය සැලැස්ම.
24. ලුම්බිණි පූජනීය පුදබිමේ නටබුන්
25. ශ්‍රී ලංකාරාමය
26. ශ්‍රී ලංකාරාමය ජනපති සුරතින් විවෘත කිරීම
27. කැමරා නෙතු දුටු - වෙහෙරේ නව තතු

### පළමුවන පරිච්ඡේදය

# ප්‍රවේශනය

## 01. හිමවතේ ආර්ය නිම්නය – නේපාලය

සිද්ධාර්ථ කුමාර උත්පත්තිය සිදු වූ ලුම්බිණිය, නේපාල හිම බිමේ පිහිටීම, නේපාලය වෙත පෙර අපර දෙදිගින් ම කීර්තිය කැන්දන් ඒමට හේතු වාසනා විය. "නේ" අපූර්ව අක්ෂරයකි. "නේ" යනු හිමාලය යන්නට පර්යාය කැරෙන පදයක් ද වෙයි. එසේ ම නොසැලෙන යන අර්ථය ද ධ්වනිත කරවයි. භූගෝල විද්‍යාත්මකව අවට හිමෙන් වැසී ගිය, එසේ ම අවට සීතල කඳුකරයෙන් රමණීය වූ නේපාලය, ආර්යාවර්තයේ අපූර්ව සානුවකි. එහි විශේෂත්වය නම් ලොව උස ම තන්හි සුපිහිටි සානුවක් වූ එක ම දේශය නේපාලය වීමයි.

හිමාල කඳුකරය ආශ්‍රිතව පිහිටා ඇති නේපාලය සිවු දිශාවෙන් ම වටවී ඇත්තේ ගොඩබිමිනි. නැගෙනහිරින් බටහිරින් හා දකුණින් ඉන්දියාවට ද, උතුරින් චීනයට ද මායිම්ව පවතී. මේ පිහිටීම සැලකිල්ලට ගෙන, නේපාල බසින්, ස්වභාවික පිහිටීම් වලින් ආරක්ෂිත දේශය යන අරුත් දෙන "නේපාල්" යන්න එරට හැඳින්වීමට භාවිත කැරෙන බැව් පැවසේ. නේපාලයෙහි වර්ග ප්‍රමාණය ව.කි.මී. 147181 කි. නේපාලය චීනයට කි.මි 1236 ක් ද ඉන්දියාවට කි.මී 1690 ක් ද දුරින් පිහිටා ඇත. ජනගහනය මිලියන 31 කට ආසන්න වේ. සංස්කෘතික හා ආගමික විවිධත්වයෙන් යුතු නේපාලයේ අග නගරය කත්මණ්ඩු ය.

කත්මණ්ඩු නගරයට එම නම ව්‍යවහාර වන්නට වුයේ 1956 දී ලක්ෂ්මී නරසිංහ මාල් රජු විසින් සර්බ චතුරස්‍රයේ ඉදිකරනු ලැබූ (KASTHMANDAP) කස්තමණ්ඩප් නම් විහාර මන්දිරය ඉදිකිරීමෙන් පසුව ය. එය එකදු ලෝහ ඇණයක් භාවිත නොකොට තනි ගසක



දැවයෙන් නිර්මිත විහාර මන්දිරයකි. නේපාල භාෂාවෙන් KASTH කස්ත් යනු දැව ය. MANDAP යනු ආරක්ෂිත ස්ථානයයි. කස්තමණ්ඩප් යන්න පසු කලෙක කත්මණ්ඩු වූ බවට එරට ජන විශ්වාසයක් පවතී.

පුරාවිද්‍යා ගවේශනයන්ට අනුව නියෝලිතික් මානවයා නේපාලයෙහි හිමාලය අඩවියට පියමන් කර ඇත්තේ මීට අවුරුදු 9000 කට පෙර ය. නේපාලය ජනාවාස වීම පිළිබඳව වූ ඉපැරණි ලිඛිත වාර්තාවල, කිරාති ගෝත්‍රිකයන් නැගෙනහිර නේපාලයේ මුල් ම යුගයේ සිට ජීවත් වූ ආදි වාසීන් ලෙස සඳහනි. අප්‍රකටව හුදකලාව පැවති නේපාලය පිළිබඳව ලෝකයාගේ දැඩි අවධානය යොමු වීම ඇරඹෙන්නේ ක්‍රි.පු. 563-483 ලුම්බිණිගේ සිද්ධාර්ථ කුමාර උත්පත්තියත් සමඟ ය.

හතරවැනි හා පස්වැනි සියවස්වල ලිච්ඡවී රාජ පරම්පරාව ඉන්දියානු තැනිතලා ප්‍රදේශයේ සිට නේපාලය වෙත සංක්‍රමණය වේ. ලිච්ඡවී රජදරුවන් ටිබෙටය හා චීනය අතර වෙළඳ සබඳතා පැවැත්වූ අතර එරට සංස්කෘතිය කෙරෙහි එම රටවලින් ද කිසියම් ආභාෂයන් ලැබිණි. දහවන සියවසේ සිට දහ අට වැනි සියවස දක්වා මල්ල රාජ පරම්පරා පාලන සමය තුළ හින්දු දහම පදනම් කරගත් නීති සංග්‍රහයක් නේපාලයට හඳුන්වා දුන්හ. උතුරු ඉන්දියාව දෙසින් එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ නිසා 18 වැනි සියවසේ මුල භාගය වන විට මල්ල රාජ වංශයේ පිරිහීම ඇරඹිණි. 1769 දී ප්‍රීති වූ නාරායන් ෂා, මල්ල රජුන් පරාජයට පත් කොට කත්මණ්ඩු තම පාලනයට නතු කරගත්තේ ය.

ෂා රාජ පරම්පරාවේ රජවරුද දුර්වල පාලකයන් වුහ. බොහෝ අවස්ථාවල රාජ්‍යත්වය දරණ ලද්දේ ළමා කුමාරවරු විසිනි.

1806 සිට 1837 දක්වා කපාවරු නේපාලය පාලනය කළ අතර 1846 දී රණා තම බලය තහවරු කරගනිමින් රාජ්‍යත්වයට පත් විය.

1950 වසර වන විට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ඇති වූ අතර 1959 දී නව ව්‍යවස්ථාවක් යටතේ ජාතික මන්ත්‍රණ සභාව තෝරා ගැනිනි. 1962 දී මහේන්ද්‍ර රජු බලයට පත්ව රටේ වැඩි බලයක් තමාට යොමුවන අන්දමින් ව්‍යවස්ථා සංශෝධනයක් කරන ලදි. මහේන්ද්‍ර රජුගේ පුත් බිහේන්ද්‍ර සිය පියාගෙන් පසුව රාජත්වයට පත් විය. ඔහුගේ පාලන සමගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් සීමා වීම නිසා මහජන උද්ඝෝෂණ හා කැළඹීලි ඇතිවිණ. එහි ප්‍රතිඵලයන් වශයෙන් 1990 පක්ෂ කිහිපයකින් සැදුම් ලත් පාර්ලිමේන්තුවට පාලන බලය පැවරීය. 2001 දී ගයේන්ද්‍ර කුමරු මුළු රජ පවුල ම ඝාතනය කර බලයට පැමිණිය ද මාවෝ වාදීන් විවිධ අරගල මගින් රජු බලයෙන් පහ කෙරිණි. 2008

අප්‍රේල් මහ මැතිවරණයෙන් පසුව ස්ථාපිත ව්‍යවස්ථා සභාව විසින් නේපාලය ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිණි.

2013 නොවැම්බරයේ පැවති මහ මැතිවරණයෙන් නේපාල කොන්ග්‍රස් පක්ෂය වැඩි ආසන සංඛ්‍යාවක් දිනා සහභාගි ආණ්ඩුවක් පිහිටුවීමට සමත් විය. සුශී කොයිරාල එහි අග්‍රාමාත්‍ය ධුරයට පත්විය.

නේපාලයේ සමාජ ව්‍යුහය පිරික්සීමේදී වාර්ගික ජන අනුපාතයෙහි මෙන්ම, ආගමික ඇදහීම්වල ද විවිධත්වයක් දැකිය හැකි ය. වාර්ගික ජන අනුපාතය තුළින් විද්‍යාමාන වන විවිධත්ය පහත දැක්වෙන වගුවෙන් මනාව ප්‍රකට වේ.

**වාර්ගික ජන අනුපාතය**

| ජන වර්ගය | ප්‍රතිශතය | ජන වර්ගය | ප්‍රතිශතය |
|---|---|---|---|
| චෙත්‍රි | 16.6% | ගුරුං | 2% |
| බ්‍රාහ්මණ | 12.2% | දෝලි | 1.8% |
| මගර් | 7.1% | ආකුරි | 1.6% |
| තාරු | 6.6% | ලිම්බු | 1.5% |
| ටැමැං | 5.8% | සාකි | 1.4% |
| නවාර් | 5% | ටෙලි | 1.4% |
| කමි | 4.8% | හරිජ්පා | 1.3% |
| මුස්ලිම් | 4.4% | කොයිරි | 1.2% |
| යදෙව් | 4% | වෙනත් | 19% |
| රායි | 2.3% | | |

ගෝත්‍ර 125 ට ආසන්න සංඛ්‍යාවක් පවතින අපර භාෂාවන් 123ක් ව්‍යවහාර වන බැව් 2011 පැවති ජන සංසනණයෙන් අනාවරණය වේ.

නේපාලයෙහි ජනතාව ප්‍රධාන වශයෙන් ආගම් පහක් අදහති. එම ආගම් පිළිවෙලින් මෙසේ දැක්විය හැකිය.

| ආගම | ප්‍රතිශතය |
|---|---|
| හින්දු | 81.3% |
| බෞද්ධ | 9% |
| ඉස්ලාම් | 4.4% |
| කිරාන්ට් | 3.1% |
| ක්‍රිස්තියානි | 1.4% |
| වෙනත් | .8% |



නේපාලයෙහි සමස්ත ජනගහනය 2014 ජූලි වන විට 30,986,975 ක් වූ අතර, එරට අග නුවර වූ කත්මණ්ඩු නගරයෙහි ජනගහනය මිලියන 1.015 කි. මෙහි සාක්ෂරතාව 57.4% දක්වා ව්‍යාප්තව ඇත.

නේපාලය අන්චාල් නමින් පරිපාලන දිස්ත්‍රික්ක 14 කින් සමන්විත ය. භක්මතී, බෙහෙරී, ධවලගිරි, ගාන්ධකී, ජනක්පූර්, කර්ණාලි, කෝසි, ලුම්බිණි, මහා කාලී, මේචී, නර්යානි, රප්තී, සාගර මාතා, (හිමාල ප්‍රදේශය) සෙතී එම දිස්ත්‍රික්ක 14 ට ඇතුළත් වේ. පොක්රා, පටාන්, භක්තිපුර් යන ප්‍රාදේශීය නගර ත්‍රිත්වය නේපාලයේ සංස්කෘතික අනන්‍යතාව මැනවින් ඉස්මතු කර දක්වන බැව් සඳහන් කළ යුතු ම ය.


හතරැස් නොවන ජාතික කොඩියක් හිමි එක ම රට ලෙසින් ද නේපාලයට සුවිශේෂීත්වයක් හිමිවේ. එය නිර්මාණය කර ඇත්තේ ත්‍රිකෝණයක් මත තවත් ත්‍රිකෝණයක් තබා ඇති විලාසයෙනි. එහි ඉම නිල් පැහැයෙන් යුතු වන අතර කොඩියෙහි පසුබිම රත් පැහැයෙන් යුක්තය. ඉහළ ත්‍රිකෝණය මධ්‍යයේ සුදු පැහැයෙන් අඩ සඳ මත හිරු නිරූපිතය. නේපාල ජාතික පුෂ්පය වූ රොඩ්ඩේන්ඩ්‍රන් හා හිමාලය රතු හා නිල් පැහැයෙන් සංකේතවත් වේ.



නේපාලයේ ජාතික කොඩිය





සිදුහත් උපත - ජයසිරි සේමගේ තෙළි තුඩින්....

## 02. නේපාලයේ ජීවමාන අනන්‍යනතාව - නොසැලෙන හිම පියස

සප්ත සූර්යෝදයෙන් ගුගුරා දුවී හලුවී යන ධවල වන් හිමාල පර්වත කොත් පෙළ මහා භද්‍ර කල්ප නිම කැරෙමින්, සොබාදම හා සබැඳෙමින් යළිත් දිස් වන්නට පටන් ගන්නේ පෘතුවියක මුල් උපත සක්වලින් සක්වලට පෙනෙන අයුරිනි. එතැන් පටන් සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය දක්වා වූ බුදු සිරිතේ සෑම සංසිද්ධියක් දෙස ම හිම වත කඳු ශිකරයන් උපේක්ෂාවෙන් බලා සිටි සෙයක් අපට හැඟේ. අරිය මහා සගනට ම සෙවන, සිසිලස ලබා දෙමින්, දෙව් බඹ ඈ නන් සුරන් ද දිය සනහා ගන්නා අනවතප්ත ඈ මහවිල් ජලයෙන් පොහොනා හිමාලය, බොදුනුවනගේ මෙන් ම හින්දු බැතිමතුන්ගේ ද අපරිමිත සම්භාවනාවට පාත්‍ර වූ, සොබා දහමේ විශ්මිත දායාදයක් ලෙසින් සැලකේ. මහමෙරක් ලෙසින් අකම්පිත වූ, හිමවත අසිරිමත් බුද්ධ සංසිද්ධීන් හී පමණක් සැලේ. ඒ වූ කලී සොබා දහම පවා බුදු උපත, පරිනිර්වාණය වන් අති සුවිශේෂී අවස්ථාවන්හි සංවේදී වන ආකාරය ප්‍රකට කරවන්නකි.

නේපාලය ආශ්‍රිත ප්‍රධාන භූ විෂමතා ලක්ෂණ අතර හිමාලය කඳු පවුරට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පංච ගංගාවන් ගේ ප්‍රභව ස්ථානය හිමාලය කඳු පියසයි. සිංදු, සරස්වතී, වෙනුවතී හා චන්‍ද්‍ර, භාග, බ්‍රහ්මපුත්‍ර, යැංසි, කහ ගඟ වන් ප්‍රධාන ගංගා රාශියක් ද හිමාලයෙන් ඇරඹේ. සමුදුර වෙත ජලය ගෙනයාම නිසා ම හිමාලයට සාගරමාතා යන නාමය ව්‍යවහාර වන්නට විය.

හිමාලය කඳු වැටිය, ඉන්දියානු උප මහාද්වීපය ටිබෙට් සානුවෙන් වෙන් කරන ස්වභාවික දේශ සීමා මායිමක් ලෙස ද සැලකේ.

හිමාලය කඳු වැටිය, නේපාලය ප්‍රධාන භූතානය, ඉන්දියාව, චීනය, ඇෆ්ගනිස්ථානය හා පාකිස්ථානය යන රටවල් හරහා ව්‍යාප්ත වූ ලොව ප්‍රධානතම පර්වත සමූහයකින් සැදුම් ලද්දකි.

අම්බට්ට සූත්‍රය, සංයුක්ත සූත්‍රය, අභිසමය සංයුක්තය, සච්ච සංයුක්තය, අංගුත්තර නිකාය, පඤ්චක නිපාත, පාලි බ්‍රාහ්ම වග්ග, ඛුද්දක නිකාය, ආපදාන පාලිය වැනි පෞරාණික ග්‍රන්ථයන්හිත්, ජාතක කතා බොහෝමයකත්, බෞද්ධ සාහිත්‍යයේත්, නිරන්තරයෙන් හිමාලය පිළිබඳව සඳහන් වේ. මෙම කඳුකරය හිමවා, හිමවාල්, හිමවත යන නම්වලින්ද හැඳින්වේ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් මහ රහතන්වහන්සේලා මධ්‍යයේ නාහිත මහරහතන් වහන්සේ විසින් කඨිනානිසංස දේශනාව පවත්වන ලැබුවේ හිමවත අනවතප්ත විල් තෙර බැව් බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ.

කුමාර සම්භවයෙහි කාලිදාසයන් භාරතයේ සිරස වන් වු හිමාලය පව්ව සැදැහවත් මුණිවරයන්ගේ පුණ්‍ය කර්මයන්ට තෝතැන්නක් ලෙස හඳුන්වති. තාපසයන් වහන්සේලා බහුලව ගැවසෙන තපෝ වනය, නන්දන වනය, ව්‍යාඝ්‍ර ගුහාව, ගණේෂ ගුහාව, සීත හා උණුසුම් විල් වසුධා වැනි වු මහා ප්‍රපාත හිමාලය පවුවේ වැදගත්ම ස්ථාන ලෙස සැලකේ.

හිමාලය භූගෝලීය වශයෙන් කලාප 03 කට බෙදේ. පළමු කලාපය රූස්ස ගස් වලින් වැසුනු මහා වනයකි. මෙහි පිහිටියා වු උස් තැනිතලා ප්‍රදේශ වල ගම්මාන පිහිටුවා ඇත. දෙවන කලාපය ඉතා උස තෘණ හා උණ වර්ගයේ පඳුරු වලින් ගැවසී ගත්තේ ය. දරුණු වන සතුන්ගෙන් ගහණ ය. ශතාධික කඳු ශිඛර සංඛ්‍යාවකින් හෙබි තෙවන කලාපය නිරතුරු හිමෙන් වැසී පවතී.

හිමාල කඳු ශිඛරයේ සිට, වන පියස වෘක්ෂ මුලයන් තෙමාලමින් ගංගා සමුහයක් වේගවත් ගමනින් ඉන්දීය දේශය හා නේපාල ගම් දනව්ව සාරවත් කරමින්ගලා බසී. ප්‍රධාන ගංගා සමුහයට අමතරව දිය කඳුරු ශතාදික සංඛ්‍යාවකට උපත දෙන්නේ ද හිමාලය කඳු පද්ධතියයි.

හිමාලයෙහි පිහිටි පපාත නම් කඳු මුදුන පසේ බුදුන් වහන්සේලා පිරිනිවන් පෑමට තෝරාගනු ලබන ස්ථානයක් ලෙසින් ද සැලකේ. සැවැත්නුවර සිට හිමාලය වෙත වැඩීමට සීවලී තෙරණුවන් ට දින අටක් ගත වූ බව පැවසේ.

හිමවත විල් සප්තකයකින් සුසැදි බව ද බෞද්ධ සාහිත්‍යයෙහි සඳහනි. අනෝතප්ත, කන්නමුණ්ඩ, රතකාර, ඡද්දන්ත, කුනාල, මන්දාකිනි, සීහප්පපථක එම සප්ත විල් ය. අනෝතප්ත විල වටා සුදර්ශන, චිත්‍ර, කාල, ගන්දමාන, කයිලාස යන පංච කුලු පිහිටියේය. මජ්ජිම, කස්සප ගොත්ත, මුලදේව, සහදේව සහ දුන්දුබිස්සර යන මහා තෙරුණ් වහන්සේලා විසින් හිමාලය ආශ්‍රිත ගම්මාන වල වැසියන් දම්දෙසා පවින් මුදවා ගත් බැව් සඳහන් වේ. කුනාල ජාතකයෙහි සඳහන් පරිදි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය කුමාරවරුන් ඇතුළු පැවිදි බවට පත් ස්වාමින් වහන්සේලාගේ සිත් ගිහි ජීවිතයෙන් බැහැර කිරීම පිණිස හිමාලයට කැඳවාගෙන ගිය බැව් සඳහන් වේ. එහිදී බුදුන් වහන්සේ වෙතින් කර්මාස්ථාන ලද එම හිමිවරු එහිදී අරහත් බව ලබාගත්හ.

බෞද්ධ සාහිත්‍යයෙහි හිමාලය කඳුකරය පිරිවරා ගත් පර්වත රාශියක් පිළිබඳව සඳහන් වේ. මනි පව්ව, චන්ද්‍ර පව්ව, උදක පව්ව, මහා කාල පව්ව, චුල්ල කාල පව්ව, ස්වර්ණ පව්ව, රිදී පව්ව, ඉගුල් පව්ව, අංජන පව්ව, පාංශු පව්ව, ස්තලික පව්ව ඒ අතර වැදගත් තැනක් ගනී. ඉන්දියානු අර්ධද්වීපය වෙන් කරන්නා වූ හිමාලය කඳු පන්තියෙහි ලොවේ උස ම කඳු ශිඛරය වූ අඩි 29035 උන්නතාංශයකින් යුතු එවරස්ට් ශිඛරය පිහිටියේ ය. හිමාලයට දකුණු දිශාගතව පිහිටි විශාල තැනිතලාවක් ගංගා හා සින්දු ගංගා දෙකට මැදිව පිහිටා ඇත. මේ අතරින් සින්දු ගංගාවේ ප්‍රධාන අතු ගංගා පහක් ගලා බස්නා ප්‍රදේශය පංජාබය යනුවෙන් හැඳින්වේ. ඉන්දියාව හා පකිස්ථානය ලොව සෙසු රටවලින් වෙන් කරන්නේ මෙම කඳු වැටියෙනි.

ඉන්දියාවේ උතුරු දේශ සීමාව දක්වා පැතිරි හිමාල කඳු වැටිය ඇෆ්ගනිස්ථානය හා ඇසෑමය දක්වා ව්‍යාප්ත ය.

හිමාලය අඩවියෙහි ගන්ධ, මාදන කූඨ පර්වතයෙහි මංජුසක වෘක්ෂයෙහි මිහිමත දිය ගොඩ පිපෙන සෑම මල් වර්ගයක්ම හටගන්නා බැව් පැවසේ. මෙම පර්වත ප්‍රදේශය මුලගන්ධ, සුගන්ධහර, කොවුල, ලවංග, පපටිකා, රස, පුපටික, එල, තමල පත්‍ර ආදි දසවිධි සුගන්ධයෙන් නිරතුරුවම ප්‍රබෝධමත්ව පවතී.

සුවිසල් විවිධ වනගොමු රාශියකින් හිමාල කඳුකරය ආවරණය වී ඇත. කහලාර වන පියස, නිලුපුල් වන පියස, රක්තෝත්ත වන පියස, සේතපල වන පියස, රත් පියුම් වන පියස, කෞවමද වන පියස මෙම වන පියස් අතරින් ප්‍රධාන තැනක් ගනී.

හිමාලයේ එක් ප්‍රදේශයක් උක් වෘක්ෂයන්ගෙන් වැසී පවතී. වනයෙහි සරණ ඇතුන් මෙහි පැමිණ උක් දඬු කඩා ගල මස්තකයෙහි තබා දෙපයින් මැඩ උක් යුෂ උරා බොති. එයින් වැගිරෙන උක් යුෂ පර්වතයේ ගල් පර හිඩැස් අතරේ තැන්පත්වී සූර්ය රශ්මියෙන් වියැලී උක් කැට බවට පත් වේ. බුදු, පසේ බුදු, මහ රහත් වහන්සේලා විවේක සුව සඳහා හිමවතට වැඩි අවස්ථාවල එහි වසන හස්තීන් එම උක් කැට කඩා ගෙනවිත් උන් වහනසේලාට පිළිගන්වා නමස්කාර කළ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ය.





හිම සිහිල් කඳු යාය - හිමි සෙවන දුන් පාය

## 03. කත්මණ්ඩු පුරවරයේ අතීත අභිමන්

### ලලිත්පූර් නොහොත් පටාන් :-

නේපාලයේ අගනුවර ලෙස සැලකෙන කත්මණ්ඩු නුවර ඉපැරණි බෞද්ධ සිද්ධස්ථාන රාශියක් පිහිටා ඇත. කත්මණ්ඩු නුවර දකුණු දිශාගතව පිහිටි ලලිත් පුර් නොහොත් පටාන් පෞරාණික නගරයෙහි ප්‍රධාන බෞද්ධ විහාරස්ථාන 18 ක් පිහිටියේ ය. ක්‍රි.පූ. 250 කිරාකි රාජ්‍ය සමයේ ව.කි.මී. 385 ක් පුරා පැතිරි මෙම නගරය අශෝක අධිරාජ්‍යයා නේපාලයට සැපත් අවස්ථාවේ ඔහු සමග පැමිණි ඔහු දියණි චාරුමතී කුමරිය සොබාවික සෞන්දර්යයෙන් විශ්මයට පත් වූ මෙම ප්‍රදේශයෙහි පදිංචි වුවා ය. පටාන් නගරය නිර්මාණය කරන ලද්දේ ඇය විසිනි. මෙහි නග්ධන නම් වැවක් ද විය. පැරණි සංස්කෘතික උරුමයන්ගෙන් පෝෂිත පටාන් පුරවරය නේපාලයේ ඉපැරණි කලා ශිල්ප වලට ද තෝතැන්නක් ව පැවතිණි. මෙහි මුලින් ම රාජ්‍යත්වයට පත් වුයේ විර්දේව් රජු ය.

මෙම නගරය මුළු මනින් ම සැලසුම් කර ඇත්තේ අහසේ සිට බලන්නෙකුට ධර්ම චක්‍රයක් ලෙස දිස්වන විලසිනි. සියළු පැරණි ගොඩනැගිලි ඉදිකර ඇත්තේ ද ධර්ම චක්‍ර ප්‍රතිරූපය නිර්මාණය වන පරිද්දෙනි.

අශෝක අධිරාජ්‍යයා පටාන් හි අශෝක ස්ථූප 04 ක් ඉදිකර ඇත. එක ස්ථූපයක් කේන්ද්‍ර කොට ගෙන සෙසු ස්ථූප 04 නිර්මාණය කර ඇත. බෞද්ධ නටබුන් 1200 කට ආසන්න ප්‍රමාණයක් මෙම නගරය පුරා විසිර ඇත. 1979 දී යුනෙස්කෝ සංවිධානය මගින් පටාන් නගරයේ පිහිටි දුබාර් චතුරස්‍රය එහි පවත්නා අතිශය ආකර්ශනීය හා පෞරාණික බෞද්ධ ගොඩනැගිලි 07 ක් ආරක්ෂා කර තැබීම උදෙසා ලෝක උරුමයන්ගේ ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කළේ ය. මෙම නගරය පැරණි ජල තටාක, ප්‍රධාන පිවිසුම් වාහල්කඩ, ජල මාළිගා, බෞද්ධ විහාරස්ථාන ආදියෙන් සමන්විත ය. ගොඩනැගිලි බිත්ති දැවමය වහල හා දොර ජනෙල් දේශීය කැටයමින් අලංකෘත ය.

මහා බෞද්ධ විහාරය නොහොත් දහසක් බුදු පිළිම වලින් සමන්විත පන්සල 16 වැනි සියවසේදී සිද්හි නාරසිංහ රජු විසින් නිර්මාණය කළේ ය. ක්‍රිෂ්ණ මන්දිර් පටාන් නගරයේ දැකුම්කලු පැරණි ගොඩනැගිල අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී. මෙම විහාරාරාම අතර ගෝල්ඩන් ටෙම්පල් නමින් හඳුන්වන විහාරස්ථානය නේපාල බෞද්ධයන් අතර මහත් ම ගෞරවාදරයට පාත්‍ර වූ ආගමික ස්ථානයකි. අභය මල්ල රජු දවස, ආනන්ද නම් තෙර නමක් විසින් රන් අකුරෙන් ලියන ලද ප්‍රඥා පාරමිතා නම් ග්‍රන්ථ සප්තකයක් මෙම විහාරයෙහි ආරක්ෂිතව තැන්පත් කර ඇත. මෙම විහාරස්ථානය වෙත පැමිණෙන බැතිමතුන්, මෙම සප්ත ග්‍රන්ථයන්හි ගාථා සංගායනා කිරීමෙන්, ඔවුන් අදෘශ්‍යමාන යක්ෂ බලවේග වලින් ආරක්ෂා වන බව විශ්වාස කරති.



කත්මණ්ඩු පුරවර - ලොව උස් මැ මහ පුර

### භක්තිපූර් :-

භක්තිපූර්, කත්මණ්ඩු ප්‍රධාන නගරයේ සිට කි.මී. 13 ක් පමණ දුරින් නැගෙනහිර දිශාවට වන්නට පිහිටියේය. භක්තිපූර්හි ඩුබාර් චතුරශ්‍රයේ ඉපැරණි බෞද්ධ හා හින්දු ආගමික ස්ථාන රාශියක් දැකිය හැකි ය. මෙහි මහල් පහකින් සමන්විත භක්තිපූර් ඉපැරණි බෞද්ධ ස්තූපය ආකර්ශනීය නිමැවුමකි. කත්මණ්ඩු නිම්නයේ පිහිටි උස ම ස්ථූපය ලෙස සැලකෙන මෙහි උස මීටර් 30 ක් පමණ වේ. මල්ල රජ දවස පටන් 15 වැනි සියවස දක්වා නේපාලයේ අගනගරය වශයෙන් පැවතියේද භක්තිපූර් නගරයයි. භක්තිපූර් නගරයට පිවිසෙන ස්ථානයෙහි ක්‍රි.ව. 1696 ඉදිකළ දැවැන්ත සිංහ රූප දෙකකින් සමන්විත අගනා කැටයමින් නිම වූ තොරණක් දිස් වේ.

ජගත් ජ්යෝජි මල්ල රජු විසින් ඉදිකළ ඓතිහාසික මහල් තුනකින් සමන්විත බෛහෙයාර් නාත් ආරාමය ද, ක්‍රි.ව. 1427 යක්ෂ මල්ල රජු ඉදි කළ අගනා කැටයමින් යුත් කවුළු 55 කින් සමන්විත දත්තාත්‍රය ආරාමය ද භක්තිපූර් හි බෙහෙවින් ම ජනප්‍රියත්වයට පත් ආගමික සිද්ධස්ථානයන් ය.

නේපාලයෙහි සංස්කෘතික අග නගරය වශයෙන් ද භක්තිපූර් නගරයට අද්විතීය ස්ථානයක් හිමිවේ.




**මහ වෙහෙර උස වී - වළා පෙළ තනි වී**
**භක්තිපූර්**

## පොක්රා :-

ගන්ධකී පරිපාලන දිස්ත්‍රික්කයෙහි කස්ති ප්‍රදේශයේ පිහිටි පොක්රා නේපාලයේ දෙවන අග නගරය ලෙස ද සැලකේ. ව.කි.මී. 55.22 වපසරියකින් යුක්ත පොක්රාහි ස්වදේශීය ජනගහනය තුන් ලක්ෂය ඉක්මවයි. කත්මණ්ඩු නුවර සිට බටහිර දිසාවට කි.මී. 200 ක් දුරින් මෙම නගරය පිහිටියේ ය. ලොව උසම කඳු ශිඛර දහය අතරින් උසම කඳු ශිකර තුනක් ම පිහිටියේ පොක්රාහීය. එම ශිඛර නමින් ධවලගිරි, අන්නපූර්ණ, මනස්ලු, යනුවෙන් හැඳින්වේ. සුප්‍රකට ගුර්කා භේවායන්ගේ නිජබිම මෙම කඳුකරය ලෙස සැලකේ.



පොක්රා පළාත පෙහෙවා, බෙග්නස්, රූපා වැනි විල් සමූහයකින්ද, සෙටි ගන්ධාකි, යමදි කොලා, කාලි කෝලා වැනි ගංගා සමූහයකින්ද යුත් ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන පෙදෙසකි.

පොක්රා නිම්නයෙහි ඉපැරණි බෞද්ධ හා හින්දු ආගමික ස්ථාන කිහිපයක් දැකිය හැකිය. පෙහෙවා විල් මධ්‍යයේ පිහිටි බරාහි ආරාමය, සාම චෛත්‍ය, බින්ද්‍යා භාෂිනි ආරාමය, භද්‍රකාලි දේවාලය, මුදුල කාර්කි කුල්යාය මන්දිරය එම ආගමික ස්ථාන අතර ප්‍රධාන තැනක් ගනී.





**හිමවත නගර දිසි - සොබා දහමේ අසිරි**

**දෙවන පරිච්ඡේදය**

# බුදු සිරිත මූර්තිමත් කැරෙන ඉපැරණි මූලාශ්‍ර

## 04. ඉතිහාසය වෙනස් කළ පසුබිමක අනන්‍යතාව.

සමූහාර්ථ වාචීව ගත් කළ මිනිසා විසින් කරන ලද මෙන් ම කියන ලද සෑම දෙයක් ම පාහේ මානව ඉතිහාසයේ ඇතුළති. සිව් සැකි කප් කෙළක් මනස උසස් කර ගනිමින්, සසර සරමින් පැමිණ අවසන් අත් බවේ දී බවය උඳුරා ලමින් සසර මුල් සිදි ලොව අසිරිමත් ම මිනිසා වූ ගෞතම බුදුන් වහන්සේගේ චරිතාපදානය ලෝක ඉතිහාසයේ අසාමාන්‍ය වූ වර්ණවත් සිත්තමකි. එම මානවත්වය සය වන් බුදුරසින් වර්ණ ගැන් වූ ගෞතම බුදුන් වහන්සේගේ බුදු සිරිත පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මුලාශ්‍රවලින් අද අධයනය කිරීමට සිදු වී තිබේ. එසේ ම එය ගෝලීය අවශ්‍යතාවයක්ව පවතී.

සිදුහත් කුමරු මවු කුස පිළිසිඳි අවස්ථාවේ සිට සම්බුද්ධ පරනිර්වාණය දක්වා වූ සිරි සම්බුදු සිරිත පිළිබඳව අඛණ්ඩ සවිස්තර තොරතුරු දැක්වෙන එකදු ඓතිහාසික කෘතියක්වත් සොයා ගත නොහේ. එබැවින් සම්බුද්ධ චරිතය පෙළගැස්වීමේදී ඉපැරණි ග්‍රන්ථ අති මහත් රාශියක් ම පරිශීලනය කිරීමට අවශ්‍යයෙන් ම සිදුවේ. බුදුන් වහන්සේ මුල් දශක දෙක තුළ වස් විසූ ස්ථාන බුද්ධවංශ අටුවාවේ සඳහනි. ත්‍රිපිටකයෙහි පවා සිද්ධාර්ථ කුමාර උත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය දක්වා නොනැසී ගලා යන බුදු සිරිතක් දුට හැකි නොවේ. බුද්ධ චරිතය රචනා කිරීමේදී ත්‍රීපිටක ග්‍රන්ථාවලියෙන් පවා අපට උකහා, උපුටා ගත හැකි වනුයේ විවිධාකාරීය ස්ථානවල විසිරුනු තනි තනි සිදුවීම් මාලාවක් ලෙසිනි.



ත්‍රිපිටකයට අටුවා කතා සංග්‍රහ කළ කතුවරුන් ත්‍රිපිටකයෙහි තන් තන්හි සඳහන්ව ඇති කථා වස්තූන් එක් කොට දීර්ඝ අඛ්‍යානයක් ලෙස සකස් කර ඉදිරිපත් කර ඇති බව පෙනේ.

**මහායානිකයන්ගේ ලලිත විස්තරය නම් වූ සංස්කෘත ග්‍රන්ථයේ** ද බුද්ධචරිතයේ ඇතැම් අවස්ථා අතිශයෝක්තියෙන් වර්ණ ගන්වා ඇති සෙයක් පෙනේ. සිදුහත් උපතේ හා සම්බුද්ධ පරිනිර්වාණයේ ඇතැම් සිදුවීම් ලලිත විස්තර කතුවරයා ලේඛනාරූඪ කර ඇත්තේ අතිශයෝක්තියෙන් ම බව විද්‍යමාන වන බවක් පුනරුක්තියෙන් සඳහන් කළ යුතු නැත. එසේ වුව ද මෙහිදී මහාචාර්යය **සුචරිත ගම්ලත් සූරීන්** ස්වීය බුද්ධචරිතය කෘතියෙහි අවධානාර්ථයෙන්ම පෙන්වා දෙන පහත දිග හැරෙන විද්වත් ප්‍රකාශය අපට කිසිවිට බැහැර කළ නොහේ.

"....අපට බුද්ධ චරිතය පටන් ගන්නට සිදුවන්නේ ඉතිහාසයෙන් නොවේ. එබඳු ශුද්ධ ඉතිහාසයක් නැත. බුදුන් පිරිනිවී ගත වූ පළමු සියවස තුළද, දෙවන සියවස තුළ ද පැවති නිශ්චිත සිද්ධීන් හා එය තුළ ගැබ් වන සත්‍ය ඉතිහාසය තෝරා බේරා ගැනීමට නම් එවා ගත යුත්තේ ඒවා තුළ ගැබ් වන අශ්චර්ය අද්භූත සිද්ධීන් ද සමඟමය. එසේ ගෙන අප එය තුළ ගැබ් වන ආශ්චර්ය අද්භූත දෑ කවරේද, සත්‍ය ඉතිහාසය කවරේද, යනු විසින් නිරාකරණය කළ යුතු වේ. වර්තමානිකයනට ඉතාමත් ම අප්‍රිය දේ නම් මේ අද්භූත දෑය. එහෙත් අද්භූත දෑ ගැබ් වන නිසාම එහි එන සිද්ධීන් බැහැර කළ නොහැකිය. කිසියම් රහත් කෙනෙකුන් කිසියම් සභාවකට අහසින් වැඩි බව කියන විට අහසින් යෑම කෙසේ වෙතත් එසේ වැඩි බව නම් සත්‍ය විය හැකිය..."

සම්බුද්ධ සිරිත පෙළ ගැස්වීම සඳහා පරිශීලනය කළ යුතු මුලාශ්‍ර රාශියකි. මුලාශ්‍රයක වටිනාකම රදා වෙන්නේ තත්කාලීන වීම, සහභාගිත්වයේ විශ්වාසනීයත්වය, නිරවද්‍යතාව, අන් පුරාවිද්‍යත්මක මුලාශ්‍ර වලින් සකස් වීම, විදේශ කෘතීන් හා සබැඳීම, හේතු ඵල සබඳතාව සාවද්‍ය නොවීම වැනි කරුණු කිහිපයක එකතුවකින් වීම වැදගති. ඒ අනුසරින් ගත් කළ බුදුනු බැතියෙන් අන්ධානුභාවයෙන් තොරව විවෘත ව අපට සත්‍ය කරුණු මතු කර ගත හැකි වනු නියති. එබඳු කෘති මහත් රාශියකි. ඒවා පහත නම් කෙරේ. ඒවා සප්තකයක් ලෙසින් හකුළුවා දැක්විය හැකි ය.

01. ත්‍රිපිටකය (තෙවලා දම්)
02. පාලි අටුවා හා හෙළටුවා
03. ඉපැරණි දේශීය කෘතින්
04. සංස්කෘත ග්‍රන්ථ
05. චීන, බුරුම ග්‍රන්ථ හා තිබ්බතීය වාර්ථා
06. දේශාටකයින්ගේ වාර්ථා
07. භාරතීය කැටයම්, බිතුසිතුවම් හා සෙල්ලිපි

මතකයෙන්, වනපොතින් ගෙන ආ දහම් කරුණු පත් ඉරුවල අකුරු කිරීම කෙතරම් අසීරු කටයුත්තක් වන්නට ඇත්දැයි සිතා බැලීමට ඔබට ම අවකාශ සලසමි. එමඟින් උන්වහන්සේලාගේ පරිශ්‍රමික කැපවීම ලොව අන් කවර කාර්යයකට සමාන කළ හැකි වේදැයි සිතන්නට මම උත්සහ ගනිමි. අනෙක් අතට අති සියුම් ගැඹුරු දහම් කරුණු අනිර්වචනීය වූ නිර්වාණය වැනි සංකල්ප සුපැහැදිළි ව ඉදිරිපත් කිරීමට තරම් පෙරදිග භාෂා උසස් තත්ත්වයක තිබීම කවර තරමේ භාග්‍යයක්ද? මෙය බෞද්ධයන් විසින් සදා අනුස්මරණීය කළ යුතු සංසිද්ධියකි.

## I. ත්‍රිපිටකය (තෙවලා දම්) :-

බුද්ධ චරිතයේ සත්‍ය තොරතුරු ප්‍රේරණය කර ගැනීමේදී ද පාරම්පරික අටුවාචාරීන් වහන්සේලාගේ මත වලින් ඔබ්බට ගොස් ත්‍රිපිටකයේ සඳහන් තොරතුරු පරිශීලනය කිරීමේ වැදගත්කම බෙහෙවි. පෙර ද සඳහන් කළ පරිදි බුදුන් වහන්සේ දිවමන් කල උන්වහන්සේ සියැසින් දැක, දහම් පද සවනිතින් ගෙන, හඳින් දරා බුද්ධ භාෂිතය ත්‍රිපිටකයට එම තෙරවරුන් නැගූ බව නිසැකය. එහෙයින් ම එකී වාර්තාවන්ගේ විශ්වාසනීය භාවය මැනවින් තහවුරු වේ. අනඳ මහ තෙරණුවෝ බුදු පා දූලි හිසින් ගනිමින්, තමන් අතහැර නොයන සෙවනැල්ලක් සේ බුදුන් වහන්සේ අසල ම රැඳෙමින්, බුදු මුවින් දේශිත සියළු දම් සුතුර හදවතින් දැරූ බැවින් උන්වහන්සේ ධර්ම භාණ්ඩාගාරික ද වූහ. ත්‍රිපිටක කරණයේ විශ්වාසනීයත්වය උන්වහන්සේ පමණ කුඩු නිදසුනක් සේ සෑහේ.

ඉතිහාසයේ මුල් වරට ත්‍රිපිටකය පෙළ ගැස්වීම පිණිස ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූයේ සුභද්‍ර නම් අහද්‍ර මහණෙකු විනය නීති රීතිනට පිටුවා තමන්ට රිසි පරිදි ජීවත්විය හැකි බවට අසත් මතයක් පැතිවරවීම නිසා බව පෙනේ. ප්‍රථම මහ ධර්ම සංගායනාවෙන් එම මතයට පිළිතුරක් ලැබුණ අතර ධර්ම විනය ඒකරාශි කර වෙනස්වීම් වලට බඳුන් වීමට අවකාශ නොතබා සුරක්ෂණීය පදනනමක් දැමීම ද අසහාය කාර්යයක් වශයෙන් බෙහෙවින් ම යහපති.

**ත්‍රිපිටකය සුරැකි සතිකා සංගීතා සංගායනා :-**

රජගහ නුවර වේභාර පර්වත පරිශ්‍රයේ ගල් ලෙනහි පුරා සත් මසක් කාශ්‍යප මහරහත් හිමයන්ගේ ප්‍රධානත්වයෙන් සිවු පිළිසිඹියාපත් මහ තෙරවරුන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම ප්‍රථම ධර්ම



සංගායනාව සතිකා සංගීතා යන නමින් ද හැඳින්වේ. **වංශ කතා හා සමන්ත පාසාදිකා** අටුවාවේ සඳහන් පරිදි අජාසත්ත රජුගේ පූර්ණ අනුග්‍රහය ඊට ලැබිණි. එහි දී මහා කාශ්‍යප තෙරණුවන් විසින් විමසන ලද ධර්මයට අදාළ සියළු ම පැනයන්ට අනඳ තෙරණුවන් විසින් එතෙක් නිර්මල ලෙස පවත්වාගෙන ආ ධර්ම කරුණු පිළිතුරු වශයෙන් දේශනා කරන ලදී. අනතුරුව සංගායනාවට සහභාගී වූ මහ රහත්හු මහත් වූ සංකථනෝපකථනයකින් ඒ සියල්ල බුද්ධ භාෂිතය බවට ඒකමතික වූහ. විනය පිළිබඳව බුදුන් වහන්සේ වෙතින් තනතුරු ලද උපාලි තෙරණුවන් විසින් මෙහිදී විනය පිටකය සංගායනා කර නිර්මල බුදු දහම නොනැසී පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික පදනම ස්ථාපිත කරන ලදී. එහිදී සූත්‍ර පිටකය නිකාය වශයෙන් කාණ්ඩ 05 කට බෙදනු ලැබූ අතර ඒවා ආරක්ෂා කොට පවත්වා ගෙන යාම සඳහා භික්ෂු පරම්පරාවට පවරනු ලැබී ය.

01. දීඝ නිකාය :-
ආනන්ද තෙරණුවන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාව

> බුදුන් වහන්සේ වදාළ දීර්ඝතම සූත්‍ර 34 ක් දීඝනිකායට ඇතුළති. මෙහි බ්‍රාහ්මජාල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය, අම්බට්ට සූත්‍රය, සෝණදණ්ඩ සූත්‍රය, මහාපදාන, ලක්ඛණ, සූත්‍රාදයෙන් බුදු සිරිතේ අසිරිමත් සිදුවීම් කිහිපයක් පිළිබඳව කදිම අවබෝධයක් ලබා ගැනීමට පුළුවන.

02. සංයුක්ත නිකාය :-
මහා කාශ්‍යප ථෙරනුවන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාව

> එකිනෙක සම්බන්ධ සූත්‍ර 56 කින් සමන්විත වෙයි. සංයුක්ත නිකාය සනාථ වග්ග, නිදාන වග්ග, ඛන්ධ වග්ග, සළායතන වග්ග, මහා වග්ග, වශයෙන් කොටස් පහකට බෙදා දක්වනු ලැබේ.

03. අංගුත්තර නිකාය :-
අනුරුද්ධ ථෙරනුවන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට

> අංගුත්තර නිකාය, එක නිපාත, දුක නිපාත, තික නිපාත, යනාදී වශයෙන් කොටස් එකොළහකින් සමන්විත වෙයි. එම නිපාත යළි සූත්‍ර 10 කට බෙදී ඇති අතර සමසථයක් වශයෙන් ගත් කළ අංගුත්තර නිකායට සූත්‍ර 2308 ක් ඇතුළත්ය.

04. මජ්ඣිම නිකාය :-
සියලු ම භික්ෂු පරම්පරාවන්

බුද්ධත්වය පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු මජ්ඣිම නිකායේ සූත්‍ර 152 ක් ආශ්‍රේයව සපයා ගැනීමට පුළුවන. භය භේරව, අරිය පරියේසන, චූල සච්චක, මහා සච්චක, ආදී සූත්‍රයන්ගෙන් මෙම තොරතරු සැපයේ.

05. ඛුද්දක නිකාය :-
සියලු ම භික්ෂු පරම්පරාවන්

ඛුද්දක නිකාය ඛුද්දක පාඨ, ධම්ම පද උදාන, විමාන වත්‍ථු, පේත වත්‍ථු, ථෙර ගාථා, ජාතක කතා යනාදී වශයෙන් කුඩා සර්ග පසළොස්සකින් සමන්විත වේ.

බුදුන් වහන්සේ පරිනිවී දින 90 ක් වැනි කෙටි කාලයකින් පැවැත්වූ පළමු සංගායනාවේදී සංගායනා වූ ත්‍රිපිටකයට ඇතුළත් කළ අසූහාර දහසක් දේශනාවලින් දෙදහසක් බුද්ධ වචන වන අතර ඉතිරි දෙදහස සංගානාවට සහභාගී වූ භික්ෂූන් වෙතින් දේශිතය. ආනන්ද හිමි මල්ල රට අනුපිය නම් අඹ උයනේදී තමන් සමඟ එකම දින පැවදි දිවියට පත් වූ බුදුන් දිවමන් කළ විසූ භද්දිය, භගු, අනුරුද්ධ, බිම්බල, උපාලි වැනි මහ තෙරණුවන් පළමු ධර්ම සංගායනාවට සහභාගි වූ හෙයින් උන්වහන්සේලා වෙතින් භාග්‍යවතුන් වහන්සේගේ ජීවන චරිතය සබැද තොරතුරු ත්‍රිපිටකයට ඇතුළත් වූ බව නම් නිසැක. බුද්ධ චරිතය පිළිබඳව අධ්‍යයනය කරන විද්වතුනට වැදගත් වන අයුරින් පහත වගුගත රටාව පහසුවක් වනු ඇතැයි හැඟේ. ඉන් ලද හැකි අලෝකය අනල්ප බව ද සිතේ.

**ත්‍රිපිටකයේ ප්‍රධාන කාණ්ඩ**

| විනය පිටකය | සූත්ත පිටකය | අභිධම්ම පිටකය |
|---|---|---|
| සුත්ත විභංග | දීඝ නිකාය | ධම්ම සංගනී |
| මහා විභංග | මජ්ඣිම නිකාය | විභංග |
| භික්ඛුණී විභංග | සංයුක්ත නිකාය | ධාතුකථා |
| ඛන්ධ දහක | අංගුත්තර නිකාය | පුග්ගලපඤ්ඤත්ති |
| මහා වග්ග | ඛුද්දක නිකාය | කථා වත්‍ථු |
| චූල වග්ග | කුද්ධක පාඨ | යමක පට්ඨාන |



ඉහත වගුව ආශ්‍රේයව ඔබට බොහෝ කරුණු අධ්‍යනය කිරීමට පුළුවන. එම පිටක ත්‍රිත්වයේ විනය පිටකයට ඇතුළත් කොටස මඟින් භික්ෂු, භික්ෂුණී චර්යාව සකසා ගැනීමට පැනවූ නීති මාලාව කෙටුම්පත් කර ඇත.

ධර්ම විනයෙහිලා අත්‍යන්තයෙන්ම වැදගත් වන්නේ සූත්‍ර පිටකය බැව් විද්වතුන්ගේ ඒකමතික පිළිගැනීමයි.

සූත්‍ර පිටකයේ අඩංගු ධර්ම සාරය ඉතා ක්‍රමානුකූලව ගෙන හැර දක්වමින් විශ්ලේෂණයේ යෙදෙමින්, අර්ථ කථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි.

**ත්‍රිපිටකය සුරැකී දෙවැනි හා තෙවැනි ධර්ම සංගායනා :-**

මුඛ පරම්පරාගතව මහ තෙරවරුන්ගේ ධාරණ ශක්තිය මත ශත වර්ෂ ගණනාවක් පවත්වා ගෙන ආ ත්‍රිපිටකය නම් වූ උත්තරීතර සදහම් ප්‍රවාහය, පසු අවස්ථා දෙකකදී ම සංගායනාවන ට බඳුන් ව එහි නිර්මලතාව හා නිරවද්‍ය භාවය තහවුරු කරගනු ලැබී ය.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් සිය වසක් ගෙවුණු තැන වජ්ජි රට භික්ෂූන් අතර පැන නැගි විනය ප්‍රශ්නයක් පදනම් කරගෙන විශාලා මහනුවර දී සබ්බකාමී තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් ධර්මධර භික්ෂූන් හත් සිය නමකගේ සහභාගීත්වයෙන් දෙවැනි ධර්ම සංගායනාව පවත්වා බුදු දහමේ චිර ජීවනය යළි තහවුරු කරනු ලැබිණි.

අශෝක මහාධිරාජ්‍යයාගේ (ක්‍රි.පූ. 273-232) අනුග්‍රහයෙන් තෙවැනි ධර්ම සංගායනාව පැවැත්විණි. ලෝක ඉතිහාසයේ සඳහන් එකම දැවැන්තම ධර්ම දූත සදහම් ව්‍යාපාරය තෙවැනි ධර්ම සංගායනාවෙන් නිපන් බව සිහිපත් කර ගැනීම යෙහෙකි. අප්‍රකටව ද බහුතර ලෝක ජනතාවක් මොහොතකට හෝ නිරාමිස සුව විඳින්නේ එහි ප්‍රතිඵලයක් නිසා බව සඳහන් කිරීම බෙහෙවින් ම සුනිසි.

දෙවන පිය තිස් මහ රජ සමයෙහි (ක්‍රි.පූ. 247-207) අරහත් මිහිඳු හිමියන් මෙරට වැඩම කොට දේශනා කරන ලද්දේ තෙවැනි ධර්ම සංගායනාවේ දී ප්‍රතිෂ්ඨාපනය කරන ලද පාලි ත්‍රිපිටකය ආශ්‍රේය ධර්ම කරුණු ය. මෙහිදී පාළි ත්‍රිපිටකය සඳහා වූ අටුවා හෙළ බසින් පිළියෙළ කරන ලදී. එවක පටන් දේශීය මහ සඟ රුවන මහත් දුෂ්කරතා මැඩ ගනිමින් මුඛ පරම්පරාගතව පවත්වා ගෙන එන ලද අසූහාරදහසක් වූ මහා ධර්මස්කන්ධය වළගම්බා රජු දවස (ක්‍රි.පූ. 29-17) මාතලේ අළු විහාර ලේනෙහිදී ලේඛනාරූඪ කරනු ලැබීමෙන් තෙවළා බුදු දහම් ලෙස ත්‍රිපිටකය ලියැවිණි. බුදු දහමේ සුරක්ෂිත බව වසර සුවහසකට තහවුරු විය.



මුඛ පරම්පරාගත ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූ වගයි

## II. පාළි හා හෙළටුවා කළ දම් අටුවා

ආගමේ විශ්වාසයනුත්, විද්‍යාවේ කල්පිතයනුත් බැහැර කළ තැන සිට බුදුසමය පටන් ගැනේ. බුදුසමය ඉන්ද්‍රියන් ගෙන් ම පසක් කරගත යුතු බැවින් එය අනුභූතික වූවකි. ස්වභාව ධර්මය හා සබැඳි බුදු දහමින් හද නිවී සැනහේ. භවය උදුරා දැමීම අපේ කාර්යය වන බැවින් අපි බෞද්ධයෝ වෙමු. එය බුද්ධිමය ක්‍රියාවලියකි. බෞද්ධයා යනු කිසි විටෙක පුහුදුන් අයෙකු නොවේ. ඔහු බුද්ධිමත් සත්ත්වයෙකි. හෙළ දනන් බුදුනු දහමින් සනහනු සඳහා මෙහි වැඩම කළ අනුබුදු මිහිඳු මා හිමියෝ දීප භාෂාවෙන් ගැඹුරු දම් දෙසූ බව **මහාවංශ කතුවර මහානාම හිමියෝ** දක්වන්නාහ. මිහිඳු මා හිමියන් අර්ථ ප්‍රකට කරනු පිණිස ත්‍රිපිටකය හෙළ බසින් ලියන ලද බව සාරත්ථප්පකාසිනියේ අටුවාවෙහි සඳහනි. පසු කාලයකදී මෙම හෙළ අටුවාවන් විවිධාකාරීය හේතූන් නිසා අභාවයට පත්විය. එසේ වුව ද එම අටුවාවෙහි සඳහන් ඇතැම් පාඨ 10 වැනි සියවසේ ලියැවුණ ධම්පියා අටුවා ගැටපදය වැනි පසු කාලීන ග්‍රන්ථවල සඳහනි.

**පස් වැනි සියවසෙහි මහානාම රජු දවස දඹදිවින් මෙරටට වැඩම කළ බුද්ධඝෝෂ හිමි** අනුරාධපුර අරසංකර පිරිවෙනෙහි වැඩ හිඳ හෙළටුවාවන් පාළි භාෂාවට පරිවර්තනය කිරීමේ නිරත වූහ. හෙළටුවාවන් අතර **මුළු තුන් පිටකයම අළලා කළ මහ අට්ඨකතා,** කුරුන්දිවේලි විහාරයේදී ලියන ලද මහා කුරුන්දි අට්ඨකතා ආදී හෙළටුවාවන් පිළිබඳ තොරතුරු බුදුගොස් හිමියන් කළ පාළි අට්ඨකතා වල සඳහන් වේ.

**බුද්ධඝෝෂ හිමියන්ගේ කෘතීන් :-**

සමස්ත ත්‍රිපිටක මාලාව ම අන්තර්ගත කර රචනා කළ **'විශුද්ධි මාර්ගය' බුදුගොස් හිමියන්ගේ පළමු කෘතිය සේ සැලකේ.** මහාවංශයේ දැක්වෙන තොරතුරුවලට අනුව විශුද්ධි මාර්ගය තෙවතාවක්ම ලියන ලද කෘතියකි. උන්වහන්සෙගේ සමන්තපාසාදිකාව බෞද්ධ ඉතිහාසය පිළිබඳව ඉතාමත් වටිනා තොරතුරු අනාවරණය කරනු ලබන කෘතියක් සේ සැලකීම මැනවි. **දීඝ නිකායට අටුවාවක් ලෙසින් කළ සුමංගල විලාසිනිය ද මජ්ඣිම නිකාය සඳහා පපංචසූදනිය නම් අටුවාව ද සංයුක්ත නිකාය සඳහා සාරත්තප්පකාසිනිය ද බුදුගොස් හිමියන් අතින් ලියැවිණි. අංගුත්තර නිකායේ අටුවාව ලෙසින් මනෝරථපූරනිය රචනා කරන** උන්වහන්සේ කෘතියෙහි අවසන "මාගේ බොඳු අටුවා ලිවීමේ මනදොළ සම්පූර්ණ හෙයින් මේ අටුවාව මනෝරථපූරණිය නම් වේ" යනුවෙන් සඳහන් කරන්නේ තම අරමුණ මැනවින් සාක්ෂාත් කර ගත් බැව් මැනවින් අවධාරණය කරවමිනි. ඛුද්දක නිකායට අයත් පරමත්ථ ජෝතිකා, ජාතකට්ඨ කතා, ධම්මපදට්ඨ කතා යන කෘතීන් ද කංඛාවිතරණිය, අත්ථසාලිනී, සම්මෝහවිනෝදනී, යන උන්වහන්සේගේ අන්‍ය අට්ඨකතා කෘතීන් ද අතිශය වැදගති.

**වෙනත් හෙළටුවාවන් කිහිපයක්**

| | | |
|---|---|---|
| ධම්මපාල හිමි | - | පරමත්ථ දීපනී |
| උපසේන හිමි | - | සද්ධම්මප්ප ජෝතිකා |
| මහානාම හිමි | - | සද්ධම්මප්පකාසිනි |
| බුද්ධදත්ත හිමි | - | බුද්ධවංශට්ඨකතා |

පූර්වෝක්ත අටුවා ග්‍රන්ථ අතරින් ජාතකට්ඨකතාවෙහි නිදාන කතාවෙහි හා **මධුරත්ථ විලාසිනි නම් වූ බුද්ධවංශ අට්ඨකතාවෙහි** බෝසතාණන් නියත විවරණය ලද සුමේධ තාපස කාලයේ සිට බුදු බව ලැබ අනේපිඬුසිටු අතින් දෙව්රම් මහ වෙහෙර පිළිගත් අවස්ථාව දක්වා සම්බුද්ධ චරිතය පිළිබඳව දීර්ඝ විස්තරයක් සැපයේ. ධම්මපද අට්ඨකතාවෙහි ද බුද්ධ චරිතය පිළිබඳව තොරතුරු සමුදායක්ම ඇතුළති.

## III. ඉපැරණි දේශීය කෘතීන්

බුද්ධ චරිතය පිළිබඳ තොරතුරු ලද හැකි මීළඟ වැදගත් මුලාශ්‍ර ලෙස සැලකෙන්නේ මීට ශතක කිහිපයකට පෙර ශ්‍රී ලංකාවේ ලියැවී ඇති කෘතින් ය.

**විල්ගම්මුල මා හිමියන් විසින් දෙවැනි පණ්ඩිත පැරකුම්බා රජුගේ ඇරියුමින් කරන ලද බෝධිවංශය බුද්ධ චරිතය** මැනවින් විස්තර කැරෙන කෘතියක් සේ දිසේ. ජයසිරි මහ බෝ හිමියන්ගේ වෘත්තාන්තය වර්ණනා කිරීමට පබැඳි මෙම කෘතියෙහි සුමේධ තවුසාණන් දිවකුරු බුදුන් වහන්සේ වෙතින් නියත විවරණ ලත් අන්දමත්, සසර පුරා පාරමිතා පිරූ අයුරුත් මෙහි කදිමට විස්තරකාරක කැරේ. එතුමා වෙසතුරු අත්බවින් මිදී තුසිතයෙහි ද ඉන් ඉක්බිතිව වැ සිද්ධාර්ථව මනුලොවෙහිද උපත ලැබීමේ පුරාවෘත්තාන්තය බෝධි වංශයේ කදිමට සුවර්ණිතවැ පවතී. බෝසත් උපතේ සිට සිදු ව මහ පෙළහර පිළිබඳව **බුත්සරණ කතුවර විද්‍යාචක්‍රවර්තී** ලෙසින් ම, **බෝධිවංශ කතුවරයා** ද අනුප්‍රාසවත් ශබ්දධ්වනිය කුළු ගන්වමින් අර්ථ ධ්වනියෙන් පාඨක සිත් සැදැහැ බන්ධනීය කරවයි. කිඹුල්වත්පුර වැණුම් හා එහි රජ පරපුර පිළිබඳව බෝධිවංශ කතුවරයා සිය කෘතියෙන් කරණු වර්ණ ගන්වන්නේ නිර්මාණ තීව්‍රතාවයෙන් වීම වැදගති. එහි දී අපට **කාලිදාසයන්ගේ රඝුවංශයේ** පදබැඳුම් සිහි ගන්වන්නේ නිතැතිණි. සිදුහත් කුමරුගේ තුරුණු විය, අභිනිෂ්ක්‍රමණය, බුද්ධත්වයට පත්වීම, මෙන්ම ලෝකයාගේ හිතසුව පිණිස බුදුන් වහන්සේ මුළු කාලයම කැප කළ අයුරු මින් කදිමට පැනේ. සැදැහැ සිත් නැගේ. නිමැසි රස ඉතිරේ.

**රෝහණ ජනපදයේ වැඩ විසූ බුද්ධරක්ඛිත තෙරුණ් විසින් රචිත ජිනාලංකාර පාළි කාව්‍යය** ද බුද්ධ චරිතය හදාරණ විද්‍යාර්ථීන්ට වැදගති. පාළි ගාථා 250 කින් සමන්විත මෙම කාව්‍යයෙහි තේමාව බුද්ධ චරිත වර්ණනා මුල් කොට ගත්ත ද කතු හිමියන් මෙමඟින් විවිධාකාරීව විරිත් හා චන්දස් පැහැදිළි කිරීමේ උත්සාහයකද යෙදුන බව නිරීක්ෂිතය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 117 ක් පමණ ඉක්ම යද්දී රචනා කළ බැවින් එහි එන තොරතුරු වල කිසියම් විශ්වාසනීයත්වයක් ඇති බව නිරනුමාන වූවකි.

කර්තෘ අඥාත දීපවංශය, මහානාම හිමියන්ගේ මහාවංශය, වේදේහ හිමියන්ගේ සමන්තකූඨ වර්ණනා, ධම්මකිත්ති හිමියන්ගේ දාඨාවංශය ද සම්බුද්ධ චරිතයෙහි නන් විධ අවස්ථා රමණීය ලෙස විස්තර කෙරෙන පාළි ග්‍රන්ථ අතර විශේෂ තැනක් ගනී.



මූල ග්‍රන්ථ නොවන වෙනත් කෘතීන් කිහිපයක්

| | | |
|---|---|---|
| ගුරුළුගෝමීන්ගේ | - | අමාවතුර |
| විද්‍යාචක්‍රවර්තීන්ගේ | - | බුත්සරණ |
| මයුරපාද බුද්ධපුත්‍ර හිමියන්ගේ | - | පූජාවලී |
| දඹදෙණි ධර්මසේන හිමියන්ගේ | - | සද්ධර්මරත්නාවලී |
| විමලකිත්ති සිද්ධාර්ථ හිමියන්ගේ | - | සද්ධර්මරත්නාකරය |
| අඥාත කර්තෘක | - | නෛෂ්ක්‍රම්‍ය වර්ණනා |

## IV. සංස්කෘත ග්‍රන්ථ කළ දහම් විවරණ

කවර නම් බසෙකින් වුවද අප හද සියුමැලිව පිරිමැදෙන්නේ නම්, එනම් සුදු මුදු වදනින් බුදු බද වණන්නේ නම් ඒ වූ කලී අප කිළිටි සිත් නිකසල කරන මා හැඟි බසෙකි. එබඳු වූ සංස්කෘත භාෂාවෙන් කළ කාව්‍ය අතර **පද්‍යචූඩාමණී** ය ද සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය දක්වා අසිරිමත් බුදු සිරිත මැනවින් වර්ණ ගන්නවන කෘතියකි. සර්ග 10 කින් සමන්විත මෙම කෘතියේ කතුවරයාණෝ **බුද්ධඝෝෂ හිමියෝ** ම වෙති. සිදුහත් උපතේ සිට බුද්ධත්වය ලැබීමෙන් අනතුරුව කිඹුල්වතට වැඩමවීම දක්වා වර්ණවත් සිත්තමක් අපට සපයනු ලබන්නේ **පැරණිම සංස්කෘත කාව්‍ය ග්‍රන්ථය වන අශ්වඝෝෂයන්ගේ බුදුසිරිත කෘතියයි.** පළමුවැනි, දෙවැනි සියවස්වල ලියැවී ඇතැයි සැලකෙන කර්තෘ නිර්නාමික කෘතියක් වන ගද්‍යයෙන් මෙන්ම පද්‍යයෙන් ද රචනා වී ඇති සර්ග 27 කින් යුක්ත **ලලිත විස්තරය** නම් කෘතියෙන් සිද්ධාර්ථ කුමාරයන්ගේ ගිහි ජීවිතය පිළිබඳව පාළි ග්‍රන්ථවලින් ලබා ගත නොහැකි අප්‍රකට තොරතුරු මහත් රාශියක් අප මනසේ රේඛනය කර ගැනීමට පුළුවන. ලෝකෝත්තරවාද නිකායේ විනය ග්‍රන්ථයක් ලෙස සලකන **මහාවස්තුව** බුද්ධ චරිතයේ විවිධ තොරතුරු විස්තර කරන සංස්කෘත කෘති අතර වැදගති. වෙනත් බෞද්ධ ග්‍රන්ථයන්හි නොපැනෙන බුද්ධ චරිතය පිළිබඳ තොරතුරු රැසක් මෙහි ඇතුළති. පළමු වැනි සියවසේදී සංස්කෘත භාෂාවෙන් රචිත, බුදු සිරිතේ වැදගත් සිදුවීම් සංගෘහිත **මිලින්ද ප්‍රශ්නය** පසු කාලයක දී මෙරට දී පාළි භාෂාවට පෙරැළැවිණි.

**අවදාන සාහිත්‍ය අපදාන ලිපි සැරිය :-**

ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ බොදුනුවන් විසින් පරිශීලනය කරනු ලබන අවදාන සාහිත්‍ය ආශ්‍රයේව ද බුදු සිරිතේ අප්‍රකට තොරතුරු මතුකර ගැනීමට ලැබෙන සහය ලඝුකොට සැලකිය

නොහේ. අවදාන සාහිත්‍ය නිර්මාණය කිරීමෙහිලා පූරෝගාමීත්වය ගෙන ඇත්තේ ථේරීය නිකායෙහි භින්න වූ සර්වාස්ථවාදී භික්ෂූන් බව පැවසේ. සූත්‍ර පිටකයේ ඇතැම් තොරතුරු ද එම භික්ෂූහු භාවිතයට ගත්හ. **අවදාන කල්පලතාව** කාශ්මීර දේශයේ **ක්ෂේමේන්ද්‍රයා** රචනා කර ඇත්තේ එකොළොස්වැනි සියවසේ බව පෙනේ. අටවිසි බුදුවරුන් අතරින් ප්‍රථම සරණංකර බුදුන්ගේ සිට ගෞතම බුදුන් හා අනාගතයේ පහළවන මෛත්‍රී බුදුහිමියන් පිළිබඳව ද විස්තර කෙරෙන සර්වාස්ථ වාදීන්ගේ **සංස්කෘත දිව්‍යාවදානය** මගින් බුදු සිරිත හදාරන්නන්ට ලැබෙන්නේ නොමඳ වූ ආලෝකයකි. එහි පරිච්ඡේද 37 කි. පාළි අපදාන, සංස්කෘත අපදාන, යන්න එකිනෙකට පරියාය වූවකි. ඉන් ගම්‍ය වන්නේ ශ්‍රේෂ්ඨත්වයට පත් වූ පුද්ගල සිරිත් යන්නයි.

අවදාන කෘති

- අවදාන ශතක
- දිව්‍යවදාන
- ජාතකමාලා
- කල්පදානමාලා
- අවදාන කල්පලතා

ලුම්බිණිය නඟා සිටවූ ධර්මාශෝක මහාධිරාජ්‍යයා ගැන අප්‍රකට රසවත් තොරතුරු ඇතුළත් වන එක ම කෘතිය **දිව්‍යවදානය** සේ ගැනීම යෙහෙකි.

## V. චීන, බුරුම සහ තිබ්බතීය බසින් ද ලියැවී ඇති පැරැණි කෘතීන්හි බුද්ධ චරිතය

බුද්ධ චරිතය මේ වන විට ලෝකයේ කවර තරම් භාෂා ගණනකින් ලියැවී ඇත්දැයි මම නොදනිමි. කිනම් බසකින් එය ලියවුන ද එම කෘති කියවන්නෝ නිවුනෝම වෙති. බුද්ධ චරිතය අධ්‍යනය කරන්නට වැදගත් වන කෘති කිහිපයක්ම චීන බසින්ද ලියැවී තිබේ. **ඥානගුප්ත නම් වියතෙකු** විසින් ක්‍රි.ව. 587 දී චීන බසට පරිවර්තනය කරන ලද අභිනිෂ්ක්‍රමණ සූත්‍රයෙන් සිදුහත් උපතේ සිට ජටිල දමනය දක්වා වූ බුදු සිරිත විස්තර වේ. පරිච්ඡේද 60 කි. අප්‍රකට තොරතුරු රැසක් ඇතුළති. ක්‍රි.ව. 414 කරන ලද සර්ග 28 කින් සමන්විත **ධර්මරක්ෂිත ථෙර** විසින් චීන බසට පරිවර්තනය කරන ලද බුද්ධ චරිතය කෘතියෙහි ද සම්බුද්ධ පරිනිර්වාණය දක්වා තොරතුරු ඇතුළති.



බුද්ධ චරිතය සැකෙවින් දැක්වෙන බුරුම කෘති දෙකක් වන මාලාලංකාර වත්‍ථු හා තථාගතාවදාන පසු කලෙකදී **බිගැන්ඩේ හිමියන්** විසින් ඉංග්‍රීසි භාෂාවට පෙරළන ලදී.

**තිබ්බතීය වාර්තා - සම්බුදු සිරිත වර්ණනා :-**

නේපාලයෙන් ටිබෙට් දේශයට ගෙන යන ලද ධර්ම ග්‍රන්ථ තිබ්බතීය බසට පරිවර්ථනය කරන ලද ඒවා අතර වැදගත් වන **දුල්වා විනය ග්‍රන්ථයෙහි** ජාතක හා අවදාන සූත්‍ර ඇතුළති. ඒවා අධ්‍යනය කිරීමට සෙසු ලෝකයාට අවස්ථාව සැලසුනේ වුඩ්විල් රොක්හිල් විසින් ඒවා ඉංග්‍රීසියට පරිවර්ථනය කර The life of Buddha Early History නමින් ඉංග්‍රීසි කෘතියක් පළ කළ හෙයිනි.

## VI. දේශාටන වාර්තා - බුදු සිරිත ආශ්‍රිතව මැවූ රටා

බුද්ධ චරිතය අධ්‍යනය කිරීමේදී මූලාශ්‍ර ග්‍රන්ථ මගින් ලබා ගන්නා තොරතුරු නිවැරදිව තහවුරු කර ගැනීමට බුදුන් වහන්සේ උපන් දේශයට පැමිණි විවිධ දේශ ගවේෂකයන් විසින් තබන ලද දේශාටන වාර්තා ද අතිශය වැදගති. චීන දේශාටක පාහියන් හිමියන් ක්‍රි.ව. 399 ඉන්දියාවට පැමිණ වසර 15 කට ආසන්න කාලයක් ඉන්දියාවේ හා නේපාලයේ බුදු පා පහස ලද සෑම තැන ඇවිද මහත් පරිශ්‍රමයකින් සකස් කළ foe Koue Kr දේශාටන වාර්තා ග්‍රන්ථය බුදු සිරිත හැදැරීමේ දී බෙහෙවින් වැදගති. චීන වන්දනාකරු **හියුං සියැන්** විසින් සකසන ලදි. i-Yu-ki නම් චාරිකා සටහන් එකතුව ද **පාහියන් හිමිගේ** චාරිකා සටහන් තොරතුරු හා ගැළපේ. හියුං සියැන් ක්‍රි.ව. 629 දී ඉන්දියාවේ සහ නේපාලයෙහි සොළොස් වසරක් සරා රැස් කර ගත් තොරතුරු මෙහි ඇතුළති. එමගින් ද බුද්ධ චරිතයේ යම් යම් සංසිද්ධීන් තහවුරු කර ගැනීමට ලැබෙන මග පෙන්වීම අති මහති.

## VII. භාරතීය කැටයම්, බිතිසිතුවම් හා සෙල් ලිපි.

බුදු සිරිත මූර්තිමත් කෙරෙන ලිඛිත සාහිත්‍යයට අමතරව භාරතීය කැටයම්, බිතුසිතුවම් හා සෙල්ලිපි වලින් ද ඉතා තීව්‍ර අන්දමින් බුදු සිරිතේ ඇතැම් සිදුවීම් සජීවී ලෙසින් නිරූපනය කෙරේ. බුදු සිරිත නිරූපිත කලාත්මක කැටයම් පිළිබඳව විද්වතුන්ගේ වැඩි අවධානයක් යොමුවන්නේ නාගර්ජුනකොණ්ඩ හා අමරාවතී චෛතය.

හයිද්‍රාබාද් හී සිට කි.මී 150 ක් පමණ දකුණ දිශාන්තයේ පිහිටි නාගාර්ජුන කන්ද නොහොත් නාගාර්ජුන කොණ්ඩ ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ ගන්තූර් දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රකට ඉපැරණි බෞද්ධ නගරයකි. මෙහි පිහිටි ප්‍රකට මූර්ති තුළින් ද බුද්ධ චරිතයේ විවිධ අවස්ථා ඉතා සියුම්ව ඉස්මතු කර දක්වේ. වනගතව පැවති මෙම කලා කෙන්ද්‍රය 1926 දී ලෝකයාට අනාවරණය කරනු ලැබුවේ **පුරාවිද්‍යාඥ ඒ. ආර් සරස්වතී** විසිනි.

මෙහි ශ්වේත වර්ණ පාෂාණයෙන් බුදුසිරිතේ විවිධ අවස්ථා ආකර්ෂණීය අන්දමින් කොටා ඇත. අමරාවතියේ සිට මෙම ප්‍රදේශයට පැමිණ බුදුදහම පැතිරවීමට මුලිබවම ක්‍රියාකලේ බෞද්ධ ආචාර්ය වරයකු වූ නාගාර්ජුන විද්වතානන්ය. ඔහු අනුස්මරණීය පිණිස ඔහු ගේ නමින් මෙම ප්‍රදේශය හඳුන්වන්නට විය.



**බුදු සිරිත කැටයම් - කළ මනා විස්කම්**



**අජන්තා ගුහා චිත්‍ර :-**

තෙවැනි සියවසට අයත් අජන්තා ගුහා බිතු සිතුවම් මඟින් බුද්ධ චරිතයේ විවිධ අවස්ථා සජීවිමත් ආකාරයෙන් නිරූපණය කර ඇත. ගුහා 30 පමණ මෙම බෞද්ධ සිතුවම් දැකිය හැකි ය. මෙම සිතුවම් වසර 800 ට වැඩි කාලයක් ගුහාවල වාසය කළ භික්ෂුන්වහන්සේලා ගේ නිර්මාණයන් ලෙස  සැලකේ. වනගතව පැවති මෙම ගුහා චිත්‍ර 1819 දී **බ්‍රිතාන්‍ය ජාතික ජෝන් ස්මිත්** විසින් ප්‍රථම වරට සොයා ගනු ලැබිණි. මහාරාෂ්ට්‍රයේ, මරතාස් ජනපදයේ ඝණ වනයෙන් වැසී ගිය සහයා ද කඳුකරයේ, වග්හෝරා නදී අසබඩ පිහිටි මෙම ගුහා සමූහය තුළ ජාතක කථා වස්තූන් මෙන් ම සම්බුදු සිරිතේ වැදගත් අවස්ථා නිරූපිත ය.



මෙම දිස්ත්‍රික්කයෙහි ම පිහිටි එල්ලෝරා ගුහා 34 ක්  ද ඉපැරණි බෞද්ධ සිතුවම් හා කැටයම් මඟින් බුද්ධ චරිතය මෙන් ම හින්දු දෙවිවරුන්ගේ චිත්‍ර වලින් ද අලංකෘත ය.



**එව බල සිහගිරි - සමවෙද අජන්තා සිරි**

**සෙල්ලිපි :-**

සිරි සම්බුදු සිරිත මූර්තිමත් කරන ග්‍රන්ථ සමුදායට අමතරව එම ග්‍රන්ථ රත්නයන්ගෙන් හෙළි වන තොරතුරු සනාථ කිරීමට සෙල්ලිපි මඟින් ලැබෙන ආලෝකය ඉමහත්ය.

ලුම්බිණියෙන් හමුවූ අතිශය වැදගත් පුරාවස්තුවක් ලෙසින් ද සැලකෙන අශෝක ශිලාස්ථම්භය සිදුහත් උපත සනාථ කරන ප්‍රධානතම සෙල්ලිපියක් ලෙස සැලකේ.

> **"දේවානං පියේන පියදසි ලාජින**
> **වීසතිසා හිසිතේන**
> **අතනෝ අගාව මහියිතෝ**
> **හිදබුධෙ ජාතේ ශාක්‍යමුණීති**
> **සිලා විගඩාභිච කාලාපිතේ**
> **සිලාතබ්බේච උසපාපිතේ**
> **හිදභගවං ජාතේති ලුම්බිනි ගාමෙ**
> **උබාලිකේ කතේ**
> **අටභාගියේච"**
>
> *(රුමින්දේ ලුම්බිණි ටැම් ලිපිය)*

අභිෂේකයෙන් 20 වැනි වර්ෂයේ අශෝක අධිරාජයා ශාක්‍ය මුනින්ද්‍රයන්ගේ උපත සිදුවූ ස්ථානයට පැමිණ තම ගෞරව උපහාර පුද කළ බවත්,මෙම ස්ථානය වටා ශිලා ප්‍රාකාරයක් තැනවූ බවත්, බුදුරජාණන් වහන්සේට ගෞරව දැක්වීමක් වශයෙන් අවට ගම්වැසියන් ගේ නිෂ්පාදනවලින් අටෙන් එකක් පමණක් බදු ගෙවීමටත් ඉතිරි බඳු නිදහස් කිරීමටත් නියෝග කරමි'යි යන්න මෙම ශිලා ලිපියෙන් ප්‍රකාශිතය.

නිගාලී සාගර් ටැම් ලිපියෙන් දේවානම්පියතිස්ස රජු කෝණාගම බුදුන්ගේ දාගැබ ද්විගුණකර ඉඳිකළ බව දක්වති.

ධම්සෙන් නිරිඳුන් විසින් අමරාවතී ස්ථූපය කළ බව දැක්වෙන සෙල්ලිපියක් ද වෙයි.



**අකුරු කළ ටැම් ලිපි - මතු කරයි බුදු අසිරිය**





**තෙවන පරිච්ඡේදය**

# බුදුකුරු දම් පෙළ

## 05. බුදුරජාණන් වහන්සේලාගේ වංශ පරම්පරාව

තමන් විසින් ම සත්‍ය ගවේෂණයෙහි නිරතව නිවන අවබෝධ කර ගත් සඳ තුන් ලොවටම එම දැනුම දේශනා කළ උත්තරීතර උතුමන් සම්මා සම්බුදුවරු වශයෙන් පිළිගැනේ. වර්තමානයේ අප අදහන ගෞතම ශාක්‍ය මුණි යන ගෞතම බුදුරජාණන් වහන්සේ අනන්ත අප්‍රමාණවූ විශ්වීය කාලය තුළ ලොව පහළ වූ 28 වැනි බුදුරජාණන් වහන්සේ ලෙසින් සැලකේ.

ගෞතම බුදුරජාණන් වහන්සේගෙන් පසුව මෙම මහා භද්‍රකල්පය තුළ පහළ වන මුනීන්‍ද්‍රයා ලෙස සැලකෙන්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ය.

අටවිසි බුදුරජාණන් වහන්සේලා පහළ වන්නේ මහා කල්ප 12 ක් තුළ ය. එසේ පහළ වන බුදුරජාණන් වහන්සේලා ප්‍රමාණය මත මහා කල්ප වර්ග කොට ඇත.

| | | |
|---|---|---|
| 01. | ශුන්‍යය කල්පය | - බුදුරජාණන් වහන්සේලා පහළ නොවන කල්පය. |
| 02. | සාර කල්පය | - එක් බුදුරජාණන් වහන්සේ නමක් පමණක් පහළ වන කල්පය |
| 03. | මණ්ඩ කල්පය | - බුදුරජාණන් වහන්සේලා දෙනමක් පහළ වන කල්පය. |
| 04. | වර කල්පය | - බුදුරජාණන් වහන්සේලා තුන්නමක් පහළ වන කල්පය |
| 05. | සාර මණ්ඩ කල්පය | -බුදුරජාණන් වහන්සේලා සිවු නමක් පහළ වන කල්පය |
| 06. | භද්‍ර කල්පය | - බුදුරජාණන් වහන්සේලා පස් නමක් පහළ වන කල්පය |



දැනට අප ජීවත් වන්නේ භද්‍ර කල්පයක ය. ඒ අනුව කකුසඳ, කෝණාගම, කස්සප, ගෞතම, යන බුදුන් වහන්සේලා මෙතෙක් පහළ වී ඇති අතර, මෛත්‍රී බුදුන් වහන්සේ ඉදිරි භද්‍ර කල්පයේ පහළ වීමට නියමිත ය. කල්පය පිළිබඳව බුදුරජාණන් වහන්සේ මෙවැනි අදහසක් පළ කළ සේක.

"මහණෙනි, යම් සේ දිගින්, පළලින් හා උසින් යොදුනක් (සැ.16) බැගින් එක සමාන වූ මහා කළු ගල් පර්වතයක් වේද, එම කළු ගල් පර්වතය අවුරුදු සියයකට වතාවක් ඉතා සිනිඳු සළුවකින් පිරිමැදීම නිසා ඉතා දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ මහා පර්වතය සම්පූර්ණයෙන් ගෙවී අවසන්වී යා හැකි ය. එය එසේ ගෙවී අවසන් වූවත් කල්පයකට ඇති කාලයයෙන් අවුරුදු ගණන අවසන් නොවේ." **කල්පය සිතින් සිතා ගත නොහැකි තරම් අනන්ත වූ කාල වකවානුවක් බැව් ඉහත බුද්ධ දේශනය අනුව අපට සිතා ගත හැකි ය.**

බුදුවරු කරුණු අටෙකින් අසමාන වෙති. ආයුෂ, ශරීර ප්‍රමාණය, කුලය, වීර්ය කාලපරිච්ඡේදය, රශ්මිය, අභිනිෂ්ක්‍රමණය, බෝධි වෘක්ෂය, පර්‍යඞ්ක ප්‍රමාණය යනු ඒ අසමානතා අට වශයෙන් සැලකේ. බුදුවරුන් පිළිබඳ කරුණු තුනක් නො වෙනස් ව පවතියි. සියලු බුදුවරුන්ගේ බෝධිපර්‍යඞ්කය එක් ම තන්හි වෙයි. දම්සක් පැවැත්ම ඉසිපතන මිගදායෙහි සිදුවේ. දේවොරොහණය, සංකස්ස නගරද්වාරයෙහි සිදුවේ.

හැම බුදු කෙනෙකුන්ට ම සාධාරණ ධර්මතා සමතිසෙකි.

1. පශ්චිම භවික බෝධිසත්වයන් සිහිනුවණින් යුතු වැ මවු කුසින් බිහිවීම.
2. මවුකුස පළක් බැඳ පිටත බලා සිටීම.
3. බෝසත් මවු සිටිපියෙහි සිට බෝසතුන් බිහිකිරීම.
4. අරණෙහි දී මවු කුසින් බිහිවීම.
5. උපන් කෙණෙහි උතුරු දිගට සත් පියවරක් ගොස් සීහනාද කිරීම.
6. සතර පෙරනිමිති දැක, පුත් කුමරු උපන්දා මහබිනික්මන.
7. පැවදි ව යටත් පිරිසෙයින් සත්දිනක් හෝ ප්‍රධන්වීර්‍ය්‍ය කිරීම.
8. බුදු වන දවස් කිරිපිඬු වැළඳීම.
9. තණ ඇතිරියෙහි වැඩ හිඳ සර්වඥතා ඥනාධිගමය.
10. බුද්ධත්වය සඳහා ආනාපානසති කමටහන් වැඩීම.
11. මරුන් බිඳලීම.
12. බෝධිපර්‍යඞ්කයෙහි දී මැ ත්‍රිවිද්‍යාදි ගුණ ප්‍රතිලාභය.
13. සත්සති ගෙවීම.
14. මහ බඹුගේ අයදිමින් දහම් දෙසීම.

15. ඉසිපතන මිගදායේදීම දම් සක් පැවැත්වීම.
16. නවම් පුර පසළොස් වක් හීම ප්‍රථම දම් දෙසීම.
17. දෙව්රම් වෙහෙර තන්හිම නිබඳ වාසය
18. සැවැත්පුර දොර යමාමහ පෙළහර දැක්වීම.
19. තව්තිසායෙහි අභිධර්ම දේශනාව
20. සංකස්සපුර දොරට දෙව්ලොවින් බැසීම
21. නිරතුරු ඵල සමාපත්තියට සම වැදීම.
22. ධ්‍යාන දෙක්හි වෛනෙයිය ජනයා බැලීම.
23. කරුණක් නැගි කල්හි මැ ශික්ෂා පැනවීම.
24. අර්ථෝත්පත්ති නිමිතිකොට ජාතක දේශනාව.
25. ඥාති සමාගමෙහි බුද්ධ වංශ දේශනාව
26. ආගන්තුක භික්ෂූණ් හා පිළිසඳර කිරීම.
27. ආරාධනායෙන් වස් වැස දායකයන් නොපිළිවිස නොයෑම.
28. දවස් පතා පසෑබුද්ධ කෘත්‍ය නොකඩ කොට කිරීම.
29. පරිනිර්වාණ දිනයෙහි මාංසරස භෝජනය.
30. සුවිසි කෙළ සුවහස් සමවත් සමවැදී පිරිනිවීම යන මේ කරුණුයි.

බුද්ධ වංශ ධාතුභජනීය කථාවෙහි දක්වෙන පරිදි බුදුරදුන්ගේ පිරිකර ද මෙසේ පැහැදිළිව දක්වා ඇත. පාත්‍රය, සැරයටිය, සිවුර, හඳනය, පසතුරුණ, ඩබරාව, කාබහන, දිය සළුව, ඌර්ණරෝම ධාතුව, කසාවත, (බෝසතුන්ගේ) හිස් වෙළුම, නිසීදනය, ඇතිරිය, අරණිය, (ගිනිගානාදණ්ඩ) පෙරහන කරකැත්ත, හිදිගුළාව යන භාණ්ඩයන් ය.

**බුද්දක නිකාය, සද්ධර්මරත්නාකරය, සද්ධර්මලංකාරය, බෝධි වංශය, ථූප වංශය, පූජාවලිය හා ජාතක පොත** ඇසුරෙන් මෙතෙක් ලොව පහළ වූ බුදුන් වහන්සේලා 28 නම පිළිබඳවත් උන්වහන්සේලා පහළ වූ කල්පයන්, මව් පියන්, උපත ලද නගර හා බුද්ධත්වය ලැබීමට සෙවන දුන් වෘක්ෂ පිළිබඳවත් තොරතුරු පහත දැක්වෙන වගුවෙන් පහසුවෙන් ම අවබෝධ කර ගැනීමට හැකිවනු ඇත. අටවිසි බුදු පිරිතෙහි ද අටවිසි බුදුරජාණන් වහන්සේලාගේ ගුණ කදම්භය මැනවින් විස්තර වේ.





## අටවිසි බුදුරජාණන් වහන්සේලා

| | බුදුන් | කල්පය | පියා | මව | උපන් නගරය | බෝධිය |
|---|---|---|---|---|---|---|
| 01 | තණ්හංකර බුදුන් | සාර මණ්ඩප | සුනන්ද රජ | මනෝනඥ බිසව | පුෂ්පවතී | රුක් අත්තන |
| 02 | මේධංකර බුදුන් | සාර මණ්ඩප | සුදේව රජ | යශෝධරා බිසව | මේඛලා | කැල |
| 03 | සරණංකර බුදුන් | සාර මණ්ඩප | සුමංගල රජ | යසවතී බිසව | විපුල | පුළිල/පලොල් |
| 04 | දීපංකර බුදුන් | සාර මණ්ඩප | සුදේව රජ | සුමේධා බිසව | රම්‍යවතී | කප්පිත්ත/පතනබෝ |
| 05 | කොණ්ඩඤ්ඤ බුදුන් | සාර මණ්ඩප | සුනන්ද රජ | රම්‍යවතී බිසව | රූපවතී | සල් |
| 06 | මංගල බුදුන් | සාර මණ්ඩප | උත්තර රජ | උත්තරා බිසව | උත්තරා | නා |
| 07 | සුමන බුදුන් | සාර මණ්ඩප | සුදන්ත රජ | සිරිමා බිසව | ක්ෂේම | නා |
| 08 | රේවත බුදුන් | සාර මණ්ඩප | විපුල රජ | විපුලා බිසව | | නා |
| 09 | සෝභිත බුදුන් | සාර මණ්ඩප | සුධර්ම රජ | සුධර්මා බිසව | සුධර්මා | නා |
| 10 | අනෝමදස්සි බුදුන් | වර | යසවන්න රජ | යශෝධරා බිසව | සඳවත් | මහ කුඹුක්/ අර්ජුන |
| 11 | පදුම බුදුන් | වර | සුදේව රජ | අනෝමා බිසව | චම්පා (රම්මක) | හුණ (මහමූරුත) |
| 12 | නාරද බුදුන් | වර | සුදෙව රජ | අනුපමා බිසව | සුධඤ්ඤවතී | මහාසෝණ/මුරුත |
| 13 | පදුමුත්තර බුදුන් | සාර | ආනන්ද රජ | සුජාතා බිසව | හංසවතී | සළල/හොර |
| 14 | සුමේධ බුදුන් | මණ්ඩ | සුදන්ත රජ | සුමණ බිසව | සුදර්ශන | කොළොන් (බක්මී) |
| 15 | සුජාත බුදුන් | මණ්ඩ | උද්ගත රජ | ප්‍රභාවතී බිසව | සුමංගල | හුණ/ වේළු |
| 16 | පියදස්සී බුදුන් | වර | සුදත්ත රජ | සුචේන්‍ද්‍ර බිසව | සුධඤ්ඤවතී | රුක්/කුකුධ |
| 17 | අත්ථදස්සී බුදුන් | වර | සාගර රජ | සුදර්ශණා බිසව | සෝභනා | සපු/චම්පික |
| 18 | ධම්ම දස්සී බුදුන් | වර | සරණ රජ | සුනන්දා බිසව | සරණ | රත්කරව්/බිම්බජාල |
| 19 | සිද්ධත්ථ බුදුන් | සාර | උදේනි රජ | සුප්පා බිසව | වේභාතික | කිණිහිරියා/කනීකාර |
| 20 | තිස්ස බුදුන් | මණ්ඩ | ජන සන්ධ රජ | පදුමා බිසව | මේකලා | මොර/අසන |
| 21 | ඵුස්ස බුදුන් | මණ්ඩ | ජයසේන රජ | සිරිමා බිසව | කසී | නෙල්ලි /ආමල |
| 22 | විපස්ස බුදුන් | සාර | බන්ධුම රජ | බන්ධුමා බිසව | බන්දුමතී | පළොල්/පාඨලී |
| 23 | සිඛි බුදුන් | මණ්ඩ | අරුණ රජ | ප්‍රභාවතී බිසව | අරුණවතී | ඇටඹ/පුණ්ඩරික |
| 24 | වෙස්සභූ බුදුන් | මණ්ඩ | සුප්පනීත රජ | යසවතී බිසව | අනුපම | සල් |
| 25 | කකුසඳ බුදුන් | මහාභද්‍ර | අග්නිදත්ත බ්‍රාහ්මණ | විශාඛා බැමිණිය | ඛේම | මගුල් මාරා/මහරිය |
| 26 | කෝණාගම බුදුන් | මහාභද්‍ර | යඤ්ඤදත්ත බ්‍රාහ්මණ | උත්තරා බැමිණිය | සොභාවතී | දිඹුල්/අට්ටික්කා |
| 27 | කාශ්‍යප බුදුන් | මහාභද්‍ර | බ්‍රහ්මදත්ත බ්‍රාහ්මණ | ධනවතී බැමිණිය | බරණැස | නුග |
| 28 | ගෞතම බුදුන් | මහාභද්‍ර | සුද්ධෝදන රජු | මහාමායා බිසව | කිඹුල්වත් පුර | ඇසතුබෝ |
| 29 | මෛත්‍රී බුදුන් | මහාභද්‍ර | සුබ්‍රහ්ම බ්‍රාහ්මණ | බ්‍රහ්මවතී බැමිණිය | කේතුමතී | නා |

# 06. දස පාරමී

තෘෂ්ණාව, මානය, මිථ්‍යාදෘෂ්ටිය යන තෙවැදෑරුම් කෙළෙසුන් හා නොගැටුණු සිත් කිළිටි නොවූ, කරුණාවෙන් හා උපාය කෞශල්‍යයෙන් දෙලෝ සෙත සැලසෙන මග සලසා ගැනීමෙහි දක්ෂ වූ නුවණින්, සිත මනාව රැක ගෙන දානාදී ගුණ ධර්මයන්හි නිරතවීම පාරමී නම් වෙත්.

මෙම දසපාරමිතා (ගුණධර්ම, ගුණ පිරුම්, ගුණ පුරුදු) පාරමිතා, උප පාරමිතා, පරමත්ථ පාරමිතා, යනුවෙන් තිස් ආකාරයකට ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. මෙයින් සම්මා සම්බුද්ධත්වය පතන මහ බෝසත්වරයෙකු එකී සමතිස් පෙරුම්දම් සපුරාලීම ට අවශ්‍ය වේ.

බෞද්ධ සාහිත්‍යයට හා ඉතිහාසයට අනුව අප භාග්‍යවතුන් වහන්සේ ද බුද්ධත්වය ලැබීමට පෙර සාරා සංඛ්‍යයය කල්ප ලක්ෂයක් මුළුල්ලේ මේ සමතිස් පෙරුම්දම් පිරූහ. බෝසතුන් බුදු බව ප්‍රාර්ථනය කෙරෙමින් පාරමිතා සපුරණ කාලය ඇරඹෙන්නේ මහා කල්පයකිනි. මහා කල්පයක් අසංඛ්‍යයය කල්ප හතරකින් සමන්විත වෙයි. මහා කල්පය යනු මිනිස් සිතට සිතා ගත නොහැකි තරම් අති දීර්ඝ කාල පරිච්ඡේදයකි. බුදුන් වහන්සේ විසින් දේශිත සාසප සූත්‍රයෙහි මහා කල්පයක දීර්ඝතාව මෙසේ පැහැදිළි කෙරෙයි.

"යොදුනක් දිග (සැ.16) යොදුනක් පළල, යොදුනක් උස විශාල ප්‍රාකාරයකින් වට ප්‍රදේශයක් පුරා ප්‍රාකාරයෙහි ඉහළ මට්ටම දක්වා අඹ අතුරා වසර සියයකට එක අඹ ඇටය බැගින් ඉවත් කළ විටක මතු යම් දිනක එම ප්‍රදේශය හිස් වේද එනමුත් මහා කල්පය අවසන් නොවන්නේය."

මෙතරම් සුවිශාල කාලපරිච්ඡේදයක් පුරා අප මහා බෝසතාණන් බුදු බව පතා දස පාරමිතා පුරා ඇති බැව් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහනි. බෝසතාණන් විසින් පුරන ලද දස පාරමිතාවන් සැකෙවින් මෙසේ දැක්විය හැකි ය.

## 01. දාන පාරමිතාව

දස පාරමිතා ආරම්භ වන්නේ දාන පාරමිතාවෙනි. කරුණා සිත පෙරදැරිව දෙලෝ යහපත සලසා ගැනීමේ අරමුණින් නුවණින් තමා සතු වූවක් පූජා කිරීමේ චේතනාවෙන් අනුන්ට දීම හා ඒ ආශ්‍රයෙන් ඇති වන්නාවූ අලෝභ චේතනාව දාන පාරමිතාව ලෙස සැලකේ. සංඛ බ්‍රාහ්මණ, අකිත්ති, කුම්මාසදණ්ඩ, මහා සුදස්සන, වෙස්සන්තර වැනි



ජාතක කථා වලින් බෝසතුන් බාහිර වස්තු පරිත්‍යාගයෙන් දාන පාරමී පිරූ අවස්ථා මැනවින් නිරූපණය වේ.

බෝසතුන් සිය සිරුරේ අවයව පූජා කරමින් දාන උපපාරමිතා ද සපුරා ඇත. සිවි ජාතකය දාන උප පාරමී පිරූ අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය.

දාන පරමත්ථ පාරමී නොහොත් සිය ජීවිතය ද පරිත්‍යාග කරමින් දාන පාරමිතා පිරූ අයුරු සස ජාතකයෙන් පැහැදිළි වෙයි.

## 02. ශීල පාරමිතාව

කරුණා සිත පෙරදැරිව, දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව තිදොර සංවරව පවත්වාගෙන යමින් භවයේ සැරි සැරීම ශීල පාරමිතා ධර්මතාවයයි.

ශීල පාරමිතාව චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය යනුවෙන් දෙවදෑරුම්ය. චාරිත්‍ර ශීලය සපුරමින් සාම, නන්දිය, අසාතමන්ත, ජයද්දිය, මාතු පෝෂක කථා වස්තු වලින් ද, ගුරුවරුන්ට කීකරුව සේවය කිරීම, කාරණ්ඩිය, ජව, සකුණ ජාතකවලින් ද, අඹුදරුවන් පෝෂණය කිරීම සුවණ්ණහංස ජාතක කථාවෙන් ද, කාම දස්සන ජාතකයෙන් ගිලනුන්ට උවටැන් කිරීම පිළිබඳව ද, පැවිදි උතුමන්ට උවටැන් කිරීම කුම්භකාර ජාතක කථාවෙන් ද පැහැදිළි වේ. නොකළ යුතු පාප ක්‍රියාවන්ගෙන් වැළකීම චාරිත්‍ර ශීලයයි. මේ අනුව ප්‍රාණඝාතයෙන් බෝසතුන් වැළකී සිටි අයුරු ශීල වීමංසන ජාතකයෙන් ද, පරදාර සේවනයෙන් වැළකී සිටි අන්දම මහා නාරද කස්සප ජාතකයෙන් ද, චේතිය හා තක්තාරු ජාතකවලින් මුසාවාදයෙන් වැළකී සිටි අයුරු ද, සුරාපානයෙන් වැළකී සිටි අයුරු කුම්භ හා භද්‍රයට යන ජාතක කථා වලින් ද පැහැදිළි වේ.

## 03. නෙක්ඛම්ම පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලෝ යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව කාමයන්ගේ ආදීනවයන් දැක එකී කාමයන්ගෙන් නික්මීම නෙක්ඛම්ම පාරමිතාවේ ධර්මතාවයයි. චුල්ල, සුතසෝම, චුල්ලබෝධි, සෝමනස්ස ආදී ජාතක කථාවලින් අඹු දරුවන්, දේපළ, ඉඩකඩම් පිළිබඳව වූ බැඳීම් බිඳ දමා නෙක්ඛම්ම පාරමිතාවද ඇස්, හිස්, මස්, ලේ ආදිය පිළිබඳව ආශාව අත්හැර දමා නෙක්ඛම්ම උප පාරමිතාවද, සිය ජීවිතය පිළිබඳව වූ ආශාව අත්හැර දමා නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවද, බෝසතුන් විසින් පුරන ලදී.

## 04. ප්‍රඥා පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව නාමරූප ධර්මයන්ගේ යථා ස්වභාවය දක්නා නුවණ ප්‍රඥා පාරමිතාව යන ධර්මතාවයයි. ප්‍රඥා පාරමිතාව චින්තනමය, සුතමය, භාවනාමය වශයෙන් තෙවැදෑරුම්ව දියුණු කර ගැනීමට බෝසතුන් මහත් වෑයමකින් කටයුතු කළේ ය. ප්‍රතිසන්ධි ප්‍රඥාව යනුවෙන්ද හැඳින්වෙන චින්තනමය ප්‍රඥාව ඒ ඒ පුද්ගලයාගේ පෙර කර්මානුරූපව උපතින්ම පිහිටන්නකි. ස්ව ශක්තියෙන් හා වීර්යයෙන් යුතුව වෙනත් කෙනෙකුගේ මඟ පෙන්වීමෙන් තොරව නුවණින් මෙනෙහි කිරීමෙන්ම චින්තනමය ප්‍රඥාව පහළ වේ. පණ්ඩිතයන් ඇසුරෙන්, ඔවුන් විසින් ලියන ලද පත පොත පරිශීලනයෙන් හා තර්කනයෙන් දියුණු කර ගන්නා නැණස සුතමය ප්‍රඥාව වශයෙන් සැලකේ. භාවනාමය ප්‍රඥාව යනු සමථ, විදර්ශනා භාවනා ඇසුරෙන් උපදවා ගන්නා ප්‍රඥවෙකි.

සියලු ම පාරමිතා වැඩීම පිණිස ප්‍රඥාව හේතුවන බවද බුදුන්වහන්සේ වදාළ සේක.

## 05. වීර්ය පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව සිතින් හා කයින් සෙසු අයට පරෝපකාරය කෙරෙහි පවත්නා වූ උත්සාහය වීර්යය පාරමිතාව යන ධර්මතාවයයි. උද්‍යෝගය නිසා කිසියම් කාර්යයක් ආරම්භ කිරීමේ සිතක් පහළ වුව ද ඒ සඳහා ඉදිරිපත්වීම අත්‍යාවශ්‍ය වේ. ඉදිරිපත් වීම පමණක් නොව එළඹි කාර්යය සඵල වනතුරු එහි නිතර වැඩීමෙන් වීමද වැදගති. වීර්යය පාරමිතාව සාර්ථක අභිවෘද්ධිය සැලසෙන්නට සේම අන්‍යයන්ගේ යහපතද සලසා දෙයි. වීර්‍ය්‍ය පාරමිතාව පාරමී, උප පාරමී, පරමත්‍ථ පාරමී වශයෙන් වීර්‍ය්‍ය පාරමිතාව තෙවදෑරුම් වේ.

## 06. ක්ෂාන්ති පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුක්තව හේතු ප්‍රත්‍යයන් මුල්කොට හටගත් සියලු දේ පිළිබඳව වූ නිවැරදි උපේක්ෂාවෙන් යුක්තව ඉවසීමේ ගුණය ක්ෂාන්ති පාරමිතා යන ධර්මතාවයයි.

ක්ෂාන්ති යන්නෙහි මූලික අර්ථය ඉවසීමේ ගුණය ප්‍රගුණ කිරීමයි. ඉවසීම ධම්ම නිජ්ඣාන ඛන්තිය සහ අධිවාසක්ඛන්තිය යනුවෙන් දෙවැදෑරුම් වේ. මෙයින් ක්ෂාන්ති පාරමිතාවට අයත් වන්නේ



අධිවාසන ක්ෂාන්තිය පමණයි. එමගින් ගම්‍ය වන්නේ සිත් තුළ උපන් කෝපය පිටවන්නට නොදී සිත තුළ ම තබාගෙන කෝපය සංසිඳවා ගැනීමයි.

අධිවාසනක්ඛ ක්ෂාන්තියද තෙවැදෑරුම් වේ.

i. බාහිර කරුණු හේතු කොට ගෙන ඇති වන කෝපය සංසිඳුවා ගැනීම.
ii. තමන් නිසා ම ඇතිවන නුරුස්නා ගති කෝපයෙන් තොරව ඉවසීම.
iii. අනුන්ගෙන් හා සතුන්ගෙන් සිදුවන හිරුහැර මැදිහත් සිතින් ඉවසීම බෝසතුන් විසින් සසර පුරා ක්ෂාන්ති පාරමිතාව පුරනු ලැබිණි.

## 07. සත්‍ය පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව ම යහපත උදෙසා මනා සිහි කල්පනාවෙන් යුක්තව බොරුකීමෙන් වැළකීම, පොරොන්දු කඩ කිරීමෙන් වැළකීම ආදී නොරැවටීමේ ගුණය සත්‍ය පාරමිතාව යන ධර්මතාවයයි. හැම විට සත්‍යම පමණක් කථා කිරීම මෙම පාරමිතාවේ මහඟු ගුණයයි.

සත්‍ය පාරමිතාව පිරීමෙන් විවිධ ආශ්චර්යමත් ක්‍රියා සිදු කළ හැකිය. අංගුලිමාල තෙරුණ් අසාධ්‍ය තත්වයට පත් ස්ත්‍රීයය සුවපත් කරන ලද්දේ සත්‍යක්‍රියා බලයෙනි.

## 08. අධිෂ්ඨාන පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව උපදවා ගත් යහපත් අධිෂ්ඨානයන්, අපේක්ෂාවන් නොවෙනස්ව පවත්වා ගැනීම අධිෂ්ඨාන පාරමිතාව යන ධර්මතාවයයි.

තම සුතඹුවන් දුකට පත් වෙද්දී, තම ධන ධාන්‍ය අහිමි වී යද්දීත් දන් දීම ආදී ගුණ දම් නොසැලී පුරුදු කිරීම අධිෂ්ඨාන පාරමිතාවයි. තම සිරුරට පීඩා ගෙන දුන්නද තම ඇස් හිස් මස් අහිමි වී ගිය ද දානාදී ගුණ දම් පිරීම නොසැළි පුරුදු කිරීම, අධිෂ්ඨාන උප පාරමිතාවයි. තම ජීවිතයට මරණීය තර්ජනයක් එල්ල වුව ද දානාදී ගුණ දම් පිරීම නොසැලී පුරුදු කරමින් අධිෂ්ඨාන පරමත්ථ පාරමිතාවයි. බෝසතුන් විසින් මෙම තෙවැදෑරුම් අධිෂ්ඨාන පාරමිතා පුරන ලදි.

### 09. මෛත්‍රී පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව තමා කෙරෙහි දක්වන ලෙංගතුකමත් කුළුණු බවත් බේදයකින් සීමාවකින් තොරව සියලු සතුන් කෙරෙහි පතුරවාලීම මෙත්තා පාරමීතා ධර්මතාවයයි. මෙත්තා පාරමිතාව පුරන බෝසත් උතුමෝ සිත, කය, වචනය යන තිදොරින් ම එය ක්‍රියාවට නගති. මෙය මෙත්තා සහගත කාය කර්ම මෙත්ත සහගත වචී කර්ම, මෙත්තා සහගත මනෝකර්ම යනුවෙන් සපුරාලිය යුක්තකි.

### 10. උපෙක්ෂා පාරමිතාව

කරුණා සිත් පෙරදැරිව දෙලොව යහපත උදෙසා මනා සිහි නුවණින් යුතුව තමා කෙරෙහි දක්වන ලෙංගතුකමින් පක්ෂපාතී වීම, ක්‍රෝධයෙන් විරුද්ධ වීම යන අන්ත දෙකෙන් බැහැරව මිතුරු පස මිතුරු සම්බන්ධයන් කෙරෙහි සම මෙත ඇතිකරගැනීම උපේක්ෂා පාරමිතාව යන ධර්මතාවයයි.

ලාභ අලාභ, යස අයස, නින්දා පැසසුම්, සැප දුක යන අටලෝ දහමට අකම්පිතව උපෙක්ෂාවෙන් කටයුතු කිරීම උපේක්ෂා පාරමිතාව පුරන බෝසත්වරුන් තුළ දැකිය සුවිශේෂීය ලක්ෂණයයි.

බෝසතානන් වහන්සේ සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ ඉහත සඳහන් දස පාරමිතාවන් සමතිස් පාරමිතාවෙන් වන අයුරින් පුරණය කරමින් අවසන් අත් බවයට පෙරාතුව පෙර තුසිත දෙව් ලොව උපත ලැබී ය.



දාන පාරමිතා



## 07. ගෞතම බෝධිසත්ත්වයන් නියත විවරණ ලබාගැනීම

සම්මා සම්බුදුරජාණන් වහන්සේ තමන් ඉදිරියේ තමන් ලැබීමට අපේක්ෂිත සම්මා සම්බුද්ධත්වය ස්ථිර වශයෙන් ම ලැබේ ද යන්නට පිළිබඳව කරුණු දැනගැනීමට හා තහවරු කර ගැනීම හැඳින්වෙන්නේ නියත විවරණ ලැබීම යනුවෙනි. බුදු සිරිත හා බැඳුනු බොහෝ විස්තර ද මෙහි දී බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශයට පත්කිරීම ද සිදුවේ. නියත විවරණ ගත් මොහොතේ පටන් බෝසත්වරු ශද්ධා, වීර්ය, සති සමාධි, ප්‍රඥා යන පංච විධි ධර්මයන් පිරීම කෙරෙහි වැඩි වශයෙන් කැපවේ. සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් පාරමී පිරිය යුතු කාලය ද මෙහිදී තීරණය වෙයි. නියත විවරණ ලබන අවස්ථාවේදී සම්පූර්ණ වී තිබිය යුතු කරුණු අටක් පිළිබඳව ද බුද්ධවංශ පාලියෙහි සුමේධ කතාවේ දක්වා ඇත.

බුද්ධත්වය ප්‍රාර්ථනා කොට නියත විවරණ ලැබීමට සුදුස්සෙක් වන්නේ, මිනිසත් බව ලබා ඇති අයෙක් පමණි. එසේ ම ඔහු පිරිමි ආත්මයක් ලබා සිටිය යුතු ය. රහත්වීමට හේතු සම්පත් තිබිය යුතු ය.

බුදුරජාණන් වහන්සේ නමක් සියැසින් දැක ගැනීමට තරම් භාග්‍ය සම්පන්න විය යුතු ය. පැවිදි බව ලැබ සිටිය යුතු වේ. අෂ්ට සමාපත්ති ලද ධ්‍යානලාභියෙකු විය යුතු ය. තවද බුදුරජාණන් වහන්සේට සිය දිවිය වුව පුදකරන්නට තරම් ආත්ම ශක්තියකින් හෙබි පුද්ගලයෙකු විය යුතු ය. බුද්ධකාරක ධර්ම හෙවත් පාරමීදම් පූර්ණය කෙරෙහි කැපවීමකින් යුක්ත පුද්ගලයෙකු විය යුතු ය.

අප මහ බෝසතුන් සුමේධ නම් තාපසයෙකුව උපත ලබා, දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයෙහි දී නියත විවරණ ලැබීමට සුදුසු වූයේ ඉහත දැක්වූ අෂ්ට ධර්මතා සපුරා තිබූ බැවිනි.

දීපංකර මහ බෝසතානෝ තුසිත දෙව්ලොවින් චුතව, මිනිස් ලොව දඹදිව රම්‍යවතී නුවර රජ කළ සුදේව රජුන්ට හා සුමේධා දේවියට පුත්ව උපත ලැබී ය. එතුමා පැවිදිව දස මසක් වීර්යය කොට පලොල් බෝධි වෘක්ෂයක් සෙවනේ සම්මා සම්බුදු පදවියට පත්විය.

ඒ අවදියේ අප මහා බෝසතානෝ පාරමී දම් සපුරමින් භවයේ සැරසරණුයේ දඹදිව අමරවතී නුවර සුමේධ බ්‍රාහ්මණ නමින් උපත ලද්දේ ය. හේ තෙම දෙමාපියන් මිය පරලොව ගිය පසුව විශාල ධනස්කන්ධය දනට පිනට දී, සියල්ල අතහැර හිමවතේ ධම්මික පව්වේ ආශ්‍රමගතව තපස් දිවියට පිළිපන්නේ ය. මේ සමයේ දීපංකර බුදු පියාණන් රම්‍ය නගරයෙහි සුදර්ශන වෙහෙර වෙත වැඩම කළේ ය.

එදින කිසියම් කාර්යයක් සඳහා රම්‍ය නගරය වෙත සැපත් සුමේධ තව්සානන්ට, නගර වැස්සන් ලහි ලහියේ නගරය පිරිසුදු කරනු දක්නට ලැබිණි. නගරවාසීන්ගෙන් විමසීමේදී තව්සානන්ට දැනගැනීමට ලැබුණේ දීපංකර බුදුරජාණන් වහන්සේ රම්‍ය නගරයට වඩින බවය. තමන් කොටස් වෙන් කර ගෙන මහ මාවත පිරිසුදු කිරීමේ කාර්යයෙහි යුහුසුළුව සිටින බව ද ඔවුහු වැඩිදුරටත් පැවසූහ. මේ පුවතින් අතිශයින් සොම්නසට පත් සුමේධ තවුසා පිරිසුදු කිරීම පිණිස මාවතෙහි කොටසක් තමන් වෙත ද පවරා ගත්තේ ය. ඔහුට හිමිවූයේ මාවතෙහි අතිශයින් මඩවී අපවිත්‍ර වී තිබූ කොටසකි. මහත් කැපවීමකින්, වෙහෙස වී පිරිසුදු කිරීම් කළ ද තාපසතුමන්ට බුදුන් වහන්සේ දනට වැඩීමට පෙර තම කාර්ය සපුරා ගැනීම අපහසු විය. පාරේ මඩ සහිත කොටසට සමීප වූ දීපංකර බුදුහිමියන්, එම ස්ථානයෙන් පියමං කිරීමට අපහසුව මඟ නැවතී බලා සිටි සේක. යෙදිය හැකි වෙනත් විකල්පයක් නොවූයෙන්, සුමේධ තවුස් තෙම මාවත මඩ වතුර ආවරණය වන පරිදි ඒ මත වැතිරී මුණින් දිගා විය. තම දිවි තොර වුව ද තථාගතයන් වහන්සේ ගේ සිරිපා යුග්මයේ මඩ තැවරීමට ඉඩ නොතැබීමේ පවිත්‍ර චේතනාවෙන් තවුසා තම සිරුර මතින් මඩ ගොහොරුවෙන් එතෙර වන ලෙසට මුණිදානන්ට ආයාචනා කළේ ය. මෙතරම් සැදැහැ භක්තියකින් හෙබි මෙම තවුසා ගේ අතීත භාවයන් පිළිබඳ දීපංකර මුණිඳුන් ආවර්ජනය කර බැලූහ. මොහු අනාදිමත් කාලයක සිට සසරේ පාරමී දම් පුරණා බෝධිසත්ත්වයෙකු බව දැන අවට සිටි රහතුන් වහන්සේලා හා උවැසියන් ඉදිරියේ සුමේධ තාපසයන්ගේ මහා පුණ්‍ය බල මහිමය ප්‍රකාශ කළහ. මෙතුමා අනාගතයේ නිසැක වශයෙන් ම සිද්ධාර්ථ ගෞතම නාමයෙන් ලොව්තුරා සම්බුද්ධත්වය ලබන බව ප්‍රකාශ කර බුදු බව පිණිස නියත විවරණ දුන්හ.

බුදුපියාණන් කිඹුල්වත් පුර වැඩි අවස්ථාවේ වදාරණ ලද බුද්ධ වංශ දේශනාව තුළින් උන්වහන්සේ බෝසත් පෙරුම් පුරන සමයේ විවිධ බුදුවරුන් වෙතින් නියත විවරණ ලද අයුරු පැහැදිළි වේ. **පූජාවලී කතුවරයා** බෝසතුන් අනුපිළිවෙලින් නියත විවරණ ලබාගත් අයුරු විස්තර කරනුයේ සහෘද සිත් සතන්හි බොදු බැතිය තීව්‍ර කරන අන්දමේ භාෂා විලාෂයක් යොදා ගනිමිනි.

"තවද ශාරිපුත්‍ර ස්ථරවිරය, මම ඒ දීපංකර නම් බුදුන් සමයෙහි සුමේධ නම් තාපස වැ අෂ්ඨ ධර්මයෙන් යෙදී ජීවිතයෙන් පූජා කොටැ, මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. කොණ්ඩඤ්ඤ නම් බුදුන් සමයෙහි, විජිතාවි නම් චක්‍රවර්ති රජ වැ, බුදුන්ට තුන් මසක් අසදෘශ මහ දන් දී, චක්‍රවර්තී රජය පුදා මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. මංගල නම්



බුදුන් සමයෙහි, සුරුචි නම් බ්‍රාහ්මණ වැ දොළොස් යොදුන් සත් රුවන් මඩුවකැ, කෙළ ලක්ෂයක් රහතන් හා සමඟ බුදුන් වඩා හිඳුවා, චතු මධුර කිරි පිඩු සත් දවසක් වළඳවා, කෙළ ලක්ෂයක් සිවුරු පිරිකර දී, මේ බුදු බවට ප්‍රාර්ථනා කළෙමි.  සුමන නම් වු බුදු සමයෙහි අතුල නම් නාග රාජයන් වැ, කෙළ ලක්ෂයක් බුදු පාමොක් මහ සඟ පිරිස් දිව්‍ය භෝජන වළඳවා කෙළ ලක්ෂයක් දිව සළු පුදා, මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. රේවත නම් බුදුන් සමයෙහි, අතිදේව නම් බ්‍රාහ්මණ වැ දහසක් වටනා උතුරු සළුවක් පුදා බුදුන් බල බලා සිටැ, විසිතුරු සොළෝ දහසක් බැඳැ ස්තුති පූජා කොටැ, මේ බුදු බවට ම ප්‍රාර්ථනා කළෙමි. සෝභිත නම් බුදුන් සමයෙහි, සුජාත නම් බමුණු වැ බුදුන්ට තුන් මසක් මහ දන් දී, මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කෙළෙමි. අනෝමදස්සී නම් බුදුන් සමයෙහි මහේශාක්‍ය වු යක්ෂ රජුන් වැ ඉපිදැ සත් දවසක් බුදු පාමොක් මහ සඟ පිරිසට දිව්‍ය භෝජන දන් දී, මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කෙළෙමි. පදුම නම් බුදු සමයෙහි, සිංහ රාජයන් වැ ඉපිද ධ්‍යාන සුවයෙන් වැයැ හුන් බුදුන් දැකැ ප්‍රීතීන් තුන් යලක් පැදැකුණු කොටැ, තුන් යලක් සිංහ නාදයෙන් පුදා, සත් දවසක් ඇස නොමරා, බුදුන් බල බලා සිටැ මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කෙළෙමි. නාරද නම් බුදුන් සමයෙහි උග්‍ර වු තාපස වැ, අසු කෙළක් රහතන් හා සමගැ මා කරා වැඩි බුදුන් දැක, සත් දවසක් බුදු පාමොක් මහ සඟ පිරිසට උතුරුකුරු දිවින් දිව්‍යාහාර ගෙනවුත් වළඳවා, අනර්ඝ වු රත් සඳුනක් බුදුනට පුදා එදින ද මේ බුදු බවට ම ප්‍රාර්ථනා කළෙමි. පියුමතුරා නම් බුදු සමයෙහි ජටිල නම් මහ රැටි වැ බුදු පාමොක් සඟ පිරිසට, මහ දන් දී සිවුරු පිරිකර හා දී මේ බුදු බවට මැ ප්‍රාර්ථානා කළෙමි. සුමේධ නම් බුදුන් සමයෙහි උත්තර නම් මානවක වැ අසුකෙළක් දන එක දා වියදම් කොටැ, දන් දී ඒ බුදු සසුන් වැඳ මහණවැ මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. සුජාත නම් බුදුන් සමයෙහි සප්තරත්න නම් චක්‍රවර්තී රජවැ ඒ සත් රුවන හා සමඟ රජය බුදුන්ට පුදා මහණ වැ මේ මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. පියදස්සී නම් බුදුන් සමයෙහි, කාශ්‍යප නම් ධන මානවක වැ කෙළ ලක්ෂයක් ධන වියදම් කොටැ සංඝාරාමයක් කරවා බුදුන්ට දන්දී මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කෙළෙමි. අත්ථදස්සී නම් බුදුන් සමයෙහි සුසීම නම් තාපස වැ බුදුන් අණින් බණ අසා, ඒ කෙණෙහිමැ දිවැ ගොස් ශක්‍රයාගේ පරසතු ගස සලා, පරසතු මල් වර්ෂාවක් වස්වා, පරසතු මලින් දිව මඬුවක් මවා, පරසතු මල් කූඩයක් ඒ බුදුන් සිරසට පුදා, එ දා ද මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කෙළෙමි. ධම්මදස්සී නම් බුදුන් සමයෙහි ශක්‍ර දේවේන්ද්‍ර වැ ඉපිදැ බුදුන්ට දිව මල් සුවඳින් පූජා කොටැ, මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. සිද්ධාර්ථ නම් බුදුන් සමයෙහි මඞගල නම් තාපසවැ දඹදිවට සලකනු වු සියක් යොදුන් උස දඹ ගසින් මහ දිය කළ

සා දඹගෙන වුත්, නව කෙළ ලක්ෂයක් රහතන් හා සමඟ ඒ බුදුන් දඹ වළඳවා මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. තිස්ස නම් බුදුන් සමයෙහි සුජාත නම් රජ තවුස් වැ, යොදුනක් සා කරඬුවකින් දිවමල් පුදා මහ පියුමක් බුදුන් සිරසට පුදා, එදාද මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. ඵුස්ස නම් බුදුන් සමයෙහි විජිත නම් රජවැ රජය හැරැ බුදුන් කෙරෙහි මහණවැ පිටකත්‍රය ගෙවා දැනැ, බුදු සස්නෙහි ධර්ම කථිකයන් කෙරෙහි අග්‍ර වැ ප්‍රතිපත්තීන් බුදුන්ට පුජා කොට මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. විපස්සී නම් බුදුන් සමයෙහි අතුළ නම් දිව්‍යනාග රාජන් වැ, සඳ මඩලක් සා මඩුවෙකැ දී සත් දවසක් බුදුන් සඟුන් වළඳවා අනර්ග මිණි පළගක් පුදා, එදා ද මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. සිඛී නම් බුදුන් සමයෙහි අරින්ද නම් රජවැ සත් දවසක් මහා දන් දී, මඟුලැතු සරසා ඇතු උසට කප්පිය භාණ්ඩ පුදා, එදාද මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. වෙස්සභූ නම් බුදුන් සමයෙහි. සුදසුන් නම් රජවැ දහසක් විහාර කරවා බුදුන් පිළිගන්වා රජ සැපතුන් පුදා මහණ වැ තවද තෙළෙස් දූතාංග ප්‍රතිපත්තීන් ඒ බුදුන්ට පුදා මේ බුදු බවට මැ ප්‍රාර්ථනා කළෙමි. කකුසඳ නම් බුදුන් සමයෙහි ඛේම නම් රජ වැ, සතළිස් දහසක් පමණ රහතන් හා සමඟ ඒ බුදුන් පවරා, මහා දන් දී සතළිස් දහසක් පමණ පාත්‍රා සිවුරු හා අඳුන් ආදී නොයෙක් බෙහෙත් බඩු දන් දී මේ බුදු බවට ම ප්‍රාර්ථනා කළෙමි. කාශ්‍යප නම් බුදුන් සමයෙහි ජෝතිපාල බමුණු වැ ඝටීකාර නම් කුම්භකාරයාගේ මිත්‍ර බලයෙන් බුදු සසුන් වැඳැ මහණ වැ තුන් පිටකය ගෙවා දැනැ ප්‍රතිපත්තීන් පූජා කොට මේ බුදු බවට ම ප්‍රාර්ථනා කෙළෙමි.

මේ අනුව අප ගෞතම බුදුරජාණන් වහන්සේ බුදුවරුන් තුන් නමකගෙන් අනියත විවරණත්, සෙසු බුදුවරුන් විසි හතර දෙනෙකුගෙන් නියත විවරණත් ලද බවද පැහැදිලි වේ.





## 08. බුද්ධාංකුරය ලොව පහළවන කල්හි සක්‍රිය මහා ධර්මතා

### i. උපතේදී සක්‍රිය ආශ්චර්යමත් ධර්මතා

**ත්‍රිපිටකයට අයත්, දීඝ නිකායෙහි ද්විතීය භාගයෙහි මහාපදාන සූත්‍රයෙහි** බෝසත්හු මිහි මත උත්පත්තිය ලබන අවස්ථාවෙහි සිදුවන ආශ්චර්යමත් ධර්මතා ගෞතම බුදුන් වහන්සේ විසින්ම සවිස්තරාත්මකව දේශනා කළ අයුරු අපට දැක ගත හැකි වේ.

"බොසත්හු තුසිත දෙව් ලොවින් චුතව මව් කුස පිළිසිඳ ගන්නා මොහොතෙහි දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලෝකයන්හී, මහත් ආලෝකයත් පහළ වෙයි." ඝනඳුර ඇති නිරයන් වෙත්ද, යම් තැනෙක මහ තෙදැති සඳ හිරුහු යම් තැනක සිය එළියෙන් අඳුර දුරලන්නට නොහැකි වෙත්ද, එහි පවා දෙවියන්ගේ දෙව් එළිය ඉක්මවා, අපමණ වු මහත් ආලෝකයක් පහළ වෙයි.

මේ දස දහස් ලෝදා ද හාත්පසින් සැලෙයි, වෙසෙසින් සැලෙයි, වෙවුලයි. (කිසිවෙකු හට විපතක් නොවුන බව අටුවාව කියයි.) දෙවියන්ගේ දේවානුභාවය ඉක්මැ ව අප්‍රමාණ වු විපුල ආලෝකයක් ලොවැ පහළ වෙයි.

යම් විටෙක බෝසත්හු මව කුසට බටුවෝ වෙද්ද, එකලැ සිවුදෙනෙක් දෙව් පුත්තු (සිවු වරම් රජහු) ඒ බෝසතුන් හෝ බෝසත් මව් හෝ කිසි මිනිසෙක් හෝ නොමිනිසෙක් හෝ නොපෙළව යි සතර දිග රැකවළට පැමිණෙත්.

එකල්හි පියවියෙන් ම සිල්වත් වු බෝසත් මව පණිවායෙන් වැළකුණි වෙයි. අයිනාදින් වැළැකුණි වෙයි. කාමමිථ්‍යාචාරයෙන් වැළකුණි වෙයි. මුසාවෙන් වැළකුණි වෙයි. මදට පමාවට කරුණු වු රහමෙරින් වැළකුණි වෙයි.

යම් විටෙක බෝසත් තෙම මව කුසට බටුයේ වේ ද, එ තැන් පටන් කොට බෝසත් මවට පිරිමින් කෙරෙහි කාමගුණනිඃශ්‍රිත වු සිතෙක් නොපහළ වේ. රාගයෙන් රත් වු සිතැති කිසිදු පුරුෂයක්හු විසින් බෝසත් මව ඉක්මියැ හැකි නොවේ.

ඕ පස්කම් ගුණයෙන් සමර්පිත ව සංයුක්ත ව ඉඳුරන් හසුරුවයි. මේ මෙහි ධර්මතා යි.

යම් විටෙක බෝසත් තෙම මව කුසැ පිළිසිඳ ගත්තේ වේද, එතැන් පටන් කොට බෝසත් මවට කිසිම ආබාධයක් නො උපදී. බෝසත් මව සුවැත්තී ක්ලාන්ත නොවූ කයැත්තී වෙයි. බෝසත් මව සිය කුස තුළැ වූ බෝසත්හු සියල් අඟපසඟ ඇත්තහු, නොපිරිහුණු ඉඳුරන් ඇත්තහු දකී.

බෝසත් හු උපන් සත් දවසැ බෝසත් මව කළුරිය කොට තුසී දෙව් ලොව උපදී. මේ මෙහි ධර්මතායි.

යම්සේ අන් ස්ත්‍රීහු නව මසක් හෝ දස මසක් හෝ කුසින් ගැබ රැක වදද්ද, බෝසත් මව එසේ බෝසතුන් නොම ප්‍රසූත කෙරෙයි. බෝසත් මව පුරා දස මසක් ම බෝසතුන් කුසින් උසුලා ප්‍රසූත කෙරෙයි.

යම් සේ අන් ස්ත්‍රීහු හිඳ හෝ වැද හෙව වදද්ද, බෝසත් මව බෝසතුන් එසේ ප්‍රසූත නොකරයි. බෝසත් මව සිටගත් ඉරියව්වෙන්ම බෝසතුන් ප්‍රසූත කෙරෙයි. යම් විටෙක බෝසත්හු මවු කුසින් බිහිවෙද්ද එවිට පළමුවෙන් දෙවියෝ ද පසුව මිනිස්සුන් ද බෝසතුන් පිළිගනිත්.

යම් විටෙක බෝසතුන් මව කුසින් නික්මෙත් ද, එකල්හි බෝසත්හු පොළොවට නොපැමිණියෝ ම වෙති. සතර දෙව් පුත් කෙනෙක් බෝසතුන් පිළිගෙන, දේවිනී, සතුටු වන්න ඔබට මහා යශස්ක පුතෙක් උපන්න යැයි කියා මව ඉදිරියේ තබත්. මේ මෙහි ධර්මතායි.

බෝසත්තු මවු කුසින් නික්මෙත් ද, විෂද වම, දියෙන් නොවැකුණෝ, සෙමින් නොවැකුණෝ, ලෙයින් නොවැකුණෝ, කිසිදු අසුචියෙකින් නොවැකුණෝ පිරිසුදුව නිර්මලවැ නික්මෙති.

යම් විටෙක බෝසත්හු මව් කුසින් නික්මෙත් ද, එකල්හි යමෙකින් බෝසතුන්ගේත්, මවගේත් දිය කිස කෙරෙත් ද එසේ වූ එකක් උණු දිය වුත් එකක් සිසිල් දිය වුත් දිය දහර දෙකෙන් අහසින් පහළ වෙයි. උපන් නොබෝ වේලෙහිම දෙව් සේසත් දරනු ලබත්ම බෝසත් තෙම තම පියෙන් පොළොවැ පිහිටා උතුර දෙසට මුහුණ ලා සත් පියවරක් යෙති. හැම දිගුන් අනුව බලති. "මම් ලොවට අග්‍ර වෙමි, මම ලොවට දෙටු වෙමි, මම ලොවට සෙටු වෙමි, මේ අන්තිම ඉපැත්මය, දැන් මට මතු භවයෙක් නැතැයි" උතුම් බස් පවසත්. මේ මෙහි ධර්මතායි.

යම් විටෙක බෝසත්හු මව් කුසින් නික්මෙත් ද එකල්හි, දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත, සත් මුලුයෙහි දෙවියන්ගේ දේවානුභාවය



ඉක්මවා යන සුළු මහත් එළියෙක් පහළ වෙයි. ගැටුම් නැති කිසිවෙකින් නොවැසුනු, අඳුරු වූ, සනඳුරු ඇති, මේ සා මහත් ඉදුහ ඇති මහත් තෙද ඇති මේ සඳ හිරුන් සිය එළියෙන් බබලවනු නොහැකි යම් ලෝ ඇඳිරි නිරයෝ වෙත් ද, එහිදු දෙවියන්ගේ දේවානුභාවට ඉක්මැ ම අපමණ වූ මහත් එළියෙක් පහළ වෙයි. එහි යම් සත්ත්ව කෙනෙක් උපන්නා හු නම් ඔහු ද ඒ එළියෙන් හවත්නි, මෙහි උපන් අන් සත්තු ද ඇතැයි උනුන් හැඳින ගනිති. මේ දස දහසක් ලෝදා ද සැලෙයි, වෙසෙසින් සැලෙයි, වෙව්ලයි. දේවානුභාවය ඉක්මැම අපමණ වූ මහත් එළියෙක් ලොව පහළ වෙයි. මේ මෙහි ධර්මතායි.

උපත ලද බෝසතුන් යමෙකින් සමන්විත මහ පිරිස් හට නිෂ්ටා (නිශ්පත්ති) දෙකෙක් ම වේ ද, අන් නිෂ්ටාවෙක් නැද්ද? මේ කුමර එසේ වූ දෙතිස් මහ පුරිස් ලකුණින් සමන්විත ය. ඉදින්, මේ තෙම ගිහි ගෙයි වෙසේනම්, සිවු සමුදුරු හිම කොටැති පොළොවට අධිපති, දිනූ යුධ ඇති, දනවු තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්විත, දැහැමි වූ ධර්මරාජ වූ සක්විත්තෙක් වෙති.

ඉදින් ගිහිගෙයින් නික්ම පැවිද්දට වදී නම් ලොවැ බැහැර කරන ලද කෙලෙස් සෙවෙනි ඇති අරහත් සම්මා සම්බුදුවරයෙක් වෙයි."

## ii. සක්විති රජුන් වෙත පහළ වන සත් රුවන

"බෝසතුන් ගිහි ගෙයි වෙසේනම්, සිවු සමුදුරු හිම කොටැති පොළොවට අධිපති, දිනූ යුධ ඇති, දනවු තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්විත, දැහැමි වූ ධර්මරාජ වූ සක්විත්තෙක් වෙති."

චක්‍රරත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, සත්වනු පරිණායක රත්තය යන මේ සත්රුවන කෙනෙක් ඔහුට වෙත්. හේ සයුර හිම් කොටැති මේ පොළොව දංඩෙන් තොර වැ සැතින් තොරවැ දැහැමින් දිනා එහි අධිපතිව වෙසෙයි. ඉදින් ගිහිගෙයින් නික්ම පැවිද්දට වදී නම් ලොවැ බැහැර කරන ලද කෙලෙස් සෙවෙනි ඇති අරහත් සම්මා සම්බුදුවරයෙක් වෙයි.

සක්විති රජුන්ට තත් සත් රුවන උරුම වන්නේ සය විධ වත් සපිරීමෙන් බව ද සඳහනි.

01. ධර්මයෙහි පිහිටා, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මය ප්‍රිය කරමින්, ධර්මය පුදමින්, ධර්මය ධජයක්ව, ධර්මය කේතුවක්ව, ධර්මය ප්‍රධාන කොට ගෙන සිය අඹුදරුවන් සීලයෙහි අනුගතව හැසිරීමෙහි පිහිටුවා ඔවුන් ධාර්මිකව ආරක්ෂා කළ යුතු ය.

02. බල සෙනඟ ද, ක්ෂත්‍රියන් ද, බ්‍රාහ්මණ ගෘහපතීන් ද, සීලයෙහි පිහිටුවා ඔවුන්ට ආරක්ෂාව සැලසිය යුතු ය.

03. නිගම ජනපද වාසීන්ට, මහණ බමුණන්ට, සිවුපාවන් හා කුරුල්ලන් ද ජීවිත දානයෙන් ආරක්ෂා කළ යුතු ය.

04. සිය රාජධානියෙහි අධාර්මික ක්‍රියා මැඩ පැවැත්විය යුතු ය.

05. දුගී රටවැස්සන්ට ධනය ලබාදිය යුතු ය.

06. සිය දේශයෙහි රාගාදිය දමනය කළ සමනය කළ යම් මහණ බමුණෙක් වෙත්ද, ඔවුන් කරා කලින් කල එළඹ ඔවුන්ගේ කුසලා කුසල විමසිය යුතු ය.

මෙම සක්විති වත් පුරනවාත් සමඟම සක්විති රජු හට මාණික්‍ය රත්න හතක් පහළ වේ.

**දික් සඟියේ මහා වග්ගයෙහි මහා සුදස්සන සූත්‍රයෙහි** භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද පරිදි, සක්විති රජුන් වෙනුවෙන් පහළ වන සත් රුවන පිළිබඳව පැහැදිළි දැනුම්වත් වීමක් ලද හැකි ය.

### i. සක් රුවන

"අනඳයෙනි, මහ සුදසුන් රජ සත් රුවනින් ද, සතර ඉදුහයෙන් ද යුත් වීය. කවර සත් රුවනෙකින් ද යත් අනඳයෙනි, ඒ පසළොස්වක් පොහෝ දා (සුවඳ දියෙන්) හිස් සෝදා නා සමාදන් වූ පෙහෙවස් ඇතිව මහඟු පහයැ මතු මහල් තලයට පැමිණ මහ සුදසුන් රජුට දහසක් අර ඇති නිම්වළලු සහිත, නැබ මඬුළු සහිත, මෙසේ සියලු අයුරින් පිරිපුන් දෙව් සක් රුවන පහළ විය.

අනඳයෙනි, ඉක්බිත්තෙන් මහ සුදසුන් රජ හුනස්නෙන් නැඟී සිට උතුරු සඟ සකස් කොට වමතින් කෙංඩිය ගෙන භවත් සත් රුවන, පෙරළේවා, භවත් සක් රුවන සතර මහා දිවයින දිනා දේවායි, කියා දකුණතින් සක් රුවනට දිය ඉස්සේ ය. අනඳයෙනි,



යම් පෙදෙසක සක් රුවන පිහිටියේ ද (රැඳී සිටියේ ද) මහ සුදසුන් රජ සිවුරඟ සේන් හා එහි නවා තැනට එළැඹියේ ය. අනඳයෙනි, පෙර දිගැ යම් පිළිමල් රජ කෙනෙක් වූහු ද, ඔහු මහ සුදසුන් රජු කරා එළඹ, මහ රජාණනි, වඩින්නැ, මහ රජාණනි ඔබ වැඩි සේ යහපත, මෙය ඔබගේ ය අපට අනුශාසනා කළ මැනව'යි" කීහ. මේ අයුරින් සක් රුවන සතර දිශාවට ම යොමු කර එම දිශාව පිහිටි සියළු රාජධානි තම අණසකට පත්කර ගැනීමට මහ සුදසුන් සක්විති රජුන්ට අවස්ථාව හිමිවූ බැව් මහා සුදස්සන සූත්‍රයෙහි පැහැදිළි කැරේ.

"අනඳයෙනි, ඉක්බිති ඒ සක් රුවන මුහුද හිමි කොට පොළව දීනා, කුශාවතී රාජධානියට පෙරලා අවුත් මහ සුදසුන් රජුගේ ඇතොවුර දෙරැ විනිසමඬල ඉදිරියෙහි ඇතොවුර හොබවනුයේ අකුරැ ගැසූ කලෙක සෙයින් සිටියේ ය. අනඳයෙනි, මහ සුදසුන් රජුට මෙ බඳු සක්රුවනෙක් පහළ විය.

### ii. ඇත් රුවන

"තවද අනෙකෙක් කියමි. අනඳයෙනි, මහ සුදසුන් රජුට සිරුැර මුළුල්ල සුදුවූ, කය සත් තැනෙකින් පොළොව පහස්නා, ඉදුමත්, අහසින් යන උපෝසථ කුලයට අයත් ඇත් රජෙක් වූ ඇත් රුවනෙක් පහළ විය. එය දැක්මෙන් ඉදින් හීලෑ බවට පැමිණියේ වී නම් ඒකාන්තයෙන් යහපත් වූ ඇත් යානයෙකැයි, මහ සුදසුන් රජුගේ සිත පැහැදිනි. අනඳයෙනි, අජානීය ඇතෙක් යම් සේ ද එසේ ම හික්මුණු බවට පැමිණියේ ය. අනඳයෙනි, පෙරැ වූ දැයක් කියමි. මහ සුදසුන් රජ එම ඇත් රුවන විමසනුයේ පෙරවරු වේලෙහි උහු අරා ගොස් මුහුද හිමි කොට ඇති මුළු පොළොව වටා හැවිදි කුශාවතී රාජධානියට පෙරළා අවුත් උදේ බොජුන් වැළඳීම කෙළේ ය."

### iii. අස් රුවන

"තවද අනෙකක් කියමි. අනඳයෙනි, මහ සුදසුන් රජුට අස් රුවනෙක් පහළ විය. ඒ කය මුළුල්ල සුදු වූ, කළු හිසක් ඇති, මෘදු තෘණ බඳු කෙහෙ ඇති, ඉදුමත්, අහසින් යන, වලාහක නම් අස් රජය. උහු දැක්මෙන් ඉදින් හික්මුණු බවට පැමිණියේ වී නම් සොඳුරු අස් යානෙකැයි, මහ සුදසුන් රජුගේ සිත පැහැදුණේය. අනඳයෙනි, එ කල්හි ඒ අස් රුවන බොහෝ කලක් මනාව දැමුණු සොඳුරු අජානී අසක්හු මෙන්ම දැමුණු බවට පැමිණියේය. ඒ

පෙරැ වූ දැයක් කියමි. අනඳයෙනි, මහ සුදසුන් රජ එම අස්රුවන විමසනුයේ පෙරවරු සෙමෙහි උහු අරා මුහුද හිමි කොටැති පොළොව වටා ගොස් කුශාවතී රාජධානියට පෙරලා අවුත් උදේ හොජුන් වැළැඳී ය."

**iv. මිණි රුවන**

"තව අනඳයෙනි, මහ සුදසුන් රජුට මිණිරුවනෙක් පහළ විය. එය සොඳුරු වූ පිරිසුදු ආකරයෙහි උපන, අටැස්, මොනොවට පිරියම් කරන ලද, පැහැදිලි වූ, වෙසෙසින් පහන් වූ සියළු අයුරින් සම්පූර්ණ වූ වෙරළුමිණෙක. අනඳයෙනි, ඒ මිණිරුවනේ එළිය හාත්පස යොත්නක් තැන් පැතිරැ පැවැත්තේ විය. අනඳයෙනි, ඒ පෙරැ දැයක් කියමි. මහ සුදසුන් රජ එම මිණිරුවන විමසනුයේ සිවුරඟ සෙන් සන්නාහ සන්නද්ධ කොට මිණි රුවන දද මුදුනට නංවා රෑ ගනඳුරෙහි නික්මුණේ ය. අනඳයෙනි, හාත්පසැ යම් ගම් කෙනෙක් වූහුද ඔහු දහවලැ යි හඟනාහු, ඒ එළියෙන් වැඩ ඇරැඹූහ."

**v. ඉතිරි රුවන**

"අනඳයෙනි, මහ සුදසුන් රජුට වෙසෙසි රූ ඇති, දැකුම්කළු, සිත පහදවන, උතුම් පැහැ සපුයෙන් යුත්, ඉතා නො උස්, ඉතා නොමිටි, ඉතා කෙට්ටු නොවූ, ඉතා නොතර, ඉතා නොකලු, ඉතා නොසුදු, මිනිස් පැහැසපුව ඉක්මැවූ, දෙව් පැහැසපුව නො පැමිණි ස්ත්‍රියක් වූ ඉතිරි රුවන පහළ විය. අනඳයෙනි, ඉඹුල් පුලුනෙහි හෝ කපු පුළුනෙහි සෙයින් ඒ ඉතිරි රුවනගේ මොළොක් පහස වෙයි. අනඳයෙනි, ශීත සමයෙහි සිසිල් වෙත්, අනඳයෙනි, ඒ ස්ත්‍රී රත්නයා ගේ කයින් සඳුන් සුවඳ හමයි. මුවින් මහනෙල් මල් සුවඳ හමයි. අනඳයෙනි, ඒ ස්ත්‍රී රත්නය මහ සුදසුන් රජුට කලින්ම නැඟී සිටිනුයේද, වතාවත් නිමවා පසු වැ හිඳුනේ ද කුමක් කරනුයේද, රජුට මන වඩනා දෑ ම කරනුයේද, පිය බස්ම තෙප්ලනුයේද, වෙයි. අනඳයෙනි, ඒ ඉතිරි රුවන සිතිනුදු මහ සුදසුන් රජු ඉක්මැ නො හැසිරෙන්නේ විය."

**vi. ගැහැවි රුවන**

"තවද අනෙකෙක් කියමි, අනඳයෙනි, ඒ මහ සුදසුන් රජුට ගැහැවි රුවනෙක් පහළ විය. යමෙකින් හිමියන් ඇත්තාවූ ද හිමියන් නැත්තා වූ ද නිධාන දක්නේද එසේ වූ කර්ම විපාකජ දිවැසෙක් ඒ



ගැහැවි රුවනට පහළ විය. හේ මහ සුදසුන් රජු කරා එළැඹ දෙවියනි, ඔබ මන්දොත්සාහ වන්න, ඔබට ධනයෙන් කටයුතු දෑ මම් ධනයෙන් කැරැදෙන්නෙමි'යි මෙසේ සැළ කෙළේ ය. ඒ පෙරැ වූවක් කියමි. අනඳයෙනි, මහ සුදසුන් රජ එම ගැහැවි රුවන විමසනුයේ නැවක නැඟ ගංගා නදිය මැදැ දිය පහරට බැස, ගැහැවිරුවන බණවා, ගැහැවිය, මට අමු රනින් හා ශුද්ධ කළ රනින් ප්‍රයෝජනය ඇතැයි, කීහ. මහරජුනි, එසේ වී නම් එක් තෙරකට නැව එළැඹෙවායි, හේ කීහ. ගැහැවිය මෙහිදීම මට හිරණ්‍ය ස්වර්ණයෙන් වැඩෙක් ඇතැයි, රජ කීහ. අනඳයෙනි, එ කල්හි ඒ ගැහැවිරුවන දෝතින් දිය ස්පර්ශ කොට හිරණ්‍ය ස්වර්ණයෙන් පිරුණු සැළියක් ඔසොවා ගෙන මහ සුදසුන් රජුට මහරජුනි, මෙතෙකින් සෑහේද? විමසීයි."

**vii. පිරිනා රුවන**

"තවද අනඳයෙනි, පණ්ඩිත වූ, ව්‍යක්ත වූ, ප්‍රකෘති ප්‍රඥා ඇති, මහ සුදසුන් රජුහු කරා එළැඹැවියැ යුත්තහු එළඹවන්නට ට ද, බැහැර කළ යුත්තහු, බැහැර කරවන්නට සමර්ථ වූ පරිනායක රත්නයද, (පුත්‍ර රත්නයද) පහළ විය. හෙතෙම මහ සුදසුන් රජුකරා එළැඹ දෙවයිනි, ඔබ මන්දෝත්සාහ වන්න, මම රට අනුසස්නෙමි'යි මෙසේ කීහ. අනඳයෙනි, මහ සුදසුන් රජුට මෙබඳු පරිනායක රත්නයෙක් විය. අනඳයෙනි, මහ සුදසුන් රජ මේ සත් රුවනින් සමන්විත විය."

ඉහත **මහා සුදස්සන සූත්‍රයෙහි** පැනෙන පරිදි, පළමු වන රුවන ලෙස දක්වා ඇත්තේ සක් රුවනකි. කෙන්ඩියෙන් සක් රුවන වෙත පැන් ඉස කිසියම් ප්‍රාර්ථනයක් කළ විට එම පැතුම අපේක්ෂිත පරිදි ම ඉටුවේ. සක්විති රජු හට පහළ වන දෙවන රුවන වන්නේ ධවල හස්තියෙකි. උපෝසථ කුලයට අයත් මෙම සුදු හස්ති රාජයා අහසින් යාමේද හැකියාව ඇති සත්ත්වයෙක් බව පැවසේ. ධවල ශරීරයකින් හා කාල වර්ණ හිසක් සහිත අහසින් යන බලාහත නම් අජානේය අශ්වයා සක්විති රජෙකුට පහළ වන තෙවැනි රුවනයි. සිව්වැනි රුවන සේ සැලකෙන්නේ මිණි රුවනකි. වෙරළුමිණෙක ලෙස හැඳින්වෙන මෙම මිණි රුවන රාත්‍රි කාලයෙහි ඒ අවට ප්‍රදේශය ආලෝකමත් කිරීමට සමත්ය. ශක්විති රජුන්ට හිමිවන පස් වන රුවන ස්ත්‍රි රත්නයකි. මැය ගතින් සඳුන් සුවඳ නික්මෙන මුවින් මහනෙල් මල් සුවඳ හමන දෙව්ලියක් හා සදිසි රූප ශ්‍රීයෙන් අගතැන්පත් තැනැත්තියකි. සක්විති රජුට සිතු පැතු දෑ පහළ කර දෙන ගෘහපති රුවන හයවැනි රුවන සේ

සැළකේ. හත්වන රුවන සේ සැළකෙන්නේ පරිනායක රුවනයි. සක්විති රජුන් හට එළඹ විය යුතු අය එළඹ වන බැහැර කළ යුතු අය බැහැර කරවන්නට සමත් වු පුත්‍ර රත්නය පරිණායක රත්නය ලෙසින් සැලකේ.

ශ්‍රී සමෘද්ධියෙන් යුතුව සිය සක්විති රාජ්‍ය පාලනය කරගැනීමට ඉවහල් වන ඓශ්වර්යමත් සත් රුවන පිළිකෙව් කොට, සත්‍ය සොයා යමේ මාර්ගයට බෝ සතුන් අවතීර්ණ වූහ.

## iii. මහා පුරුෂ ලක්ෂණ

**දීඝ නිකායේ තෘතිය භාගයෙහි එන ලක්ඛණ සුත්‍රයේ** භාග්‍යවතුන් වහන්සේගේ පුණ්‍ය මහිමය ප්‍රකට කරවන දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිළිබඳව විස්තර කෙරේ. සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ සිටිමින් භාග්‍යවතුන් වහන්සේ දේශිත ලක්ඛණ සුත්‍රය තුළින්, තේජාන්විත භාවයෙන් පිරිපුන් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් අනූන වූ දුටු දුටුවන් සිත් සනහන්නාවූ පින්බර රූප කායක් භාග්‍යවතුන් වහන්සේ සතුව පැවති බව ප්‍රකාශිතය.

"මහා පුරුෂ තෙමේ සුපිහිටි පා ඇත්තේ වෙයි. දික් විලුම් ඇත්තේ වෙයි. දික් ඇඟිලි ඇත්තේ වෙයි. දික් විලුම් ඇත්තේ වෙයි. දික් ඇඟිලි ඇත්තේ වෙයි. නුගරුකක් බඳු පිරිමඬුලු කය ඇත්තේ වෙයි. සිහ රජකුගේ බඳු හනු ඇත්තේ වෙයි. පුලුල් දිව ඇත්තේ වෙයි."

ආදී වශයෙන් මහා පුරුෂ ලකුණු විස්තර කර ඇත. දික් සඟියෙහි, මහා වග්ගයේ මහාපදාන සුත්‍රය ද සිදුහත් කුමරුන් වෙත ජන්මයෙන් ම දායාද වූ මහා පුරුෂ ලක්ෂණ මෙසේ සවිස්තරව දක්වා ඇත.

"මේ කුමර සුපිහිටි පා (එක පැහැර බිම පහස්නා පතුල්) ඇත්තේය. මෙ කුමර සුපිහිටි පා ඇත්තේ ය යන යමෙක් ඇද්ද, මෙ ද මේ මහ පුරිස්හුගේ මහ පුරිස් ලකුණෙක් වෙයි.

මේ කුමරහුගේ යැටි පතුල්හි දහසක් අර ඇති, නිම්වලලු සහිත, නැබ සහිත, හැම සැටියෙන් පිරිපුන් චක්‍රයෝ හටගත්තාහු වෙත්.

මේ කුමර (පිරිපුන්) දික් විලුම් ඇත්තේ ය. මෙ ද මේ මහපුරිසහුගේ මහපුරිස් ලකුණෙක් වෙයි.

මේ කුමර (මුලින් දළ අගින් සිහින් ) දික් ඇඟිලි ඇත්තේ ය.



මේ කුමර මොළොක් තුරුණු අත් පා ඇත්තේ ය.

මේ කුමර (අත සතර ඇඟිලි පය පස් ඇඟිලි එක ප්‍රමාණව වැ ඇති බැවින් ජාල කවුලුවක්) බඳු අත් පා ඇත්තේ ය.

මේ කුමර උස් (නැගී පිහිටි) බොලට ඇත්තේ ය.

මේ කුමර පිණි මුවන්ගේ බඳු කෙංඩා ඇත්තේ ය.

මේ කුමර තෙම සිටියේ ම නො නැමී දෙ අත්ලෙන් දෙදන ස්පර්ශ කෙරෙයි, පිරිමදී.

මේ කුමර කොශයෙහි අවහිත වස්ත්‍රගුහ්‍ය (අංගජාතය) ඇත්තේ ය.

මේ කුමර රන්වන් ය. කසුන් කඳක් බඳු පහන් සිවි පැහැ ඇත්තේ ය.

මේ කුමර සියුම් සිවිය ඇත්තේ ය. ස්විය සියුම් බැවින් දූලි හෝ දැලි ඇඟැ නො ඇලෙයි.

මේ කුමර එකෙකී ලොම් ඇත්තේ ය. ලොමකුපයන්හි (එක් එක් ලොමකුපයෙක) එකෙකී ලොම් හටගත්තේ ය.

මේ කුමර උඩු අග් ලොම් ඇත්තේ ය. නිල් වු අඳුන්වන් ලොම්හු කොඬොල් අයුරින් කරකැවී දක්ෂිණාවර්තක ව ඇත.

මේ කුමර බ්‍රහ්මයාගේ සෙයින් සෘජු වු ගාත්‍ර ඇත්තේ ය.

මේ කුමර උස් ව පිරුණු මස් ඇති බැවින් (දෙඅත් පිට දෙපාපිට දෙඋර කඳ යන) සත් තන්හි උත්සන්න (පිරිපුන්) මාංශ ඇත්තේ ය.

මේ කුමර සිංහයාගේ පෙරඬකය බඳු පිරිපුන් සිරුර ඇත්තේ ය.

මේ කුමර චිත වු (පිරිපුන්) අන්තරාංස (පිටැ දෙ අංසයන් අතර මැදකොටස) ඇත්තේ ය.

මේ කුමර සම වු කඳ හා සම වු අතු ඇති (අයම්විතරින් සම වු) නුගරුකක් සෙයින් පරිමණ්ඩල වෙයි. මුඹගේ කය යම් පමණ ද, බඹයක් එපමණ ම වෙයි. බඹය යම් පමණ ද, කයත් එපමණ ම වේ.

මේ කුමර සම වට කඳට ඇත්තේ ය.

මේ කුමර රස ග්‍රාසාග්‍රය. (රසයන්ගෙන් ග්‍රාසයෙහි - රස විඳී - මෙහි ඌර්ධවාග්‍ර වු රස නහර ඇත්තේ ය.)

මේ කුමර සිංහයාගේ අධස්තාත් හනුව සෙයින් පිරිපුන් හනු ඇත්තේ ය.

මේ කුමර නොඅඩු සතළිස් දත් ඇත්තේ ය.

මේ කුමර විවරරහිත දත් ඇත්තේ ය.

මේ කුමර සම වූ දත් ඇත්තේ ය.

මේ කුමර ඉතා සුදු (දිලිසෙන පැහැ ඇති) දත් ඇත්තේ ය.

මේ කුමර මොළොක් දික් පුළුල් දිව ඇත්තේ ය.

මේ කුමර බ්‍රහ්මයාගේ ස්වර බඳු විශුද්ධස්වර ඇත්තේ ය.

කුරවිකෙවිල්ලන්ගේ බඳු මිහිරි හඬින් බණන සුලු ය.

මේ කුමර නිල් වුවමනා තන්හි ඉතා පිරිසුදු නිල් පැහැ ඇස් ඇත්තේ ය.

මේ කුමර එකෙණෙහි උපන් වස්සක්හුගේ බඳු මොළොක් සිනිඳු නිල් සියුම් ඇස් පියුම් ඇත්තේ ය.

මේ කුමරුගේ දෙබැම අතරෑ වූ, සුදු වූ මොළොක් පුලුන් රොදක් බඳු ඌර්ණරෝමය වෙයි. මේ කුමරහු දෙබැම අතරෑ සුදු මොළොක් පුලුන් පොදක බඳු ඌර්ණරොමයක් ඇද්ද, මේද පමපුරිස්හුගේ මහ පුරිස් ලකුණක් වෙයි.

මේ කුමර නළල් පටින් වෙළන ලද හිසක් සෙයින් පිරිපුන්, නොහොත් නළල් පට සෙයින් හැමතන්හි පිරිමඩුලුවූ හිස ඇත්තේය. මේ ද මෙ මහ පුරිස්හුගේ මහපුරිස් ලකුණෙක් වෙයි."

භාග්‍යවතුන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ මහා පදාන සුත්‍රයෙහි පැහැදිළි කෙරෙන්නේ මීට තරමක් වෙනස් ආකාරයෙනි.

බුදුන් වහන්සේගේ සුවාසුදහසක් ශ්‍රී ධර්මස්කන්ධයන් දෙසා වදාළ බුදු මුවින් නිකුත් වාග් මාලාව සූත්‍ර පිටකයෙහි ඛුද්දක නිකායට අයත් මහානිද්දේස පාලියෙහි අති උත්කෘෂ්ඨවත් අන්දමින් වර්ණනා කර ඇත. "මනහර වදන් ඇති, මිහිරි වදන් ඇති, පෙම් වඩන වදන් ඇති, සිත් ගන්නා වදන් ඇති, කුරවි නද සෙයින් මනහර ගොස ඇතියේ, ඒ බුදුන්ගේ මුවින් අෂ්ටාඬගසම්න්වාගත වූ ඝොෂය නික්මෙයි. නො පැකිලෙනුයේද, මැනවින් දත හැක්කේද, මධුර වූයේද, නිනද ඇත්තේද වේ. තවද ඒ බුදුහු පිරිස් පමණින් ස්වරයෙන් හගවා ලන සේක.



ඒ බුදුන්ගේ ඝෝෂය පිරිසෙන් බැහැර නොනික්මේ. තවද ඒ බුදුහු බඹගොස ඇත්තාහු, කුරවිකොවුල්හඬ මෙන් මිහිරි වදන් ඇති සේක්.



මහා පුරුෂ ලක්ෂණ

### හතරවන පරිච්ඡේදය

# අතීතාවලෝකන පෙළගැස්ම

## 09. ශාක්‍ය වංශයෙහි සම්භවය හා ශාක්‍ය පෙළපත

දීඝ නිකායේ අම්බට්ට සූත්‍රයේ ශාක්‍යයන්ගේ උත්පත්ති **කථිකාව මැනවින් දක්වා ඇත.** ඔක්කාක රජ තමන්ට වඩාත් ප්‍රිය වූ බිසවගෙන් උපන් ජන්තු කුමරුට රජකම පවරනු රිසි විය. ඒ අනුව ඔක්කාක රජු තමන්ට දාව අග බිසවගෙන් උපත ලද ඔක්කාමුඛ, කරකන්ඩු, හත්ථිනික, සිනිපුර යන වැඩිමහල් කුමරුවන් ද පියා, සුප්පියා, ආන්දා, විජිතා, විජිතසේන යන දූ කුමරියන් ද රටින් පිටුවහල් කළේය. බුදුගොස් හිමියන් රචිත අටුවා කතාවල සහ මහාවස්තුව කෘතියෙහි සඳහන් පරදි මොවුන් පිටුවහල් කරනු ලැබුවේ සාකේත (අයෝධ්‍යාව) ප්‍රදේශයේ සිට ය. ඔවුහු හිමාලය අඩවියේ මහා වන මැද නුවරක් තනා ගැනීමට සුදුසු ස්ථානයක් සොයන්නට වීය. ඒ සමයෙහි බෝසතුන් කපිල බ්‍රාහ්මණ නමින් ඉපිද ගිහි ගෙය හැර හිමාලය අඩවියෙහි විල්තෙරෙක අසපුවක් තනාගෙන බවුන් වඩමින් සිටියහ. නුවරක් තනන්නට යෝග්‍ය ස්ථානයක් පිරිස්සමින් සිටි කුමාරවරුන් සහ කුමරියන් කෙරෙහි අනුකම්පා කළ කපිල මුණිවරයා තම අසපුව පිහිටි ප්‍රදේශය ඒ සඳහා යෝග්‍ය බව පෙන්වා දුන් බැව් සුමංගල විලාසිනියෙහි සඳහනි. ඒ ස්ථානය මතු මුළු දඹදිව් තලයම අග නගරය වන බවත් මතු උපදින උත්තරීතර පුද්ගලයෙක් තුන් ලොවටම අග රජ වන බවටත් කපිල මුණිවරයා අනාවැකියක් ද පළ කළේය.

කුමාරවරුන් එම ස්ථානයේ නුවරක් ඉදි කරවා කපිල මුණිවරයා සිහිපත් වීම පිණිස එනුවර කපිල වස්තු පුර නමින් හඳුන්වාලි ය. මෙම පෙදෙසේ සල් ගස් බහුලව පැවති බැවින් ඔවුහු සල් ගස තම වංශයේ සංකේතය ලෙස යොදා ගත්හ. එමගින් ශාක්‍ය වංශය යන නම



භාවිතයට පැමිණියේ ය. බුදුගොස් හිමියන්ගේ පාලි අටුවා කතාවල ද තිබ්බතයේ බෞද්ධ ග්‍රන්ථ වල සහ මහා වස්තුව කෘතියෙහි ද ඉහත තොරතුරු ඇතුළති.

**කෝළිය වංශිකයින්ගේ සම්භවය පිළිබඳ ත්‍රිපිටකයට අයත් සුත්ත නිපාතය, ජාතක පොත, මහා වස්තුව, තිබ්බත විනය පිටකය,** රාමායනය යන ග්‍රන්ථයන්හි විවිධ මති මතාන්තර සඳහන්ව ඇත. **ශ්‍රී ලංකාවේ දීප වංශ හා මහා වංශ කෘතිවලද කෝලිය වංශික සම්භවයේ** වෘතාන්තය ඇතුළති.

කපිලවස්තු පුරය අග නගරය කරගෙන රාජ්‍ය විචාළ ශාක්‍ය කුමරුවන්ගේ වැඩිමහල් සොයුරියට ස්වේත කුෂ්ඨ රෝගය වැළඳිනි. තමන්ටද මෙම රෝගය බෝ වීමට ඉඩ ඇති බවට සැක පහළ කළ කුමාරවරු සිය රෝගී වැඩිමහල් සොයුරිය අවශ්‍ය කළමනා සපයා දී වනයට පිටමන් කළහ. බරණැස් රාම රජ ද, ස්වේත කුෂ්ට රෝගයෙන් පෙළීම නිසා එම කාල වකවානුවේ ම වනගත වාසයට පැමිණීයේය. වනපල හා වන පත්‍ර ආහාරයෙන් යැපීම නිසා ටික කලකින්ම ඔවුන්ට වැළඳී තිබූ කුෂ්ට රෝගය සුවපත් විය. රාම රජු තමනට වනයේදී මුණගැසුණු ශාක්‍ය වංශික කුමාරවරුන්ගේ දෙටු සොයුරිය තම බිසව ලෙසින් සරණ පාවා ගත්තේය. ඔවුනට පුතුන් තිස් දෙනෙකු ලද බව ද මහාවස්තුවේ සඳහනි. ඔවුහු වන පියසේ දැවැන්ත කොළොන් වෘක්ෂයක් පිහිටි ස්ථානයක තම රජ මාලිගය ඉදිකිරීමට තෝරාගත් බවත් කෝලිය වංශයේ සම්භවය මේ අයුරින් සිදු වූ බවත් කියැවේ.

**ශාක්‍ය පෙළපත :-**

ශාක්‍ය වංශිකයින් හා කෝලිය වංශිකයින් අතර විවාහ සම්බන්ධතා ද ඇතිවිය. ජයසේන රජුට සිංහ හනු නම් පුත්‍රයෙක් ද යශෝධරා නමින් දුවනියක් ද විය. සිංහ හනු කුමාරයා කෝලිය දේශයේ දේවදහ ශාක්‍ය රජුගේ දියණි කාංචනා කුමරිය සරණපාවා ගත්තාය. සිංහ හනු රජුට සුද්ධෝදන (සුපිරිසුදු බත් හිමි) අමිතෝදන (අපමණ බත් හිමි) ධෝතෝදන (දෝවනය කළ බත් හිමි) සුක්ඛෝදන (සුදු බත් හිමි) මිතෝදන යනුවෙන් පුතුන් පස් දෙනෙක් හා අමිතා, සුමිතා නමින් දියණියන් දෙදෙනෙකුද සිටි බව මහා වස්තුව කෘතියේ සඳහන් කරයි. පසල් දනව්වක ඇති වූ කැරැල්ලක් මැඩ පැවැත්වීමට යන ලෙස තම පුතුන් පස් දෙනාට දැන්වූ අවස්ථාවක බාල කුමරුවන් සිව් දෙනා එම අභියෝගය පිළිගැනීමට මැළි වුහ. වැඩිමහල් සුද්ධෝදන කුමරු සිය පියාගේ ඉල්ලීම පිළිගැනීමට තරම් කිකරු වුවා සේම, නිර්භීතභාවයෙන් ද පිරිපුන් පුද්ගලයෙක් විය. හේ පසල් දනව්වට ගොස් සාර්ථකව කැරැල්ල මැඩ, සිය පියා අභිමුව ට පැමිණියේ ජයග්‍රාහී විලාසයෙනි. මහත් ප්‍රසාදයට පත් සිංහහනු රජු තමන් කැමැති වරයක් ඉල්ලන ලෙස


සුද්ධෝදන කුමරුට දැන්වීය. ඔහුගේ ඉල්ලීම වුයේ තම මාමණ්ඩිය වු අංජන රජුගේ සුරූපි දියණියන් මහාමායාවන් හා ප්‍රජාපතී ගෝතමිය එක වර සරණ පාවා දෙන ලෙසයි. ඉල්ලීම ඒ අයුරින්ම ඉටු විය. සිංහහනු නිරිඳුන්ගේ ඇවෑමෙන් සුද්ධෝදන රජු ශාක්‍ය දේශයේ ආධිපත්‍යයට පත් විය. එතුමාගේ අග මෙහෙසිය වු මහා මායා කුසින් සිද්ධාර්ථ කුමරු උපත ලැබී ය. මහායානයේ සිද්ධාර්ථ කුමරු හැඳින් වුයේ සර්වාස්ථ සිද්ධ යනුවෙනි. සුදොවුන් රජුගේ දෙවෙනි මෙහෙසිය වු මහා ප්‍රජාපතී ගෝතමිය නන්ද නමින් පුත් කුමරුවෙකු හා නන්දා නමින් දූ කුමරියක් බිහි කළා ය.

**මහානාම හිමි විසින් රචිත මහා වංශයෙහි ද**, සිදුහත් කුමරුන්ගේ ඥාති පරම්පරාවෙහි විකාශනය පිළිබඳව පැහැදිළි විස්තරයක් ගෙනහැර දක්වයි.

“සිංහ ස්වර රජහු දරු මුනුබුරු රජුන් සෙයාසු දහසෙක, ඔවුන් ගේ අන්තිම රජ ජයසේන නම් විය. මොවුහු කිඹුල්වත් පුරයෙහි ශාක්‍ය රජහු යයි ප්‍රසිද්ධ වුහ. සිංහහනු නම් මහ රජ තෙම ජයසේන රජහුගේ පුත්‍ර වුයේ ය. ජයසේන රජහුගේ දියණි තොමෝත් යසෝධරා නම් විය. උහුගේ අංජන නම් කුමාරයෙක, නම් වු මිහිපතියෙක් විය. උහුගේ අංජන නම් කුමාරයෙක, යළිත් කච්චානා නම් වු කුමාරියෙකැයි දරු දෙදෙනෙක් වුහ. ඒ කච්චානා කුමාරිකා තොමෝ අංජන නම් රජහුගේ මෙහෙසි විය. ඒ යසෝධරා නම් කුමාරිකා තොමෝ සිංහහනු නම් රජහුගේ මෙහෙසි විය. අංජන නම් ශාක්‍ය රජහුගේ මායා හා ප්‍රජාපති යයි දූවරුන් දෙදෙනෙකු වුහ. දණ්ඩපාණිශාක්‍ය ය, සුප්‍රබුද්ධ ශාක්‍ය යයි පුත්‍රයන් දෙනෙක් ද වුහ. සිංහහනු නම් ශාක්‍ය රජ හට වනාහි පුත්‍රයෝ පස් දෙනෙක් ද, දූවරුන් දෙදෙනෙක් ද වුහ. සුද්ධෝදන, ධෝතොදනය, සුක්කෝදනය, අමිතෝදනය, මිතෝදන යයි මේ පංච පුත්‍රයෝය. අමිතාය, ප්‍රමිතා යයි මේ දියණි දෙදෙනාය. අමිතා තොමෝ සුප්‍රබුද්ධ නම් ශාක්‍ය රජ හට මෙහෙසිය විය. ඒ මෙහෙසියට භද්දකච්චානය, දේවදත්ත යයි දරු දෙදෙනෙක් වුහ. මායාය, ප්‍රජාපති යයි සුද්දෝධන රජහුගේ මෙහෙසි දෙදෙනක් වුහ. මහා මුනි වු සර්වඥ උතුමෝ තෙම සියලු ක්ෂත්‍රියයන්ගේ මුදුන් වු ආවාහ විවාහාදියෙන් අසම්භින්නව මෙසේ පැවති මහා සම්මත වංශයෙහි අන්තිම ජාතියෙහි උපන් සේක.

බෝධිසත්ත්ව වු සිද්ධාර්ථ නම් කුමාරයා හට භද්දකච්චානා නම් කුමාරිකා තොමෝ මෙහෙසි විය. ඒ මෙහෙසියගේ පුත්‍ර තෙම රාහුල නම් වුයේය. බිම්බිසාර කුමාර තෙමේ ද සිද්ධාර්ථ කුමාර තෙමේ ද යහලු වුහ. ඒ දෙදෙනාගේ පිය රජහ දෙදෙනම යහලුවෝම වුහ. බෝධිසත්ව තෙම බිම්බිසාර රජහට පස් අවුරුද්දක් වැඩි වයස් ඇත්තේ විය. වයසින් එකුන් තිස් හවුරුදු වු බෝධි සත්ව තෙම (බුද්ධත්වය පිණිස) අභිනිෂ්ක්‍රමණය කළේ ය.”





## i. ගෞතම නාමය හිමිවීම

භාග්‍යවතුන් වහන්සේට ගෞතම නාමය ආදේශ වීමට හේතුවූ කරුණු ඉපැරණි **සද්ධර්ම සාගර කෘතියෙහි** මැනවින් විස්තර කෙරේ.

"උන්වහන්සේ ගෞතම ශබ්දයෙන් හඳුන්වන ලද සේක්, උන්වහන්සේගේ වංශයෙහි ආදීම පුරුෂ ගෞතමර්ෂීන් බැවිනි. ගෞතමර්ෂීන් පරම්පරායෙහි පහළ වූ දස දහස් ගණනක් රාජ පුරුෂයන් අතුරෙහි ශ්‍රේෂ්ඨ ස්ථානය දිනුවෝ බුදුරජාණන් වනහ්සේ ය. ගෞතමගේ පුත්‍රපෞත්‍රයෝ ගොතම - ගෞතම නමින් ප්‍රකට වූහ. ගෞතමර්ෂී තෙමේ සපතර්ෂීන් අතුරෙහි කෙනෙකි. හරිවංශයෙහි සප්තර්ෂීලෙසින් පූර්වයුගයෙහි, එකත - දවිත - ත්‍රිත යි සහෝදරයෝ තිදෙනෙක් වූහයි ද, ඔවුන්ගේ තපස් තෙදින් හා කාය සංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් ගෞතම පහළ වී යයි මහාභාරතයෙහි කියන ලද්දේය. එහි ගෞතම, බ්‍රහ්ම පුත්‍රයෙකැ යි කියන ලද්දේ ය.

ආදියෙහි ගෞතම නමින් පහළ වූ මේ පුත්‍රපෞත්‍ර පරම්පරායෙහි වූවෝ කලින් කල විවිධ හේතූන් නිසා ගොත්‍රනාම විසින් විවිධත්වයට පැමණියහ. බුදුරජුන්ගේ පියමුතු පරපුර පසු කාලයෙහි ශාක්‍යවංශ නමින් හැඳුනුනේ ද එහෙයිනි. පූර්වික ශ්‍රෝත්‍ර නාම විසින් ගෞතම යනුත්, පශ්චිම නාම විසින් ශාක්‍ය යනුත් උන්වහන්සේ කෙරෙහි නැඟුණේ ය. ඉක්ෂවාකු - සූර්ය - චන්ද්‍ර ආදී ගොත්‍රයෝ ද ගෞතම ගොත්‍රයට අයත් වෙති. මධ්‍යමකාලයෙහි උපන් කපිල මුනිහුගේ අසපුවෙහි වූ ශාකවෘක්ෂ ඇසුරු කොට ඒ අසල විසූ බැවින් පසු කාලයෙහි ශාක්‍ය නම් වූහ."

## ii. ශාක්‍ය ජනපදය හා කපිලවස්තු රාජධානිය

අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, මාත්ස්‍ය, කුරු, පංචාල, සුරසේන, අස්මක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ යන පුරාණ දඹදිව් තලයෙන් පිහිටි සොළොස් මහා ජනපදයන් ය. ඒ අතර කෝසල, ජනපදය තුළ පිහිටි ශාක්‍ය දනව්ව සෙසු ජනපදයන්ට වඩා වැදගත් සමෘද්ධි සම්පන්න ජනපදයක් ලෙස අංගුත්තර නිකායෙහි තික නිපාතයෙහි සඳහනි. උතුරු නේපාල කඳුවැටියට දකුණින් ගංගා නම් නදියත්, නැගෙනහිරින් සදාහරිත හෙවත් ගණ්ඩකී නදියත්, බටහිරින් පංචාල රටත් මායිම්ව කොසොල් රට පිහිටියේ ය. බහ්රෙයික් හා ගොරොක්පූර් අතර නේපාල දේශ සීමාව ඔස්සේ, කෝසල රටෙහි හිමාලය කඳුවැටියෙන් දකුණු දිශාගතව පිහිටි බෑවුම් ප්‍රදේශය පුරා



ශාක්‍ය ජනපදය පැතිර තිබිණි. කපිලවස්තු නොහොත් කිඹුල්වත්පුර ශාක්‍ය ජනපදයේ අගනුවර විය. මෙය වර්තමානයේ හැඳින්වෙන්නේ පදරියා යන නමිනි. සැවැත්නුවරට සැ.45 ක් පමණ ඊශාන දෙසින් පිහිටි (කොහානා) රෝහිණි නදී ගං දැලේ ශාක්‍ය වංශිකයන්ගේ හා කෝලිය වංශිකයන්ගේ වාසභූමි පිහිටා තිබුණි.

සොළොස් මහා ජනපද අතුරෙන් කොසොල් රට හා සමානව ම ඉතා වැදගත් වූ රාජධානි තුනක් බුද්ධ කාලයේ දඹදිව පැවතිණි. ඒ අතුරින් වත්ස්‍ය රාජ්‍ය උදේනි රජු යටතේ පාලනය විය. කොසඹෑ නුවර එහි අගනුවර විය. අවන්ති රාජධානියෙහි පාලකයා වූයේ චණ්ඩපජ්ජෝත රජු ය. අගනුවර වූයේ උජ්ජේයිනි නුවරයි. මගධ රාජ්‍ය බිම්බිසාර රජු යටතේ පාලනය වූ අතර එහි අගනුවර වූයේ රජගහ නුවරයි. මගධ රාජ්‍යයට වයඹ දෙසින් පිහිටි කොසොල් රටේ පාලකයා වූයේ පසේනදී රජු ය. ගංගා 5 කින් පෝෂණය වූ කෝසල දේශය පාලනය කළ හෙයින් එම රජුට පසේනදී නම ව්‍යවහාර වූ බවට ජනප්‍රවාදයක් පවතී. කොසොල් රාජ්‍යයේ අගනුවර වූයේ සැවැත් නුවරයි. කිඹුල්වත් පුරය අගනුවර කරගත් ශාක්‍ය ජනපදයෙහි ප්‍රාදේශීය පාලකයා වූයේ ශුද්ධෝදන රජු ය.




සොළොස් මහ ජනපද

# 10. පස් මහ බැලුම් හා මහමායා දේව්ය දුටු ස්වප්නය.

කිඹුල්වත්පුර සුදොවුන් මහ රජුගේ දැහැමි පාලනයෙන් ප්‍රීතිමත්ව සිටිනා රට වැසියෝ සෑම ඇසළ මසකම ඇසළ සැණකෙළි උත්සවකර්ෂවත් ලෙස පැවැත්වූහ. මායා දේවිය ද ඇසළ මස පුරපසළොස්වක පෝ දාට සතියකට පෙර සිට සුදානම්ව මල් ගඳ විලවුන් ආදියෙන් සැරැසී සැණකෙළියට සහභාගී වූවා ය. ඇසළ පෝ දින මහ දන් දුන්නා ය. එදින සිරියහන් ගැබ නින්දේ පසුවෙද්දී මායා දේවිය සිහිනයක් දුටුවා ය. ලලිත විස්තර කතුවරයා මෙම අවස්ථාව මහත් අභිරුචියෙන් විස්තර කර ඇත.

දේවිය යහන පිටින් ඔසවා ගත් සතරවරම් දෙව් රජදරුවෝ ඇය හිමාලය පෙදෙසෙහි සැට යොදුනක් දිග හිරියල් ගල් තලාවෙක මහ සල්රුක මුලක තබා පසෙකට වී සිටියහ. එවිට සතර වරම් රජදරුවන්ගේ බිසෝවරු පැමිණ දේවිය අනෝතප්ත විලට ගෙන ගොස් එහි දියෙන් නහවා දිවසළු හඳවා, සුවඳ විලවුන් ගල්වා, දිවමල් පළඳවා, අසල වූ රිදී පව්ව තුළ රන් පහයෙක දිව යහනක් පනවා එහි දේවිය පෙරදිගට හිසලා සැතැප්ප වූවාය. එවිට සද්දන්ත සුදු ඇත්පැටවෙකු අසළ වූ රන් පව්වෙන් බැස, රිදී පව්වකට නැග උතුරු දෙසින් පැමිණ, රිදී පැහැයෙන් යුත් සොඬින් සුදු පියුමක් ගෙන, කුංචනාද කොට විමනට පිවිස දේවියගේ යහන වටා තුන් වරක් පැදකුණු කොට දකුණු පසින් දේවියගේ කුසට පිවිසුනාක් මෙන් විය.



මහාමායා දේවි - දුටු සිහින කැටයම් වී



**ලලිත විස්තරයේ මෙන්ම දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේද** දක්වා ඇති පරිදි මේ ස්වප්නයෙන් පෙනී යන්නේ එතෙක් තුසිත දෙව් ලොව වැඩ සිටි අප මහා බෝසතාණන් වහන්සේ උතුරු සල නැකතින් දේවියගේ කුස පිළිසිඳ ගත් බවය. බෝසතුන් තුසිත දෙව්ලොව කල්ගත කරද්දී දෙවියන් පැමිණ ආරාධනා කළවිට කාලය, දීපය, දේශය, කුලය හා මව යන පස් මහ බැලුම් නිරීක්ෂණයෙහි යෙදිණි.



පස් මහ බැලුම් ගෙන - තව්තිසින් සමුගෙන

කාලය වශයෙන් එක්සිය විසි වසරකට ආයුෂ සීමා වූ මෙම කාලයත්, දීප වශයෙන් ජම්බුද්දීපයත්, දේශය වශයෙන් දඹදිව කොසොල් දනව්ව හා කිඹුල්වත්නුවර අයත් මධ්‍ය දේශයත්, කුලය වශයෙන් බමුණු හා ක්ෂත්‍රීයය යන කුල දෙකම සුදුසු වූවත් මේ කලට රජ කුලය සුදුසු හෙයින් රජ කුලයත්, මව් වශයෙන් තවත් දස මස් හා සතියකට පමණක් ආයුෂ ඇති, එමෙන්ම උසස් ගුණ සමුදායෙන් හෙබි මහාමායා දේවියත් දුටු මහබෝසතාණන් වහන්සේ තමාට බුදුවීමට කාලය එළඹ ඇති බව සෙසු දෙවිවරුන්ට දැන්වීය. මීළඟට බුදු වන බෝසතුන් ලෙස තමන් නැති තැන තුසිත භවනේ තම උපරාජයා ලෙස මෛත්‍රී බෝධිසත්වයන් පත් කර, බෝසතුන් තුසිත දෙව්ලොවින් චුතව මහාමයාදේවී මව්කුස පිළිසිඳ ගත්හ.

**රසවාහිනිය ජාතකට්ඨ නම් ථූප වංශයයෙහි,** භාග්‍යවතුන් වහන්සේ තුසිත දෙව් ලොව උපත ලද බව හා එහදී දිව්‍ය සමූහයා උන්වහන්සේට කළ ආරාධනය සනිටුහන් කර ඇත්තේ ජීවමාන ස්වරූපයෙනි,

".... මම තුසිත දිව්‍ය ලෝකයෙහි සංතුසිත නම් ඇතිව විසීමි. එකල්හි දස දහසම සක්වල දෙවියෝ එක්වී ඇඳිලි බැදගෙන මෙසේ මාගෙන් ඉල්වති. මහා වීරයන් වහන්ස, මව් කුස පිළිසිඳ දෙවියන් සහිත ලෝකයා එතෙර කිරීමට මේ සුදුසු කාලයයි. මෙසේ බුදු බවට ආරාධනා කළ කල්හි කාලය, ද්වීපය, දේශය, කුලය, මව්ගේ ආයුෂ ප්‍රමාණය යන මේ පස් මහ බැලුම් බලා බුදු වීමට කරන ලද සනිටුහන් ඇත්තේ එයින් චුතව ශාක්‍ය රාජ වංශයෙහි පිළිසිඳ ගෙනැ එහි මහා සැපතින් පරිහරණය කරන්නේ පිළිවෙලින් බද යොවුන් වියට පැමිණ, තුන් ඍතුවට සුදුසු තුන් පහසෙහි දිව්‍ය ලෝක සම්පත්තිය වැනි රාජශ්‍රීය අනුභව කරමින්....."

පසු දින අවදි වූ මායාදේවී ඉහත තමන් දුටු සිහිනයේ තොරතුරු සුද්ධෝදන රජුට විස්තර කළාය. සිහිනයේ අරුත් විමසීමට රජු නැකැත් දන්නා නායක බමුණු පඬිවරුන් සුසැට දෙනකු කැඳවා, ලද පස් මල් අතුළ බිම අසුන් පනවා, ඔවුන් එහි අසුන් ගන්වා ගිතෙල්, මී පැණි හා හකුරු මුසු කිරිබත් සාදවා රන්රිදී සිව්සැට බඳුනක් පුරවා, එබඳු සුසැට තැටියකින් වසා ඔවුනට පිළිගැන්වීය. ඉන්පසු ව ඔවුනට අගනා සළු හා කිරි දෙනුන් ද දන් දී අවසන දේවිය දුටු සිහිනය විස්තර කර එහි පලාඵල කෙබඳු දැයි විමසී ය.

'මහරජ බියවීමට කරුණක් නැත, ඔබගේ දේවියගේ කුසෙහි පුණ්‍යවන්ත දරුගැබක් පිහිටියේය. එය ද ඔබට ලැබෙන පුත් රුවනකි. ඔහු ගිහිගෙයි වසයි නම් සක්විති රජකම ලබන්නේය. ඉදින් ගිහිගෙයින් නික්ම පැවිදි ලබන්නේ නම් බුදු බව ලබන්නේය.' යනුවෙන් පඬිවරු සිහිනය පහදා දුන්නෝ ය.

**දීඝනිකායේ මහපදාන සූත්‍රයේ** විස්තර වන ආකාරයට මෙම අවස්ථාවේ දී බෝසතුන්ගේ මෑණියන් සත්ත්ව ඝාතනය, නුදුන් දේ ගැනීම, කාමයෙහි වරදවා හැසිරීම, මුසාවාදය හා සුරා පානය, යන පස් පවින් වැළැකී, උසස් ශීල සමුදායෙන් හෙබි තැනැත්තියක් වීම ධර්මතාවයකි. ලලිත විස්තරයේ දක්වා ඇති ආකාරයට, සුදොවුන් රජුගේ මව්පිය පරපුර ද, ඔහුගේ දේවියගේ මව්පිය පරපුර ද, නොකලැල් ය. උසස් රජ පරපුරකින් හා යසසින් හෙබි ඔහු මනාව වැඩුනු සිහින් සිරුරෙන් යුතු දක්ෂ රාජ්‍ය පාලකයෙක් හා අනුශාසකයෙක් වීය. මුතු මැණික් ඇතුළු සියලු ධනයෙන් අගතැන්පත්, නොයෙකුත් ශිල්ප ශාස්ත්‍ර දහම් හා කලා ශිල්ප ආදිය කෙරෙහි පෘථුල දැනුමක් ඇත්තේ ය. පවිටු චේතනා ඔහු තුළ නොවීය.

මහබෝසතුන් මව්කුස පිළිසිදගත් අවස්ථාවේ හාත්පස පරිසරයේ ඇති වූ ආශ්චර්යාත්මක සිදුවීම් ඉතා කමනීය අයුරින් **ලලිත විස්තරයේ** සටහන්ව ඇත. බෝසතුන් මව්කුස පිළිසිඳ ගන්නා විට එකපැහැර සියලු දස දහසක් සක්වලම අධික ලෙස කම්පාවිණි. දෙතිස් පෙරනිමිති පහළ වීය. සියල් ලෝ තළය පුරා අපමණ ආලෝක ධාරා පැතිර ගියේ ය. සත්ත්වයන්ගේ නොයෙකුත් ආබාධ නැතිවී කාටත් මේ සිරි නැරඹිය හැකි විය. නිරයන්හි ගිනි නිවී ගියේ ය. තිරිසන් හා ප්‍රේත අපායන්හි සත්ත්වයන්ගේ දුක් නැති විය. සියලු සතුන්ගේ රෝග සුව විය. ජනයා ප්‍රියවදන් යුතු වුහ. අභරණ නාද වීය. සෑම දිසාවක් ම පැහැපත් වීය. සතනට සුවය ලබමින් මෘදු සුළඟ හමායන්නට වීය. අකල් වැසි වසින්නට වීය. ජාතක නිධාන වස්තුවේ සඳහන් පරිදි මේ පෙළහරේ නිමක් නැති වීය. බෝසතුන් හා මෑණියන්ට මෙතැන් සිට සතර වරම් දෙවි රැකවරණය නොමදව ලැබිණි. ඔවුනට කිසි ආබාධයක් නොවිණි.





සුපින්වත් මහමායාවන්

## පස්වන පරිච්ඡේදය

# සුනිර්මිත බුදු උපත

## 11. අසිරිමත් උපත

බෝසතුන් නීරෝගීව, නිරුපද්‍රිතව දස මසක් මුළුල්ලේ මව් කුස වැඩෙද්දී, මායා දේවිය දරු ප්‍රසූතිය සඳහා දෙව්දහ නුවර තම මාපියන් වෙත යාමට ඇති කැමැත්ත සුද්ධෝදන මහරජ වෙත දන්වා සිටියා ය. දේවියගේ කැමැත්ත සපුරාලනු වස් රජතුමා කිඹුල්වත්පුරය සිට දෙව්දහ නුවර දක්වා මහ මඟ රඹ ගස් සිටුවා, පුන්කලස් තබ්බවා, දද කොඩි ඔසවා, අලංකාර ලෙස සරසා මහත් පිරිවර සහිතව මහ පෙරහැරකින් දේවිය අලුත් රන්සිවි ගෙයක සිඳුවා ඇගේ මාපියන් වෙත පිටත් කළේ ය.

ඉමහත් උත්සව සිරියෙන් සුවසේ ගමන් ගත් මේ පිරිස ක්‍රමයෙන් කිඹුල්වත්පුර හා දෙව්දහ නුවර අතර වූ ලුම්බිණි නම් සිත්කළු සල් උයන වෙත ළඟා වූහ. දෙනුවර වැස්සන් ම විවේකය හා විනෝදය



අසිරි සිරි ගත් සිරි - පෙරහැර පෙළහරක සිරි



තකා නිතර පැමිණෙන මේ මඟුල් උයන මායා දේවියගේ මිත්තනියක වූ ලුම්බිණි දේවිය විසින් පරිත්‍යාග කරන ලද්දකි.

**ත්‍රිපිටකයේ සුත්ත නිපාතය මෙන් ම අඨකතාවල ද ලුම්බිණි වනෝද්‍යානය** පිළිබඳව තොරතුරු ගෙන හැර දක්වයි. නාලක සූත්‍රයෙහි ලුම්බිණිය පිහිටියේ ශාක්‍ය ජනපදයේ බැව් පැහැදිළි ව ම සඳහන්ව ඇත. ප්‍රපංචසූදනියේ මෙන්ම ජාතක අට්ඨකතා නිදානයෙහිද විස්තර කෙරෙන පරිදි ලුම්බිණිය, කපිලවස්තු හා දෙව්දහ දෙනුවර මධ්‍යයේ පිහිටියේ ය. මෙම උයන ශාක්‍ය වංශිකයින් සහ කෝලීය වංශිකයින් විවේක සුව ගත කරන්නට, සැණකෙළි පවත්වන්නට පොදු ස්ථානයක් ලෙස භාවිත කළහ.

බුදුන් වහන්සේ ජීවමානව සිටි අවධියේ මනික ලුම්බිණි උපවන යන නාමය ද ලුම්බිණි වන උද්‍යානයට ව්‍යවහාරව ඇත. මෙහි මාතෘ රෝහලක් පැවතීම මනික ලුම්බිණි යන නම ව්‍යවහාර වීමට හේතු වූ බවටද ජන විශ්වාසයක් පවතී. ලුම්බිණි උද්‍යානයේ සල් වෘක්ෂ පමණක් රෝපණය කර තිබීමට විශේෂ හේතුවක් තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ලංකාවේ දක්නට ලැබෙන සල් ගසට වඩා හාත්පසින්ම වෙනස් වූ නේපාල් සල් ගස SHOREA ROBUS යන උද්භිත නාමයෙන් හැඳින්වේ. කුඩා ප්‍රමාණයේ පත්‍ර වලින් සමන්විත වන මෙම සල් වෘක්ෂය අඩි 40 ක් පමණ උසට වැවේ. ඉතාමත් ශක්තිමත් වෘක්ෂයක් වූ සල් ගසෙහි කශාවන් පැහැයෙන් යුත් සුගන්ධනීය පුෂ්පයන් හට ගනී.

මහ භාරතයේ මෙන් ම නේපාලයේ ජනතාව සල් වෘක්ෂය දරුඵල ලබාදීමේ ගුප්ත ආකර්ශනයකින් යුක්ත සංකේතයක් ලෙස සලකති. සාලභජ්නිකා නම් දේවතාවිය සල් ගසට අරක් ගෙන සිටින බවට ද ජන විශ්වාසයක් පවතී. ඒ අනුව දරුවන් නොමැති කාන්තාවන් සල් රුක වෙත පැමිණ සත් වරක් වෘක්ෂය පැදකුණු කර තම වම් පාදයෙන් වෘක්ෂයේ කඳ පිරිමැදීමෙන්, තමනට දරු සම්පතක් ලබා ගැනීමට ගසට අරක් ගත් දේවතාවියගේ ආශිර්වාදය ලැබෙන බව ද ඔව්හු තරයේම විශ්වාස කරති.



සල්වනයේ අතීත සැමරුමක සල් වෘක්ෂයක්

සල් වනයේ මනරම් විසිතුරු දුටු මායා දේවිය උයන තුළට ගොස් විඩා හැර විනෝදයෙන් මදක් කල් ගෙවීමට කැමැති වූ බැවින් ඇමතියන් ඇතුළු පිරිස ඇය උයන තුළට කැඳවාගෙන ගියාය. සුපිපි කුසුමෙන් යුතු මඟුල් සල් රුකක් වෙතට

පිය නැඟු දේවිය එහි මල් බර අත්තක් ඇල්ලීමට අත එසවූවාය. අත්ත පහත් වී මායා දේවීයට සමීප විය. ඈ අත දිගුකර අත්ත අල්ලා ගති. එකෙනෙහිම විළිරුදාව දැණිනි. සල් අත්තද ඇයට ආවරණය සලසමින් ඇය වටා විහිදිණි. පරිවාර ජනයා ඇය වටා වට තිර ඇද්දාහ.

'**ලුම්බිණි වංශ**' යෙහි මෙම පරිච්ඡේදය කෙරෙහි දෙනෙත් යොමු කරන සහෘද ඔබ සිත්හි මෙයින් සියවස් කිහිපයකට පෙර බුදු උපත සිදු වූ අතිශය හැඟුම්බර අවස්ථාව, ඔබ මනසේ මේ අයුරින් සජීවී ලෙස විචිත්‍රණය වනවා නොඅනුමානය.

ක්‍රිස්තු පූර්ව 563 හි පැහැබර දිනයකි. පෙර දිග අහසේ වෙසක් පසළොස්වක සඳ මෝදු වෙමින් පැවතිණි. කිඹුල්වත් පුර සිට මහ පෙරහරින් වඩනා පින්වත් මාතාවකි. ඕ මහමායාවෝ වෙති. මහමායාවන් ගමන් විඩාව දුරු කර ගැනීමේ රිසියෙන් ලුම්බිණි සාල වනයට පිවිසියාහ. සිහිල් නිල් දිය පිස හැමූ සුළඟ ඇයගේ විඩාව නිවන්නට සමත් වූවා සේය. තුරු හිස් නෙක මලින් ගැවසිණි. මල් සුගන්ධයෙන් මහා මායාවන්ගේ සිත් තුළ පහළ වූයේ ප්‍රබෝධමත් සිතිවිල්ලෙනි. මලින් බරව තිබූ සල් අත්තකින් මලක් නෙලා ගැනීමට ඇය සිත ඇයට බල කළා ය. නිමේෂයකින් මහා මායා කුසින් සිදුහත් කුමරු උපත සිදු වූයේ දෙරණ සලිත කරමිනි.

**6 වැනි පැරකුම්බා රජු දවස විමලකිත්ති සිද්ධාර්ථ තෙරුන් වහන්සේ** විසින් රචිත සද්ධර්මරත්නාකරය කෘතියෙහි ලුම්බිණියෙහි සොබා අසිරිය හා සිද්ධාර්ථ කුමාර උත්පත්තිය ඉතා කමණීය අයුරින් මෙසේ මූර්තිමත් කරවයි.


**තුසිත පුර සිට වැඩි සුරත් අත කුමරු වැඩි**

"පුෂ්ප ඵල පල්ලව සෑදී සිනිඳු සුනිල් වන ගහන මුදුනෙන් හමන සුවඳ මලතුර මුවරද සළාවෙන් නිකුත් සුරභි ඇල් බොල් පවනින් වනය එක සුවඳ පිඬක් සේ දන මන ගිමන් නිවන, සිහිල් මනකල් ඡායා සම්පන්න වූ ලුම්බිණි උප වන ෂණ්ඩයෙහි නන් විසිතුරු බලමින් කෙකාසර නඟා රඟන බස්නා මත් මොණර කැලන්සේ සඳැස් පිල් කැල කැළුමෙන් එකළු වූ දිගු පුළුල් තැනිතලා ගල් තලින් දැක ගමන මද මද පවන් විඳ විඳ සපිරි වරින් පැමිණියාහ. එසේ පැමිණියාවු ඒ මහමායා දේවි නම් වු බුද්ධ මාතාවන් උයන්



මැඳ සිට ඒ ලුම්බිණි නම් වු වනෝද්‍යානයෙහි සුපිපි අතු පතරින් සැඟවුනා වු මගුල් සල්තුර මුලට දෙවඟනක ලීලාවෙන් ලීලෝපේතව ගොස් මිහිලොලින් බමණ මත් බඹර වැලැන් විසින් එක කෝලාහල වු සුපිපි සල් අතු පතරක් කරා අත දිගු කළ කල්හි නැමී පිළිගත් අතුළ් තල ඇති එම සල් අත්ත අතින් ගෙන මහ මේ ගබක් මැද පහළ විදුලියක් මෙන් සිටි කල්හි කර්මජසමීරන චලනව බෝධිසත්ව උත්පත්ති කාරණය පෙනුණු කල්හි වැඩ පසස්නා මඟුල් මහ ඇමතියන් විසින් විසිතුරු ඝන තිර වට බඳවා මුවා කොට වට රැකවල් ලවා ගෙන සිටි කල්හි ධර්මාසනයකින් බස්නා ධර්ම කථිකයක්හු සේ අතපය දිගු කොට අප මහා බෝසතාණෝ මවුකුසින් බිහිවුහ."

**දළදා සිරිත කතුවරයා** මෙම ආශ්චර්යමත් අවස්ථාව සිතුවම් කරන්නට යොදා ගෙන ඇත්තේ ශබ්ද මාධූර්ය පිළිරැව් දෙන භාෂා රිද්මයක් වූ උත්කලිප්‍රාසය නම් ගද්‍ය රීතියයි.

"නන් මුවන්, විලි මුවන්, කෙවිල්ලන් විසින් යුත් උදුල, පුලින තෙලෙ ලද බොළඳ සඳගණන් මන දඟ කළ අමින්මින් සරුසා සර සරු සරවා රවන බමන බුමර තිසර රුවින් සැදුම්ලත් සෘතුමදම් ලුම්බිණි විලසිබනි විවිධ රස ලුම්බිණි විකසිත කදම්බිණී මධුපකුල චුම්බනී වනෝදන්‍යාන යෙහි මාතෘ ගර්භවයෙන් පුසුතවැ..."

බුදු උපතක් අශ්චර්ය අද්භූත වීම ධර්මතාවයකි. බෝසතුන් බිහිවූයේ දස මසක් සපුරා මව් කුස වැඩීමෙන් පසුවය. අන්‍ය සත්ත්වයෝ අපද්‍රව්‍යයන්ගෙන් කිලිටි වී උපන්නත් බෝධිසත්වයෝ සුපිරිසිදුවම උපත ලබති. කසී සළුවක තබන ලද මිණිරුවණක් සේ බබලමින් ද ධර්මාසනයෙන් බසින ධර්ම දේශකයාණන් කෙනෙකු මෙන් බෝසතුන් මව් කුසින් වැඩ බිහිවන්නාහ. එසේම බෝසතුනට හා බෝසත් මවට ද ගෞරව පිරිනමමින් අහසින් නික්මුණු දිය දහරා දෙකකින් මවු පුතු සිරුරු මැනවින් සෝදා ලන්නී ය. 5 වැනි සියවසේ ලුම්බිණියට වැඩි හියුං සියැන් භික්ෂුන් වහන්සේ මෙම උල්පත් ද්වය දුටු බැව් සිය චාරිකා වාර්තාවේ සටහන් කර ඇත.

**මජ්ඣිම නිකායට අනුව සද්ධාවාස දෙවියෝ** රන් දැළින් බෝසතුන් පිළිගෙන මව ඉදිරියේ තබා දේවිය සතුටු වුව මැනව, ඔබට මහේශාක්‍ය පුත් රුවනක් ලැබී ඇතැයි කියති. සතරවරම් දෙවි රජවරු මුදු පහස් දෙන සම්මානනීය කුරංග ඹුව සමකින් බෝසතුන් පිළිගත්හ. ඔවුන් අතින් සෙසු පිරිස සිනිඳු පට සළුවකින් බෝසතුන් පිළිගත්හ. ඉන්පසුව සම පාදයෙන් පා තැබූ බෝසත්හු උතුරු දිග බලා සත් පියවරක් දස දහසක් සක්වල එක මිදුලක් මෙන් පෙනී ගියේ ය. හැම දික් ඔබ මොබ දස දෙසම බැලු බෝසතුන් සේසත් රැගෙන බඹුන් හා දෙවියන් පසුපසින් එද්දී සත්වන පියවරේ නතර වී,

මම ලොවට අග වෙමි
මම මුළු ලොවට දෙටු වෙමි
මම ලොවට උතුම් වෙමි
මෙය අවසන් උපත වෙයි, මෙයින් මතු උපතක් නැත.

අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති නත්පීදානි පුනබ්භවෝ

යනුවෙන් සිංහ නාද පැවැත්වූහ. අචඡරියභූත සූත්‍රය, මෙම සූත්‍ර දේශනාවේ දී ම බුද්ධත්වය ලබන මහ බෝසතාණන් වහන්සේ කෙනෙකුගේ උත්පත්තියේදී වෙනත් සත්ත්වයෙකු හට සිදු නොවන ආශ්චර්ය අද්භූත කරුණු 19 ක් සඳහන්ව ඇත. බෝසතුන් මෙලොව බිහිවත්මැ දෙතිස් පෙර නිමිති පහළ වි තිබුණි. එදින ම පන්සියයක් පිරිවර සහිතව යශෝධරා දේවිය ද, (රාහුල මාතා) ආනන්ද තෙරුණ් වහන්සේ, ඡන්න හා කාළුදායි ඇමැතියෝ ද, අජානීය ඇත් පැටවා ද, කන්ථක අශ්වයා ද, උපත ලදහ. බෝසතුන් පිටදී බුදු බව ලැබූ ජය ශ්‍රී මහා බෝ රුක ද සතර මහා නිධානය ද පහළ වූ බව **ථේර ගාථා අටුවාව හා ජාතක පාළි අටුවාව අනුව බුද්දක භාණකයෝ පවසති.**



**දියැ මල් දෙරණ ගෙන - කුමරු පා පියුම් ගෙන**

සිදුහත් උපතින් පසුව කුමරුවන් මහ පෙරහරකින් කිඹුල්වත් පුරයට වැඩම කළ අයුරු **පූජාවලිය** කතුවරයා මෙවැනි සටහනකින් මූර්තිමත් කරයි.

"මාගේ ස්වාමිදරුවාණන් ලුම්බිණි වනෝද්‍යානයේදී මුළු ලොවට මුදුන් මල්කඩක් සේ මුළු ලොවට අම්කඩක් සේ මුළු ලොවට රුවන් කඩක් සේ මව් කුසින් බිහිව මෙසේ මරුබඩ කාලය තුළ ප්‍රජා පාලනය කළ ශාක්‍ය දෙනුවර එක්ලක්ෂ හැටදහසක් රජදරුවන් මහත්වූ පෙරහරකින් බෝසතතුන් කිඹුල්වත් පුරයටම වැඩමවා ගෙන ගියහ."


**මායාදේවි ස්ථූපය**



# 12. සිදුහත් කුමර – ඉසිවර හමුව

අෂ්ඨ සමාපත්තිය හා පංච අභිඥා උපදවා සෘධි බලයෙන් යුතු වූ අසිත නම් තවුසෙක් හිමාලයෙහි වැඩ වාසය කළේ ය. හෙතෙම දිවා ආහාරයෙන් පසුව තව්තිසා දෙව්ලොවට ගොස් තම විවේකය ගත කරමින් සිටියදී, දෙවියන්ගේ ප්‍රීති ඝෝෂා අසන්නට ලැබී, ඊට හේතු විමසී ය. සුද්ධෝදන රජුගේ පුත් කුමරුගේ උපත ඊට හේතුව බව ඔහුට දැනගන්නට ලැබිණි. අසිත ඉසිවරයා වහා ම සුද්ධෝදන රජ මැදුර වෙත පිය නැගී ය. මෙම සිදුවීම අවදාන කල්පලතාවෙහි සඳහන් වන්නේ, අසිත තවුසාගේ බෑනණු වූ කිෂ්කින්ධා පව්වේහි භාවනා යෝගීව සිටි නාලකයන්, බෝසතුන් උපන් දා අහස් ගැබෙහි පහළ වූ දීප්තිමත් අලෝකයන් දර්ශනය වී, ඒ කිමෙක් දැයි අසිත තවුසාගෙන් විමසූ බව ද, අසිත තවුසා තුන්ලොවට ම අධිපතිවන උතුමකු පහළ වී ඇති බව ප්‍රකාශ කොට, නාලකයන් ද සමඟ බෝසතුන් දක්නට ගිය බව ය. රජතුමාගේ පුත් කුමරා දැකගැනීම සඳහා පැමිණි බව දැනගත් සුද්ධෝදන රජතුමා ඔහුව ළදරුවා සිටි යහන් ගැබ වෙත කැඳවාගෙන යන ලදි. මායා දේවිය ළදරුවා වඩා ගෙනවිත්, ඔහු ලවා ඉසිවරයාට නමස්කාර කරවීමේ අදහසින් ළදරුවාගේ හිස ඉසිවරයාගේ දෙපතුළ දෙසට සමීප කළේය. එහෙත් වූයේ අනෙකකි. ළදරුවාගේ දෙපා ඉසිවරයාගේ හිස දෙසට යොමු විය. එවිට සුද්ධෝදන රජතුමා තම පුතුන් ලවා ඉසිවරයාට වැන්දවීමට තෙවරක් ම උත්සාහ කළේ ය. මෙදෙස බලා සිටි අසිත තවුසා තම අසුනින නැගිට රජු අමතා, "මහ රජ මේ ළදරුවා ලවා මට නමස්කාර කරවීමට තැත් නොකරනු මැනවි. මෙය ආශ්චර්යයකි. මහා පුරුෂයෙකු ලොවට පහළ වී ඇත." යනුවෙන් තෙපළේ ය.

අසිත ඉසිවරයා දකුණු දණ බිම ඇන, දකුණු උරහිසින් සළුව ඉවතට ගෙන, රජකුමරුවා දැතින් වඩා ගත්තේ ය. ඉක්බිති තම අසුනෙහි ඉඳගත් ඉසිවරයා රජ කුමරා තම ඇකයේ හිඳුවා ගත්තේ ය. එකල්හි මායා දේවි, "ඉසිවර තුමනි, ළදරුවාට ඔබේ දෙපා නැමදවීමට ඉඩදෙනු මැනවයි" පැවසූවා ය. "එසේ නොකියනු දේවියනි, මා පමණක් නොව දෙව් මිනිසුන් සහිත සියළු ලෝකයා මේ කුමරුවන් නැමදිය යුතුවේ" යැයි ඉසිවරයා පැවසුවේ මහත් භක්තිමත් ස්වරයෙනි.

ළදරුවා ගැන මෙන් ම තමාගේ අනාගතය ද නුවණැසින් බැලූ අසිත ඉසිවරයාගේ දෙනෙතට කඳුළු පිරුණේ නිතැතිනි. සුද්ධෝදනයෝ අසිත තවුසන් කඳුළු සලා දිගු සුසුම් ලමින් වැළපෙනු දුටහ. නිරිඳුන් ඊට හේතු විමසුහ. "මුනිඳුනි, ඔබ හිටිගමන්ම කඳුළු සලා දිගු සුසුම් ලා වැළපෙනු කිම, දරුවාට විපතක් නැතැයි සිතමි."

"රජතුමනි දරුවා ගැන නොවැලපෙනු මැනවි, දරුවාට විපතක් නැත, මා වැලපෙන්නේ මා ගැනමය, ඒ මක් නිසාද යත් මම වයෝවෘද්ධියෙක්මි, මහලුයෙමි, මේ සර්වාර්ථ සිද්ධයෝ සම්මා සම්බුදු බව ලැබ ලොව කිසි ශ්‍රමනයෙකු හෝ බ්‍රාහ්මනයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ අන් කිසිවකු හෝ විසින් නොපවත්වන ලද උතුම් දම්සක් පවත්වන්නාහු ය. ලෝකයාගේ යහපත ද, සන්තුෂ්ඨිය ද පිණිස ඔවුහු ධර්මය දේශනා කරන්නාහු ය. ආදී කල්‍යාණ වූ, මධ්‍ය කල්‍යාණ වූ, අන්ත කල්‍යාණ වූ සවිස්තරාර්ථයෙන් ද, සාරාර්ථයෙන් ද, සර්ව සම්පූර්ණ වූ ද, ශුද්ධ වූ ද බ්‍රහ්මචර්ය ප්‍රකාශ කරන්නාහු ය. රජතුමනි, කිසියම් කලෙක, කිසියම් තැනක අත්තික්කා මලක් මතුවෙන්නාක් සේ අනන්ත වූ කල්ප ගණනාවක ඇවෑමෙන් ලොව කිසියම් කලෙක කිසියම් තැනක බුදුවරයාණන් කෙනෙක් පහළ වන්නාහු ය. මේ දරුවානෝ නිසැකයෙන්ම පරමෝත්කෘෂ්ඨ වූ බුද්ධත්වය ලබා අනන්ත සත්ත්වයින් සංසාර සාගරයෙන් එතෙර කොට අමා මහ නිවනට පමුණුවන්නාහ. මම ඒ බුද්ධ රත්නය දැකීමට නොලබමි. එහෙයින් මහ රජතුමනි මම වැළපෙමි. දුක් දොම්නසින් දිගු සුසුම් ලමි." මෙහිදී අසිතයෝ එකී දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ද, අසූ අනු ලක්ෂණ ද, කියා තම අනාවැකිය යළිත් පළ කරති. මින් අප්‍රමාණ ප්‍රීතියට පත්වන සුද්ධෝදන රජු පුතුට වැඳ නමස්කාර කරයි.

සුදොවුන් රජ මැදුරෙන් පිටත් වූ අසිත ඉසිවරයා, තම බෑනනුවන් වූ නාලකට බුදුන්ගේ සසුනෙහි පැවිදිව විමුක්තිය ළඟා කරගන්නා ලෙස ඉල්ලීමක් කළේ ය. බුදුන් බුදු වන්නේ මගද රට බරණැස් නුවරට නුදුරු බව දැනගත් ඉසිවරයා එහි සිය බෑනනුවන් උදෙසා අසපුවක් කරවීය.

## i. නම් තැබීමේ උළෙල

කුමරු ඉපිද පස් වන දින නම් තැබීමේ මඟුල් උළෙල විය. **දීඝ නිකායේ මහාපදාන සූත්‍රයෙහි** සඳහන් වන ආකාරයට ත්‍රිවේදයෙහි කෙළ පැමිණි බමුණන් 08 දෙනෙකු කැඳවා කුමරුන්ගේ සිරුරු ලකුණු අනුව අනාගතය පිළිබඳ විමසීය.

බමුණු පඩිවරයන් අතර රාම, ධජ, ලක්ඛන, මන්ති, භෝජ, සුයාම, සුධත්ත හා කොණ්ඩඤ්ඤ යන 08 දෙනා සිරුරු ලකුණු අනුව අනාවැකි කීමෙහි සමත් වූහ. මේ අතරින් සත් දෙනෙක් ම දෑඟිලි ඔසවා, මෙවැනි අසිරිමත් ලකුණු දරන්නෙකු චක්‍රවර්තී රජෙකු හෝ බුදුවරයෙකු වන බවට අනාවැකි පළ කළහ. බමුණන් අතුරින් ලාබාලම



කොණ්ඩඤ්ඤ බමුණා එක් ඇඟිල්ලක් ඔසවා, මෙබඳු පින්සර ලකුණු පිහිටන්නේ නිසැකයෙන් ම බුදුවන උතුමකුගේ පමණක් බව කීහ. මෙම පින්බර කුමරුවන් වියපත් වූවකු, රෝගියෙකු, මළ කඳක් හා තවුසෙකු යන සතර පෙර නිමිති දැක නියත වශයෙන්ම ගිහි ගෙය හැර යන බව ද දැන්වීය. මිලින්ද ප්‍රශ්නයෙහි තත් බමුණන්ගේ නම් සඳහන්ව ඇත්තේ මීට මඳක් වෙනස් ආකාරයකටය. එහි, රාම, ධජ, ලඛ්ඛන, ජාතිමන්ත, යඤ්ඤ, සයාම, සුභෝජ, සුදත්ත යනුවෙන් දක්වා ඇති බැව් නිරීක්ෂණය වේ.

**අභිනිෂ්ක්‍රමණ සූත්‍රයෙහි** හා ලලිත විස්තරයෙහි කුමරුන් ගේ නම සඳහන් වන්නේ සර්වාස්ත්‍ර සිද්ධ ලෙසයි. එමෙන් ම අශ්වඝෝෂයන්ගේ බුද්ධ චරිතයෙහි ද දැක්වෙන්නේ සර්වාස්ත්‍ර සිද්ධ යනුවෙනි. එහි අර්ථය වනුයේ උසස් පරමාර්ථයක් ඉටුකර ගන්නා තැනැත්තා යනුයි.



**ලොව අත් සිදුවී - කුමරු සිදුහත් නම් වී**

බෝසතුනගේ මෑණියන් සිදුහත් උපතින් සත් දිනක අවෑමෙන් මිය ගොස් තුසිත දෙව් ලොව උපත ලැබුවා ය. මායා දේවිය මිය යාමෙන් පසු සිදුහත් කුමරු රැකබලා ගැනීමේ කාර්යය පැවරුණේ මහා මායවන්ගේ නැගණිය වූ ප්‍රජාපති ගෝතමිය වෙත ය. ඇයට සහාය වීමට කිරි මව්වරුන් තිස් දෙදෙනෙක් වූහ. ඔවුන් අතරින් අට දෙනෙකු දරුවා කිරෙන් පෝෂණය කිරීමට ද, අට දෙනෙකු දරුවා නැවීමට ද, අට දෙනෙකු ආහාරයෙන් පෝෂණය කිරීමට ද, අට දෙනෙකු දරුවා සමග ක්‍රීඩා කිරීමට ද සේවයෙහි යොදවා තිබුණි.


## ii. වප් මගුල

සුදොවුන් රජුගේ වප් මඟුලදා මුළු කිඹුල්වත්පුරම දෙව් විමනක් මෙන් සරසනු ලැබී ය. කුඹුරු යාය සීසෑම සඳහා නගුල් 108 ක් යෙදවිණි.

ඉමහත් හරසරින් වප් මඟුල සඳහා පිටත් වු රජතුමා තම කුඩා පුත් කුමරුවානන් ද ගෙනයාමට අමතක නොකළේ ය. කුඹුරු යාය අද්දර ජම්බු ගසක් සෙවනේ කුමරුට යහනක් පනවා එහි උඩු වියන් බඳවා, ඒ අවට තිර රෙදි ඇද රැකවරණයට කිරි මවුන් ද සමඟ කුමරුවා එහි හොවන ලදි.

රජතුමා රන් නගුලින් ද, ඇමතිවරු රිදී නගුලින් ද, සාමාන්‍ය ජනයා ලී නගුලින් ද කුඹුරු යායෙහි සී සෑම ඇරඹූහ. වප් මගුලේ අසිරිය නරඹන්නට කිරි මවුවරු කුඹුර වෙත දිව ආහ. අටුවා හි සඳහන් පරිදි කිසිවෙකු අසළ නොසිටි බව දැනගත් කුමරු යහන මත බද්ද පර්යංකයෙන් හිඳ ආනාපානා සතිය වඩා ප්‍රථම ධ්‍යාන ලදහ. මිලින්ද ප්‍රශ්නයෙහි බෝසතාණන් සතර වන ධ්‍යානය වඩා අහස්හි පලක් බැඳ හුන් බව සඳහන් වේ. කිරි මවුන් පෙරළා එනවිට අන් ගස්වල සෙවනැලි බැසගොස් දඹ ගසේ සෙවනැල්ල පමණක් පෙර තිබු සේම ඉතිරිව තිබුණි. මේ පුදුමය ඔවුහු රජුට දැන්වූහ. වහාම එතැනට පැමිණි රජතුමා ඒ ප්‍රාතිහාර්ය දැක "පුතනුවනි, මේ මාගේ දෙවැනි වැඳීමය" යැයි පවසමින්, දෑගිලි බැඳ සිදුහතුනට නමස්කාර කළේ ය.

සුදොවුන් රජුගේ වප් මඟුල පිළිබඳ **අභිනිෂ්ක්‍රමණ සූත්‍රයෙහි** හා **මහා වස්තුවෙහි** විවිධ විස්තර අන්තර්ගත වේ.



**පළක් බැඳ කුමරු හිඳී - පිය රජු පළමු වර වඳී**



# 13. සිදුහත් උපත හා පහළ වූ සප්ත සම්පත්

## i. ආනන්ද හිමි

පසේනදී කොසොල් රජු බුදුන් වහන්සේ නමදින්නට වෙහෙරට ගිය අවස්ථාවේ එහි සිටි ප්‍රිය ජනක භික්ෂු නමක් කෙරෙහි පැහැදීමට පත් වෙති.

'බුදු හිමියනි මෙම තෙරුන් කවරෙක්ද?'

'රජතුමනි හේ ආනන්ද (සතුට) නම් වෙයි.'

ප්‍රසාදයට පත් කොසොල් රජු, 'මොනතරම් ආනන්දයක්ද? සැබෑ ම ආනන්දයක්' කන්නකත් එල සුත්‍රයෙහි ආනන්ද හිමියන් ගේ නම විග්‍රහ වන්නේ එසේ ය.

ආනන්ද හිමි, සිදුහත් කුමරුන්ගේ පියාණන්වූ, සුදොවුන් නිරිඳුගේ සහෝදරයෙකුගේ පුත්‍රයෙකි. හෙතෙම සිදුහත් උපත ලද දිනම මෙලොව බිහි වීය. එවක් පටන් සිදුහත් කුමරුගේ ළඳරු, බාල, ශිෂ්‍ය, තරුණ යන සෑම අවධියක දී ම ආනන්ද හිමි එතුමාගේ කල්‍යාණ මිත්‍රයෙකු විලසින් එකට හැඳී වැඩුනේ ය. අනතුරුව බුදු සසුනෙහි පැවිදි වූ හෙතෙම සම්බුද්ධ පරනිර්වාණය දක්වා ම බුදුරජාණන් වහන්සේට උවටැන් කරමින්, සෙවනැල්ලක් සේ භාග්‍යවතුන් වහන්සේ ඇසුරේ ම කල් ගෙවී ය. අංගුත්තර නිකායෙහි බුදු සසුනෙහි අග තනතුරු දැරූ පිරිසගේ නම් සඳහන්ව ඇත. විනයධාරී යහපත් හැසිරීම පරෝපකාරය, ධාරණ ශක්තියෙන් අග තැන්පත් ධර්ම භාණ්ඩාගාරික ලෙස කටයුතු කිරීම ආදී ගුණාංගයන්හී මෙන් ම භාග්‍යවතුන් වහන්සේ ගේ අග්‍ර උපස්ථායක වශයෙන් ද ආනන්ද හිමියන්ට බුදු සසුනේ විශේෂ තැනක් හිමිවේ.

භාග්‍යවතුන් වහන්සේ වැඩ වසන ආරාමයට උන්වහන්සේ බැහැදැකීමට එළඹෙන ගිහි පැවිදි දෙපාර්ශවයම සුදුසු අවස්ථාව බලා බුදුන් වහන්සේ වෙත කැඳවා ගෙන යාමේ සම්ප්‍රදායික මෙහෙවර ඉටුකරනු ලැබුවේ ද ආනන්ද හිමි විසිනි.

පසේනදී කොසොල් රජුගේ අන්තඃපුරයෙහි උපත ලද කුල කුමරුවන් 500 ක් පැවිදි කිරීමේ කර්තාව්‍යයද ආනන්ද හිමි විසින් සිදු කරන ලද බැව් පූජාවලියෙහි දැක්වේ. ජය ශ්‍රී මහ බෝධි ශාඛාවක් ආනන්ද හිමිගේ නමින්ම ජේතවනාරාම බිහි දොර අසළ රෝපණය කරන ලද්දේද ආනන්ද හිමි විසිනි.

බුදුරජාණන් වහන්සේ ධර්ම චාරිකාවේ යෙදුණු බොහෝ අවස්ථාවල ආනන්ද හිමිද උන්වහන්සේ සමඟම විය. බුදුන් වහන්සේට උපස්ථාන කරමින් බුදුන් වහන්සේ ගේ ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය සිය ස්මරණයෙහි තැන්පත් කර ගනිමින් ආනන්ද හිමි භාග්‍යවතුන් වහන්සේගේ සෙවනැල්ලක් ලෙසින් ගම් දනව් වල සැරි සැරූ අයුරු බෞද්ධ ඉතිහාසයේ වර්ණිත ය.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයට ස්වල්ප මොහොතකට පෙර දේශිත මහා පරිනිබ්බාන සූත්‍රයෙහි වස්තු බීජය වූයේ ආනන්ද තෙරුණ් බැව් දීඝ නිකායේ සඳහනි. කුළුණ බර ධූරදර්ශී, සිල්වතුන් අතර ජනප්‍රිය පරාර්ථකාමී භික්ෂුවක වෙනුවෙන් කරන ලද ගුණ වර්ණනාවක් මෙහි ඇතුළත්ි.

ප්‍රථම ධර්ම සංගායනාවේදී සූත්‍ර හා අභිධම්ම යන පිටක ද්වයම පිළිබඳව විස්සජ්ජක (පිළිතුරු දෙන) භික්ෂූන් වහන්සේ වශයෙන් මහා සංඝයා වහන්සේ විසින් ඒකමතිකව පත්කර ගන්නා ලද්දේ ආනන්ද තෙරුන් ය. උන්වහන්සේ අර්හත් භාවය ලබන්නේ ද ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට නියමිතව තිබූ දිනට පෙර දිනක දී ය.

ආනන්ද හිමි වසර 120 ක් ආයු සංස්කාර විඳ අපවත් වීම ආසන්න බව භික්ෂු සංඝයාට දැනුම් දෙනු ලැබිණි. එහිදී රෝහිණී නදිය දෙගම්බඩ ජීවත් වූ ශාක්‍ය කෝලිය ජනපදිකයින් දෙපාර්ශවය ම තම ජනපදයට වැඩ පිරිනිවන් පානා ලෙසට විවිධ ඉල්ලීම් කළහ. රෝහිණී නදී දෙතෙර වැසියෝ එකහා සමානව ම තමන්ට උපකාරිව සිටි බැවින් තමන් වහන්සේ ගං ඉවුරේ එක් පැත්තක පිරිනිවන් පෑවේ නම් අනෙක් තෙර වැසියෝ නොසතුටට පත්ව අරගල කර ගනු ඇතැයි කල්පනා කළ ආනන්ද මහරහතුන් වහන්සේ රෝහිණී නදිය මැද අහසෙහි ඍද්ධියෙන් පලක් බැඳ වැඩ සිට දෙපිරිසටම දහම් දෙසා පරිනිර්වාණයට පත්වූ සේක.



## ii. යශෝධරා

සිද්ධාර්ථ කුමාර උත්පත්තිය සිදු වූ දින ම යශෝධරාවන් ද උපත ලද බව බෞද්ධ ඉතිහාසයේ සඳහනි. මහා මායා දේවියගේ සහෝදරයකු වූ දෙව්දහ කෝලිය පුර රාජ්‍යත්වය හෙබ වූ සුප්පබුද්ධ රජ යශෝධරාවන්ගේ පියාණන් ය. අමිතා බිසව ඇයගේ මව ලෙස සැලකේ.

යශෝධරාවන් සිද්ධාර්ථ කුමරුන්ගේ බිසවුන් ලෙස අභිසෙස් ලබා ඇත්තේ මෙම භවයේදී පමණක් නොවේ. සංසාරයේ ආත්ම ගණනාවක දී ම ඇය බෝසතුන්ගේ පතිනිය වීමේ වරම් ලද්දී ය. වෙස්සන්තර ජාතකයේ බෝසත් වෙස්සන්තර රජුගේ අග මෙහෙසි මන්ත්‍රී දේවිය වූයේ ද ඇයයි. කුස ජාතකයේ මෙන් ම සඳකිඳුරු ජාතකයේද, පෙර අත්බැව් හී ඇය බෝසතුන්ගේ පත්නිය වූවා ය.

මහා ප්‍රජාපතී ගෝතමිය විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් කාන්තා පැවිද්ද සඳහා අවසරය ලද පසුව, මුලින් ම පැවිදි භාවය ලද කාන්තාවන් අතුරෙන් යශෝධරාවන්ට ප්‍රමුඛස්ථානයක් හිමිවේ.

යශෝධරා තෙරණියගේ ජීවන ප්‍රවාහය පිළිබඳ තොරතුරු සමුදායක් ථේර අපදානයෙන් හෙළිවේ. යශෝධරා තෙරණිය සිය 78 වන උපන් වර්ෂය වන විට පිරිනිවන් පෑමට තීරණය කරනු ලැබුවා ය. නන්දා, සිය පුත් රාහුල, අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා, සුදොවුන් රජ, මහා ප්‍රජාපති ගෝතමිය, ආදී බොහෝ දෙනෙක් මේ වන විට පිරිනිවන් පා තිබීම, ඇය මෙවන් තීරණයක් ගැනීමට හේතුවක් වූවාසේ ය.

භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ යශෝධරා තෙරණිය "මහා වීරයන් වහන්ස, මම අද රාත්‍රියේ පිරිනිවන් පෑමට අදහස් කරනවා. සංසාරය පුරාවට ම මම ඔබවහන්සේ සමඟ මෙම ගමන සපැමිණියෙමි. ඔබවහන්සේට මගේ සිත කය වචනය යන තිදොරින් කිසියම් වරදක්, අවැඩක් සිදුවූවා නම් ඒ සියල්ලට මට සමාව ලැබේවායි" අයැද සිටියා ය.

භාග්‍යවතුන් වහන්සේ වෙතින් ඇයට පිරිනිවන් පෑම සඳහා අවසරය ලැබිණි.

ත්‍රිපිටකයෙහි ථේර ආපදානයෙහි යශෝධරා තෙරණිය විසින් ඉදිරිපත් කෙරෙන ස්වයං ආත්ම කථනයෙන්, එම තෙරණියගේ මුළු ජීවිත වෘත්තාන්තයම හකුළුවා දක්වන සුළු ය.

යශෝධරා තෙරණිය පිරිනිවන් පෑමට භාග්‍යවතුන් වහන්සේ වෙතින් ලද අවසරයෙන් අනතුරුව රජගහ නුවර මනරම් මෙහෙණවර

කළ වැඩ විසූ යශෝධරා තෙරණියට මෙබඳු විතර්කයක් පහළ වූයේ ය.

ඒ සමයෙහි රම්‍ය වූ සමෘද්ධිමත් රජගහ නුවර එක්තරා නරනායක වූ තථාගතයන් වහන්සේ වැඩ විසූහ.

නන්දය, රාහුලභද්‍ර, එසෙයින් ම අග්‍ර ශ්‍රාවකය, සුද්ධෝදන මහ රජ ය, ප්‍රජාපතී ගෝතමී ය, ප්‍රසිද්ධ මහ තෙරණුවෝ ය, මහත් ඍද්ධි ඇති තෙරණියෝ ය, යන ඔබ ආස්‍රව රහිත වූවාහු, (තෙල් රහිත) පහන් සිළු සෙයින් ශාන්තියට ගියාහූ ය.

ලෝකනාථයන් වහන්සේ ජීවමන කල්හි ම, මම් ද, ශාන්තියට යන්නෙමි’යි සිතා තමන් ආයු පමණ බලන්නී, ක්‍ෂය ව ගිය ආයු සංස්කාර දැක පා සිවුරු ගෙන සිය අසපුවෙන් නික්ම, සිය දහස් ගණනක් මෙහෙණන් විසින් පෙරටු කරන ලද මහත් ඍද්ධි ඇති මහත් ප්‍රඥා ඇති ඒ යශෝධරාවෝ සම්බුදු රජුන් කරා එළැඹුණාහ.

සම්බුදු වැඳ සක් ලකුණු ඇති භාග්‍යවතුන් වහන්සේ අසළ පසෙක හිඳ මෙවදන් බිනූහ.

මහා මුනි තුමනි, ඔබ වහන්සේට සැළකරමි. මම අටසැත්තෑ හැවිරිදි වෙමි. මෙසේ පැසුළු වයස මරණ නමැති ප්‍රපාතයේ ඉමට පැමිණ සිටිමි.

මාගේ වයස මුහුකුරා ගොසිනි. මාගේ ජීවිතය මද කල් පවත්නේය. ඔබ වහන්සේ හැර යන්නෙමි. මා විසින් තමහට පිහිටා කරගන්නා ලදී.

මරණ තෙමේ පශ්චිම කාලයෙහි ආයු පෙළයි. මහා වීරයන් වහන්ස අද රැය නිවනට පැමිණෙන්නෙමු.

මුනිවරයන් වහන්ස, යම් කෙනෙකු ජාති - ජරා - ව්‍යාධි - මරණ නැත්ද, යම් කෙනෙකැ ගිය සත්ත්ව නො පැනේ ද, වීරයන් වහන්ස, මම එහි යන්නෙමි.

මෙහි යම් පමණ පිරිස් කෙනෙක් ශාස්තෘන් වහන්සේ වෙතැ රැස් ව හිඳිත්, මා කළ දොසක් දනිත් නම් මුනිඳුන් හමුවේ කමත්වා!

මහ වීරයාණනි, සැළකරමි, සසර සරා ඇවිදුනාහු සෙමෙහි ඔබවහන්සේ කෙරෙහි මාගේ දොසක් වී නම් එය ක්‍ෂමා කළ මැනවි.

ඇගේ වදන් අසා මුනීන්ද්‍රයන් වහන්සේ මෙසේ වදාළ සේක. නිවනට යන තොපට මතු කුමක් නම් කීය.

මාගේ අනුසසුන් කරන්න, ඍද්ධි ද දක්වා, සසුන්හි ලා සියළු පිරිස් හි සැක ද සිඳවා යන්න යැයි බුදුන් වහන්සේ වදාළහ.



මුනිඳුන්ගේ ඒ වදන් අසා ඒ යශෝධරා මෙහෙණ ඒ මුනි රජුන් වැඳ මෙවන් අදහසක් පළ කළහ.

වීරයන් වහන්ස ශාක්‍යකුලයෙහි උපන් ස්ත්‍රී ලක්‍ෂණයෙහි පිහිටි මම යශෝධරා වෙමු. ගිහි ගෙයිදී ඔබට භක්තිමත්  පතිනි වීමි.

වීරයාණනි, මම ඔබවහන්සේගේ නිවසෙහි එක් ලක්‍ෂ අනූ දහසක් කාන්තාවනට ප්‍රමුඛ වීමී. සියල්ලට ඉසුරු ද වීමී.

රූප ආචාර ගුණයෙන් යුතු යොවුන් වියේ සිටී මම ප්‍රියතෙපුල් ඇති වීමී. මිනිසුන් දෙවියන් පුදන සෙයින් සියල්ලෝ මා පුදත් .

ශාක්‍ය පුත්‍රයන්ගේ නිවෙස්හි සහස්‍ර කන්‍යාවනට ප්‍රමුඛ වීමේ සමාන සුව දුක් ඇති, ඒ කන්‍යාවෝ නඳුනුයනෙහි දේවතාවන් බඳු වූහ.

කාමධාතු ඉක් මැ වූවා රූපධාතතුහි සිටියා වෙමි. ලෝකනාථයන් තබා රූපයෙන් මට සමාන වූවෙක් නොවීය.

යශෝධරාවෝ මේ ආදීය කියා අහසට පැන නැඟ බුදුරදුන්ගේ අනු දැනුමෙන් නොයෙක් ඍද්ධි දැක්වූහ.

කය සක්වළ හා සම හිස උතුරුදෙසින් වූ කුරු දිවයින පියාපත් යුවළ (පූර්වවිදෙහ-අපරගොයාන) දෙ දිවි ය සිරුරින් දඹදිව ය.

පිල් කළඹ දකුණු සයුරය, පියාපත් නානා (වෘක්‍ෂ) ශාඛාය දෙයැස සඳගිරය, මෙරුපර්වතයෙන් ශිඛා ය.

තුඩ සක්වළ ගිරය, මෙබඳු ලිහිණි රුවක් මවා දඹදිවට සලකුණු වූ දඹරුක් මුල් සහිත වැ උපුටා (එයන්) පවන් සලමින් එළැඹැ ලෝකනාථයන් වහන්සේ වඳිති.

ඇත්රුවක් ද, එසෙයින් ම අස්රුවක් ද, පව්වක් ද, මහසයුර ද, එසේ ම සඳු ද, හිරු ද, මෙරුව ද සක්රුව ද දැක්වූහ.

වීරයන් වහන්ස, මම යශෝධරා ය, චක්‍ෂුර්මතුන් වහන්ස, පා වඳිමි’යි පවසමින් දහසක් ලෝදා විකසිත පද්මයකින් වැසූහ.

බ්‍රාහ්මවේෂ ද, මවා ශූන්‍යතා ප්‍රතිසංයුක්ත ධර්ම දේශනා කළා ය. වීරයාණනි, මම යශෝධරා ය. චක්‍ෂූර්මතාණනි, ඔබගේ පා වඳිමි.

මහා මුනිතුමනි, ඍද්ධියෙහි ද, දිබ්බසෝතධාතුවෙහි (දිව කන්හි) ද වසී වෙමි. මෙරමාසිත් දන්නා නුවණෙහි ද වශී වෙමි.

පෙර විසූ කඳ පිළිවෙල දනිමි, දිවැස් පිරිසිඳ කරන ලදී. සියළු ආශ්‍රය ක්‍ෂීණාස්‍රය. දැන් පුනර්භවයෙක් නැත.

මහා වීරයන් වහන්ස, අර්‍ථ - ධර්ම - නිරුක්තියෙහිද, එසෙයින්ම ප්‍රතිභානයෙහිද ඥාණය ඔබවහන්සේ වෙතින් ලදී.

මුනිතුමනි, පෙරැදැගි, කළ මාගේ යම් කුසලකර්මයක් වේද එය සිහි කරනු මැනැවි. මහා වීරයාණනි, ඔබවහන්සේ වෙනුවෙන් විසින් පින් රැස් කරවන ලදී.

මහා වීරයාණනි, අභව්‍යස්ථාන හැරපියා අනාචාර දුරු කොට ඔබ වහන්සේ වෙනුවෙන් මා විසින් ජීවිත පරිත්‍යාග කරන ලදී.

මහා මුනිතුමනි, නොයෙක් කෙළ දහස්ගණන් දැහි භාර්යයා පිණිස මා දුනනහු. ඔබවහන්සේට වැඩ පිණිස එහිලා දොම්නස් නොද වෙමි.

නොයෙක් කෙළදහස් අත්බව්හි (අනුනට) උපකාර පිණිස මා දුන්නහු. මහාමුනිතුමනි, ඔබවහන්සේට වැඩ පිණිස එහිලා දොම්නස් නොද වෙමි.

මහාමුනිද්‍රයාණන් වහන්ස, අනේක කෝටි සහසු ජාතීන්හි, ආහාර සඳහා මා යක්‍ෂ රාක්‍ෂාදීන්ට දුන්නාහු, ඔබවහන්සේට පිණිස එහිලා විරුද්ධ මනස් ඇති නොවෙමි.

නොයෙක් කෙළ දහස් ජාතිවළැ ඔබ වහන්සේ වෙනුවෙන් මාගේ ජීවිතය පරිත්‍යාග කළෙමි. (සිංහව්‍යාඝ්‍රාදීන්ගෙන් වන) බියෙන් මුදවන්නේ මැයි මාගේ ජීවිතය දුනිමි.

ශරීරගත පළඳනා ද, නන්වැදැරුම් නොයෙක් වස්ත්‍ර ද ස්ත්‍රී ආභරණ ද මහා මුනිතුමනි, යදිනට දෙමි.

මහා මුනිතුමනි, ධනධාන්‍ය පරිත්‍යාග කළෙමි. ගම් නියම්ගම් ද, කෙත් ද, දූපුත්තු ද පරිත්‍යාග කරන ලදහ.

මහා වීරයාණනි, සඬඛ්‍යා රහිත ඇත්තු ද, අස්හු ද, ගවයෝ ද, දැස්සෝද, සේවිකාවෝද, මා විසින් පරිත්‍යාග කරන ලදහ.

මහ වීරයාණනි, සසරැ විවිධ ජාතිවලැ අපමණ වූ නන් වැදැරුම් බොහෝ දුක් ඔබවහන්සේ වෙනුවෙන් විඳුනා ලදහ.

මහ මුනිතුමනි, සුවපත් වූවා (උදම්ව) නොද සතුටු වෙමි. දුකෙහිදී නොද දුමනස් ඇති වෙමි. ඔබවහන්සේ වෙනුවෙන් තැන්හි තුලා බඳු (සම) වෙමි.

සම්බුදුරජාණන් වහන්සේ මඟ පිළිවෙලින් යම් ධර්මයක් ගෙනහැර වදාළ සේක් ද, මහා මුනීද්‍රයන් වහන්සේ සුවදුක් අනුභව කොට (ඒ) සම්මා සම්බෝධියට පැමිණ සේක.



බ්‍රහ්මදේව නම් වූ ලෝකනායක ගෞතම සම්බුදුරජාණන් වහන්සේ අපි දෙදෙනාම දුටුම්හ. (අපර භාගයෙහි පහළ වූ) අන්‍ය ලෝකනාථයන් වහන්සේගේ සමාගම් ද 'ඔබවහන්සේ විසිනුදු මා විසිනුදු ලබන ලද ය.

මහ මුනිතුමනි, බුදුකුරු දහම් සොයන ඔබවහන්සේට මම පරිවාරිකා වීමි.

මෙ කපින් චතුරාසංඛ්‍යයක් අධික කොට ඇති සුව හස්වැනි කප්හි ලෝකනායක වූ දීපංකර බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

පසල් දනව්වෙක (දනෝ) තථාගතයන් වහන්සේට නිමන්ත්‍රණ කොට ඔබ වඩනා මඟ තුටුසිත් ඇත්තාහු පිරිසුදු කෙරෙත්.

එ සමයෙහි සුමේධ නම් බ්‍රාහ්මනයෙක් වූයේ ය. හේ සියල්ල දක්නාසුළු වඩනා බුදුරදුනට මඟ ද සකසා දුන්නේ ය.

එකල්හි මම බමුණුකුලෙහි උපන්නෙමි නමින් සුමිත්තා නම් වූ කන්‍යාවක් වීමී. (තථාගත) සමාගමයට ද එළැඹුනේවෙමි.

ශාස්තෲන් වහන්සේ පුදනු සඳහා උපුල් අටමිටක් රැගෙන ගිය මම ජනසමාගම මධ්‍යයෙහි හුන් උග්‍ර තපොව්‍රත ඇති සෘෂී කෙනෙකුන් දුටිමි.

එසඳ වැහැරී මතුයෙහි හුන් අතිකාන්ත වූ මනෝහර වූ සෘෂිහු දැකැ මාගේ ජීවිතය සඵලයැ යි සීති.

එදවස (සුමේධ) සෘෂිහුගේ එල සහිත ඒ ජීවිත (ජීවිත පරිත්‍යාග සඞඛ්‍යාත) පරාක්‍රමය දුටිමි. පූර්වපුන්‍යාකර්ම හේතුයෙන් සම්බුද්ධයන් වහන්සේ කෙරෙහි මාගේ සිත ද ප්‍රසන්න වී.

උදාර මනස් ඇති සෘෂිවරයා කෙරෙහි බෙහෙවින් සිත පහදවාලිමි. තපස්වීතුමනි, දිය යුතු අන්දැයක් නො දක්මි, තොපට මල් දෙමි.

තවුසාණනි, මේ උපුල් අට මිටෙන් පස් මිටෙක් තොපට වේවා. තුන් මිටෙක් මට වේවා, එයින් (අපගේ ප්‍රාර්ථනා) සිද්ධිය සම වේවා. සෘෂීතුමනි, තොපගේ බුද්ධත්වය පිණිස ද වේවා!

සුමේධ තවුස් තෙමේ ඒ මල් රැගෙන බුදුබව පිණිස ජනසන්නිපාත මධ්‍යයෙහි වැඩම කරන මහා යශස් ඇති මහාර්ෂී බුදුරජාණන් වහන්සේ පිදුයේ ය.

ජනසමාගම මධ්‍යයෙහි සිටි උදාරසිත් ඇති සෘෂීහු දැක මහාවීර වූ දීපංකර මුනීන්ද්‍රයන් වහන්සේ මෙසේ වදාළසේක.

මෝ තොප හා සම සිත් ඇති, සමකර්ම ඇති, සම ක්‍රියාකරන්නිය වෙයි. මහා තවුස, තොපට වැඩ පිණිස ක්‍රියා යෙන්ද ප්‍රිය වේ.

මනා දැකුම් ඇති, මොනොවට ප්‍රිය වූ, මන වඩන, ප්‍රිය තෙපුල් බණන, ඒ තොපගේ ධර්මයට දායාද වූ ප්‍රිය භාර්යාවක් වෙයි.

යම්සේ ධනහිමියෝ භාණ්ඩසමුද්ගය (ධනාගාරය) රකිත් ද, එසෙයින් කුසල් දහම් පිළිබඳ සමුද්ගය මෝ තොමෝ රකින්නී ය.

ඒ තොපට අනුකම්පා කරමින් පාරමී ධර්ම පුරන්නී ය. පඤ්ජරය (කූඩුව) බිඳ පියා පලා යන සිංහයෙකු සෙයින් මෝ අර්හත්වයට පැමිණෙත්.

මෙකපින් පෙර අපරිමේය කපෙක්හි (දීපංකර) බුදුරජාණන් වහන්සේ මට යමක් ප්‍රකාශ කළසේක් ද, එවදන් අනුව සතුටුවන මම් එසේ කරන්නට වීමි.

ඒ බුදුන් කෙරෙහි සිත පහදවාලිමි. ඒ කුශල කර්ම බලයෙන් අපමණ දෙව්මිනිස්දැහි උපත ලබා දෙවියන් කෙරෙහි දූ මිනිසුන් කෙරෙහිදූ සුවදුක් වළඳ කොට පැසුළු භවය එළැඹ සිටි කල්හි ශාක්‍ය කුලයෙහි උපන්නෙමි.

රූ ඇති වෙමි. භෝග ඇති වෙමි. යශස් හා සිල් ඇති වෙමි. එසෙයින් සර්වාංග සම්පත් ඇති වෙමි. කුසල් දහම්හි අතිසත්කෘතද, (බෙහෙවින් කරන ලද සත්කාර ඇති) වෙමි.

ලාභ ය, ගුණකර්මය, සත්කාරය, ලෝකධර්ම සමාගමය යන සියල්ල ලබමි. දුක්ඛිත වූ ද සිතෙක් නැතී බිය රහිත ව වෙසෙමි.

සසර කලකිරී දහසක් පිරිනිවන් යුක්තව ශාසනයෙහි පැවදි වීමී. පැවදිව, පළිබෝධ රහිත වීමී.

ගිහිගෙය හැර පියා අනගාරික සංඛ්‍යාත ශාසනයෙහි පැවදි වීමි. අඩමසක් නොපත් කල්හි සිව්සස් අවබෝධ කළෙමි.

බොහෝ දෙන සාගරයාගේ රළ මෙන් නොයෙක් සිවුරු ද පිණ්ඩපාතයද, ගිලන්පසද සෙනසුන්ද, එළවත්.

මාගේ සියළු කර්මයන් ක්ෂය වීය. පසැස් ඇති සර්වඥයෙනි, ඔබවහන්සේගේ පාසඟුළුවන් වදිමි.



## iii. කාළුදායි අමාත්‍ය

**ඛුද්දක නිකායෙහි අපදාන පාලියෙහි**, කාළුදායි ථෙරපදානය තුළින් අපට, සිදුහතුන් මෙලොවට බිහිවූ දින ම උපත ලද කාළුදායි ඇමැති පිළිබඳ ව තොරතුරු මැනවින් අධ්‍යයනය කළ හැකි ය.

"එකල්හි පෘථිවි තොමෝ මහත් නාද පැවැත්වූහ. මේඝයෝ ගර්ජනය කළහ. දෙව් බඹ මිනිස් ඇතුළු අසුරයෝ සාධුනාද පැවැත්වූහ.

කාරුණික වූ භාග්‍යවතුන් වහන්සේ ආශ්චර්යයකි. සදහම් දෙසුම ද ආශ්චර්යයකි. භව සයුරෙහි ගිළී ගිය පිරිස් මුදවා ගැනීම ද ආශ්චර්යයකි.

මෙසේ දෙව්බඹුන් සහිත වූ මිනිසුන් ප්‍රීතියෙන් ඇලලී ගිය මොහොතක භාගයවතුන් වහන්සේ කුල පහදවනුවන් අතුරෙන් අග්‍ර යයි ශ්‍රාවකයෙකු පැවසී ය.

එකල්හි කාළුදායි ථෙර පෙර භවයේදී හංසවතී නගරයෙහි ඇමැති කුලයක උපත ලැබ, දුටු දුටුවන් පහදවන්නා වූ, දැකුම්කළු වූ, සමෘද්ධ වු ධනධාන්‍ය ඇති කෙනෙක් විය.

එක් දිනක මොහු සංඝාරාමයට එළඹ, බුදුරජුන්හට වැඳ මිහිරි දහම අසා තාදී ගුණ ඇති ඒ බුදුරජුන් හට සත්කාර කොට, උන්වහන්සේ පා මුල වැඳ වැටී මෙවන් ප්‍රාර්ථනයක් කළේ ය. "මුනීන්‍දයන් වහන්ස, ඔබ වහන්සේ විසින් කුල පහදවනුන් අතුරෙහි අග්‍රය යි යම් ශ්‍රාවකයෙක් පසසන ලද, වීරයන් වහන්ස, මම ද ශ්‍රේෂ්ඨ බුදුවරයෙකුගේ සසුනෙහි එබඳු (කුලප්පසාදක භික්ෂූන් අතුරෙන් අග්‍ර වූ) ශ්‍රාවකයෙක් වේ නම් මැනවි." එකල්හි මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ පුතණුවෙණි, නැගිටිවු, ඒ මනදොළ ලබනෙහි ය, බුදුවරයෙකු කෙරෙහි සත්කාරයක් කොටැ කෙසේ නම් නිෂ්ඵල වන්නේ දැයි" වදාළේ ය.

"මෙයින් මතු සියක් දහස්වැනි කපෙහි ඔක්කාකකුලයෙහි උපදනා වූ, නමින් ගෞතම නම් වූ ශාස්තෘන් කෙනෙක් ලොව පහළ වන්නේය.

උන්වහන්සේගේ ධර්මයෙහි මනාව පිහිටියා වූ උදායි නම් වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් පහළ වන්නේයැ'යි ද වදාළේ ය.

එයින් අපමණ සතුටට පත් ඔහු, මෙත් සිත් පෙරදැරිව බුදුරජුන් හට සිවුපසයෙන් උවටැන් කළේ ය.

ඒ කර්ම විපාකය හේතු කොට ගෙන ද චිත්ත ප්‍රීතිය හේතු කොට ගෙන ද හෙතෙම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොව උපත ලැබී ය.

අවසන් භවයෙහි රම්‍ය වූ කපිලවස්තු නගරයෙහි සුද්ධෝදන මිහිපතිහුගේ මහ ඇමැති කුලයෙහි උපත ලැබීමට තරම් හේ භාග්‍යමත් විය.

සිද්ධාර්ථ බෝසතුන්  සව් ලොවට හිත පිණිස ද සුව පිණිස ද රම්‍ය වූ ලුම්බිණි සල්උයනෙහි දී මව් කුසින් බිහි වී ද,

එදවස්හී ම ඔහුගේ උපත ද සිදුවිය. බෝසත් සිදුහතුන් සමඟ ම වැලි කෙළියේ පටන් එකට හැදී වැඩිණි. ඔහු සිදුහතුන්ට ප්‍රිය වූ දයාවත් වූ, අතිදක්ෂ වූ, ව්‍යක්ත වූ සගයෙක් විලසින් කටයුතු කළේ ය.

වයසින් එකුන් තිස් හැවිරිදි වූ සිදුහත් බෝසත් තෙමේ ගිහිගෙන් නික්මුණේ පැවදිව, බුද්ධත්වය ලද පසුව, කාළුදායි සුදොවුන් නිරිඳුන්ගේ ඉල්ලීම මත බුදුන් වහන්සේ බැහැදැකීමට ගියේ ය.

එහිදී බුදුරජුන් දැකැ පැවදිව හෙතෙම රහත් බව ලැබීය.

අනතුරුව බුදුරජුන් ඇයැද කපිලවස්තු නගරයට  උන්වහන්සේ වැඩමවීමට මුලිකව ක්‍රියා කරන ලද්දේ ද කාළුදායී ථෙරුන් විසිනි.

ඒ ගුණයෙන් සතුටුව ගෞතම බුදුරජුන් මහපිරිස් මැද කාළුදායි ථෙර කුල පහදවනුන්ගෙන් අග්‍රස්ථානයෙහි තැබී ය.

## iv. ඡන්න ආමාත්‍ය

සුද්දෝදන රජුගේ දාසියකගේ කුස පිළිසඳ මහ බෝසතාණන් වහන්සේ උපන් දින ම ඉපිද ‘ඡන්න’ නමින් වූයේ ය. බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට වැඩම වූ අවස්ථාවෙහි ඇති වූ ශ්‍රද්ධාවෙන් පැවිද්ද ලැබූ මුත් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ ප්‍රේමයෙන් ‘බුදුන් අපගේ ය, ධර්මය අපගේ ය’ යනාදි වශයෙන් මමත්වය උපදවා ගෙන ඒ දැඩිවූ සෙනෙහස විඳ ගැනීමට නොහැකිව මහණදම් නිසි පරිදි නොපිරි බව ත්‍රිපිටකයේ දැක්වේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පානා තෙක්ම මෙසේ මමත්වයෙන් කටයුතු කළ හෙයින් ද සාසනික දියුණුවක් නොලබා තිබූ හෙයින් බුදුන් වහන්සේ පිරිනිවීමට පෙර මේ ඡන්න හිමියන් වෙත ‘බ්‍රහ්මදණ්ඩය’ පනවන ලෙස ආනන්ද හිමියන්ට වදාළ විට මෙයට සංවේගයට පත් ඡන්න හිමියෝ එම දැඩි සෙනෙහස සිඳ දමා විදසුන් වඩා නොබෝ දිනකින් ම රහත් බවට පත්වූ සේක.

“මම පෙර සිටු කුමරෙක්ව ඉපිද සිට කලෙක සිද්ධර්ථ බුදුරජාණන් වහන්සේ එක්තරා රුක්මුලක වැඩහිදිනු දැන පැහැදුනු සිතින් මුදුවූ පහස් ඇති තණ ඇතිරිල්ලක් අතුරා පූජා කොට හාත්පස



මල් ද විසුරුවා කළ ඒ මහා පින්කමේ ආනිසංසයෙන් දෙව්ලොව ඉපිද පසුව තව තවත් නිවන පතා පින්කම් කොට කාමසුගතීන්ම උපත ලැබ පශ්චිම ජීවිතයෙහි මෙසේ උපත ලැබී” යනුවෙන් ඡන්න තෙරුන්ගේ ථෙරගාථා වර්ණනාවේ සඳහන්ව ඇත.

## v. කන්ථක අශ්වයා

මහ බෝසතාණන් වහන්සේ උපන් දා ම උපත ලැබූ සප්ත සහජාත වස්තු අතර මේ අශ්වයා ද එක් වස්තුවකි. උන්වහන්සේ මහා අභිනිෂ්ක්‍රමණයට සම්බන්ධ වූ මේ අසුමහ බෝසතාණන් වහන්සේ හිසකෙස් කපා දමා රාජාභරණ මුදා හැර වනගත වනු දැක හදවත පැළී මිය පරලොව ගිය බව බුද්ධවංශ අටුවාවේ ගෞතම බුද්ධ වංශ වර්ණනාවේ සඳහන්ව ඇත.



කන්ථක අසු - සෙනෙහස

විමාන වත්ථුවේ කන්ථක පිළිබඳව මෙවැනි සඳහනක් ඇත. තම ස්වාමියාගේ දෙපා ලෙවකෑ අසු වහා වීරයන් යන දෙස හඬමින් බලා සිට ළය පැළී මියගොස් අනේක සැප ඇති තව්තිසා භවනෙහි ඉපිද මුගලන් තෙරුන් වහන්සේ හමුවූ අවස්ථාවක මේ සියලු විස්තර කියා මහබෝසතාණන් බුදුවූ බව අසා ඒ මහෝත්තමයන් මාගේ සිරසින් වඳින බව දන්වන ලෙස මුගලන් මහ රහතන් වහනසේට කන්ථක දේවතාව පැවසී ය. පසුව මේ සක්වල එවන් පස්මරුන් දිනූ ඒ බුදුරජාණන් වහන්සේ දක්නට මම ද යන්නෙමියි සිතා මේ දෙව්පුත් බුදුරජාණන් වහන්සේ වෙත එළඹැ ධර්මය අසා දහම් ඇස පිරිසුදු කරගත්තේය. එනම් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන ත්‍රිවිධ සංයෝජන නසා සෝවාන් විය. අනතුරුව බුදු සිරිපා වැඳ එහි ම අතුරුදහන් විය.

## vi. ජය ශ්‍රී මහා බෝධිය

සිද්ධාර්ථ ගෞතම බෝධිසත්වයන් වහන්සේ දස පෙරුම් පුරා, බුද්ධත්වය ලබා ගැනීමේ ධ්‍යානයෙන් වැඩ සිටි උතුරු ඉන්දියාවේ උරුවෙල් දනව්වෙහි ගයාහී (බිහාර්) ශ්‍රී මහා බෝධිය මිහි මතින් පැන නැගුණේ, සිද්ධාර්ථ කුමාර උත්පත්තිය සිදුවූ මොහොතේ ම බැව් බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ. පාලි භාෂාවෙන් අස්සත්ථ වශයෙන් ද, සංස්කෘත භාෂාවෙන් අශ්වත්ථ ලෙසින් ද, හැඳින්වෙන බෝධීන් වහන්සේ දේශීය වශයෙන් ඇසතු, ඇහැටු යන නමින් ද හැඳින්වේ. Ficus Rligiosa යන උද්භිත විද්‍යානාමයෙන් හැඳින්වෙන ඇසතු වෘක්ෂයට බෝධිය යන නම ව්‍යවහාර වන්නට වූයේ ගෞතම සිද්ධාර්ථයන් එම වෘක්ෂය මූල වැඩහිඳිමින් ලොවුතුරා බුද්ධත්වයට පත්වූ බැවිනි. බෝධි යන්නෙන් ගම්‍ය වන ධ්වනිතාර්ථ සමූහයකි. බෝධි, සම්බෝධි, අභිසම්බෝධි යන සමාන අරුත් දෙන පදවලින් සිදුහත් තවුසානන් විසින් සාක්ෂාත් කළ යථා භූත බුද්ධ ඥානය ද, එහි ප්‍රතිවේධ කරවනු වස් ප්‍රගුණ කළ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ද, චතුරාර්ය සත්‍යය ද බෝධි යන්නෙන් ගම්‍ය වේ.

ක්‍රි.පූ. 3 වැනි සියවසේ මැද භාගයේදී, දඹදිව පිහිටි ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවේ අනුරපුරය වෙත වැඩමවන ලදී.

ලොව පැරණිතම ලිඛිත ඉතිහාසයක් ඇති, අති වන්දනීය වූ එකමැ වෘක්ෂය ලෙස ශ්‍රී මහා බෝධියට ලොව අද්විතීය ස්ථානයක් හිමි වේ.



"ඉමේ ඒතේ මහා බෝධි

ලෝකනාතේන පූජිතා"

යන ගාථා පාඨයෙන් කියැවෙන පරිදි භාග්‍යවතුන් වහන්සේ පවා ශ්‍රීමහා බෝධීන් වහන්සේට පූජෝපහාර දක්වා ඇත.

භාග්‍යවතුන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ගයාහි පිහිටි ශ්‍රී මහා බෝධීන් මූලයෙහි දෙසතියක් ම ගත කළ සේක. බුද්ධත්වයෙන් පළමු සතියේදී ශ්‍රී මහා බෝධි මූලයෙහි පර්යංකයෙන් වැඩහිඳිමින් සම්මා සම්පත්තියට සම වැද හුන් සේක. බුද්ධත්වයෙන් දෙවන සතියේදී ශ්‍රී මහා බෝ සමිඳුන්ගේ ඊසාන දෙස සිට තමන් වහන්සේට බුද්ධත්වය ලබා ගන්නට සෙවන ලබා දුන් බෝධීන් වහන්සේ වෙත කෘතවේදීත්වය පළ කරමින් අනිමිස ලෝචන පූජාවෙහි නිරත වූ සේක.

## vii. සතර මහ නිධානය

මෙම සතර මහ නිදානය (මහ බෝසතුන් සමඟ එකදා බිහිවූ) සප්ත සහජාන වස්තුන් ලෙසින් ද සැලකේ.

මේ පිළිබඳව විස්තර ථේරගාතා, ජාතක වංශ අටුවාවල සඳහන් වේ.

පහත විස්තර වන්නේ සිවු මහ නිධානයන් හී ප්‍රමාණයන් ය.

සංඛ නිධානය ගව්වක් විශාල බවත්,
එල නිධානය අඩ ගව්වක් විශාල බවත්,
උත්පල නිධානය ගව් තුනක් බවත්,
පුණ්ඩරික නිධානය යොදුනක් බවත්,

ඒවායෙහි ද ගත් ගත් තැන් නැවත පිරෙන බවත් සඳහනි. මොවුන් සතර මහා නිධානයක් (හිරන්‍ය - ස්වර්ණයක්) අත්හැර මහබෝසතානන් වහන්සේ පැවිදි වූ උතුමෙක් ලෙස ම.නි. 2 - වංකි සූත්‍රයේදී බමුණා අනෙකුත් බමුණු පිරිසට කළ විස්තරයක් මෙම සූත්‍ර අටුවාවේ එයි. මෙහි හිරණ්‍ය නම් අමු රන් ය. ස්වර්ණ නම් පිරිසුදු කළ රන් ය. ස්වර්ණාභරන, රන් ආභරණ වේ.

හයවන පරිච්ඡේදය

# සිදුහත් ගිහි වත

## 14. කුමරු උගනී අකුරු සොඳවා

ත්‍රි වේදයෙහි මෙන් ම වේදාංගයන් පිළිබඳ පදප්‍රාප්ත උදිච්ච ගෝත්‍රයේ විශ්වමිත්‍ර (සර්වමිත්‍ර) ඍෂිවරයා, සිදුහත් කුමරුගේ ඇදුරුතුමා වීය.

සුබ දිනයක, සුබ මොහොතක සිදුහත් කුමරු විශ්වමිත්‍රයන්ගේ සිප්හලට ඇතුළු විය. එකෙණෙහි ම මහත් ආලෝකයක් පතුරවමින් තුසිත දෙව්ලොව සිට පැමිණි සුභංග දෙවිදුන් විශ්වමිත්‍ර පඬිවරයාට සැළකර සිටියේ, කුමරු සියළු සිප් සතර මැනවින් දන්නා බැවින් සෙසු දරුවන්ට ද ඉගැන්වීම කිරීමට හේ සමත් බව ය. සඳුන් පුවරුවක් හා රනින් කළ කුරක් අතට ගත් සිදුහත් කුමරු 'ගුරුතුමනි, ඔබ මට ඉගැන්වීමට අදහස් කරන්නේ කුමන අක්ෂර වර්ගයක්ද? එය, බ්‍රාහ්මී ද, පුෂ්කරයන්ද,' ආදී වශයෙන් අකුරු සුසැට වර්ගයක ම නම් කියමින් විමසුවේ ඇදුරන් මවිතයට පත්කරලමිනි. සිදුහත් කුමරුන් විසින් බ්‍රාහ්මී නම් අක්ෂර විශේෂයක් නිපද වූ බැව් ක්ෂේමේන්ද්‍ර පඬිතුමන් විසින් රචිත බුද්ධජන්ම නම් පුස්තකයේ සඳහන් වේ.



හැඩයට අකුරු ලියමින් නිවැරදිව පවසති



එයින් ඉමහත් විශ්මයට පත් වූ ගුරුතුමා, සිප්හලට පැමිණ අකුරු කරන්නටත් පෙර මේ කුමරුවා සියළු ශාස්ත්‍ර පිළිබඳව හසළ දැනුම් සම්භාරයක් ජන්මයෙන් ම රැගෙන ආ පින්වත් දරුවෙකු බවත්, ඔහු දන්නා ඇතැම් අක්ෂරයන්ගේ නම් පවා තමා මින් පෙර අසා නොතිබූ බවත් පැවසී ය.

සිදුහත් කුමරුන් සමග එහි පැමිණි දහසකටත් අධික අනෙක් කුමාරවරුන් සිප් සතර හැදෑරීමෙහි නිරත වූහ.

සිදුහත් කුමරුට යුද ශිල්පය හැදෑරීමට ක්ෂන්ති දේව නම් යුද ශිල්පයෙහි කෙළ පැමිණියෙකු ගෙන්වීය. 'යුද ශිල්පය මම ස්ව උත්සාහයෙන් ම උගනිමි'යි සිදුහත් කුමරු දැන්වූයෙන් ක්ෂාන්ති දේව විසින් අනෙක් කුමාරවරුන්ට යුධ ශිල්පය පුහුණු කරවන ලදි.

කුමරු තම මාමා කෙනෙක් වූ සුලභ ගෙන් හස්ති ශිල්පයත්, සහදේව ගෙන් දුනු ශිල්පයත් ඉගෙනගත් බව පැරැණි මූලාශ්‍රවල සඳහන් වේ. එමෙන් ම යොවුන් වියේ පසු වූ සිද්ධාර්ථයන් පිළිබඳ තොරතුරු ලලිත විස්තර යේ ඇතුළත්. කුඩා සිදුහත් කුමරුට රන් තලියක ආහාර පිළිගැන්වීමට කිරි මවට අවශ්‍ය විය. නමුත් තලියේ බර වැඩි වීම නිසා තිබූ තැනින් එසවීමට අපහසු විය. එය එසවීමට රජතුමන්ට, ඇමැතියන්ට, සේවකයන්ට හෝ ඇතුන්ට ද නොහැකි වූ නමුත් සිදුහත් කුමරු තනි අතින් රන් තලිය ඉවතට ගත් බවක් ද කියැවේ.



සිප් සතර පාමින් - මත් කළ දනෝ විස්මින්



සුව නිමැසී - වඩුන් රිසී
දන සුවසී - සතොසී

සිදුහත් කුමරුන් සමග වැලි කෙළියේ පටන්ම සුහද මිත්‍රයෙකු වූ වත්ස නම් බ්‍රාහ්මණ කුමරා ද, සිදුහත් කුමරුන් හා එකට අධ්‍යාපනය ලැබී ය. සිදුහත් කුමරු සක්විති රජ වෙතියි දැන සිටි ලිච්ඡවි රජ දරුවෝ ඇතකු අලංකාර ලෙස සරසා සිදුහත් කුමරුට තෑග්ගක් ලෙස කිඹුල්වත් නුවරට එවූහ. ඇතා සිදුහත් කුමරුට එවූ තුටු පඬුරක් බව දැනගත් දෙව්දත් කුමරු මිට මොළවා පහරක් ඇන ඇතා මරා දැමී ය. නමුත් ඇතාගේ මළ කඳ එතැනින් ඉවත් කිරීමට අපොහොසත් විය. නන්ද කුමරු එම ස්ථානය පසුකර යාමට පැමිණ, ඇත් මළකඳ නිසා මාර්ගය අවහිර වී ඇති බව දැන එය එතනින් ඉවතට ඇද දැමී ය. පසුව එහි පැමිණ සිදුහත් කුමරු ඇත් මළ කඳේ වලිගයෙන් ගෙන සත් පවුරකින් එපිටට විසි කළේ ය. මෙම ස්ථානයේ පසු කලෙක ස්තූපයක් ගොඩනැංවූ බැව් **තිබ්බතීය** වාර්තාවල සඳහන් වන අතර **චීන, දේශාටක හියුං සැන්** ද **හස්තිගර්ත** නම් වූ එම ස්ථානයේ දාගැබක් දුටු බැව් වාර්තා කර තිබේ.

මේ සිදුවීමෙන් සිදුහත් හා දෙව්දත් කුමරුන් අතර මත භේදයක් ඇති නොවූ බවත්, පසු කලෙක උයනේ දී සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් වෛරයක් ඇති වූ බවත් කියැවේ.

දෙව්දත් කුමරු තම උයනේ සිටිය දී පියාඹා යන පක්ෂියෙකු දැක ඌට විද්දේ ය. ඊතලය වැදුනු විහඟ සිදුහත් කුමරුගේ උයනට ඇද වැටිණි. කුමරු ඊතලය ගලවා බෙහෙත් දමා පක්ෂියා සුවපත් කළේ ය. පක්ෂියාට විද ඌ බිම හෙළුවේ තමා බවත්, ඒ සතා අයිති තමාට බවත් දන්වා දෙව්දත් දූතයෙක් එවී ය. නමුත් විහඟා අයිති වන්නේ ඌ විද මැරීමට තැත් කළ අයට නොව, ඌ මරණයෙන් ගලවාගත් තැනැත්තාට බව සිදුහත් පැවසීය. මේ සිදුවීම දෙව්දතුන් තුළ සිදුහත් කෙරෙහි මුල්වරට වෛරයක් පහළ වීමට හේතු විය.



නෙක අයුරු සිත් රූ - කැටයමින් කළ මහරූ



සිදුහත් කුමරුන් ජනිත දින, රෝහිණී නදී තෙර හටගත් කල්‍යාණ ගර්භ නම්වූ දැවැන්ත රුකක් වැසි සමයේ මුල් ඉදිරී ගඟ හරහා වැටී තිබිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ගඟ පහළ දෙව්දහ පුර ජනපදිකයන්ට ජලය නොලැබී යාමෙන් එහි ජනතාව මහත් අසීරු තාවයකට පත්විය. කාය ශක්තියෙන් පිරිපුන් සිදුහත් කුමරු ගඟ හරහා වැටී තිබූ එම දැවැන්ත රුක ඉවතට විසිකර දැමීමට සමත් විය. සිදුහත් කුමරුන්ගේ හිතවත් ම යහළුවා වූ, උදායි කුමරුවන්ට මෙහිදී සර්පයකු දෂ්ට කළ බවත්, එමගින් ඔහුගේ සිරුර කළු පැහැ ගැන්වුණු බවත් **වංශකථාවල** සඳහන් වේ. උදායි කුමරුවන්ගේ නම එතැන් පටන් කාළුදායි නමින් ව්‍යවහාරයට පත්විය.

## විවාහය :-

රජ කුමරුවකු ලෙසින් තමන් ගත කළ අධි සුඛෝපභෝගී ජීවිතය පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ විසින් ම කරන ලද විස්තරය අංගුත්තර නිකායේ සඳහන් වේ. "මට මාළිගා තුනක් විය. එකක් ශීත සෘතුව සඳහා ය. තවෙකක් ග්‍රීෂ්ම සෘතුවට ය. අනෙක වර්ෂා සෘතුවට ය. වැසි සාර මස මුළුල්ලේ කාන්තාවන් විසින් පවත්වනු ලබන තූර්යයෙන් පිනන ලද්දා වූ මම මාළිගයෙන් පහත නොබැසම වාසය කළෙමි."

බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයන් හි මෙම මාළිගා ත්‍රිත්වය පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුළත්. එම මාළිගා රම්‍ය, සුරම්‍ය, සුබ නමින් හැඳින්විණි.

හේමන්ත කාලය සඳහා සාදන ලද මාළිගය මහල් නවයකින් යුතු විය. ගිම්හාන සමය සඳහා වූ මාළිගය පස් මහළින් ද, වස්සාන සමය සඳහා වූ මාළිගය සත් මහළකින් ද යුක්ත විය. මෙසේ තම පුතු වෙනුවෙන් ප්‍රාසාද තුනක් තැන වූ සුදොවුන් පිය රජු, තම පුත්‍රයා විවාහ වීමට සුදුසු කාලය එළඹ ඇති බැව් කල්පනා කළේ ය. රජ කුමරා විවාහය සඳහා පතන්නේ කෙබඳු කුමරියක් දැයි ඔහුගෙන් විමසී ය. ලලිත විස්තරය කුමරුගේ කැමැත්ත කෙබඳු අන්දමේ තැනැත්තියකට ද යන්න විස්තර කරද් දී, පාඨකයගේ මනසේ චිත්‍රණය වන්නේ පරමාදර්ශී කාන්තාවකි.

'ඇය උසස් වංශයෙන් හා කුල පරපුරෙන් පැවතෙන යොවුන් වියෙන් හා රූ සපුවෙන් මෙන්ම ගුණ සමුදායෙන් අනූන විය යුතු ය. රූමත් වුවත් සිය රූ සපුව ගැන ආඩම්බර නොවිය යුතු ය. ඇගේ මව සහ සොහොයුරන් ජීවත්ව සිටිය යුතු ය. සත්‍යවාදී බව, කරුණාව, පරිත්‍යාගශීලී බව හා මනා පරීක්ෂාව ඇය තුළ තිබිය යුතු ය.

අපකීර්තිය, සදොස් බව, නපුරු බව, අහංකාරය හා අනුන්ගේ කීර්තිය නොඉවසීම ආදී දුර්ගුණ ඇය තුළ නොතිබිය යුතු ය. දිවි හිමියෙන් පතිවත රැකිය යුතුවා මෙන් ම, අන් තැනැත්තෙක් සිහිනෙන්වත් ප්‍රාර්ථනා නොකරන්නියක් විය යුතු ය. පසිඳුරන් පිනවීමෙහි ඇබ්බැහි නොවිය යුතු ය. ලද දෙයින් සතුටු විය හැකි අයකු විය යුතු ය. අනුන්ගෙන් ඉල්ලීමට පුරුදු නොවිය යුතුය. ප්‍රසිද්ධ දර්ශන බැලීමට ඇගේ කැමැත්තක් නොතිබිය යුතු ය. සිත, කය හා වචනය පිරිසුදුව ආගමික වතාවත්වල යෙදිය යුතු ය. සිය මයිලණුවන් හා නැන්දණියන් කෙරෙහි තම යුතුකම් ඉටු කළ යුතු ය. හිතෛෂීවන්ත බවත්, දැසි දසුන්ට ප්‍රසන්න බවත් ඇය වෙතින් ප්‍රකට විය යුතුය. සැමියාට පසුව නින්දට යෑමටත් සැමියාට ප්‍රථම අවදිවීමටත් පුරුදු විය යුතු ය. මවක මෙන් අවංකව ගෘහ පාලනය කළ යුතු ය. විවිධ ශාස්ත්‍ර හදාරා තිබිය යුතුවා මෙන්ම ලේඛන කලාවෙහි මෙන්ම කාව්‍යකරණයෙහි ද සමත් විය යුතු ය.'

කුමරු ඉදිරිපත් කළ ගුණාංගයන්ගෙන් පරිපූර්ණ තරුණියක සොයා බැලීමට සුදොවුන් නිරිඳුන් දූතයන් පිටත් කළහ. කුමාරයාට ස්වයංවර උත්සවයක් පිළියෙළ කළේ ය. කිඹුල්වත් පුර සියලු රාජකීය කුල කුමරියන්ට රාජකීය මඟුල් උයනට නියමිත දින පැමිණෙන ලෙස රාජ නියෝගයක් නිකුත් කළේ ය. පැමිණෙන සියලු දෙනාට ම රාජ කුමාරයා විසින් අගනා ත්‍යාග පිරිනමන බව ද ප්‍රසිද්ධ කළේ ය.

රාජ නියෝගය අනුව සිදුහත් කුමරුගේ ස්වයංවරය සඳහා ශාක්‍ය කුල කුමරියන් අලංකාර වස්ත්‍රයෙන් හා අගනා ආභරණයන්ගෙන් සැරසී රාජකීය මඟුල් උයනට දහස් ගණනින් රැස්වූහ. සිදුහත් කුමරු තමන් හමුවට ආ සියළු තරුණියන්ට වටිනා තෑගි පිරිනමා අවසන් විය. අවසානයේ කුමරු වෙතට පැමිණි රූමත් කුල කුමරිය අනෙක් සෑම අයෙකුට ම වඩා රූමත් බව සිදුහතුන්ට හැඟිණි. ඇය ඔහුගේ සිත දිනාගත් නමුදු දීමට සිදුහතුන් අත තෑග්ගක් ඉතිරි වී නොතිබිණි. අවසන තමාගේ ගෙළ වට පැළඳි වටිනා රන් මාලය ගලවා කුමරියගේ ගෙල පැළඳවීමට කුමරු ඉදිරිපත් විය. එමෙන්ම තම ඇඟිල්ලෙහි වූ වටිනා මුද්දද ගලවා කුමරියගේ ඇඟිල්ලෙහි පැළඳුවේ ය. මේ රූමත් කුමරිය අන් කිසිවක් නොවේ සුප්පබුද්ධ රජතුමාගේ දියණිය වූ භද්දකච්චායනා නොහොත් යශෝධරා කුමරියයි.

අතිශයින් රූමත් වූ, සුන්දර රජ කුමරියක් වූ යශෝධරාවන් සිංහල බෝධිවංශ කතතුවරයා දකින්නේ මිහි බට වන දෙව් ලියක් විලසිනි.



"තමලු ලිය සේ නිල් වු සුවඳ ඇත්තා වු කේශ කලාපයක් ඇති, පුන්සඳ මඩල සේ සෞම්‍ය මුහුණ ඇති, සුපිපි නිලුපුල් මල් සේ මනෝඥ වු ඇස් ඇති, දෙව්දුන් සේ වක් වු නිල් බැමි ඇති, බඳුවද පෙති සේ රත් වු අදර පල්ලවයන් ඇති, ස්වර්ණ කුණ්ඩලාභරණයෙන් හොබවන ලද කපෝලස්ථලයන් ඇති, පයෝධර නමැති ස්වර්ණ හංසයන් ගේ සඞ්ගමයට පැමිණියා වු ආකාශ ගංගා ජලධාරාවන් සේ බබළන්නා වු ඉතා මනෝඥ වු මුක්තාහාරයන් ඇති, වසාරාජි නමැති ලියට තෝතැන්නක් බඳු වු රුවන් කර්මාන්ත කරන ලද රනි මෙවුල් දමෙකින් වට කරන ලද ඝන පුළුලුකුල ඇති, ඇත් සොඬක් සේ ක්‍රමයෙන් සම්පුර්ණ ඌරු යුගලයක් ඇති, පියෙහි පියෙහි නාද කරන්නා වු මැණික්මය නුරුවළා ඇති, අලතා පිඩු සේ ළපලු ලිය සේ රත් වු පාද පද්මයක් ඇති, දිව්‍යාංගනාවක් හා කින්නරාංගනා සමුහයක් ද ඉක්මැ සිටියා වු, චතුරාංග සංගීතයෙන් ජය ගන්නා ලද දිව්‍ය නාටිකාවක් ඇති, හතළිස් දහසක් රාජ කන්‍යාවන් මධ්‍යයෙහි, සාගරයට වෙරළක් බඳු වු, හස්ති රාජයෙකු හට මද ලේඛාවක් වැනි වු, වෘක්‍ෂයක් හට පුෂ්ප ලතිකාවක් වැනි වූ, පුෂ්ප සමෘද්ධියක් වැනි වු, මලය පර්වතයට චන්දන වන රේඛාවක් බඳු වු, තම හට ආභරණයක් වැනි වු, ඇසට වන් නිද්‍රාවක් බඳු වු බිම්බාදේවීන් අග්‍රමෙහේසිකා කොටැ....."

සිදුහත් කුමරුන්ගේ ස්වයංවරය දිනාගත්තී යශෝධරා බව දැනගත් සුදොවුන් මහ රජ, ඇය තම පුතුට පාවා දෙන ලෙස දන්වා ඇගේ පියාණන් වෙත රාජ දූතයන් යැවී ය.

සුප්ප්‍රබුද්ධ රජතුමා තම කුල ධර්මය අනුව, තම දියණිය පාවා දීමට අදහස් කරන්නේ, දුනු ශිල්පය, හස්ති ශිල්පය හා කඩු හරඹ ආදියෙන් විශිෂ්ටතම නිපුණතා දක්විය හැකි කුමරුවකුට පමණක් බැව් දන්වීය. ඒ අනුව සිදුහත් කුමරුගේ හැකියාවන් විමසා දූතයන් රජ මැදුරට එවීය.

සුදොවුන් රජු ස්වයංවරයෙන් සත් වැනි දින ශිල්ප දැක්වීමට සියලු කටයුතු සුදානම් කරවීය. සිදුහත් කුමරුගේ විශ්මය ජනක ශිල්ප දැක්වීමෙන් ශාක්‍ය වංශිකයෝ අමන්දානන්දයට පත්වූහ. සිදුහත් කුමරු හා භද්දකච්චායනා කුමරිය අතර විවාහය ප්‍රහර්ෂවත් ලෙස පවත්වන ලදී. භද්දකච්චායනා කුමරිය සිදුහත් කුමරුගේ අගබිසව වූ අතර ඇගේ පරිවාර කාන්තාවෝ 40,000 ක් වූහ. බෝසතුනට උත්පලවන්නා හා මෘදගජා නමින් මෙහෙසියන් දෙදෙනෙකු සිටි බව ද චීන මහායාන ග්‍රන්ථහි මෙන්ම ලලිත විස්තරහිද සඳහන් වේ.

# 15. පෙරමග සදිසි – සතර පෙර නිමිති

රෝගී වූවෙකු දැක්මෙන් ස්වභාව ධර්මයේ සර්ව සාධාරණ දහමක් වූ ව්‍යාධිමය බව හැඟේ. මහල්ලෙක් දැක්මෙන් පැවැත්මේ අනිත්‍යතාව පසක් කැරේ. මරණය ආත්මීය නිමාවක්ද? නැතිද? යන ප්‍රශ්නය ඉතිරි කර ඇත. පැවිද්දෙකු දැක්මෙන් පූර්වෝක්ත සංසිද්ධි තුන පිළිබඳව ගවේෂණයෙහි නිමග්න වන්නට සිත යොමු වූවාට සැක නැත. මන්ද? සිදුහතුන් එමඟ තෝරා ගත් හෙයිනි.

ඡන්න ඇමැතියා සමඟ ඇතිවූ සංවාදයෙන් ස්වභාව ධර්මයේ සනාතනික සත්‍යය තමන්ටද උරුම වන බව සිද්ධාර්ථයෝ පසක් කර ගනිති.

අට විසි වියෙහි පූර්ණ මනසකින් පිබිදුණු සිද්ධාර්ථයෝ මේ වන විට කුමර දිවියේ අනුඵල භුක්ති විඳීමෙන් බලවත් කලකිරීමකට ද, නිෂ්ක්‍රීය දිවියකට අනුහුරුව ද, අපේක්ෂා විරහිතව ද කල් ගෙවති. අනෙක් අතට ආත්මීය පාරමී පූරණයේ ශක්‍යතා ඥනමය බව ද මනසේ මතුවෙමින් වැඩෙමින් තිබිණි. සිදුහත් කුමරුන්ට මේ බුද්ධත්වය ලැබීමට සුදුසු ම කාලයයි. අපි එතුමන්ට පෙර නිමිති දක්වමු. දෙවියෝ කතිකා කර ගත්හ. එම දසුන සිදුහතුන්ට හා රථාචාර්යාට පමණක් දක්වන ලෙස දෙවියෙකු මහළු වෙස් ගෙන වීදියට බටහ.

**මහා පදාන සූත්‍රයේ** දැක්වෙන පරිදි උයන් කෙළියට යන අතර, මහ මඟට පිළිපන් මහල්ලා කුමරු නෙත ගැටේ. පැසුණු කෙසින්, දිරා ගිය සිරුරින්, දත් නැති මුවින්, හතිලමින්, සැරයටියක වාරුවෙන්, මහ මග ගාටන මහළු මගියෙකි. කිසි දිනෙක වියපත් වූවෙකු දැක නැති රාජකීය තරුණයාගේ සිත එම රුව දැක්මෙන් තිගැස්සිනි.

"ඡන්න අර දුබල මිනිසා කවුරුන්ද? ස්වාමිණි ඒ වියපත් මහල්ලෙක්."

සිදුහත් කුමරුගේ ඊළග ප්‍රශ්නය දන්නා ඡන්න, "ස්වාමිණි අපටත් කිසියම් දිනෙක නියත වශයෙන්ම මහළු වියට පත් වන්නට සිදු වනවා."

"ඡන්න ආපසු අසු හරවන්න. ඇයිද? ස්වාමිණි"

"උයන් කෙළියට යාමට තරම් සතුටක් මගෙ සිතේ නැහැ." කුමරු යළි මාළිගය බලා යයි. ඡන්න සිදුවීම සුදොවුන් රජුට හෙළි කරයි.

තම පුතු කළකිරවන සුළු මහළු මිනිසුන් රජ මැදුරෙන් අඩ යොදුනක් ඈතින් තැබීමට පෙර පනවා තිබූ රාජ ආඥාව යළි නිකුත් විය. පුත් කුමරුන් නිරන්තයෙන් ප්‍රීති ප්‍රමෝදයෙන් තැබීම පිණිස,



මාළිගයේ සැප සම්පත් පෙරට වඩා වැඩියෙන් සැලැස්වීමට සුදොවුන් රජු සැලකිලිමත් විය.

කුමරුවන් 24 පැය මුළුල්ලේ තමන් මහ මග දුටු දෙය පිළිබඳව කල්පනාවේ නිමග්නව සිටින්නට ඇත.

දෙවැනි දින උයන් කෙළිය සඳහා නික්මි සඳ, පෙර මග දකින්නේ ව්‍යාධියෙන් පෙළෙන තැනැත්තෙකි.

"ඡන්න අර කවරෙක්ද? යොවුන් සිදුහත් කුමරුට පැනයෙකි. ඒ වන විට ඔහු උගත් බමුණු දහමෙන් පෝෂිත සතර වේදයෙන් එවැන්නක් ඔහු අධ්‍යයනය කර නොතිබුණා වෙන්නට පුළුවන. ප්‍රශ්නාර්ථය තුළ ඇත්තේ පිළිතුර අපේක්ෂාවකට වඩා විමංසනමය සිතිවිල්ලකි.

"ස්වාමීනී, ඔහු රෝගී තැනැත්තෙකි" සිදුහත් කුමරුවන්ට විමසන්නට ඇත්තේ තවත් එක් ප්‍රශ්නයක් පමණි.

"ඡන්න අපිත් රෝගී වන්නේද? "



සසර සරන - මග නවතන - ඇරඹි ගමන - දිසෙ මෙතැන

'මොවුනගේ හද නිවී පහන් වී යනුයේ කුමක් නිවී ගිය කල්හි ද, රාග ගින්න නිවුණු කල්හි එය නිවියේ ය, මෝහ, ද්වේෂ, මිත්‍යාදෘෂ්ටි, සියළු ආශා සහ වේදනා ගිනි නිවී ගිය කල්හි හද නිවියේ. මේ කාව්‍යයෝක්තිය නිවීම සොයන මට කදිම පාඩමක් උගන්වාලී ය. නිවන සොයා අභිනිෂ්ක්‍රමණය කිරීමේ අභිප්‍රාය ම සිත්හි කුළු ගැන් වූ ඇයට මා ගෙල බැඳි මේ වටිනා මාලය උපහාරයක් වේවායි' පවසමින්, එය ඇයට පරිත්‍යාග කළේ ය. කුමරුවන් තමන් කෙරෙහි ඇති වූ ප්‍රේමයෙන් මෙම පරිත්‍යාගය කරන්නට ඇතැයි සිතූ ඇයත් මුතුහර මහත් භක්තියෙන් පිළිගත්තා ය. මහා වස්තුවට අනුව මුව දෙනෙකුට සමාන දිගු නෙත් තිබූ බැවින් ඇය මෘගී ය යන නමින් හැඳින්වූ බව දැක්වේ. මෝ තොමෝ දණ්ඩපාණි ශාක්‍ය රජුගේ දුව බවත්, තිබ්බත බෞද්ධ ග්‍රන්ථයෙහි සඳහන් වේ.

සිය මැදුර වෙත සපැමිණි සිදුහත් කුමරුවන් සිරි යහන් ගැබ වෙත පිවිසියේ ජීවිතය පිළිබඳ කළකිරුණු චිත්ත ස්වභාවයකිනි. රූමත් නළඟනන් රගමින්, ගයමින් පංච තූර්ය භාණ්ඩ වයමින් කුමරු ප්‍රමෝදයට පත් කිරීමේ නිරර්ථක වෑයමක යෙදුනාහ. ඒ කිසිත් සැලකිල්ලට නොගත් කුමරුන් ඇසිල්ලකින් නින්දට පිවිසියේ ය. නළලඟනන් ද කුමරු නිදි බැව් දැන, තමන් සිටි තැන්වල ම වැටී නිදන්නට වූහ. මැදියම් රැයේ අවදි වූ කුමරුවන්ට දක්නට ලැබුණේ තැන් තැන්වල වැටී විකාර ලෙස නිදන නළඟනන් ය. සමහරුන්ගේ මුවින් කෙළ වැගිරී ඇති අතර, සමහරු දත් කුරු සපමින් ද, තවකෙකු සිහිනෙන් නන් දොඩවමින් ද, තව කෙනෙකුන්ගේ ඇඳුම් අශෝභන අයුරින් සිරුරින් ඉවත්වී තිබෙන දුටු කුමරුවන් සිත්හි පැවති කළකිරීම වඩාත් තිවුර කිරීමට සමත් විය.

මේ අතර පෙර දින රැයෙක තමන් දුටු ස්වපනය ද කුමරු ට සිහිපත් වූවා සේ ය. එහි අරුත කිම? තමන් මේ සියලු බැඳීම්, අලුයම ලූ කෙළ පිඩක් සේ බැහැර කර, විමුක්තිය සොයා යාමට කාලය එළඹ ඇති බැව් එම ස්වපනයෙන් ඉගියක් ලබා දුන් සෙයක් ඔහු සිතට දැනෙන්නට වින.

## සතර පෙර නිමිති දකින්නට පූර්වයෙන් පිය පුතුන් දුටු සිහිනය.

සූත්‍ර පිටකයට අයත් අංගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයෙහි ඇතුළත් මහා සුපින සූත්‍රයෙහි බෝසතුන් දුටු මෙම ස්වප්න පිළිබඳව විස්තර කෙරේ. එම පඤ්ච ස්වප්නයන් කෙබඳු ද යත්,

"මහණෙනි, මේ මහ පොළොව මහ යහන් විය. පැදුම්



සමුදුරෙහි වම් අත තැබිණි. පැළදිග සමුදුරෙහි දකුණත තැබිණ. දකුණු මුහුදෙහි උභයපාදයෝ වේ. පහළ වූ ප්‍රථම ස්වප්නය යි."

තථාගත අභීත සම්‍යක් සම්බුද්ධයනට සම්බෝධියෙන් පෙර ම අනගි සම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම තිරය නම් තෘෂ්ණාදියෙක් නැබින් පැනනැගී අහසැ පැතිරැ සිටියේ විය. බෝධිසත්ත්ව වූවනට මෙසේ ද්වීතිය මහා ස්වප්නය පහළ විය.

අභිසම්බුද්ධ නොවූ බෝධිසත්ත්වයින්ට කළු හිස් ඇති ශෙවන කෘමීහු (පණුවෝ) දෙපසින් නැගී දණමඩුළු තෙක් වසා සිටගත්හ. සම්බුද්ධයනට සම්බෝධියෙන් පූර්වයෙහි ම අනගි සම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට ම මෙ තෘතිය මහා ස්වපනය පහළ විය.

බෝධිසත්ත්ව වූවනට ම නීලාදි නන් පැහැ ඇති සතර ලිහිණි කෙනෙක් සිව් දිගින් අවුලු පාමුල හෙවැ සර්වශෙවතව ගියහ. බෝධිසත්ත්ව වූවනට ම මෙ සතර මහා ස්වප්නය පහළ විය.

බෝධිසත්ත්ව වූවා හු ම මහාමීඪ පර්වත මස්ථයෙක්හි මීඪයෙන් නො තැවරෙමින් සක්මන් කරන්නාහ. සම්බෝධියෙන් පූර්වයෙහි ම අනගි සම්බුද්ධ වූ බෝධිසත්ත්ව වූවනට මේ පස්වන මහා ස්වප්නය පහළ විය."

## සුදොවුන් රජු දුටු සිහිනය :-

සිදුහතුන් සතර පෙරනිමිති දකින්නට දින කිහිපයකට මත්තෙන් සුද්ධෝදන පිය රජු සිහින සතක් දර්ශනය වූ බැව් අභිනිෂ්ක්‍රමණ සූත්‍රයේ සහ මහා වස්තුව කෘතියෙහි සඳහන් ව ඇත. රාජකීය ධජය ඔසවා ගත් මහා පිරිසක් කිඹුල්වත් පුර සිට පැමිණ නැගෙනහිර ද්වාරයෙන් නික්ම යාම.

සිදුහතුන් ඇතුන් විසින් ඇදගෙන යන ලද අලංකාර සරසන ලද රියකින් දකුණු ද්වාරයෙන් නික්ම යාම.

සිදුහතුන් අශ්වයින් සිය දෙනෙකු අදිනු ලැබූ මඟුල් රියකින් බටහිර වාසලින් නික්ම



අසු අරා - මග සරා

යාම.

මැණික් ඔබ්බන ලද විශාල පළිහක් අහසින් පා වී විත් උතුරු ද්වාරයෙන් ඉවතට පා වී යාම.

කිඹුල්වත සිවුමන්සලක දී සිදුහතුන් යගදාවකින් දැවැන්ත බෙරයකට ගැසීම.

කිඹුල්වත මැද පිහිටි උස් අටල්ලකට නැගී සිදුහතුන් එහි සිට සිවු දෙසට මැණික් විසි කිරීම.

කිඹුල්වත පවුර ආසන්නයේ මිනිසුන් හය දෙනෙක් තම හිස් වැටි කඩා ඉවතට විසි කිරීම.

සුදොවුන් රජු දුටු සප්ත ස්වප්න ලෙස සැලකේ.

සුදොවුන් රජුන් සිහින ඵල අරුත් බමුණන් වෙතින් විමසන්නට විය. ඔවුහු සිහින හතෙහි ප්‍රතිඵල මෙසේ සැකවින් දක්වන්නට වූහ. පළමු සිහිනයෙහි සිදුහතුන් රජ සැප හැර පියා කිඹුල්වතින් පිටව ගොස් පැවිදි වන බව ද, දෙවැනි සිහිනයෙන් පැවිදි බව ලබන කුමරුවන් නොබෝ කළකින් බුදු බව ලබන බව ද, තෙවැනි සිහිනයෙන් බුද්ධත්වයෙන් අනතුරුව එතුමන් සතර විර්යයෙන් යුක්ත වන බව ද, සිවුවැනි සිහිනය ප්‍රකාර ලෝකයාගේ හිත සුව පිණිස දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන බව ද, පස්වැනි සිහිනයෙන් දම් සක් සූත්‍රය දේශනයෙන් පසුව බුදු දහම තුන් ලොවෙහි ව්‍යාප්ත වන බවද, හය වැන්නෙන් සදහම් රුවන් වැසි වස්සවන බව ද, අවසන් සිහිනයෙන් මිස දුටු ෂඩ් ශාස්තෘවරු පිරිහීමට පත්වන බව ද ඔවුහු පෙන්වා දුන්හ.

අභිනිෂ්ක්‍රමණ සූත්‍රයෙහි මහා ප්‍රජාපතී ගෝතමිය ද අපූරු සිහිනයක් දුටු බව සඳහනි. විශාල ස්වේත වර්ණයෙන් යුත් ගවයෙක් කෑ ගසමින් කිඹුල්වත හරහා දිව යනු ඇය දුටු සිහිනයයි. එම රැයෙහිම යශෝධරාවන්ට ද සිහින කිහිපයක් දර්ශනය වු බැව් දැක්වේ. දෙරණ වෙව්ලා සලිත වීම, හිරු සඳු තරු බිම පතිත වීම, ගස්වැල් තුරුලතා ඵල, කොළ හා මල් බිම වැටීම ආදී සිත සසල කරන සුළු සිහින ඈ දුටු බවද සඳහනි.

## 16. මහාබිනික්මණ

මැදියම් රැය ද ඉකුත්ව හෝරාවක් පමණ ගත වී තිබිණි. පරිසරය නිසල ය. යහන් ගැබින් පිටතට පැමිණි කුමරු සිත් හී අලුත උපන් තම බිළිඳු පුතු දැකීමේ ආශාවක් දැල්විණි. සෙමෙන් යශෝධරාවන්ගේ කුටිය අසලට පියමන් කළ කුමරු කුටියේ දොර



සීරුවට විවර කළේ කිසිවෙකුට නෑසෙන පරිද්දෙනි. දසත ආලෝකය මෙන් ම සුගන්ධයක් ද පතුරවමින් මොළකැටි පුතුගේ යහන අසල සුවඳ තෙලින් යුතු පහනක් දැල්වෙමින් තිබිණි. බිළිඳු රාහුල කුමරු යශෝධරාවන්ගේ තුරුලේ තද නින්දේ පසුවනු කුමරු නෙත් ගැටිණි. පුතු සියතට ගෙන සිප ගැනීමෙ ආශාවෙන් මඩනා ලද සිදුහත් කුමරු නිදි යහන අද්දරට ම සමීප විය. ඒ සැණින් කුමරුගේ ඇතුල් සිත ඔහු මෙහෙයවන්නට වූවා සේ ය.

'රාහුලයන් දෝතට ගෙන සිපගන්නට ගියහොත් යශෝධරාවන් පිබිදෙනු නිසැක ය. එසේ වුවහොත් විමුක්තිය සොයා යන ගමනට බාධාවක්. මම බුදු බව ලබා පෙරළා විත් ඔවුන් බැහැදකිමි. ඔවුන් ද සසර දුකින් මුදා ගනිමි.'

මෙවන් කල්පනාවකින් මඩනා ලද කුමරු දේවියගේ යහන් ගැබේ දොර සීරුවෙන් වසා පිටතට පැමිණියේ විමුක්තිය ලබන්නට නම් සියළු බැඳීම් වලින් විනිර්මුක්ත විය යුතුය යන දැඩි හැඟීමෙනි. සියල්ල අත් හැර දැමීමේ දැඩි අධිෂ්ඨානයෙන් කුමරුගේ සිත ශක්තිමත් වුවා සේ ය.

සිදුහත් කුමරුන් රජ මැදුරෙන් පිටතට පැමිණ ඡන්න අමාත්‍යා කැඳවීය. තම ස්වාමියාගේ උවනත වෙනදා නොදුටු උපශාන්ත ස්වභාවයක් හේ දිටී ය. ගිහිගෙයින් නික්ම යාම සඳහා කන්තක අසු රැගෙන එන ලෙසට ඔහුට විධාන ලැබිණි. මොහොතකින් ජව සම්පන්න කන්තක අශ්වයා ගමනට සූදානම් කරගෙන ඡන්න අමාත්‍යවරයා සිදුහත් කුමරු අභිමුවට පැමිණියේ ය.

'කන්තකය අද මා එක් රැයෙන් ම එතෙර කරව. මතු මා බුදු වී දෙව් බඹුන් සහිත ලෝකයා එතෙර කරවමි.'යි පවසමින් සිදුහත් කුමරුන් ඡන්නයන් සමඟ අසු මතට නැගිණ. දෙන ලද මුදු සුමුදු විධානයට අශ්වයා හේශාරව කර ප්‍රතිචාර දැක්වීය.

සුදොවුන් රජ මැදුරේ ඇතුළු ප්‍රාකාරයේ සියලු දොරවල් යතුරු ලා තිබුණ ද සිදුහත්



සිදුහත් මහබිණික්මනයට පෙර

කුමරුගේ අධිෂ්ඨාන ශක්තියෙන් ඒවා ඉබේ විවෘත විය. තිබ්බතීය වාර්තාවන්හි මෙම දොරටු අධිගෘහිත දේවතාවුන් විසින් විවෘත කළ බව සඳහන් වේ.

ඒ උතුරු සළ නැකත එළඹී ඇසල පුන් පොහෝ දා ය. හිමගිරි දෙසින් මතු වූ පුන් සඳ එම නිසල රාත්‍රියෙහි පැවති අන්ධකාරය දුරු කළේ ය.

කන්තක අසුන් රජ වාසල නැගෙනහිර දිශාගත ද්වාරයෙන් ඉවතට පනිනවාත් සමඟම මහත් ශබ්ද නගමින් කිසියම් දැවැන්ත පුද්ගලයෙක් අසුගේ ගමන් මග අවුරමින් බෝසතුන් ඉදිරියේ පෙනී සිටියේ ය.



මහබිණික්මන් කළ නැගෙනහිර ද්වාරය




මහබිණික්මන් කළ නැගෙනහිර ද්වාරය හැඳින්වෙන පුවරුව



සිදුහත් කුමරු ගිහි ගෙය හැරපියා අභිනික්මන් කරමින් කපිලවස්තු පුර නැගෙනහිර දිශාගත නගර ද්වාරයෙන් නික්මෙන්නට පෙරාතුව බිහිදොර අවහිර කරමින් මෙසේ පෙනී සිටියේ අන් කිසිවෙකු නොව මාර දිව්‍ය පුත්‍රයා ය. හෙතෙම සිදුහතුන් අමතමින්,

**'සුරා විතත් ගී පොතත් ඉවත ලා**
**නුරාව ඉතිරෙන සොඳුර පසෙක ලා**
**ඔබ ඔය සොයනා සසර විමුක්තිය**
**ඇත්තේ කොතැනද කියනුව කුමරුනි**

**නැත අම රසයක් සුරා බඳුන තුළ**
**තෙරපෙන ඉතිරෙන හද සනහාලන**
**නැත අන් මිහිරක් නුරාව උතුරන**
**සොඳුරු ඇගේ තොල් මීවිත**
**තැවරුණු**

**මුළු ජීවිතයම බවුන් වඩන විට**
**හැකි වෙද එමගින් නිවන**
**ලබන්නට**
**ගයන්න ගීතය ඇය තුරුලේ හිඳ**
**නිති රස විඳිමින් මදු බඳුනේ '**

සිදුහත් කුමරුන් සිය අභීත හඬ අවදි කළේ ය.

"එම්බා මාර දිව්‍ය පුත්‍රය, ඔබ ඔය පසසන සුරාව ද, නුරාව ද, සරාව ද මම අත්විඳ ඇත්තෙමි. එහි අවසන් ප්‍රතිපලයද කඳුළ තැවරුණ දුකකි. මට අවැසි වන්නේ මේ බව දුක නැති කිරීමටයි." මාර දෙව් පුත් සිය උත්සාහය අත් නොහැරී ය.

**'මහා මේරු කඳු යායම මම්**
**ඔබේ නමින් රන්යාය**
**කරන්නම්**
**අනෝතප්ත විල සත් රුවනින් පුරවන්නම්**
**සක්විති රජ වී රජ සිරි විඳී මැන**
**සත් රුවනින් මහ වරුසාවන් ගෙන**
**තරු කැට මිණි කැට සේ වස්සනම්**
**සක් විති රජ වී රජ සුව විඳිනට**
**අභිනික්මන් කොට වෙහෙසනු**
**කුමකට'**

මාර දිව්‍ය පුත්‍රයාට කළ නොහැක්කක් නොමැති බව

දනී. එහෙත් තම සිත නම් ඔහුට කෙසේවත් වෙනස් කළ නොහැකි බව සිදුහතුන්ට හොඳට ම විශ්වාසය.

'එම්බල මාර දිව්‍ය පුත්‍රය, මාගේ අන් අත්බව වලදී මම සක්විති රජ සැපත ද වින්දෙමි. එහෙත් මා සොයනා සතුට ප්‍රමෝදය එහි නැත. සත්ත්වයා සංසාරිකව පෙළෙන දුකට හේතු වන දුක නැති කිරීමත් එහි මගත් මම සොයාගන්නෙමි. මාගේ මග අවහිර නොකරව.'

සිදුහත් කුමරුගේ මහභිනික්මන වළකාලිය නොහෙන බව කල්පනා කළ මර දෙව් පුත් දස බිම්බරක් මාර සේනාව ගෙන මතු දින සටන් වදිමියි සනිටුහන් කර පලාගියේ වන.

මාර දිව්‍ය පුත්‍රයාගේ ප්‍රයත්නය ව්‍යාර්ථ කළ කුමරු අසු වේගයෙන් ඉදිරියට මෙහෙයවන්නට ඡන්නයන්ට උපදෙස් දුනි. මේ අතර තමා කුඩා කළ සිට හැදී වැඩුනු කිඹුල්වත් පුරය දෙස ආපසු හැරී බැලීමෙන් නොතිත් ආශාවක් කුමරුන් තුළ පිළිසිඳිනි. එතුමන් ට ආමග පසුපස බැලීමට සිදුනොවන ලෙසට මහ පොළොව කැරකී හැරිණි. එම ස්ථානය මතු කන්තක නිවර්තන චෛත්‍ය ඉදිවන ස්ථානය බැව් බෝසතුන් පවසන්නට යෙදුනි. ඡන්න අමාත්‍යවරයාගේ මෙහෙයවීම මත කන්තක එක් රැයින් ම ශාක්‍ය, කෝලිය, මල්ල යන රාජ්‍ය තුන පසු කර තිස් යොදුන් පමණ මග ගෙවා අරුණ නැගෙන මොහොතේ අනෝමා නදී තීරයට සමීප වීය. එහිදී ඡන්න ඇමතු සිදුහත් කුමරුන්, 'මිත්‍ර ඡන්නයෙනි, තොප මා පැළඳි ආභරණත් අශ්වයාත් ආපසු මාළිගයට ගෙන යනු,' යැයි පැවසී ය. ඡන්නයන් ද ඒ අවස්ථාවේ ම පැවදි වීමට කැමැත්ත පළ කළ ද මතු දිනයක ඔහු පැවදි කරවාගන්නා බව දන්වා ඔහු ආපසු සිය නුවර වෙත යැවීමට සිදුහත් කුමරා ක්‍රියා කළේ ය.

ඉක්බිතිව සිදුහත් කුමරු වමතින් කෙස් වැටිය ගෙන දකුණතින් කඩුව ගෙන කෙස් සිඳ දමා පැවදි බව ලැබී ය.



## i. සිදුහත් කුමරුන් සොයා රාජ දූතයන් පිටත් කිරීම.

බෝසතාණන් රජ මැඳුරෙන් නික්ම යාම සැළවූ, සුදොවුන් නිරිඳුන් ප්‍රජාපතී ගෝතමිය, යශෝධරාවන් මෙන් ම කිඹුල්වත් පුර වැසියන් ද හඬා වැලපෙන්නට වුණා. ඡන්නයන් වෙතින් කුමරා ගිය දිසාව අසා දැනගත් සුදොවුන් රජු සිය පුතු ආපසු කැඳවා ගෙන ඒම පිණිස දූතයන් පිටත් කළේ විකල් වූ සිහියෙන් යුක්තව ය.

සිදුහත් තවුසන් සොයා ගිය දූතයන්, පිය රජු, අග මෙහෙසිය, ඇතුළු පවුලේ සැම හඬමින් වැළපෙමින් සිටිනා බවත් යළි රජ මැඳුරට පැමිණ ඔවුන් සනහා, කලක් රජ කර වියපත් වූ පසුව පැවදි වන ලෙසටත් ඇවිටිලි කළහ.

සියල්ල නිහඬව අසා සිටි සිදුහත් තවුසා මා පියාණන්ගේ දාරක ප්‍රේමය මෙන් ම යශෝධරාවන්ගේ ස්වාමි භක්තියද මට මනා සේ වැටහේ. එහෙත් ඔබ මා පවුලේ සියළු දෙනා ඇතුළු මුළු මහත් මිනිස් වර්ගයා ම නිතැතින් ම ගොදුරුවන ජාති, ජරා, ව්‍යාධි, මරණ දී බිහිසුණු දුක් කන්දරාව මගේ සිතට තදින් ම දැනේ. මෙම දුකින් මිදීමේ ඒකායන මඟක් සෙවීමේ දැඩි අරමුණ ඇතිව සියල්ල අත්හැර මෙම මාළිගාවෙන් පිට වන්නට තීරණය කළෙමි.

පියා, සුළු මව, යශෝධරාවන් සනහන්නට මා යළි මාළිගය වෙත පියමන් කළ ද කාටත් පොදු මරණය අප සොයා ආ දින යළි යළිත් ඔවුන්ට හඬා වැළපෙන්නට සිදුවනු ඇත.



කෙස් වැටිය කපමින - තපස් බව ලබමින



බුද්ධත්වය





මහබිනික්මණ

**හත්වන පරිච්ඡේදය**

# සම්බුද්ධත්වයෙන් පසු

## 17. බුදුරජාණන් වහන්සේ පළමුවරට කපිලවස්තුවට (කිඹුල්වතට) වැඩම කිරීම.

තම පුතණුවන් සත්‍ය අවබෝධ කොටැ ගෙන බරණැස ඉසිපතනයේ දී ධම්සක් සූත්‍රය දෙසීම පිළිබඳවත් එම දහමේ සුවිශේෂීයත්වය පිළිබඳවත් සුදොවුන් රජුට නිරන්තරයෙන් අසන්නට ලැබිණි. ඒ සියල්ල අභිබවමින් ද, ගිහිගෙය හැරගිය සිය පුතු දැකීමේ බලවත් ආශාවෙන් හා ධාරක ප්‍රේමයෙන් මඩනා ලද සුදොවුන් නිරිඳුන්, කිඹුල්වත තම මාළිගයට වඩින ලෙස දන්වමින් ඇමැතිවරු නව දෙනෙකු හා පිරිවර අත තම පුතුට පණිවිඩ යැව්වේයි, පණිවිඩ රැගෙන ගිය සියළු ම දෙනා බුදු බණ ශ්‍රවණයෙන් පසුව, පණිවිඩය නොපවසා ම පැවිදි බව ලබා රහත් ඵල ලදහ. රහත් වූ පසු මධ්‍යස්ථවීම, උපේක්ෂාශීලි වීම රහතුන්ගේ ස්වභාවයක් බැවින් සුදොවුන් රජුගේ පණිවිඩ දැන්වීමට උන්වහන්සේලා උත්සාහ නොගත්හ. අවසානයේදී සුදොවුන් රජ තම පුතු කුඩා කළ සිට සමීපව ඇසුරු කළ, සිද්ධාර්ථ කුමරු උපත ලද දින මෙලොව එළිය දුටු කාලුදායි අමාත්‍යවරයා මෙම දූත කාර්යයෙහි යෙදවූයේ මහත් බලාපොරොත්තු සහිත ව ය.

වසර ගණනාවක් පුතු නොදුටු සොවින්, පසුතැවිල්ලෙන් පසුවූ සුදොවුන් නිරිඳුන් තම පුතණුවන් කිඹුල්වතට වැඩමවා ගැනීම පිණිස කාළුදායි ඇමැතිවරයා වෙත කෙරෙන කුළුණු බර ඉල්වීම නෛෂ්ක්‍රම්‍යා වර්ණනාව කෘතියෙහි සජීවමත් ලෙසින් ගෙනහැර දක්වයි.

"තවද සුද්ධෝදන රජ්ජුරුවෝ සත් රුවනක් පතන සක්විති රජකු සේ බුදුන් දැකුම් පතා පෙර මඟ බලා විඩාව වැ නැවත බුදුන් හා



එක දා උපන් කාළුදායි නම් ඇමැතියාණන් කැඳවාලා, පුත කාළුදායිනි තොප හා එක දා උපන්, එක කෙළි මඩලෙහි වැඩි, තොප හා ඉතා යහළු වූ මපුතණුවන් සිද්ධාර්ථ කුමාරයන් කැඳවා දස දහස් ඇමැතියන් දී නව වාරයෙක, නව මහා අමාත්‍යයකු යැවීය. මේ නව දහසක් දූතයන් අතුරින් මා පුතණුවන් ගෙනෙන්නා තබා, අසුන් පමණක් කියා එන කෙනෙක් නැත. තෙපි ද දහසක් දෙනා හා සමඟ මඟුල් වෙසින් මපුතුණුවන් මා ඇසැ දක්වාලිය එවු දැයි විචාළේ ය.

කාළුදායි කියන්නේ 'මම ගියෙම් නම් නුඹ පුතණුවන් ඇස දක්වා ලමින් බල එකෙක් ඇත. බුදුන් දුටු විට ම බුදුන් කෙරේ මහණ වන්නට අවසර ලදිම් නම්' දැන් ම යෙමි කිවු ය. රජ්ජුරුවෝ කියන්නාහු පුත තොපි මහණවේවයි මහණ නොවේවයි ම පුතණුවන් ඇස දක්වා පුම් නම් මට නොකළ මනා උපකාරයක් නැතැයි කිහ...."

පෙර පණිවිඩකරුවන් ලෙසින් ම කාළුදායි සසුන්ගත වීය. එනමුදු සුදුසු වේලාවක් එළඹී කල්හි හෙතෙම තමා පැමිණි කාරණය බුදුන් වහන්සේට හෙළි කිරීමට කාළුදායි රහතුන් වහන්සේ පසුබට නොවූහ.

මැදින් මස පුර පසළොස්වක සඳ නැගෙනහිර අහසේ මෝදු වෙමින් පැවතිණි. කිඹුල්වත් පුරය සනහමින් හේමන්ත ඍතුව එළඹෙමින් තිබූ බව කාළුදායි තෙරුණට සිහිපත් වීය. මෙහිදී තමන් ගිහි කළ කිඹුල්වත් පුරවර හේමන්ත ඍතුව පිළිගැනීමට සැදි පැහැදී සිටි අයුරු කාළුදායි තෙරුණුන්ගේ මනසේ චිත්‍රණය වූවාට සැක නැත. නියං සමයේදී ගිනිදැලින් වැසුනා වැනි වියළි කොළ සැලී ගොස් තුරු හිස් ලා දල්ලෙන් නැවුම් වන දසත සුගන්ධය පතුරවමින් මල් විකසිත වන හේමන්තය, කිඹුල්වතට භාග්‍යවතුන් වහන්සේ වැඩිය යුතු සුදුසුතම කාලය බැව් ද කාළුදායි තෙරුණ්ට පසක් වීය. බුදුන් වහන්සේ වෙත එළඹී කාළුදායි තෙරුණ් වහන්සේ තම සිතැඟි භාග්‍යවතුන් වහන්සේ වෙත පළ කළේ සිත් කාවදින පරිද්දෙනි. සූත්‍ර පිටකයට අයත් ඛුද්ධක නිකායෙහි, ථේර ගාථා පාලියෙහි, දසක නිපාතයෙහි මෙම ආයාචනය සනිටුහන් කරන්නේ චිත්ත රූප සාධනය කරවන සුළු සජීවීමත් විලාශයෙනි.

**"අංගාරිනො දානි දුමා භදන්තෙ**
**ඵලෙසිනොඡදනං විප්පහාය**
**තෙ අච්චමනෙකා ව පහාසයන්ති**
**සමයො මහාවීර භගීරසානං**

**දුමානි ඵුල්ලානි මනොරමාති**
**සමන්තතො සබ්බ දිසා පවන්ති**
**පත්තං පහාය ඵලමාසසානා**
**කාලො ඉතො පක්කමනාය වීර"**

"වහන්ස දැන් වෘක්ෂයෝ ගිනි අඟුරු වැනි රතු පැහැති මල් දළු ඇත්තෝ, පරණ කොළ හැලි පලදරන කාලයට පැමිණියෝ වෙත්. ඒ මේ වෘක්ෂයෝ පහන් සිළු සේ බබළත්, මහා වීරයන් වහන්ස භගීරථ පරම්පරාවෙහි වූවනට (ශාක්‍යයනට) අනුග්‍රහ පිණිස වඩින්නට දැන් කාලය වේ.

පිපුණු මල් ඇති වෘක්ෂයෝ හැම අතට සුවඳ විහිදුවත්, පුරාණ පත්‍ර හැර දමා (වැටීමෙන් පසු) ඵල බලාපොරොත්තුවෙන් සිටින්නෝ වෙත්, වීරයන් වහන්ස, දැන් මෙයින් පිටත් වන්නට කාලයයි.

ඉතා සිහිලස නොමැවෙයි ඉතා උණුසුම් ද නොමැවෙයි. වසන්ත ඍතුව සුව පහසු ගෙන දෙයි. ගමනට යෝග්‍යය ය. ආපසු හැරී රෝහිණී ගඟින් එතෙරවන ඔබ වහන්සේ ශාක්‍ය කෝලීය රජුහු දකිත්වා.

ගොවි තෙම සරු අස්වනු බලා කෙත් වපුරයි. ධන රැස්කරන වෙළෙඳහු මතු බලා සමුද්‍ර තරණය කරත්, මම ද ඔබ වහන්සේ කිඹුල්වතට වැඩම කරවන්නට යම් පැතුමකින් සිටීම ද ඒ මාගේ ප්‍රාර්ථනාව සමෘද්ධි වේවා.

එක් වරෙකින් නොනැවතී ගොවියෝ යළි යළි ධාන්‍ය වපුරත්, වැස්සද නැවත නැවත වසී, නැවත නැවත ද ගොවීහු කුඹුරු හාත්, නැවත නැවත හාල් ආදී ධාන්‍ය වර්ග රටට ලැබේ.

යාචකයෝ ද යළි යළි කුලයන් කරා එළඹෙත්, දානපතිහු ද යළි යළිත් දන් දෙත්, එසේ දීමෙන් යළි යළිත් දෙව් ලොවෙහි උපදිත්, යම් කුලයක මහාප්‍රාඥ වූ වීර පුරුෂයෙක් වේ නම් හෙතෙම සත් වන මුතුන් මිත්තන් දක්වා පරම්පරා යුග සතක් මනා ප්‍රතිපත්ති හේතුයෙන් ශුධ කරයි. දෙලෝ වැඩ දන්වා හෙයින් මුනි යන නම සත්‍ය වශයෙන් ලත් දේවාතිදේව වූ භාග්‍යවතුන් වහන්සේ එයටත් වඩා පාප නිවාරණයෙහිත් යහපතෙහි අනුන් පිහිටුවා ලීමෙහිත් සමාර්ථ යැයි සිතමි.

මහර්ෂින් වහන්සේගේ පියා ශුද්ධෝදන මහ රජාණෝයි. යම් උත්තමාවක් බෝසතුන් කුසින් දරා සිට මරණින් මතු දෙව් ලොවැ දෙව් පුතෙක්ව ඉපිද සැප වීදි ද ඒ මයා දේවී, පින්වතුන් වහන්සේගේ



මෑණියෝ ය. මෙයින් කළුරිය කළ ගෞතම ගෝත්‍රජ වූ ඕ තොමෝ දෙව්ලොව ඉපිද දේව සමූහයා පිරිවරා පංචකාම කොට්ඨාසයන්ගෙන් සමන්විතව මහත් සැප විඳී..."

මෙලෙසින් කාළුදායි තෙරුණ්ගේ අභිනන්දනය ගාථා 60 කින් සමන්විත ගමන වර්ණනා ගාථාවලින් බුදුපියාණන්ට කිඹුල්වත් පුරයට වඩිනා ලෙසට ආරාධිතය.

සියළු කෙලෙසුන් නැසූ වීතරාගී සිතක නිසගයෙන් ම පහළ සෞන්දර්යාත්මක හැඟීම් සමුදායක් මෙම ගාථා සමුච්චයෙන් මොනවට ප්‍රකට වේ.

කාළුදායි තෙරුණුවන්ගේ ආරාධනය පිළිගැණිනි. භාග්‍යවතුන් වහන්සේ මහ රහතුන් විසි දහසක් පිරිවරා, මැදින් පුර පසළොස්වක පොහෝ දින කිඹුල්වත වෙත වැටී තිබූ මාර්ගයට අවතීර්ණ වූයේ සන්සුන් ගමනිනි. පා ගමනින් දිනකට යොදුන බැගින් දෙමසකින් යොදුන් හැට අවසන් කළ භාග්‍යවතුන් වහන්සේ පෙරටුකොට ගත් රහතුන් වහන්සේලා කිඹුල්වතට ළඟා වන විට වෙසක් පුර පසළොස්වක සඳ උදාවෙමින් පැවතිනි.

## i. ශාක්‍යයන්ගේ මානය බිඳීම.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත වෙත සැපැත් වූ අවස්ථාවේ ඥාති ශාක්‍ය රජ දරුවන් තම ඥාතියා පිළිගැනීමට යොදා තිබූ වැඩපිළිවෙල **නෛෂක්‍රම්‍ය වර්ණනා කතුවරයා** චිත්තරූප මවාපාන ආකාරයට  මෙසේ සිත්තම් කරයි.

"......මෙසේ සැට දවසකින් වැඩැ වෙසෙග මැදි පෝදා බුදුන් කිඹුල්වත් නුවරට වැඩි කළ එක්ලක්ෂ හැටදහසක් කුලෙහි ශාක්‍ය රජ දරුවෝ අපගේ නෑ උතුමා අද බලම්හයි. රැස්වැ බුදුන් වසන්නට සුදුසු තැන් කවරේදෝ හෝයි පරීක්ෂා කරන්නාහු නිග්‍රෝධ නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ උයන ඉතා රම්‍යය. ඉතා සදුසුයැයි සනිටුහන් කොටැ එහි කළමනා වූ රාත්‍රී ස්ථාන චංක්‍රමනාදි විහාර කර්මාන්ත නිමවාලා බුදුන්ට පෙර ගමන් කරන්නාහු සියළු අලංකාරයෙන් හෙබියා වූ සොළොස් හැවිරිදි සිටු කුමරුවන් සරසා සුවඳ මල් දී පන්සියයක් දෙනැ පළමු කොට පෙරමගට යවා දොළොස් හැවිරිදි සිටු කුමරියන් පන්සියයක් සරසා මානෙල් මල් කළස් අතට දී දෙවැනිව යවා ඉක්බිත්තෙන් පන්සියයක් ශාක්‍ය කුමරුවන් සුවඳ මල් දී මග පෙරහැරින් යවා සතර වනුව පන්සියයක් ශාක්‍ය කුමරියන් සරහා යවා

පස්වැනිව එක්ලක්‍ෂ සැටදහසක් ශාක්‍ය රජදරුවෝ මහ පෙරහැරින් ගොස් මහත් වූ පූජායෙන් සුවඳින්, මලින් සුවඳ සුන්නෙන් පුද පුදා බුදුන් වඩා නිග්‍රෝධාරාමයට ගෙන ගියාහුය....”

මෙසේ කිඹුල්වත් පුරය වෙත සැපැත් භාග්‍යවතුන් වහන්සේට වන්දනා මාන කිරීමට ශාක්‍යයන් එකවර ම ඉදිරිපත් නොවූහ. හේතුව ඔවුන් තුළ පැවැති කුල ගර්වය සහ අධික මානයයි. වැඩිහිටි ශාක්‍යයන් පසුපසට වී ලාබාල ශාක්‍ය කුමර කුමරියන් පමණක් බුදුන් වහන්සේට වන්දනා මාන කිරීම පිණිස ඉදිරියට එවීමට ඔව්හු සියුම් වැඩපිළිවෙලක් යෙදූහ.

මෙම අවස්ථාවේදී ශාක්‍ය වාංශිකයිනට බුද්ධත්වයේ බල මහිමය දක්වාලීම සුදුසු යැයි උන්වහන්සේට හැගී ගියා සේ ය. උන්වහන්සේ එක් සැනෙකින් අභිඥාපාදක ධ්‍යානයට සැමවැද ආකාශයේ සක්මන් මළුවක් මැවූ සේක. එම එලෙහි සක්මනහි යෙදෙමින් උන්වහන්සේ සිය ශාක්‍ය ඥාති සමූහයාට යමා මහ පෙළහර දැක්වූහ. එම අවස්ථාවේ දෙව් බමුන් සතුටු කරමින් දස දහසක් සක්වල ආලෝකමත් වීය. බුදුන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ දොළොස් කොටසකින් එකවර ජලය හා ගින්දර නිකුත් වන්නට වීය. මෙම අසිරිමත් යමා මහ පෙළහර මානයෙන් උදම්වී සිටි සියළුම ශාක්‍ය වාංශිකයන් තුළ පැවැති මානය විශද කරවන්නක් වීය.

භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි සුදොවුන් පිය රජු, ‘භාග්‍යවත් වූත් ආශ්චර්යයමත් වුත් මා පුතණුවනි ඔබවහන්සේගේ උපත සිදු වූ දින අසිත දේව තවුසාණන්ගේ හිසමත ඔබ දෙපා රැඳුනු මොහොතේ මම මගේ පළමු නමස්කාරය කළෙමි. වප්මඟුල් උත්සවයේ දී දඹ රුක් මූලයේදී භාවනා යෝගීව සිටි ඔබ සිරි පතුල දෙවැනි වතාවට වන්දනය කළෙමි. සම්මා සම්බුද්ධත්වයට පත් වූ ඔබවහන්සේට මේ මගේ තෙවැනි නැමදීමයි’ පවසමින් සිය නළල් තලය බුදු සිරිපතුල මත ස්පර්ශ කළේය. නිරායාසයෙන් ම සම්දුන් වෙත සමීප වූ සෙසු ශාක්‍ය පිරිස් බිම වැතිරී සිරි පතුල වන්දනා කළහ. පාවා නුවර සිව්මල්ල රජදරුවන්ගේ පුත්‍රයින් වූ ගෝධික, සුබාහු, වල්ලිය, උත්තිය නම් වූ මිත්‍ර කුමාරවරුන් සිව්දෙනාද යමා මහ පෙළහර දර්ශනයෙන් ප්‍රමුදිතව බුදු සසුනේ පැවිද්ද ලදහ. ඒ හා සමඟම අකල් තඹ වතුර වැස්සක්ද මිහිමත පතිත වීය. එම වැස්සෙන් කිසිවෙක් නොතෙමුණහ. එළඹි අකල් වැසි පිළිබඳව පිරිස් අතර විවිධ මත පලවීය. නෛෂ්ක්‍රමය වර්ණනාව කතුවරයා මෙම අවස්ථාව සිය කෘතියෙහි සිත්තම් කරන්නේ මහත් අපූර්වත්වයකින් යුතු ව ය.



“.... මහණෙනි, දැන් මතු නොවෙයි. පෙරත් මගේ බන්දු සමාගමෙහි පොකුර වැසි වටුයේ මැ වේ දැයි වදාරා දහසක් ගාථාවෙන් ප්‍රතිමණ්ජිත වූ මහා වෙස්සන්තර ජාතකය ගෙනහැර දක්වා ධර්ම දේශනා කොට වදාළ සේකැ. ඒ වේලෙහි බොහෝ ප්‍රාණීහු සෝවාන් ආදී මාර්ග ඵලයට පැමිණියහ.

එකල රාහුල කුමාරයාණන් වහන්සේට මව් වූ යශෝධරා දේවි බුදුන් දොර දොර පිඬු සිගතියි අසා සිද්ධාර්ථ කුමාරයෝ මෙම නුවරින් රථයකට පැන නැගි, සිව් සැටක් ආභරණ පැළඳ රුවන් රසින් දිලිසෙන අනර්ඝ වූ ඔටුන්නක් පැළඳගෙන ලක්‍ෂයක් අගනා වූ මුත් හරෙකින් උර මඩල පුරාගෙන ලක්‍ෂ ගණන් ඇමැතිවරුන්ද නළු පිරිස පිරිවරා ගෙන ශක්‍ර දේවේන්ද්‍ර ලිලාවෙන් රාජ්‍ය ශ්‍රී විඳ ඇවිද්දාහු ය. ඒ මගේ ස්වාමියාණෝ දැන් කෙස් වැටි දැළි රැවුල කපා ඒ ශරීරය වසා රත් පවුලක් පෙරව මැටි පාත්‍රයක් අතින් ගෙන මෙම නුවර පෙරළා මෙම ජාතියෙහි දොර දොර සිගමින් සිටියෝ. උන් මහණ වන්නට ගියදා මා දිවි තිබූ ආදීනවයෙන් ලාමක වූ කණට අමධුර වූ සිතට අමනෝඥ වූ හදවත උණු කරවන්නා වූ මෙසේ තෙපළක් ඇසිමි.

රාහුලයන් වැනි එක් වැනි පුතුණු කෙනෙකුන් දැක දැකැ උන් ඇඟ අතගා සිඹැ සනහාත් නොපියා සොරා එකලා ව ගියේ මෙසේ වූ ආශ්චර්යයක් ඇති ගමනකට ද, මෙසේ වූ ශරීර ප්‍රතිභාවක් සොයා ගිය දැ මෙසේ වූ පර්ෂදයක් සොයාද? මේ නුවර හැර ගිය සේ යහපත් ම යැ, නුඹ රජසිරි හැර මහණ වුසේ යහපත් ම යැ. නුඹ ලද සැපත නුඹට ම හොබීමයැ. පෙර නුඹගේ ඒ ආශ්චර්යය රාජ්‍යයට වඩා දැන් නුඹගේ සිඟන රාජ්‍යයට මට රිසියෙයි.

විගැස ම, මයිලණුවන් ශුද්ධෝදන රජ්ජුරුවන් ගේ ගෙට දිව වැද ස්වාමිණි මයිලණුවන් වහන්සේ, නුඹ පුතුණුවන් සිද්ධාර්ථ කුමාරයන් සත් අවුරුද්දකින් තමන්ගේ නුවරට ම ආ තැනැත්තවුන්ට එක දවසකුත් නොසිගවා බත් දීලිය නොහෙන්නේ ද, නුඹ සිගාකෑ කෙනෙක් ද දැන් ඔහු දොරින් දොර පිඩුසිඟමින් සිටියේය. ඔහු නුඹ සේ වූ දරුවන්ට දැඩි කෙනෙක් නැත. නුඹ මේ ගෙයි ඉද කුමක් කරන්නේදැයි යනාදිය මයිල් රජහට දෙඩුහ...”

තම ලේලිය යශෝධරාවන්ගේ මෙවදන් මාලාවෙන් සංවේගයට පත් සුදොවුන් රජු ඇසිල්ලකින් බුදුහිමිපාණන් පිඬුසිගා වඩමින් සිටි වීදියට සම්ප්‍රාප්ත වීය.

“ස්වාමිනී, මා පුතණුවන් වහන්ස, මට අගරු වන සේ, මෙසේ මහ මග පිඩුසිගා නොවැඩමවුව මැයි ඔබවහන්සේ ඇතුළු මේ සියළුම

භික්ෂූන් වහන්සේටලාට දන් පිරිනමාලන්නට මට පිළිවන් යි කීය.”

“මේ අපේ පරපුරේ චාරිත්‍රයයි, මහ රජතුමනි”

“මා දන්නා තරමින් අපේ පරපුර මහා සම්මත රජ පරපුර නොවේද? මහා සම්මත රජ පරපුරේ කිසිවෙක් ආහාර සිගා වීදි දිගේ නොගියහ.” රජතුමා පැවසිය.

“ඒ ඔබේ රාජ පරපුරයි, මහ රජතුමනි. අපගේ පරපුර බුදු පරපුරයි. මෙතෙක් ලොව පහළ සියළුම බුදුවරු පිඬුසිගාවෙන් වීදි බටහ යි” භාග්‍යවතුන් වහන්සේ පිළිවදන් දුන්හ.

බුදුන් වහන්සේ සුදොවුන් නිරිඳුන්ට දෙසු ගාථා පද කිහිපයක් ශ්‍රවණයෙන්, එතුමා සෝවාන්, සකෘදාගාමී, මාර්ග ඵල පසක් කර ගත්තේ ය.

## ii. භාග්‍යවතුන් වහන්සේ සුදොවුන් රජ මැඳුරට වැඩමවීම.

කෙසේ වුව ද, බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝරත්නය තම රජ මැඳුරට කැඳවා ගැනීමට සුදොවුන් රජු සමත්වී ය. රජ මාළිගයේදී ප්‍රණීත දන් වේලකින් බුදුන් වහන්සේ ප්‍රමුඛ සඟුන් පිදූ සුදොවුන් රජු මහත් සැනසිල්ලට හා ප්‍රීතියට පත්වූහ. මහා දාන අවසානයේ බුදු සමිඳුන් සිය පිය රජු ඇතුළු ශාක්‍ය ඥාති සමූහයට ධම්මපාල ජාතකය දෙසූ සේක. දේශනය අවසානයේ රජතුමන් අනාගාමි මාර්ග ඵල පසක් කරගත් අතර ප්‍රජාපතී ගෝතමිය සෝවාන් ඵල ලද්දා ය. දේශනය අවසානයෙහි සියළුම ශාක්‍ය වංශික ඥාති සමුහය භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දණ නමස්කාර කළහ. එනමුදු යශෝධරා දේවිය පමණක් එහි නොවුවා ය. සුදොවුන් රජු යශෝධරාවන් වෙත සේවිකාවක අත පණිවුඩයක් යවනු ලැබී ය. ‘මාගේ ගුණ දම’ පිරීම පිළිබඳව බුදුන් වහන්සේ තුළ පැහැදීමක් තිබේ නම් උන්වහන්සේ මෙහි වඩිනු ඇත.’ ඇය සේවිකාව අත දන්වා එවුවා ය. සුදොවුන් රජ මාළිගයට වැඩි අවස්ථාවේ තමා වහන්සේ බැහැ දැකීමට නොපැමිණි යශෝධරා වෙත කරුණාවෙන් ඇයගේ කුටිය වෙත වැඩමවීමට තරම් භාග්‍යවතුන් වහන්සේ නිහතමානි වූහ. සිය පාත්‍රය පිය රජු අතට දුන් බුදුන් වහන්සේ සාරිපුත්ත මහ මොග්ගල්ලාන යන අගසව් දෙනම සමග යශෝධරා දේවියගේ කුටිය දෙසට පියමන් කළහ. යශෝධරාවන්ට රිසි සේ තමන් වහන්සේ වැඳපුදා ගැනීමට ඉඩ සලසන ලෙසත්, ඇයට කිසිඳු බාධාවක් නොකරන ලෙසත් භාග්‍යවතුන් වහන්සේ තමන් සමඟ ගිය පිරිසට පූර්ව දැනුම් දීමක් කළහ.



## iii. යශෝධරාවගේ වැලපීම

සුදොවුන් රජ යශෝධරාවන් ඉකුත්ව ගිය සත් වසර ගත කළ හුදකලා අසරණ ජීවිතය පිළිබඳව භාග්‍යවතුන් වහන්සේට පැහැදිළි කළේ ය. එම මුළු කාලය ම ඇය ගත කළේ තපස්වරියකට හා සමාන දිවියක් බවද ඔහු සඳහන් කළේ ය. භාග්‍යවතුන් වහන්සේ සිය කුටියට පියමන් කළ විගස ඇය බුදුහිමි සිරිපා වැළඳ හඬා වැටෙන්නට වුවා ය. ගුණගරුක කුල කාන්තාවක වෙනුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ සන්තානයෙහි උසස් සැලකිල්ලක් හා මාර්තෘත්වය කෙරෙහි උත්තරීතර ගෞරවයක් ද පැවතිණි.

යශෝධරා දේවි එදා බුදුන් තමන්ගේ ගෙට වඩනා බව දැන, පන්සියක් පරිවාර ස්ත්‍රීන් හා සමග කෙස් වැටී කපාහැර කසා පිළි පොරවා බුදුන් පිළිගන්නට පෙර මග බලා සිටියේ මහත් නොඉවසිල්ලෙනි. සන්සුන් ගමනින් බුදුපියාණන් යශෝදරාවන් කුටියට වැඩම කර, පනවන ලද ධර්මාසනයෙහි අසුන් ගත් සැණින්, යශෝධරාවන් බුදුන් වහන්සේගේ සිරිපාමුල හිස තබා ඉකිගසමින් හඬා වැටුණාය. එමගින් භාග්‍යවතුන් වහන්සේට කිසියම් අගරුවක් අනාදරයක් ඇතිවිය යන සැකයක් සුදොවුන් නිරිඳුන් තුළ පහළ වීය. එම සිතුවිල්ලෙන් මඩනා ලද රජ තෙමේ, තම ලේලිය සත් වසරක් පුරා කළ කැපවීම භාග්‍යවතුන් වහන්සේ වෙත විස්තර කිරීමට ඉදිරිපත් වීය. එම අවස්ථාව පෞරාණික නෛෂ්ක්‍රමය වර්ණනා නම් කෘතියෙහි සංගෘහිත කර ඇත්තේ සහෘද සිත් සතන් හී ශෝකය දනවන ආකාරයෙනි.

“.... නුඹ වහන්සේ කසා කඩක් පෙරවගත්හයි අසා තුමු ද, කසි සළු නොහැඳ මේ සත් අවුරුද්ද මුළුල්ලේ අද දක්වා තෙලෙ කසා පිළි ම හැන්දි ය. තවද නුඹ වහන්සේ එක් වේලේ වළදි’තියි අසා තොමෝ ද මේ සත් අවුරුද්දෙහි අද දක්වා රෑ කන බතක රස නොදන්නි ය. තවද නුඹ වහන්සේ මල් සුවඳ නොපළදිතිය අසා මෙ සත් අවුරුද්ද මුළුල්ලේ තොමෝ මල් සුවඳ නොපැළැන්දි ය. තවද නුඹ වහන්සේ මැටි පාත්‍රයක් ගෙන සිඟති යි අසා තොමෝ ද, මේ සත් අවුරුද්ද මුළුල්ලෙහි රන් වළදින් නොකා මැටි පාත්‍රයකින් ම කෑව, තවද නුඹ වහන්සේ උසසුන් මහ අසුන්වල නොසැපෙතියි අසා තොමෝ ද, මේ සත් අවුරුද්ද මුළුල්ලෙහි මහා යානාවෙක නොහොත්තී ය. තවද, මාගේ බෝහෝ නෑ රජ දරුවන් අපි රකුම්හයි, අප රකුම්හයි කියා වෙන වෙන බොහෝ පඬුරු එවු කල ගිවිස්නා තබා ඔවුන්ට තමන්ගෙන් තෙපුල් පමණකුත් නොදී නුඹවහන්සේට ම පක්ෂපාතව විසූහ. මෙසේ මගේ යෙහෙළණියෝ නුඹ වහන්සේටම මහත් වු ගුණ ඇතියහ. ඉතා ශික්ෂිතියහ. ඈ නොදැන

කළ වරදට කමා කොට වදාළ මැනවයි කීහ. ස්වාමිදරුවෝ වනාහි වෙස්සන්තර ජාතිකයෙහි බමුණන්ට බැඳ දෙන වේලෙහි ක්‍රිෂ්ණජිනා නම් ප්‍රිය වූ දියණියන් තමන් වහන්සේගේ පය අල්වාගෙන හඬන වේලෙහි උපන් මහ කරුණාවෙන් ම පියකු පය අල්ලාගෙන හඬන දුවක් මෙන් සිතා වැඩහුන් සේක....” සිය හදවත පෙළූ දුක් දොම්නස් පහව ගොස් යශෝධරාව ගේ සිත් සතන් සන්සුන්වූ පසුව භාග්‍යවතුන් වහන්සේ ඇයට සඳකිඳුරු ජාතකය දේශනා කරන ලදහ.

## iv. නන්ද කුමරුන්ට පැවිද්ද ලබාදීම.

භාග්‍යවතුන් වහන්සේ සුදොවුන් මාළිගයට වැඩම කර ගිය පසු එළඹි තුන්වැනි දිනයේදී සුදොවුන් රජු නන්ද කුමරුගේ උත්සව කිහිපයක් සංවිධාන කර තිබිණි. නන්ද කුමාරයාගේ අභිෂේක මංගල්‍යය ගෘහ ප්‍රවේශ මංගල්‍යය සහ විවාහ මංගල්‍යය මෙම ත්‍රිවිධ උත්සව ලෙස සැලකේ.

නව ගෘහ ප්‍රවේශයෙන් පසුව, එහි පැවැති දානමය පුණ්‍යකර්මයට නන්ද කුමරුන් බුදුරජාණන් වහන්සේ ඇතුළු මහ රහතන් වහන්සේලාට ආරාධනා කළේ ය. දාන පුණ්‍යකර්මය අවසානයේ ධර්ම දේශනාවක් ද කළ භාග්‍යවතුන් වහන්සේ පෙරළා නිග්‍රෝධාරාමයට යාම පිණිස නැගී සිටියේ, තමන් වහන්සේගේ පාත්‍රය නන්ද කුමරු අතට දීමෙනි. බුදුන් වහන්සේ පෙරටුව ගමන් ගත් සේක. නන්ද කුමරුන් තුළ තම සොහොයුරා කෙරෙහි පැවැති අසීමිත භක්තිය නිසා ම, ඔහු පාත්‍රය ද රැගෙන බුදුහිමියන් පසුපස ආරාමය දක්වා ම පිය නගන්නට වීය. සඳළුතලයේ සිටි නන්ද කුමරුන් ගේ මනාලිය ‘ස්වාමිනි’ ඉක්මණින් ම පෙරළා එන්නැයි’ කී වදන නන්ද කුමරුන් සිත අභ්‍යන්තරයේ දෝංකාර දෙමින් පැවිතිණි. නිග්‍රෝධාරාමයේදී බුදුන් වහන්සේ නන්ද අත තිබූ පාත්‍රය ආපසු ලබා ගනිමින් ම, ‘නන්ද මහණ වෙන්න කැමැතිදැ’යි විමසූ සේක. නන්ද කුමරු වික්ෂිප්ත බවින් යුතුව බුදුන් වහන්සේ වෙත පැවැති භක්තිය නිසා ම අකැමැත්තෙන් වුව ද ‘එසේය ස්වාමිණි, මහණ වෙන්නම්’ යැයි පැවසිය. එම අවස්ථාවේම ඔහුට පැවිද්ද ලබාදෙනු ලැබීය. එම සිදුවීම බුද්ධත්වයෙන් දෙවැනි වර්ෂයේ වෙසක් මස අව දියවක දා සිදු වූ බව බෞද්ධ ඉතිහාසයේ සඳහන්ය. මෙම පුවත සැලවීමෙන් සුදොවුන් රජ මැදුරම කැළඹිණි. රජු හා මහ ප්‍රජාපතී ගෝතමිය තුළ මෙම පුවත සැලවීමෙන් ඇති වූ වේදනාව ඔවුන් විඳ දරාගත්තේ මහත් අසීරුතාවයෙනි. සත් වසරකට පෙර තම වැඩිමහල් පුතු සිද්ධාර්ථයන් ගිහිගෙය හැරගිය පසුව ඇති වූ



පාළුව කාන්සිය මදකට හෝ තුනී කර ගැනීමට හැකි වුයේ ඔවුන්ගේ දෙවන පුත් නන්දයන් නිසා ය. ඔහුගේ නික්මයාම ද ඔවුන් දැඩි පීඩනයකට බඳුන් කළේ ය. නන්ද කුමාරයාට විවාහ අපේක්ෂිතව සිටි කුමරිය හඬා වැටෙන්නට වුවා ය.

බුදුන් වහන්සේ කෙටි කලකින් කපිල වස්තුපුරයෙන් නික්ම මල්ල රටට සම්ප්‍රාප්ත වූ සේක. එහි අනෝමා නදී තීරයෙහි අනුපිය අඹ වනයෙහි වැඩ වාසය කරන සඳ, සුදොවුන් රජුගේ මෙහෙයවීම මත ශාක්‍ය කුමාරවරු රාශියක් පැමිණ පැවිද්ද ලබා ගත්හ. මෙම පිරිස අතර භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, බිම්බිල යන පිරිස ද වූහ.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩ වාසය කළ සමයෙහි තමන් වහන්සේ විසින් කිඹුල්වත් පුරයේ දී ශ්‍රමන භූමියට ඇතුළත් කරගන්නා ලද නන්ද තෙරුන් පිළිබඳව අසුබ ප්‍රවෘත්තිය භික්ෂු සංඝයා වෙතින් උන්වහන්සේට දැන ගන්නට ලැබිණ. නන්ද තෙරුන් පැවිදිවීමට පෙර තමන් විවාහ ගිවිස ගෙන සිටි ජනපද කල්‍යාණිය පිළිබඳව උකටලී ලෙස පසුවෙමින් සිවුරු හැරයාමේ උත්සාහයක යෙදෙන බව එම අසුභ ප්‍රවෘත්තියෙන් කියැවිණි. බුදුහිමි නන්ද තෙරුණ් තම අභිමුවට කැඳවා එම පුවත නිවැරදි බව තහවුරු කර ගනු ලැබී ය. භාග්‍යවතුන් වහන්සේ ඍධි බලයෙන් නන්ද තෙර තුසිතයට කැඳවාගෙන යන අතර, ගිණිගත් හේනක දා ගිය වැදිරියකගේ ස්වරූපය නන්ද හිමියන්ට දැකගන්නට සැලැස්වූහ. තවුතිසා දෙව්ලොවේදී සක් දෙවිඳුන්ගේ පරිවාර දිව්‍යාංගනාවන් දුටු නන්ද තෙරුන් වශීකෘත වීය. භාග්‍යවතුන් වහන්සේ නන්ද හිමි අමතමින් ‘නන්ද මේ දෙවගණන්, ජනපද කල්‍යාණිය යන දෙපක්ෂයෙන් වඩා සිත්කළු වන්නේ කවරහු දැයි’ විමසූහ. දෙවගණන් වඩා සිත්කළු බවත්, ඔවුන් ඉදිරියේ ජනපද කළ්‍යාණිය තමන් අතරමගදී දුටු දා ගිය වැඳිරියට සමාන බවත්, නන්ද තෙරුන් පැවසීය.

‘නන්ද ශාසන බ්‍රග්මචර්යායෙහි ඇලෙව, එවිට ඒ රූපත් දෙවගණන් ලැබිය හැකි බවට මම ඇපවෙමියි’ බුදුන් වහන්සේ නන්ද තෙරුණ්ට දන්වා සිටියහ. මෙම වදණින් දිරිමත් වූ නන්ද හිමි මහත් කැපවීමකින් උත්සාහ සම්පන්නව මහණදම් පුරා නොබෝ කලකින් සියළු කෙළෙස් නසා අරහත් භාවය ලබාගැනීමට සමත්වූ සේක.

## V. නන්දා ජනපදකලයාණි අපදානය

සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායෙහි ආපදාන පාලියෙහි, නන්ද ජනපද කල්‍යාණියගේ පෙර භවය පිළිබඳව මෙන්ම, ජීවිතයෙහි ඇති අනියත භාවය පිළිබඳවත් කදිමට ගෙන හැර දැක්වේ.

සියළු ධර්මයන්ගේ පරතෙරට පැමිණි, ලෝකනායක වූ පදුමුත්තර ජිනේන්ද්‍රයන් වහන්සේ මෙයින් සුව හස් වැනි කප්හි ලොව පහළ වී වදාළ කල්හි.

"මම හංසවතී නුවර, නන් රුවනින් බබළන, මහත් සුවයෙන් සමර්පිත සිටුකුලයක උපන්නෙමි.

ඒ පියුමතුරා මහ වීරයන් වහන්සේ වෙත එළැඹ, අමෘත වූ පරම ආශ්වාදකර පරමාර්ථප්‍රකාශක ධර්ම දේශනා ශ්‍රවණය කළෙමි.

එකල්හි සංඝයා සහිත ලෝකනායකයන් වහන්සේ නිමන්ත්‍රණ කොට, ඔබට මහ දන් දී සිය දිවිහිමියෙන් ප්‍රසන්න වූවා, සංඝයා සහිත ලෝකනායක වීරයන් වහන්සේ වෙත මස්තකයෙන් වැඳ වැටී, ධ්‍යාන ලද භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ප්‍රාර්ථනා කළෙමි.

එවිට අදාන්තදමක වූ තිලෝකසරණ වූ, ප්‍රභූ වූ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේ ඒ මනා ප්‍රර්ථනාව ලබලන්නෙහි'යි ප්‍රකාශ කළ සේක.

මෙකපින් සුවහස්වන කප්හි, ඔක්කාක කුලය උපත් කොට ඇති, ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘහු ලොවැ පහළ වන්නාහ.

ඔබ දහම් දයාද වූ ඖරස වූ, ධර්මනිර්මිත වූ, නමින් නන්දා නම් වූ, ශාස්තෘශ්‍රාවිකාවක් වන්නේය'යි ප්‍රකාශ කළ සේක.

ඒ අසා ප්‍රමුදිතව ව, මෙත්සිත් ඇතිව විනායක වූ ජිනේන්ද්‍රයන් වහන්සේ දිවිහිමි කොට සිව්පසින් උවටැන් කළෙමි.

මම ඒ කුශලකර්ම හේතුයෙන්ද, චෙතනාප්‍රණිධි හේතුයෙන් ද, මිනිස්කය හැරපියා තව්සිතා දෙව්ලොව උපත ලදිමි.

මම එයින් චුතව යාම දෙව්ලොවට ගියෙමි. එයින් තුසිතයට ද, එයින් නිර්මාණරතියට ද එයින් වශවර්ති පුරවරයට ද ගියෙමි.

ඒ කර්ම බලයෙන් කිසියම් තැනක උපන්නේද, ඒ ඒ තැන දෙව්රජුනට මෙහෙසි බව ලදිමි.

ඒ දෙව්ලොවින් චුත වූවා මිනිසත් බව ලදිමි. සක්විති රජුනට ද, ප්‍රාදේශීය රජුනට ද, මෙහෙසි බව ලදිමි.



සැපත් වළඳ දෙවියන් කෙරෙහි ද මිනිසුන් කෙරෙහිද සුඛිතව නොයෙක් කප්හි සැරිසැරුවෙමි.

පශ්චිම භවය පැමිණිකල්හි මම කිඹුල්වත් නුවර සුද්ධෝදන රජුහට අනින්දිත වූ දුහිතෘ විමී.

සිරිකත වන් රූමත් මා දැකැළු කුලය ප්‍රීතිමත් වීය. ඒ හේතුයෙන් නන්ද යන මාගේ නාමයට සුන්දරී යන උප පදය ද සබැඳි මම සුන්දරීනන්ද නමින් ප්‍රසිද්ධියට පත්වීම.

ඒ රම්‍ය වූ නගරයෙහි යශෝධරාව තබා සියළු යුවතීන් අතර කල්‍යාණි යැයි ප්‍රකට විමි.

මාගේ දෙටු බෑයා තුන්ලොවට අග්‍ර වූ බුදුරජාණෝ ය. එසෙයින් ම කණිටු බෑයා රහත් නමකි. එකල ව ගිහිගෙයි මා මෑණියන්ගේ දෝෂ දර්ශනයට භාජනය වීමි.

දියණියනි, ශාක්‍යකුලයෙහි උපන් ඔබ බුදුරදුන්ගෙන් ද නන්දයන්ගෙන් ද වෙන් වූවා කුමක් හෙයින් ගිහි ගෙයින් රැදෙන්නේ ද යොවුන් බව ජරාව අන්තකොට ඇත්තේ ය. රූපය අපවිත්‍ර යැයි සම්මත ය. නිරෝගී බව රෝගය අන්තකොට ඇත්තේ ය. ජීවිතය මරණය අන්ත කොට ඇත්තේ ය.

චන්ද්‍රයා සේ කාන්ත වූ, මනහර වූ භූෂණයනට වඩා අලංකාර වූ ශ්‍රී සමූහයක් බඳු වූ ලෝක සාරය පිඬු කළාක් වැනි වූ, නෙත්‍රරසායන වූ තොපගේ මේ ශුභ රූපය ද නොබෝ කලකින් ම මහළු බවින් මැඩලන්නේ ය. ජරාවෙන් රූපය මඬිනු ලබන්නේ ය. අනින්දිත දියණියනි, ගෙය හැරපියා තුරුණුවියෙහි දී ධර්මචාරී මඟට පිවිසීම යෙහෙකැයි, ඇයගේ මව නිරන්තරයෙන්ම ඇයට පැවසුවා ය.

රූපලාවණ්‍ය යොබ්බනලාලන පරවශ වූ මම, මවුගේ බස් අසා බුදුසසුන්හි කයින් පැවදි වීමි. එසේ වුව ද සිතින් පැවදි වන්නට තරම් සිත හීලෑ කරගත නොහැකි විය.

මවු තොමෝ මහත් ප්‍රයන්තයෙන් මා ධ්‍යාන ඉගැන්මෙහි යෙදුනක කරන්නට කථා කරයි. මම ඒ සඳහා නොමඳ උත්සාහයේ යෙදුනෙමි.

ඉක්බිති මහාකාරුණික ජිනේන්ද්‍රයන් වහන්සේ කාමයෙහි ලොල්වූ මා දැකැ රූපයෙහි කළකිරවනු පිණිස මා ඇස් හමුයෙහි ස්වකීය අනුභාවයෙන් ශෝභා ඇති දැකුම්කළු ඉතා මනහර මා හටත් වඩා අතිශයින් රූමත් වූ ස්ත්‍රියක් මැව් සේක.

අති විෂ්මය ජනක සිරුරු ඇති ඇය දැක විෂ්මයට පැමණි මම මාගේ නෙත්‍රලාභයක් මිනිසත් බවත් සඵලැ යි සිතු වෙමි.

ප්‍රියාවනි, එව, යමකින් ප්‍රයෝජන ඇත්ද එය මට කියව, ඉදින් තොපට ප්‍රිය වේ නම් තොපගේ නාමගෝත්‍ර ද කියව, මම ඇයට පැවසීමි.

නිර්මිත ස්ත්‍රිය ප්‍රියාවනි, ප්‍රශ්න කිරීමට කල් නොවෙයි මා (තොපගේ) ඇකයට ගනු මාගේ අවයව කිඳා බස්නාක් මෙනි, මොහොතකට තගේ ඇකයට ගනුව,

ඉක්බිති ශෝභන නෙත් ඇති ඕ, මාගේ ඇකයෙහි හිස තබා සයනය කළා ය. එ වෙළෙහි ඉතා දරුණු මකුළුවෙක් ඇයගේ නළලත පතිත විය.

ඒ මකුළුවා වැටීම සමඟ ම මා මුව මඩල බිබිලක් නැඟිණි. බිබිල පුපුරා කුණු වූ සැරව ලෙහෙ වැගිරිණි.

මුව ද බිඳුණේ කුණු දුගද ඇති වීය. සිරුර ඉදිමී නිල් වැ සැරව වගුරවාලීය.

වෙව්ලන සියළු අවයව ඇති ඕ, වරින් වර සුසුම් ලමින් සිය දුක හඟවමින් බැගෑසේ වැළපුණා ය.

දුකින් දුක් ඇති වේ. වේදනාවෝ (මා) පහසිත්, මහ දුක්හි එවිට මම ගැලුණා, වෙමි. යෙහෙලිය, මට පිහිටවව ව යි කීවා ය.

තොපගේ මුඛශෝභාව කොයිද, තොපගේ තුඟු පැහැය කොහීද, තොපගේ තඹවන් බිඹුපල බඳු ලවන් කොහිද, තොපගේ මුව කොහී ගියේ ද,

ඉඳුවන් උවන කොහී ගියේ ද, රන් මිහිගු බෙරයක් බඳු ග්‍රීවා ව කොහි ගියාද, රනෝවිලි වන් ලෙලදෙන කර්ණයෝ විවර්ණයට එළැඹියා ය.

පියුම් කැකුළු බඳු කලස් වැනි පයෝධරයෝ බිඳුණාහු, කුණු වැ ගියාහු දුගඳ ඇති බවට පැමිණියාහු.

සිහිනිඟ හා පුළුලුකුල ඇති ඕ ඉදිමුණු වුණයෙන් කිලිටි වූවා, අසූචියෙන් හරිත වූවාය. රූපය අශාශ්වත ය ආශ්චාර්යයි.

මුළා වූවෝ යම් තැනක ඇලෙත්ද, සිරුරෙහි හටගත් ඒ සියල්ල දුගඳ ය, බිහිසුණුය, සොහොනක් සෙයින් පිළිකුලැ යි කීය.



එවේලෙහි මහාකාරුණික මාගේ බෑයා වූ ලෝකනාථයන් වහන්සේ කලකිරුණු සිතැති මා දැකැ මේ ගාථා වදාළ සේක.

නන්‍දවෙනි, ලෙඩ වන, කුණු වන, වැගිරෙන අපිරිසිදු මිනිස් කය බලව. සිත අසුභ වශයෙන් වඩා එකඟ කරගනුව.

දුගඳ වහනය වන, මළ වැගිරෙන, නුනුවණ අයගේ මන වඩන. මෙය යම්සේද එය මෙසේයි, එය යම්සේ ද මෙය එසේයි,

බුද්ධ දේශනය ශ්‍රවණයෙන් අතිශයින් සංවේගයට පත් මම, එහිම සිට විදසුන් වඩා රහත් වීමි.

## vi. සාමණේර පැවිද්ද ලද රාහුල කුමරු

කිඹුල්වතට වැඩි සත්වන දින බුදුන් වහන්සේ නුවර වීදියේ පිඬු සිඟා වඩිද්දී යශෝධරාවන් තම පුතණුවන්ට සිය පියාණන් හඳුන්වා දුන් ආකාරය පූජාවලියෙහි භික්ෂාටනාදී අද්භූත පූජ කථා නම් වූ පරිච්ඡේදයෙහි, වාච්යාර්ථයන් ඉක්මවන මනෝචාලක සිත්තමක් ලෙසින් පාඨකයා වෙත ඉදිරිපත් කර ඇත.

"......එ කලැ යශෝධරා දේවි තම පුතණුවන් සත් හැවිරිදි රාහුල කුමාරයන් කැඳවා ඇකය පිට හිඳුවාගෙන සිඹ සනහා පුතණ්ඩ රාහුලයෙනි, තොපගේ පියාණන් වහන්සේගේ සතර මහා නිධානයෙක් ඇත. ඒ නිධාන හතර ගව්, දෙගව්, තුන්ගව්, සතරගව් පමණ වටින් ඇතියේ යැ. ගැඹුර මෙතෙකැයි පමණ දන්නෝ නැත. උන්වහන්සේ මහණ වු තැන් පටන් ඒ සතර මහ නිධානය කොතනෙකැ බවත් දන්නෝ නැතැ. තවද ඔබගේ චක්‍රවර්ති රාජ්‍යය හා සත් රුවනෙකුත් ඇතැ. පියණ්ගේ සැපත් දරුවන්ට හිමි වේ දැයි කියාලා තොප පියාණන් වහන්සේ කරා ගොස් ඒ සතර මහ නිධානය හා සත්රුවන් සක්විති රජයන් ඉල්ලා ගනුවයි කීහ. රාහුල කුමාරායෝ මුතුන් රජ්ජුරුවන් අඳුනන බව මුත් පියණ් කවුරුන් බවත් නොදනිති එසේ හෙයින් අම්ම, මපියාණෝ නම් කවරු දැයි කීහ. යශෝධරා දේවි පුතණුවන් වඩාගෙනැ, සී මැඳිරියෙහි දොරැ හැර රාජ වීථියෙහි දෙතිස් මහ පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් හා දිලිහි, දිලිහි කසුන් කඳක් සේ සවණක් රැස් විහ ප්‍රකට විහිදා වඩනා බුදුන්, පුතණුවන්ට අත දිගු කොටැ පෑලා...." යශෝදරාවන් තම පුත් රාහුලයන්ට, මහා පුරිස් ලකුණින් පිරිපුන් බුදුන් වහන්සේ හඳුන්වා දෙන්නේ ලයාන්විත, රසාලිප්ත ගාථා සමුච්චයක් මගිනි. නරසීහ ගාථා තුළින්, භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රතාපවත්, පුණ්‍යවත් දේහ විලාශය මැනවින් ප්‍රකාශ වේ.

## නරසීහ ගාථා :-

**"චක්ක වරඞ්කිත රත්ත සුපාදො**
**ලක්ඛණ මණ්ඩිත ආයත පණ්හී**
**චාමර ඡත්ත විභූසිත පාදෝ**
**ඒස හි තුය්හ පිතා නරසීහෝ**

උතුම් වූ රිය සකක ලක්‍ෂණයන් ගෙන් යුතු රත් පැහැ ශ්‍රී පා යුග්මයකින් හෙබි මඞගල ලක්‍ෂණයන් ගෙන් ශෝභමාන වූ දිගු විළුම් ඇති චාමර, ඡත්‍ර ආදී ලක්‍ෂණයන් ගෙන් යුතු සිරි පා ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි.

**සක්‍ය කුමාර වරෝ සුඛුමාලො**
**ලක්ඛණ විත්තිත පුණ්ණ සරීරො**
**ලොකහිතාය ගතො නරවීරො**
**එස හි තුය්හ පිතා නරසීහො**

ශ්‍රේෂ්ඨ වූ ශාක්‍ය කුලයෙහි උපන් අතිශයින් ම සුකුමාල වූ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයන් ගෙන් ශෝභන වූ සුන්දර පිරිපුන් සිරුරක් ඇති දෙව් මිනිසුන් සහිත ලෝකයාට හිත සුව පිණිසම වැඩියා වූ අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි.

**පුණ්ණ සසඞක නිභෝ මුඛවණ්ණො**
**දෙව නරාන පියො නරනාගො**
**මත්ත ගජින්ද විලාසිත ගාමී**
**එස හි තුය්හ පිතා නරසීහෝ**

පුන් සඳ මඩල වන් බබළන මුව ශෝභා ඇති, දෙව් මිනිසුන් සහිත ලෝක සත්‍වයන් ගේ මන වඩන්නා වූ නර ශ්‍රේෂ්ඨ වූ මහා හස්ති රාජයකුට සමාන ගමන් විලාශයක් ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් ය.

**ඛත්තිය සම්භව අග්ග කුලීනො**
**දෙව මනුස්ස නමස්සිත පාදො**
**සීල සමාධි පතිට්ඨිත චිත්තො**
**එස හී තුය්හ පිතා නරසීහෝ**

උතුම් ක්‍ෂත්‍රිය වංශයේ උපන් ශ්‍රේෂ්ඨ වූ කුල වත්, දෙව් මිනිසුන් විසින් නමස්කාර කරණු ලැබූ පා පියුමින් යුත්, සීල සමාධියෙහි පිහිටි මනා සිත් ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි.

**ආයත තුංග සුසණ්ඨිත නාසො**
**ගෝපඛුමෝ අභිනීල සුනෙත්තො**
**ඉන්දධනු අභිනීල භමූඛො**
**එස හි තුය්හ පිතා නරසීහො**



දික් වූ උස් වූ මනා කොට පිහිටි දික් තුඟු නාසයක් ඇති, අලුත උපන් ගව පැටවකුගේ ඇස් දෙකට සමාන වූ ඉතා නිල්වන් වූ සුන්දර ඇස් දෙකක් ඇති දේදුනු දෙකක් වැනි ඉතා නිල්වන් වූ දෙබැමින් යුත් අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේයි.

**වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවො**
**සීහ හනු මිගරාජ සරීරො**
**කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො**
**එස හි තුය්හ පිතා නරසීහෝ**

වට වූ මැනවින් වට වූ මනා කොට පිහිටි ගෙලකින් හෙබි ඇති සිංහයකු ගේ වන් පිරිපුන් හනු ඇති මෘග රාජයකු ගේ වැනි පෙර කයක් ඇති රන්වන් වූ සිනිඳු සිවියක් ඇති උතුම් පැහැ ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේයි.

**සිනිඬ සුගම්භිර මඤ්ජු සුඝෝසො**
**හිංගුල බද්ධ  සුරත්ත සුජිව්හො**
**වීසති වීසති සේත සුදන්තො**
**එස හි තුය්හ පිතා නරසීහො**

සිනිඳු වූ අතිශයින්ම ගැඹුරු වූ ඒවාගේ ම මිහිරි වූ මනා කට හඬක් ඇති රත්හිරියල් වැනි ඉතා රතු වූ දිවක් ඇති උඩ යට යන හනු දෙකේම විස්ස බැගින් වූ සුදු පැහැති දත් හතළිහක් ම ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි.

**අඤ්ජන වණ්ණ සුනීල සුකේසො**
**කඤ්චන පට්ට විසුද්ධ ලලාටො**
**ඕසධි පණ්ඩර සුද්ධ සුඋණ්ණො**
**ඒස හි තුය්හ පිතා නරසීහො**

අඳුන් පැහැ ගත් හිස කෙස් ඉතා නිල්වන් පැහැයෙන් යුක්තය. රන්පටක් වැනි විශුද්ධ වූ පළල් නළල් තලයක් ඇති සිකුරු තරුව මෙන් දීප්තිමත් වූ සුදු පැහැති ඌර්ණ රෝමයක් ඇති අර එන නරශ්‍රේෂ්ඨයා ඔබේ පියාණන් වහන්සේ යි.

**ගච්ඡති නීලපථෙ විය චන්දො**
**තාරගණා පරිවෙඨිත රූපො**
**සාවක මජ්ඣගතො සමණින්දො**
**එස හි තුය්හ පිතා නරසීහො"**

තාරකා සමූහය පිරිවරා ගත් පූර්ණ චන්‍ද්‍රයා අහසෙහි ගමන් කරන්නාක් මෙන් ශ්‍රාවකයන් සමූහයා පිරිවරා ගෙණ අර මහ මග වඩින්නා වූ සමිදාණන් ඔබේ පියාණන් වන්සේයි.

යනාදී වශයෙන් මෙම නරසීහ ගාථා කීවා ය.

දායාද පතමින් තමන් වහන්සේ පසුපස පියමන් කළ කුඩා රාහුල කුමරුන්ට භාග්‍යවතුන් වහන්සේ, මිහි මත ලබාදිය හැකි උත්තරීතර දායාදය හිමි කරදුන් සේක. ඒ රාහුල කුමරුවන් පැවිදි දිවියට ඇතුලත් කරගැනීමයි. මෙම සිදුවීම සුදොවුන් රජු සිත් රිදවීය. බුදුන් වහන්සේ වෙත එළැඹි සුදොවුන් රජ මතු දෙමාපිය අවසරයෙන් තොරව දරුවන් පැවිදි දිවියට ඇතුළත් නොකරන ලෙසට ආයාචනා කළේය. අදහස පිළිගැණිනි. මතු දෙමාපිය අවසරයෙන් තොරව කුඩා දරුවන් පැවිදි දිවියට ඇතුළත් නොකළ යුතු බවට විනය ශික්ෂා පදයක් පනවනු ලැබිණි. තත් ශික්ෂා පදය මහා වග්ග පාලියෙහි, 'මහණෙනි, එසේ නම් අද පටන් මව්පියන්ගේ අවසරය නොලැබූ කුල දරුවෙකු පැවිදි නොකළ යුතුය. යමෙක් පැවිදි කරන්නේ නම් ඔහුට දුතුළා ඇවැත් වන්නේය' යනුවෙන් සඳහන්ව ඇත.

## රාහුල කුමරුගේ අතීත භවය :-

රාහුල කුමරුන්ගේ අතීත කථාවද මෙහි දී නිතැතින් ම අපගේ මතකයට නැගේ. නාග ලෝකයෙහි නා රජිඳුන් ලෙස උපත ලද පඨවින්දර, පදුමුත්තර බුදුන් වහන්සේ තම වාස භවනට කැඳවා දානයක් පිරිනැමීමට කටයුතු සංවිධානය කළේ ය. භික්ෂු සංඝයා පිරිවරින් නාග භවනට වැඩි පදුමුත්තර බුදුන් වහන්සේ, උපරේවත සාමණේරයන් වහන්සේ ද, එම දානයට සහභාගී කරවූ සේක. උපරේවත හිමිගේ ශරීර ලක්ෂණ පදුමුත්තර බුදුන් වහන්සේගේ ශරීර ලක්ෂණවලට බෙහෙවින් සමාන වීය. පඨවින්දර නා රජු තම විමනට වැඩ සිටි ස්වාමින් වහන්සේලා ගෙන් මෙම සමානතාවයට හේතු විමසී ය.

පදුමුත්තර ශාස්තෘන් වහන්සේගේ ගිහි කළ පුත්‍රයා වූ නිසා අපේ භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි ඇතැම් මහ පුරුෂ ලක්ෂණ උපරේවත තෙරුණ්ගේ කයෙහ විද්‍යාමාන වේ යැයි සෙසු ස්වාමින් වහන්සේලා නා රජුට කරුණු පැහැදිළි කළේ ය.

දානය අවසනායේදී පදුමුත්තර බුදුන් වහන්සේගේ දෙපා මුල වැඳ වැටුණු පඨවින්දර නා රජු තමන් විසින් සිදු කළ මෙම දාන කුසල කර්මයේ බලයෙන් තමන්ට ද පදුමුත්තර බුදුන් වහන්සේගේ ගිහි කළ පුත් වූ මෙම උපරේවත තෙරුණ් මෙන් අනාගතයේ ලොව පහළ වන බුදු බව ලබන බෝධි සත්වයන් වහන්සේ නමකගේ පුත්‍රයා වීමට භාග්‍ය ලැබීමට ප්‍රාර්ථනා කළේ ය.

කල්ප ලක්ෂයක් ඇවෑමෙන් ලොව පහළව බුද්ධත්වය ලබන සිදුහත් කුමරුන්ගේ පුත්‍රයා බවට පත්ව රාහුල නමින් ප්‍රකටව බුදු සසුනෙහි පැවිදිව මහ රහත් බව පසක් කරගන්නා බව දේශනා කළ පදුමුත්තර බුදුන් වහන්සේ වෙතින් ඔහු නියත විවරණ ලැබී ය.



නියත විවරණ ලද දින විවිධ පුණ්‍ය ක්‍රියාවල නිරත පඨවින්දර නා රජු නාලොවින් චුතව සුගතියෙහි උපත ලැබී ය. අනතුරුව බොහෝ කලක් සසර සැරි සරා ශාක්‍ය මුණි ගෞතම සම්මා සම්බුදු රාජාණන් වහන්සේ ලොව පහළ වන අවදියේ මනුලොව උපත ලැබී ය. සිදුහත් කුමරුන් හා යශෝධරාවන්ගේ පුත් රුවන ලෙස ජන්ම ලාභය ලද රාහුල කුමරු භවයේ අවස්ථා ගණනාවක දී ම බෝ සතුන්ගේ පුත්‍රයා ලෙසින් ඉපිද ඇති බව ජාතක පොතෙන් හෙළි වේ.

මඛාදේව ජාතකයෙහි මඛාදේව රජුගේ පුතු ලෙසින් ද, සීහ කොට්ටුක ජාතකයෙහි සීහ රජුගේ පුතු ලෙසින් ද, උරග ජාතකයෙහි බමුණාගේ පුතු ලෙසින් ද, කුම්භකාර ජාතකයෙහි කුම්භකාරගේ පුතු ලෙසින් ද, චුල්ල සුතසෝම ජාතකයෙහි සුතසෝම රජුගේ වැඩිමහල් පුතු ලෙසින් ද, විදුර ජාතකයෙහි විදුර පණ්ඩිතගේ පුතු ලෙසින් ද, වෙස්සන්තර ජාතකයෙහි වෙස්සන්තර රජුගේ පුතු ලෙසින් ද උපත ලබා ඇති බව ජාතික පොතෙහි සඳහනි.

බුදුන් වහන්සේගේ දිවා විහරණය සඳහා අන්ධ වනයට වැඩ එහිදී රාහුල තෙරුණ්ට ධර්මාවබෝධය පිණිස ජීවිතයෙහි අනියතතාව පිළිබඳ පවත්වන ලද දේශනාව අවසානයෙහි රාහුල තෙරණුවෝ සකල ක්ලේශයන් ප්‍රහීනයට පත්කරමින් සිව් පිළිසිඹියා පත්ද සමඟින් මහ රහත්භාවයට පත්වූ සේක. රාහුල තෙරුණුවන් රහත් භාවයට පත්වන අවස්ථාවේ උන්වහන්සේ විසිවැනි වියෙහි පසු වූ බැව් පපංඤ්චසූදනී යෙහි සඳහනි. රාහුල මහ තෙරුණ් ශාසනයෙහි ශික්ෂාකාමී භික්ෂූන් අතරින් අග්‍රස්ථානයට පත්වූ බව ප්‍රකට කරුණකි.

සංයුක්ත නිකායෙහි නිදාන වර්ගයෙහි රාහුල සංයුක්තයෙහි, භාග්‍යවතුන් වහන්සේගේ ජේතවන විහාරයෙහි වැඩවසන සමයෙහි, තමන් වහන්සේ වෙත එළැඹි රාහුල හිමි වෙත සසරෙහි පවත්නා අනාත්‍යතාව පසක්කරලීම පිණිස, චක්කු, වින්නාන, සමතස්ස, වේදනා, සන්නා, සන්තේවතා, තණ්හා, ධාතු, ඛන්ධු යන සූත්‍ර දේශනා කරන ලද බව සඳහන් වේ.

භද්දකච්චානා (යශෝධරා) ස්ථවිරාවියන් තමා බිහිකළ පුත් වූ රාහුල හිමියන් දක්නට දිනපතා ම විහාරය වෙත පැමිණීම සිරිතක්ව පැවතිණි. එක් දිනක් භද්දකච්චානා තෙරණියට කුසේ වේදනාවක් ඇතිවී රහල් හිමි දැකගැනීමට පැමිණීමට අවකාශයක් නොවීය. අන්තේවාසික භික්ෂුණියකගෙන් තම මෑණියන් ගිලන්ව සිටින බැව් සැලවී, රාහුල තෙරණුවෝ වහා තම මෑණියන් වැඩසිටි ආරාමයට ගියහ. මෙම රෝගය ගිහි ගෙයි සිටියදී වැළඳනු අවස්ථාවල මී අඹ සමඟ

හකුරු අනුභව කළ විට සුවපත් වන බව උන්වහන්සේට දැන ගන්නට ලැබී ය. එම අවශ්‍යතාව සැරියුත් තෙරුණ්ට දන්වා උන්වහන්සේ සමග පසේනදී කොසොල් රජතුමා වෙතින් මී අඹ සහ හකුරු ලබාගත් බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මී අඹ වැළඳූ භද්දකච්චායනා තෙරණියගේ අසනීපය සුවපත් වූ බැව් ද පැවසේ. මෙම සිද්ධිය දම් සභා මණ්ඩපයට රැස් වූ මහ තෙරුණ් සාකච්ඡා කරමින් සිටි තැනට වැඩි ලොව්තුරු බුදුරජාණන් වහන්සේ අදත් මතුනොවේ පෙරත් ශාරිපුත්‍ර ස්ථවිරයන් රාහුල මාතාවන්ට අඹ දුන්නේ වේ දැයි වදාරා අබ්භ්‍යාන්තර ජාතකය වදාළ සේක.

තම ආයු කාලය අවසන් වෙමින් පවතින බැව් දිවියෙහි මධ්‍යම භාගයට එළඹෙද්දී රාහුල තෙරුන්ට පසක් වීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි රාහුල තෙරුණ්, පිරිණිවන් පෑම පිණිස උන්වහන්සේගේ අවසරය ඇයැද සිටියේ ය. බුදුන් වහන්සේ වෙතින් ඒ සඳහා අවසරය ලැබිණි. පිරිනිවන්පාන්නේ කිනම් ස්ථානයක දැයි මෙහිදී භාග්‍යවතුන් වහන්සේ රාහුල හිමිගෙන් විමසා සිටි සේක.

'භාග්‍යවතුන් වහන්ස, මාගේ පරිනිර්වාණය තව්තිසා දෙව්ලොවදි සිදුවනු දැකීමට බොහෝ දෙවිවරු කැමැත්තෙන් සිටිති. ඔවුන්ගේ කැමැත්ත පරිදි තව්තිසා දෙව්ලොවට ගොස් එහිදී පිරිනිවන් පාන්නෙමියි. රාහුල තෙරුණ් මහත් භක්තියෙන් බුදුපියාණන් වෙත සැළකර සිටියහ. සුමංගල විලාසිනිය, සඳහන් කරන පරිදි තව්තිසා දෙව්ලොව පිරිනිවන් පෑ එකම තෙරුණ් ලෙසින් රාහුල තෙරුණ්ගේ නම බෞද්ධ ඉතිහාසයට එක්වී ඇත.



රාහුල කුමරු පැවිද්ද ලද ස්ථානය, වත්මනයේ ශිවලිංගය අදහන හින්දුන්ගේ දෙවොලක් බවට පත්ව ඇති සැටි...



රාහුල කුමරු පැවිද්ද ලද ස්ථානය



# 18. දෙවැනි සහ තෙවැනි වර කපිලවස්තු නුවරට වැඩම කිරීම.

## i. ශාක්‍ය කෝලිය වංශ ගැටුම සමථයකට පත් කිරීම.

වෛශාලියෙහි වැඩි සිටි සම්මා සම්බුදුරජාණන් වහන්සේ වස් පවරා යළි දෙවැනි වරටත් තම නිජබිම වූ කපිලවස්තු පුරයට වැඩිසේක. නිග්‍රෝධාරාමයෙහි විවේක සුවයෙන් කල් ගත කළ බුදුන් වහන්සේට ශාක්‍ය කෝලිය දෙරට රජුන් රෝහිණී නදියේ ජලය බෙදාගත නොහැකිව සංග්‍රාමයකට සූදානම් වන බව දැන ගන්නට ලැබිණි. මහ මනුෂ්‍ය විනාශයක් සිදුවන්නට යන බව අවබෝධ කරගත් භාග්‍යවතුන් වහන්සේ, රෝහිණී නදිය දෙපස කඳවුරු බැඳගෙන සිටි ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතරට අහසින් වැඩිසේක. දෙපිරිස මධ්‍යයේ ඍධි බලයෙන් එලක් බැඳ එහි වැඩ සිටි බුදුහිමි දෙපිරිසට අත්තදණ්ඩ සූත්‍රය දේශනා කළ සේක. දෙපිරිස අතර තැකෑරෙමින් පැවැති වෛරය ක්‍රෝධය දේශනය අවසානයේ පහව ගියේ ය. වැඩිදුරටත් එම දෙපරිසට එන්දන, දද්දභ, ලටුකික ජාතක හා අත්තදාන සූත්‍රය දේශනා කර දෙවංශිකයන් සමගි කරවූ සේක. මෙම දේශනා අවසානයෙහි ශාක්‍ය කෝලිය වංශ දෙකේ ම කුමාරවරු 250 බැගින් 500 දෙනෙක් බුදුන් වහන්සේ වෙත එළැඹ පැවිදි බව අයැද සිටිය ය. ඔවුන් සියළු දෙනා ඒහි භික්ෂු ප්‍රව්‍රජ්ජාවෙන් පැවැදි කළහ. මෙම පිරිස පැවිද්දට ඇලුම් කළහ. ඔවුන්ගේ අඹුදරුවන් විටින්විට නිග්‍රෝධාරාමයට පැමිණ තම ස්වාමිපුරුෂයන් යළි ගිහි බවට පමුණුවා ගැනීමේ උත්සාහයක යෙදිණි. එපවත් දැනගත් භාග්‍යවතුන් වහන්සේ ඍධියෙන් නවක භික්ෂූන් සියළු දෙනා හිමාලය වනයට රැගෙන ගොස් කුණාල ජාතකය වදාළ සේක. දේශනය අවසානයේ ඔව්හු මාර්ග ඵල ලදහ. උසභ ශාක්‍ය කුමාර, ගෝතම ශාක්‍ය කුමාර, සුදොවුන් රජුගේ පුරෝහිත පුත් සප්පදායි, නිසභ, කෝලිය පුත් ආදී බොහෝ පිරිසක් ද බුදු දහම කෙරෙහි පැහැදි සසුන්ගත වූහ.

රෝහිණී නදිය නම් කර ඇති පුවරුව






ශාක්‍ය කෝලිය ගැටුම් සිහිගන්වමින් රෝහිණී නදිය නිසලව ගලා බසින්නී.

මේ සමයෙහි බුදුන් වහන්සේ වෙත එළැඹි දස දහසක් සක්වල දෙව් බමුන් වෙනුවෙන් භාග්‍යවතුන් වහන්සේ මහා සමය සූත්‍රය දේශනා කළහ.

## ii. ගිලන් වූ සුදොවුන් නිරිඳුන්ට පිළිසරණවීම

භාග්‍යවතුන් වහන්සේ විසල් පුර සමීප වනයෙහි කූටාගාර ශාලා ආරාමයෙහි වැඩසිටි සමයෙහි අලුයම ලොව බලා වදාරණ අවස්ථාවේ සුදොවුන් නිරිඳුන් තමන් දැකීමේ ආශාවෙන් පසුවන බව පෙනී ගියේය. මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ දිනකට තෙවරක් ලොව බලා වදාරණ බවත්, එකල්හි පිහිට වියයුතු කිසියම් කෙනෙකුන් වුවහොත් බුදු නැණස ඒ පුද්ගලයා වෙත යොමු වන බවත් අටුවාවල සඳහන් ය.

මහා සංඝයා ද කැටුව උන්වහන්සේ ඍද්ධි මහිමයෙන් යළි කිඹුල්වත වෙත වැඩිසේක. සුදොවුන් රජු රෝගාතුරව යහනෙහි සැතපී සිටියේ ය. පිය රජුගේ සයනය ආසන්නයේ පැනවූ අසුනක වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ තම පියාණන්ගේ නළලෙහි සිය දක්ෂිණ හස්තය තබා රෝගය සමනය සඳහා සත්‍යක්‍රියා කළහ. භාග්‍යවතුන් වහන්සේ, අනුගමනය කළ නන්ද තෙරුන්, සුදොවුන් රජුගේ දකුණතද, ආනන්ද මහ තෙරණුවෝ රජුගේ වම් අතද සැරියුත් මහ තෙරණුවෝ පිටද, මුගලන් මහ තෙරුණුවෝ දෙපයෙහිද සිය අත්ල තබා සත්‍යක්‍රියා කළහ. මේ සියළු සත්‍යක්‍රියා බලයෙන් සුදොවුන් රජගේ වේදනාව දුරුවීය.

අනතුරුව බුදුන් වහන්සේ පිය රජුට අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මයෙන් අනුශාසනා කළ සේක. දේශනාව අවසානයේ සුදොවුන් රජු රහත් ඵල ලැබීමට පුණ්‍යවන්ත විය. එවක් පටන් රජතෙමේ සතියක් පුරා විමුක්ති සුවයෙන් කල් ගෙවීය. ඒ වන විට තමන්ගේ ජීවිතයේ අවසාන මොහොත එළඹ ඇති බව රජුට පසක් වී තම යහන වටා රැස් වී වැළපෙමින් සිටි ප්‍රජාපති ගෝතමිය ඇතුළු ඥාතීන්ට ශෝකවීමේ නිශ්ඵල බව පෙන්වා දී ජීවිතයේ ස්වභාවය සියල්ලන්ට ම පසක් කර දෙමින් සුදොවුන් රජු අනුපාදිශේෂ පරිනිර්වාණයෙන් පිරිනිවන් පෑහ. භාග්‍යවතුන් වහන්සේ මහත් ගෞරව සම්ප්‍රයුක්තව පිතෘ දේහය ආදාහනය කර ශෝකයට පත් ඥාතීන් හා රට වැසියන්ගේ ශෝකය සංසිදෙන සේ සියළු සත්වයන් මරණයට යටත් බව දක්වමින් ධර්ම දේශනා කොට යළි වෛශාලී පුරයට වැඩිසේක.





සුදොවුන් රජුගේ ස්ථූපය

## iii. මහා ප්‍රජාපති ගෝතමී කාන්තා පැවිද්ද ලබා ගන්නට ගත් උත්සාහය

සුද්ධෝදන නිරිඳුන්ගේ අභාවයෙන් පසුව ගිහි ජීවිතය පිළිබඳව බෙහෙවින්ම කළකිරුණු ප්‍රජාපතී ගෝතමිය පැවදි දිවියට ඇතුළු වීමට අදහස් කළා ය. එවකට නිග්‍රෝධාරාමයෙහි විවේක සුවයෙන් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹි ප්‍රජාපතී ගෝතමිය,

"භාග්‍යවතුන් වහන්ස, බුදු සසුනෙහි උතුම් පැවිද්ද ලබාගැනීම කාන්තාවන්ට ද ඔබවහන්සේගේ අනුදැනුම ලබා දෙන්නේ නම් මැනවැ" සැළකර සිටියා ය.

"ගෝතමිය මට එය අනුදන වදාළ නොහැකිය. මෙම ශාසනයෙහි කාන්තාවන් පැවදි බව අපේක්ෂා නොකළ යුතු යැයි, බුදුන් වහන්සේ වදාළ සේක.

දෙවැනි වරටත් සිය ඉල්ලීම ඉදිරිපත් කළ නමුත් ඒ සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙතින් අනුමැතිය නොලැබුණි. මහා ප්‍රජාපතී ගෝතමීය, කාන්තාවන්ට ද සසුන් ගත වීමට අවස්ථාව සලසා ගැනීමට ගත් උත්සාහය චුල්ලවග්ග පාලියෙහි භික්ඛුණී ඛන්ධකය යෙහි මනාව පැහැදිළි වේ.

"ගෞතමීනි, කම් නැත. තථාගතයන් දැන හෙළි කළ සස්නෙහි ගිහිගෙන් නික්ම මාගමක් හෝ පැවදි වනු ඔබට රිසි නොවේවා" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

දෙවැනි වරද මහ ප්‍රජාපති ගෞතමී තොමෝ.... වහන්ස, මාගම... පැවිද්ද ලබන්නී නම් මැනැව, යි කීවා ය.

ගෞතමීනි, කම් නැත. මාගමක්හු පැවදි වනු ඔබට රිසි නොවේවායි. භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

තෙවෙනි වරද මහ ප්‍රජාපති ගෞතමී තොමෝ වහන්ස, මාගම පැවිද්ද ලබන්නී නම් මැනැවැ යි කීවාය.

ගෞතමීනි, කම් නැත. තථාගයන් දැන හෙළි පෙහෙළි කළ සස්නෙහි මාගමක පැවදිවනු ඔබට රිසි නො වේවා යි, භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති මහ ප්‍රජාපති ගෞතමී, මාගමට ගිහිගෙයින් නික්ම තථාගත ප්‍රව්දිත සස්නෙහි පැවිද්ද භාග්‍යවතුන් වහන්සේ නො අනුදන්නා සේකැ යි, දුක් ඇත්තී, දොම්නස් ඇත්තී, කඳුළු පිරී මුහුණු ඇත්තී හඬමින් භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියා ය. එයට පසු භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්හි කැමැති තාක් වැස විසල් පුරාබලා නික්මැ සැරිසරා වැඩි සේක. පිළිවෙලින් සැරිසරා වඩනා සේක්, විසල් පුරට පැමිණ වදාළ සේක. ඒ කලැ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසල් පුර මහ වනයෙහි කුරා රහල් හි වැඩ වසන සේක.

එක ළ මහ ප්‍රජාපති ගෞතමී කෙහෙ සිඳුවා කසාවත් හැඳ බොහෝ ශාක්‍ය ස්ත්‍රීන් කැටුව විසල් පුර බලා නික්මියා ය. පිළිවෙලින් ගොස් විසල් පුර මහවෙනෙහි කුළාරහලට එළැඹියා ය. ඉක්බිති මහ ප්‍රජාපතී ගෞතමී ඉදිමුණු පයින්, දුහුවිලි වැකි ගතින් යුතු වැ දුක් ඇත්තී දොම්නස් ඇත්තී, කඳුළු පිරි මුහුණ ඇත්තී, හඬමින් බිහිදොර කොටුයෙහි සිටියා ය. එසේ සිටුනා ප්‍රජාපතී ගෞතමිය ආනන්‍ද තෙරණුවෝ දුටුවාහු. දැකැ 'ගෞතමීනී, කවර හෙයින් තෙපි ඉදිමැගිය පයින් දුහුලි වැකි ගතින් යුතුව දුක් ඇත්තෝ, දොම්නස් ඇත්තෝ, කඳුළු පිරි මුහුණැත්තෝ, හඬන්නෝ මේ බිහි දොරකොටුයෙහි සිටිවුදැයි,' විචාළහ. 'ආනන්‍දයන් වහන්ස, එසේ මැ යැ, භාග්‍යවතුන් වහන්සේ මාගමට ගිහියෙන් නික්ම තථාගත ප්‍රව්දිත ශාසනයෙහි පැවදි වන්නට නො අනුදන්නා සේකැ',යි ඕ කීවා ය.

'එසේ වී නම් ගෞතමීනි, මා මාගමට ගිහිගෙයින් නික්මැ තථාගත ප්‍රවීදිත සස්නෙහි පැවිද්දට භාග්‍යවතුන් වහන්සේට යාච්ඤා කොට එන තෙක් තව මොහොතක් මෙහි ම පොරොත්තු වන්නැ'යි, අනන්‍ද තෙරණුවෝ වදාළහ.



ඉක්බිති ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා වැඩියහ. වැඩ පසෙක උන්හ. පසෙක හුන් ආනන්ද තෙරණුවෝ, වහන්ස, මේ මහ ප්‍රජාපතී ගෞතමී ඉදිමුණු පයින් දූලි වැකි ගතින් යුතුවැ භාග්‍යවතුන් වහන්සේ මාගමට තථාගත ප්‍රවිදීත ශාසනයෙහි ගිහියෙන් නික්ම පැවිද්දට නො අනුදන්නාසේකැ'යි දුක් ඇත්තී දොම්නස් ඇත්තී, කඳුළු පිරී මුහුණ ඇත්තී හඬමින් සිටියා වෙයි. වහන්ස, මාගම තථාගත ප්‍රවිදීත ශාසනයෙහි ගිහිගෙන් නික්ම පැවිද්ද ලබන්නී නම් මැනැවැයි, වදාළහ.

"කම් නැත ආනන්දයනි, මාගමට ගිහිගෙන් නික්මැ තථාගත ප්‍රව්දිත ශාසනයෙහි පැවිද්ද තොපට රිසි නො වේවා" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

දෙවෙනි වරද අනඳ තෙරණුවෝ "වහන්ස, මාගම පැවිද්ද..... ලබන්නී නම් මැනැවයි" වදාළහ.

"අනඳයිනි, මාගමට..... පැවිද්ද තොපට රිසි නො වේවා" යි වදාළ සේක.

තෙවෙනි වරද ආනන්ද තෙරණුවෝ "වහනස්, මාගම.... පැවිද්ද ලබන්නී නම් මැනැව"යි වදාළහ.

"ආනන්දයිනි, මාගමට....... පැවිද්ද තොපට රිසි නො වේවා"යි (තෙවෙනි වරද) භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

එකල ආන්නද තෙරණුවෝ "භාග්‍යවතුන් වහන්සේ මාගමට ගිහිගෙන් නික්මැ තථාගත ප්‍රව්දිත ශාසනයෙහි පැවිද්ද නො අනුදන්නා සේක. අන් වටා මගෙකිනුත් මාගමට ගිහිගෙන් නික්මැ තථාගත ප්‍රව්දිත සස්නෙහි පැවිද්ද යෙදේ නම් නම් මැනැවැ"යි සිතූහ. ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් "වහන්ස, මාගම සෙදගැමිපල හෝ අනගැම්පල හෝ රහත් පල හෝ පසක කරන්නට භව්‍යද"? (හැකිද?) යි විචාළහ.

"අනදයෙනි, මාගම ගිහිගෙන් නික්මැ තථාගත ප්‍රව්දිත ශාසනයෙහි පැවිදි වැ සොවත් පල සෙදගැම්පල අනගැම්පල රහත් පල පසක් කරන්නට භව්‍ය යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වහන්ස, මාගම... රහත්පල පසක් කරන්නට භව්‍ය වේ නම්..... වහන්ස මහ ප්‍රජාපතී ගෞතමී භාග්‍යවතුන් වහන්සේට (කළ) බොහෝ උපකාර ඇත්තී ය, කුඩා මෑණියෝය, ආපාදිකා යැ, වැඩූ යැ, පෝෂණය කළ තැනැත්තී ය, කිරිදුන් තැනැත්තී ය, මව කලුරිය කළ කල්හි සිය තනයෙන් කිරි පෙවූවා ය. වහන්ස, මාගම ගිහිගෙන් නික්ම තථාගත

ප්‍රව්‍රජිත ශාසනයෙහි පැවිද්ද ලබන්නී නම් යෙහෙකැ"යි අනඳ තෙරණුවෝ වදාළහ.

"අනඳයෙනි, මහ ප්‍රජාපති ගෞතමී ගරු දහම් අටක් පිළිගන්නී නම්, එය ම ඇයගේ උපසම්පත්ති වේවා. මේ ඒ ගරු දහම් අට ය."

උපසපැන් වැ සියක් වස් වු මෙහෙණ වසින් එදවස් උපසපන් වු මහණ හට වැඳුම දැ හුනස්නෙන් නැඟී සිටීම දොහොත් මුදුන් තබා නැමදීම සාමීචි කර්මය නිසිවත් කළ යුතු. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුදා යවිදිවි නො ඉක්මැ රැක්ක යුතු.

මෙහෙණ විසින් භික්ෂූන් නැති ගමෙකැ වු ආවාසයෙකැ වස් නො විසියැයුතු. මේ දහම ද..... යවිදිවි නො ඉක්මියැයුතු.

අඩමසක් පාසා මෙහෙණ විසින් බික්සඟන කෙරෙන් පොහෝ විචාරීම ද ඔවා ලබනුවස් එළැඹීම ද යන දෙ දහම් අපේක්ෂා කළ යුතු. මේ දහම ද..... යවිදිවි නො ඉක්මියැ යුතු.

වස් වුසු මෙහෙණ විසින් භික්ෂු භික්ෂුණී යන දෙසඟ පිරිස්හි ම දුටු දැයින් ඇසු දැයින් සැකකළ දැයින් යන තුන් දැයින් පැවැරිය යුතු. මේ දහම ද ... යවිදිවි නො ඉක්මියැයුතු.

ගරු ඇවැත් අවන් මෙහෙණ වසින් දෙ සඟන කෙරෙහි පක්ෂ මානත පිරියැයුතු. මේ දහම ද.... යවිදිවි නො ඉක්මියැයුතු.

දෙ අවුරුද්දක් දහම් සයෙක්හි හික්මුණු සික ඇති මෙහෙණිය විසින් ද සඟන වෙතැ උපසපුව සෙවියැ යුතු. මෙ දහමුදු.... යවිදිවි නො ඉක්මයැයුතු.

මෙහෙණ විසින් කිසිඳු කරුණෙකින් මහණ තෙම ආක්‍රොශ පරිභව නොකළ යුතු. මේ දහම ද.... යවිදිවි නො ඉක්මියැයුතු.

අද සිට ඉදිරියට මෙණෙනට මහණුන් විසාහි (මෙසේ යව, මේ දැ කරව ඈ විසින්) අණ දෙනු විසින් කථා මඟ හවුරන ලදුයේ ය, මෙහෙණන් විසාහි මහණුවට කථා මඟ නොහැවුරුණේ ය. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුදා යවිදිවි නො ඉක්මියැයුතු ය.

අනඳයෙනි, මහ ප්‍රජාපතී ගෞතමී මේ ගුරු දහම් ඉගෙනැ මහ ප්‍රජාපතී ගෞතමීන් කරා එළැඹ, "ගෞතමීනි, ඉදින් තෙපි මේ ගුරු දහම් අට පිළිගන්නාහු නම් එය ම තොපට උපසපුව වන්නේ ය.

"උපසපුවෙන් සිය වස් වූ ද මෙහෙණ විසින් එදවස් උපසපන් වූ මහණහට වැඳීම දැක හුනස්නෙන් නැගී සිටීම, දොහොත් මුදුන් තබා නැමදීම, සාමාචි කර්මය කළ යුතු.... අද සිට ඉදිරියට මෙහෙණනට



මහණුන් විසාහි (මෙසේ යව, මේ දැ කරව ආදීන්) අණ දෙනු විසින් කතාමඟ හවුරන ලද්දේ ය. මෙහෙණන් වීසාහි මහණුනට කතාමඟ නො හැවුරුණේය. මේ දහම ද සකසා ගුරු කොට බුහුමන් කොට පුදා යවිදිවි නොඉක්මියැ යුතු.

ගෞතමීනි, ඔබ මේ ගුරු දහම් අට පිළිගන්නාහු නම්, එය ම තිට උපසපුව වන්නේ යැ" යි වදාළහ.

"ආනන්දයන් වහන්ස, කය සරසන සුළු තරුණ යොවුන් වියෙහි සිටි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ඉස සෝදා නැයේ උපුල් මල්දමක් හෝ වසසික (සමන්) මල් දමක් හෝ අතිමුතතක (යොහොඹු) මල්දමක් හෝ ලැබ දොහොතින් පිළිගෙන උත්තමඬග වු හිසෙහි පිහිටුවන්නේ ද ආන්නදයන් වහන්ස, එසේ ම මම මේ යවිදිවි නොඉක්මියැ යුතු ගුරු දහම් අට පිළිගනිමි"යි ප්‍රජාපති ගෞතමී කීවාය.

ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්ස වෙත එළැඹියහ. එළැඹ වැඳ පසෙක ඉඳගත්හ. පසෙක හුන් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, මහ ප්‍රජාපතී ගෞතමීන් විසින් ගුරුදහම් අට පිළිගැනිණ. භාග්‍යවතතුන් වහන්සේ ගේ සුළු මෑණියන් දැ උපසපුව ලැබුහ"යි කීහ.

මේ අයුරින් මහ ප්‍රජපතී ගෝතමින් ස්ත්‍රි වර්ගයට බුදු සසුනෙහි පැවදි බව ලබාදීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් ඉදිරිපත් වු අයුරු සජීවී ආකාරයෙන් නිරූපනය වේ. ප්‍රජාපති ගෝතමිය කාන්තා පැවිද්ද ලබා ගැනීමට ගත් උත්සාහයට තවත් කාන්තාවන් විශාල පිරිසක් ද එක්වූහ. රෝහිණී නදියෙන් ජලය බෙදා ගැනීමට ශාක්‍ය කෝලිය වංශිකයන් අතර වූ ගැටුම භාග්‍යවතුන් වහන්සේ මැදිහත්වීමෙන් විසඳුණු අවස්ථාවේ එම දෙකුලයෙන් ම පැවදි බව ලද පන්සියයක් කුමාරවරුන්ගේ භාර්යාවන් ද ප්‍රජාපති ගෝතමියගේ උත්සාහයට අනුබල ලබා දුන් බව පරමත්ථදීපනිය සඳහන් කරයි.

ප්‍රජාපති ගෝතමියගේ මෙහෙයවීම මත ප්‍රතිෂ්ඨාපිත වූ මෙහෙණි සස්නෙහි කුල කාන්තාවන් රාශියක් පැවදි බව ලැබීමට උත්සුක වූහ. යශෝධරාව පැවදි බව ලැබ භද්දකච්චායනා මෙහෙණිය නමින් ප්‍රකට වූවා ය. නන්ද කුමරු හා විවාහ ගිවිස ගෙන සිටි ජනපද කල්‍යාණියද ප්‍රජාපතියගේ දියණිය වූ නන්දාවන් ද, බිම්බිසාර රජුගේ බිසවක වූ ඛේමා ද, සිටු දියණියක වූ උත්පලවන්ණා ද, මහා කාශ්‍යප තෙරුණ්ගේ ගිහි කල භාර්යා වූ භද්දා කපිලානි ද, මෙහෙණි සසුන ස්ථාපිත මුල් ම යුගයේදී පැවදි බව ලද කාන්තාවන් ලෙස ඉතිහාසයට එක්ව ඇත.

## iv. මහ ප්‍රජාපතී ගෝතමිය ගේ පිරිනිවීම.

දෙව්දහ නුවර සුප්පබුද්ධ නොහොත් අඤ්ජන මහ රජුගේ හා සුලක්ඛණ බිසවගේ දියණිය වූ මහා ප්‍රජාපති ගෝතමිය ගේ දෙටු සොහොයුරිය වූයේ මහමායාවන්ය. මහමායාවන්ගේ අභාවයෙන් පසුව ඇය සිදුහත් කුමරුන් කෙතරම් සෙනෙහසින් රැක බලා ගත්තේද යත්, ඇය තම කුසින් බිහි කළ නන්ද කුමරුන් කිරිමව්වරුන්ගේ භාරයට පත්කොට සිදුහත් කුමරුන් රැක බලා ගැනීම වෙනුවෙන් සිය මුළු දිවියම කැප කළා ය. බුදුන් වහන්සේ සුදොවුන් රජ මැඳුරට වැඩි අවස්ථාවේ ධර්මය ශ්‍රවණය කළ ඇය සෝවාන් ඵලයට පත්වූවා ය. කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයේ වැඩසිටි බුදුහිමියනට තමන් ම සැකසූ කඨින චීවරයක් පිරිනමා මුල්ම කඨින පූජාව ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේද මහ ප්‍රජාපති ගෝතමිය වෙත ය.

ශාසනයේ පැවදිව බොහෝ කල් ගත කළ භික්ෂුණීන් අතරින් මහ ප්‍රජාපති ගෝතමිය අග්‍රවන බව භාග්‍යවතුන් වහන්සේ සිව්වනක් පිරිස මධ්‍යයේ වදාළ සේක.

වසර 120 දීර්ඝායුෂ විඳි ප්‍රජාපති ගෝතමිය, පිරිනිවන් පෑමට අවසර ලබාගැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුන සේක.

සුත්‍ර පිටකයෙහි ඛුද්දක නිකායෙහි ථේරී ආපදායෙහි මහා ප්‍රජාපති ගෝතමී රහත් තෙරණිය පිරිනිවන් පෑමට ආසන්න සමයේ සිය අනුගාමික තෙරණියන්ට කළ අපදානය බෙහෙවින් ම සහෘද්ධ සිත් සසල කරන සුළු ය. 'භාග්‍යවතුන්  වහන්සේ විශාලා මහනුවර වනගත කූඨාගාර ශාලාවේ වැඩවසන කල්හි ජිනේන්ද්‍රයන් වහන්සේගේ සුළුමව වූ මහා ප්‍රජාපති ගෝතමි තෙරණියෝ ඒ නගරයෙහි කරන ලද රම්‍ය වූ මෙහෙණවරෙහි කෙලෙසුන්ගෙන් මිදුණු මෙහෙණනන් පන් සියයක් සමඟ වාසය කළහ. විවේකී සිටි ඔවුනට මෙබඳු මනෝසංකල්පයෙක් පහළ විය.

මම බුදුරදුන්ගේ පිරිනිවීම හෝ දෙ අගසව්වන් වහන්දෑගේ පිරිනිවීම හෝ රාහුල - ආනන්ද - නන්ද තෙරණුවන්ගේ පිරිනිවීම හෝ දක්නට නොලැබෙන බැව් දනිමි. ලෝකනාථ වූ මහාර්ෂීන් වහන්සේ විසින් අනුදන්නා ලද ආයුසංස්කාරයන් හැර පියා කල්ඇතිව නිවීමට යන්නෙම් නම් මැනැවි.

එකෙණෙහි මහපොළව කම්පිත විය. මේඝගර්ජනා පැතිරිණි. මෙහෙණවරට අරක්ගත් දේවතාවෝ ද ශෝකයෙන් පෙළුණහ. ඔව්හු වැළපෙමින් කඳුළු වැගිරවූහ. ගෝතමී තෙරණිය හා මිත්‍ර මෙහෙණෝ ගෝතමිය වෙත එළඹ, පා මත වැඳ වැටී මෙවදන් බිණූහ.



ආර්යාවෙනි, දිය පොදකින් සිය සිරුරු තෙමාගත් අපි එහි රහොගත (එකලා) වුම්හ. ඒ අචල වූ පොළොව සැළිණ, මේඝයෝ ගර්ජනා කළහ. වැළපීම් ද ඇසෙයි. ගෝතමී උත්තමාවනි, මේ කුමක් නිසාද' "ආර්යාවෙනි, පරම ශාන්ත වූ නිවන ඉදින් ඔබට රිසි නම් මනා ව්‍රත ඇති උත්තමාවෙනි, සියල්ලෝද බුද්ධානුඥානයෙන් පිරිනිවන් පාන්නෙමු.

අපි සියලු දෙනා එක්ව ම ගෙයිනුදු භවයෙනුදු නික්මුණෝ වම්හ. උතුම් නිවන් පුරයට එක්ව ම යන්නෙමු. එවිට ඕ තොමෝ (ගෝතමී) නිවනට යන්නන් හට කුමක් කියම්දැයි පවසමින් සියල්ලන් සමග මෙහෙණ වරින් බැහැරව ගියා ය.

යම් කෙනෙක් ජරා චේවයි, මරණ චේවයි, අප්‍රිය සම්ප්‍රයෝග චේවයි, ප්‍රිය විප්පයෝග වෙවයි, නැත්ද අසංස්කෘත වූ ප්‍රත්‍යයෙන් සකස් නොවූ එතැනට යන්නෙමියි ඕ පැවසුවා ය.

ගංගා නදිය පන්සියයක් නදීන් සමග සයුරට වදනා සේ මහ ප්‍රජාපති ගෝතමිය පන්සියයක් මෙහෙණියන් සමඟ නිවනට යෙහි. උවැසියෝ මෙවදන් බිණූහ. මහ භාග්‍යවත් උත්තමාවෙණි, අප කෙරෙහි පහදනු මැනවි. අනාත වූ අප හැර පියා ඔබ පිරිනිවන්නට යුතු නැතැයි ඔවුහු මහත් සේ හඬ නගා වැළපුනාහ.

ඔවුන්ගේ ශෝක ප්‍රහාණය ඇසූ ගෝතමී තොමෝ, මිහිරි වදන් පැවසුවා ය. දරුවෙනි හැඬීමෙන් කම් නැත. තොපට අද මේ සිනා සීමට කාලයයි.

මා විසින් දුක පිළිසිඳ දක්නා ලදය. දුකට හේතුව දුරු කරන ලද මා විසින් දුක්ඛ නිරෝධ පසක් කරන ලද මාර්ගය ද මැනවින් වඩනා ලදය. එබැවින් කුමට ශෝක කෙරෙත් ද?. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදහ, බුදු සසුන් කොට නිමවන ලද, ස්කන්ධභාරය බහාලන ලද, තෘෂ්ණාව  මුලිනපුටා නසන ලදි. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්ම, බුදු සසුනෙහි පැවදි වූයෙම් ද, සියළු සංයෝජනයන්ගේ ක්ෂය වූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්තයි.

බුදු රජාණන් වහන්සේත් ඔබගේ අනූන වූ සද්ධර්මයත් යම්තාක් සිටුනා සේක් ද ඒ තාක් පිරිනිවෙන්නට මට කාලය වෙයි. දියණියනි, මා ගැන ශෝක නොකරව."

# 19. කිඹුල්වතට වැඩි අවසන් ගමන

## i. නිග්‍රෝධාරාමයේ වැඩ සිටීම.

බුද්ධත්වයෙන් දොළොස්වන වස අග භාගයේදී පමණ භාග්‍යවතුන් වහන්සේ වෛශාලී පුරයේ සිට කපිලවස්තු පුරයට වැඩ නිග්‍රෝධාරාමයේ විසූ සේක. නිග්‍රෝධාරාමය වෙත පැමිණි මහානාම, ශාක්‍ය රජුන් බුදුන් වහන්සේ නැමැද සිව් මසක් පුරා භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ මහ සංඝයාට දාන මානාදියෙන් ඇප උපස්ථාන කිරීමට අවසර ලබාගත්තේ ය. කිඹුල්වතට සැපැත්ව නිග්‍රෝධාරාමයේ ගත කළ කෙටි කාලය තුළ භික්ෂු සංඝයා හා උවැසි උවැසියන් උදෙසා සූත්‍ර දේශනා කිහිපයක් ද පවත්වන ලදහ. අනතුරුව උන්වහන්සේ චාලිකා නගරාසන්නයේ චාලිකා පර්වතයෙහි වූ විහාරයෙහි වැඩසිටි සේක. වස්සානය පැමිණි හාර මාසය තුළ දෙව්රම් වෙහෙරෙහි වැඩවසද් දී තමන් වහන්සේගේ හමුවට එළැඹි රාහුල හිමි විසිවැනි විය සම්පූර්ණ කර සිටි හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ හිමියන්ට උපසම්පදාව ලබාදුන්හ. වස්සාන සමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහා රාහුලෝවාද සූත්‍රය දේශනා කළ අතර දෙසුම අවසානයේදී රාහුල හිමියෝ අරහත් ඵල ලබාගැනීමට සමත්වූහ.

නිග්‍රෝධාරාමය






බුද්ධත්වයේ 12 වැනි වර්ෂයේ ශාස්තෘන් වහන්සේ අවසන් වතාවට යළි කිඹුල්වත වෙත වැඩමවන ලදී. උන්වහන්සේ නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන සඳ නන්දීය ශාක්‍ය රජු භාග්‍යවතුන් වහන්සේ වෙත පැහැදි දාන මානයෙන් උන්වහන්සේට උවටැන් කළ බව දැක්වේ. ශාස්තෘන් වහන්සේ කෙරෙහි දැඩි වෛරයකින් පසු වූ යශෝධරාවන්ගේ පිය රජු සුප්‍රබුද්ධ ශාක්‍ය රජු මියැදී අපාගත වූයේ ද මෙම චකවානුවෙහි බැව් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වෙයි.

කිඹුල්වතට වැඩි අවසන් චාරිකාවෙන් පසුව භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරට වැඩ ජේතවනාරාමයේ විසූ සේක.

## ii. සුප්පබුද්ධ රජුගේ මරණය

භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් සොළොස් වන වස කපිලවස්තු පුර නිග්‍රෝධාරාමයේ වැඩ වසද්දී යශෝධරාවන්ගේ පියාණන් බුදුන් වහන්සේ හමුවට පැමිණ තමන් සිත වූ වෛරය සංසිඳුවා ගැනීම පිණිස බුදුන් වහන්සේට වරින් වර දෝෂාරෝපණය කළේ ය. එක් අවස්ථාවක හෙතෙම මත්පැන් පානය කර බුදුන් වහන්සේ දානයට වඩින පෙරමග ට ගොස් පාර අවුරා සිටියේ ය. බුදුන් වහන්සේ සන්සුන් ගමනින් මෛත්‍රී සහගත සිතින් යළි විහාරයට වැඩි සේක. එම අවස්ථාවේ ආනන්ද තෙරුණ් ඇමතූ බුදුන් වහන්සේ "ආනන්දය සුප්පබුද්ධ රජු විසින් සිදුකර ගන්නා මෙම පාපය හේතු කොට ගෙන, අදින් සත් දවසක් ඇවෑමෙන් ඔහු සිය මාළිගාවේ උඩුමහළින් වැටී මියගොස් අපාගත වන්නේ යැයි" පැවසූ සේක.

සිය චර පුරුෂයන් මගින් මේ පුවත සුප්ප බුද්ධ රජු කන වැකිණි. හේ තම ජීවිතය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් එම සතියේ ම, මාළිගාවෙන් බැහැර නොයා එහි උඩුමහලේ ආරක්ෂාකාරී ලෙස කල් ගෙවී ය.

සත් වන දින එළඹිණි. එදින රජුගේ අශ්වයා සුරාවෙන් මත්ව, රාජ ප්‍රාසාදයේ කුළුණක හැපී මහා ඝෝෂා කරන්නට විය. ශබ්දය කුමක්දැයි පිරික්සීමට සඳළු තලයේ දොර විවෘත කළ අවස්ථාවේ රජුගේ පය පැකිළී පඩි පෙළලින් පහළට වැටී, පඩි පෙළ පාමුල දී මරණයට පත්විය.

මෙම සිද්ධිය අරභයා බුදුරජාණන් වහන්සේ වදාළ මේ ගාථාව ධම්ම පදයට්ඨ කතාවේ ඇතුළති.

"මරණින් ගැලවීමට තැනක් අහසෙහිද නැත, මුහුදු මධ්‍යයේද

නැත, පර්වත ගුහාවල ද නැත, මරණින් ගැලවීමට ලොව කොතැනක සිටිය ද නොහැකි ය. කිඹුල්වතට වැඩි අවසන් චාරිකාවෙන් පසුවන භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරට වැඩ ජේතවනාරාමයේ වැඩ විසූ සේක.

## iii. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම සිතුවම නිර්මාණය වීම.

බුදුරජාණන් වහන්සේ දිවමන් කල උන්වහන්සේගේ රූපකාය පිළිඹිබු වන චිත්‍රයක් ප්‍රථම වරට නිර්මාණය කරන ලද්දේ බිම්බිසාර රජතුමාගේ මැදිහත්වීමෙනි. මෙම කථා ප්‍රවෘත්තිය දක්නට ලැබෙන්නේ සංස්කෘත දිව්‍යාවදාන කෘතියෙහි පමණි.

"බිම්බිසාර රජතුමා බුදුරජාණන් වහන්සේ වෙත ගොස් මෙසේ කීවේ ය. ස්වාමීණි භාග්‍යවතුන් වහන්ස, රෝරුක නගරයේ රුද්‍රායණ රජ මාගේ අදෘෂ්ට මිත්‍රයෙකි. ඔහු මට ඉතා වටිනා යුධ සැට්ටයක් තෑගි පිණිස එවා තිබේ. ඔහුට ආපසු යැවිය යුතු ත්‍යාගයක් ගැන සිතා ගැනීමට අප කාටවත් නොහැකි විය. එබැවින් ඊට සුදුසු ත්‍යාගයක් අනුදැන වදාළ මැනව.

රජතුමනි, තථාගතයන් වහන්සේගේ පිළිරුව වස්ත්‍රයක සිතුවම් කොට දහම් පණිවිඩයක් ද එහි ලියා යැවීම සුදුසුය'යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

බිම්බිසාර රජ දක්ෂ චිත්‍ර ශිල්පීන් ගෙන්වා බුදු පිළිරුව වස්ත්‍රයක අඳින ලෙස නියෝග කළේ ය. දේවයන් වහන්ස, මෙහි සිට බුදුපිළිරුවක් චිත්‍ර ගත කිරීම කළ නොහැකි ය. එබැවින් බුදුරජුන්ට දානය සඳහා රජමාළිගයට වඩින ලෙස ආරාධනා කළ මැනවි. එසේ වැඩම කළ විට අපි එම බුදුරුව චිත්‍රගත කරන්නෙමුයි, ශිල්පීහු කීහ. එයැසූ බිම්බිසාර රජු බුදුරදුන් තම රජමැඳුරට වැඩම කරවා දන් පුදා ඒ අතර බුදු රුව චිත්‍ර ගත කිරීමට ශිල්පීන්ට පහසුකම් සැලැස්වී ය. එනමුත් ඒ එකදු ශිල්පියෙක්වත් බුදු සිරුරේ අඟපසඟ තත්වාකාරයෙන් ඇඳීමට සමත් නොවීය.

ඒ දුටු බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ශරීරයෙහි ඡායාව වස්ත්‍රය මත වැටෙන සේ වැඩ හිඳ එම ඡායාව අනුව බුදුසිරුර සිතුවම් කරන ලෙස ශිල්පීන්ට වදාළ සේක. ශිල්පීහු එවිට ස්වභාවික ලෙස බුදුරුව වස්ත්‍රයෙහි සිතුවම් කළහ.

බිම්බිසාර රජතුමා එම බුදුපිළිරුව යට "බුද්ධං සරණං ගච්ඡාමි"



යන සරණාගමන ශික්ෂා පදය ද ඊට යටින් අනුලෝම ප්‍රතිලෝම වශයෙන් (මුල සිට අගටත් නැවත අග සිට මුලටත් කියැවෙන ලෙස) "අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදාන, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං" යන අංග දොළසකින් යුත් පටිච්ච සමුප්පාද ධර්මය ද ලියවා රුද්‍රායණ රජු වෙත තෑගි කර යැවීය. බිම්බිසාර රජුගේ උපදෙස් අනුව රෝරුක් පුරයේ රුද්‍රායණ රජතුමා තම නගරයේ සිට තුන්යොදුන් මඟ සරසා ඉදිරියට අවුත් එම බුදු රුව සහිත දහම් පණිවිඩය මහ පෙළහරින් තම නුවරට ගෙන ගියේය. ඉතා සන්සුන් පරිසරයක මහ ජනතාවද රැස්කොට එම බුදු සිතුවම් පටය දිග හැර බැලීය. මධ්‍ය දේශයේන් එහි පැමිණ සිටි වෙළෙන්දෝ එම බුදුරුව දකිත්ම මහ හඬින් සාධුකාර දී 'නමෝ බුද්ධාය' යන නමස්කාර පාඨය හඬ නගා කීහ. මින් පෙර නොඇසූ විරූ බුද්ධ යන වචනය ඇසූ විගස රුද්‍රායණ රජුගේ ලොමු දැහැ ගත්තේ ය. ඔහු මධ්‍ය දේශයට පැමිණ සිටි වෙළෙඳුන්ගෙන්, 'භවත්නි බුද්ධ' නම් කවරෙක් දැයි ඇසීය.

"දේවයන් වහන්ස, හිමාලය පර්වතය ප්‍රාන්තයේ භාගීරථී නදී තෙර කපිල ඍෂිවරයාගේ අසපුව පිහිටා තිබුණ හෙයින් කපිලවස්තු නම් වූ නගරයෙහි ශාක්‍ය කුමාරයෙක් උපන්නේ ය. ඒ කුමරුන් උපන් දිනම නිමිති කියන බ්‍රාහ්මණයෝ ඉදින් මේ කුමරා ගිහිගෙයි වසන්නේනම් මහමුහුද කෙළවර කොටැති මේ මහා පෘථිවිය මණ්ඩලයෙහි චක්‍රවර්තී රජ වන්නේ ය. නො එසේව ඉඳින් ගිහි ගෙයින් නික්ම පැවදි වන්නේ නම් තථාගත වූ අර්හත් සම්මාසම්බුදු වන්නේය"යි ප්‍රකාශ කළහ. මේ එම සම්මා සම්බුදුන් වහන්සේගේ පිළිරුවයි, කීහ.

මෙහි යට ලියා තිබෙන බුද්ධං සරණං ගච්ඡාමි ආදී පාඨවලින් කුමක් අදහස් කෙරේදැයි රුද්‍රායණ රජු නැවතත් ඇසීය.

ඒ උන්වහන්සේ සරණ යන ශික්ෂා පදයයි. ඊට යටින් ලියා ඇති පාඨයෙන් විස්තර වන්නේ මේ මනුෂ්‍යාත්මභාවය නමැති ලෝකයේ ප්‍රවෘත්ති නිවෘත්ති (හට ගැනීම් හා නතර වීම්) දැක්වෙන, උන්වහන්සේ විසින් දේශනා කරන ලද පටිච්ච සමුප්පාද ධර්මයයි යනුවෙන් මගධ වෙළෙන්දෝ කීහ.

එතැන් සිට රුද්‍රායණ රජු තම ආමාත්‍යවරුන් ද සමඟ පෙරවරු කාලයට නියමිත සියළු රාජකාරී කටයුතු නිමවා, එම බුද්ධ චිත්‍රය ඉදිරිපිට පළඟ බැඳ කය ඍජුව තබා හිඳගෙන එම දොළොස් අංගයකින්

යුත් පටිච්ච සමුප්පාද ධර්මය අනුලෝමව ප්‍රතිලෝමව වශයෙන් කියවා මෙනෙහි කරන්නට පටන් ගත්තේ ය. එසේ කරන්නාවූ රුද්‍රයාණ රජු සක්කාය දෘෂ්ටිය බිඳ දමා සෝවාන් ඵලයට පැමිණියේ ය.

රුද්‍රයාණ රජතුමා බිම්බිසාර රජු වෙත සන්දේශයක් ද යැවීය.

ඒ මෙසේය, "මා මිත්‍ර මහ රජතුමනි, නිරය, තිරිසන් යෝනිය ප්‍රේත ලෝකයන් වෙත යොමුව තිබූ මා දෙපය ඔසවා දෙව්මිනිස් සැපතෙහි පිහිටුවන ලද්දේ ඔබ තුමන් විසිනි. මා ලේ කඳුළු මුහුද ඔබ විසින් වියලා ලන ලදී. මිනිස් ඇට කැබලිති ගොඩ ඉක්මවා යාමට මට අත දුන්නාහු ඔබ වෙති. අක්මුල් නැති සසරෙහි මා සිත තුළ පැවති සක්කාය දෘෂ්ටිය නමැති මහ ගල්කුල නුවන් විදුරෙන් බිඳ දමා සෝවාන් ඵලය ලදිමි.මම බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් දකිනු රිසියෙමි. කුළුණු පෙරදැරිව භික්ෂු නමක් මෙහි එවනු මැනවි."

ඒ සන්දේශය ලත් බිම්බිසාර රජතුමා බුදුරදුන් වෙත ගොස් එපුවත් දන්වා බුදුරදුන්ගේ නියමය පරිදි පන්සියයක් භික්ෂූන් සමඟ මහකාත්‍යායන තෙරුන් රෝරුක් පුරය වෙත පිටත්කර යැවීය. රුද්‍රයාණ රජ තෙමේ දහස් ගණන් පිරිවරා ජනයා සමඟ අඩතුන් යොදුනක් ඉදිරියට පැමිණ කාත්‍යායන තෙරුන් ප්‍රධාන ඒ මහ සඟ පිරිස පෙළහරින් තම නුවරට වැඩමවා ගෙන ගියේ ය. රෝරුක පුරයෙහි විහාර පන්සියයක් කරවා උන්වහන්සේට පූජා කළේ ය. ඒ සඟ පිරිස දැක බලා ගැනීමට රෝරුක් පුරවාසීහු දස දහස් ගණනක් එක් රැස් වූහ. මහකාත්‍යායන තෙරණුවෝ ඔවුන්ට දහම් දෙසූහ. ඒ ඇසූ සිය දහසක් දෙනා සෝවාන් ආදී මාර්ගඵලවලට පත්වූහ. සමස්ත රෝරුක නගරය ම බෞද්ධ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. බුදු, දහම්, සඟ යන තෙරුවන් සරණ ගිය උවැසු උවැසියන්ගෙන් මුළු රෝරුක පුරයම පිරී ගියේ ය.



**පසු කාලයේදී නිග්‍රෝධාරාමය හින්දු බැතිමතුන්ගේ ශිව කෝවිලක් බවට පත්ව...**



## 20. කපිල වස්තුවේදී පැවැත්වූ සූත්‍ර දේශනා

තමන් වහන්සේගේ උත්පත්ති ග්‍රාමය වූ කිඹුල්වතදී බුදුරජාණන් වහන්සේ විසින් පහත දැක්වෙන සූත්‍ර දේශනා කළ බැව් සූත්‍ර පිටකයෙහි සඳහනි.

01. ඥාතිකාගමදී - (නෑයන් විසූ ගම) දී.නි. 2 - ජනවසභ සූත්‍රය

02. ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් පුර අසළ දී - දී.නි.2 - මහාසමය සූත්‍රය

03. ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුර අසළ දී වේධඤ්ඤ ශාක්‍යයන්ගේ අඹ වනයෙහි දී. - දී.නි.3 - පාසාදිකා (පැහැදීම ඇතිකරවන) සූත්‍රය.

04. කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි දී - ම.නි. 1 - චූලදුක්ඛන්ඛන්ද සූත්‍රය

05. කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි දී - ම.නි. 1 - මධුපිණ්ඩික සූත්‍රය

06. කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි දී - ම.නි. 2 - සේඛ සූත්‍රය (නවසන්ථාගාරයක් විවෘත කිරීම)

07. කෝලීය රටෙහි හලිද්දවසන නම් නියම් ගමෙහි දී - ම.නි.2 - කුක්කරවතිය සූත්‍රය

08. ශාක්‍ය ජනපදයෙහි මේදතළුම්ප රජුගේ නියම් ගමෙහි දී - ම.නි.2 - ධම්ම චේතිය සූත්‍රය.

    මෙම සූත්‍රය කොසොල් රජු විසින් ම ප්‍රකාශිත දහම් කරුණු රැසක් අළලා ලියැවුනු බුද්ධභාෂිත සූත්‍රයකි.

09. ශාක්‍ය ජනපදයෙහි ශාක්‍ය රජ දරුවන්ගේ දේවදහ නම් නියම් ගම ඇසුරු කොට ලුම්බිණි උයනෙහි වැඩවසමින් දෙසූ සූත්‍රය - දේවදහ සූත්‍රය - ම.නි. 3 (දේවදහ ගමේ නමින්ය)

10. ශාක්‍ය ජනපදයෙහි සාමග්‍රාමයෙහි දී - සාමග්‍රාම සූත්‍රය - ම.නි.3

11. ශාක්‍ය ජනපදයෙහි - කිඹුල්වත්පුර - නිග්‍රෝධාරාමයේ දී - - මහාසුඤ්ඤත සූත්‍රය.

මෙම සූත්‍රයේ මෙවැනි කරුණු සඳහන් වී තිබේ.

නිග්‍රෝධාරාමයේ වැඩවසද්දී දිනක් පිඬු පිණිස කිඹුල්වතට වැඩ සවස් වරුවේ දිවා විහරණය සඳහා කාලඛේමක ශාක්‍ය රජුගේ විහාරයට වැඩි සේක. එම වෙහෙරෙහි පනවා තිබූ බොහෝ අසුන් දුටු බුදුරජාණන් වහන්සේට මෙහි බොහෝ අසුන් ඇත, එනිසා ම බොහෝ භික්ෂූන් වෙසෙත් දැයි සිතක් පහළ විය. එකල ආනන්ද තෙරණුවෝ මේ සටාය නම් ශාක්‍යයන්ගේ විහාරයෙහි බොහෝ භික්ෂූන් සමඟ චීවර කර්ම කෙරෙමින් වැඩ වසති. සවස් වරුවේ සමවතින් නැගී සිටි බුදුරජාණන් වහන්සේ අසුන්හි වැඩ සිටි ආනන්ද මෙහි බොහෝ අසුන් ඇත. මෙහි බොහෝ භික්ෂූන් වෙසෙත් දැයි විමසූ සේක. එසේය ස්වාමිණී මේ සිවුරු මැසීම ආදිය කාලය (චීවර කර්ම) හෙයින් බොහෝ භික්ෂූන් වෙතියි පැවසූහ.

12. කිඹුල්වත් නුවර - නිග්‍රෝධාරාමයෙහි - මහ ප්‍රජාපති ගෝතමී වෙනුවෙන් - ම.නි.3 - දක්ඛිණාවිභංග සූත්‍රය.

13. ශාක්‍ය ජනපදයේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි දී අංගුත්තර නිකායේ තික නිපාතයෙහි 3.2.3.3. සූත්‍රය ඤාති මහානාම ශාක්‍ය රජුට දේශනා කොට ඇත.

(අංගුත්තර නිකායේ ඒකක - දුක හා තික නිපාතවල සූත්‍ර දේශනා වලට සූත්‍ර නාම නැත. ඇත්තේ අංකයක් පමණි.)

14. කිඹුල්වත් නුවරට වැඩ එක් රැයක් විසීම සඳහා සුදුසු ආවාසයක් සොයන්න යයි මහානාම ශාක්‍ය හට බුදුරජාණන් වහන්සේ දන්වා සිටි සේක. මහානාම ශාක්‍යයන් මුළු කිඹුල්වත් නුවර ඇවිද එබඳු තැනක් නොදුටු ඒ බව බුදුරජාණන් වහන්සේට දැන්වූහ. එහෙත් පැරැණි සබ්‍රහ්මචාරියෙකු වන භරණ්ඩුකාලාම තවුසාගේ අසපුවෙහි ඒ රැය ගත කරන ලෙස සැළ කළේ ය. එහි වැඩ විසූ බුදුරජාණන් වහන්සේ මහානාම ශාක්‍යහට දෙසූ දහමක් අංගුත්තර නිකාය තික නිපාතයේ 3.3.3.4 සූත්‍රය යටතේ සඳහන්ව ඇත.

15. අ.නි. චතුත්තක නිපාතය - සුප්පවාසා සූත්‍රය 4.2.17 - කෝලිය ජනපදයෙහි සජ්ජනේල නම් වූ කෝලිය රජ කුලිකයන්ගේ නියම් ගමෙහි දී



16. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතය - සාපූගිය සූත්‍රය 4.4.5.4 - කෝලිය නුවර සාපුගිය නියම් ගමේදී (ආනන්ද හිමි දේශනාවකි) එහි කෝලිය වැසියන්ට දෙසන ලද්දකි.

17. ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ දී නිගණ්ඨ ශ්‍රාවක වප්ප නම් ශාක්‍යයන්ට මහ මුගලන් තෙරණුවෝ දෙසන ලද්දකී. අංගුත්තර නිකායෙහි චතුත්තක නිපාතය වප්ප සූත්‍රය - 4.4.5.5

18. ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි දී - මහානාම ශාක්‍ය හට

19. අංගුත්තර නිකායෙහි ඡත්ත නිපාතය මහානාම

20. ශාක්‍ය ජනපදයෙහි සාමගාමක ගමෙහිදී පොක්ඛරණියා නම් වෙහෙර වැඩවසන කල්හි එක්තරා දිව්‍ය පුත්‍රයකු උදෙසා අංගුත්තර නිකායෙහි ඡක්ක නිපාතය - සමගාමක සූත්‍රය 6.1.3.1. දේශනා කළ සේක.

21. කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයෙහි වැඩ වෙසෙද් දී මහා ප්‍රජාපති ගෝතමිය භික්ෂුණී පැවිද්ද ඉල්ලා සිටියදී තෙවරක්ම ප්‍රතික්ෂේප කළ හා පසුව වර 8 ක් යටතේ එය පිහිටවූ ආකාරය අංගුත්තර නිකායේ අඨට නිපාතයේ ගෝතමී සූත්‍රයේ එයි.

22. ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත නිග්‍රෝධාරාමයෙහි දී ශාක්‍ය උපාසකවරුන් වෙත දෙසූ සූත්‍රය අංගුත්තර නිකායේ දසක නිපාතය - සක්‍ය සූත්‍රය 10.1.5.6.

23. නිග්‍රෝධාරාමයෙහිදී නන්දිය ශාක්‍යාහට දෙසූ සූත්‍රයකි. අංගුත්තර නිකායේ ඒකාදසක (ii) නිපාතය - නන්දිය සූත්‍රය - 11.2.3.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතදී දේශිත ඉහත සඳහන් සූත්‍ර අතුරෙන් වැදගත් ම ධර්ම කරුණු අඩංගු සූත්‍ර කිහිපයක් විමසා බැලීම යහපති.

## i. මහා සමය සූත්‍රය

ත්‍රිපිටකයේ දීඝනිකායේ මහා වග්ගයේ පැනෙන මහා සමය සූත්‍රය තුළින් භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයේ සිය නිජ බිම වූ කිඹුල්වත් පුර වනාශ්‍රාත ප්‍රදේශයක රහතන් වහන්සේලා පන්සිය නමක් සමග වැඩ විසූ කල්හි බුදුන් වහන්සේ බැහැදැකීම පිණිස දෙව් දේවතාවුන් රාශියක් එහි පැමිණි කථා පුවත විස්තර කැරේ.

මෙමඟින් සනාථ වන්නේ බුදුන් දවස මුළු මහත් විශ්වය පුරා ව්‍යාප්තව සිටි දේව ගණයා, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දක්වන ලද්දාවූ අනුපමේය භක්තියයි. ඔවුන් සියළු දෙනා බුදුන් සරණ ගිය අයුරු ද මෙහි කදිමට පැහැදිළි කැරේ.

කිඹුල්වත රහතුන් පරිවරා වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ වෙත දේව සමූහයා පිළිබඳව මහා සමය සූත්‍රය ආශ්‍රයෙන් හෙළි වන පහත දැක්වෙන තොරතුරු බොදුනුවන් තුළ මහත් ම සැදැහැ බැතියක් කුළු ගන්වන සුළු ය.

එක් පසෙක සිටියා වූ එක් දෙවියෙක් භගවත් බුදුරදුන් හමුයෙහි මේ ගාථාව කීහ.

**මහා සමයෝ පවනස්මිං**
**දෙව කායා සමාගතා**
**ආගත මහ ඉමං ධම්ම සමයං**
**දක්ඛිතායේ අපරාජිත සඞසන්ති**

**මහ වෙනෙහි මහ මුළුවෙකි**
**දෙවි මුළුහු රැස්වුහ**
**කෙළෙසුන්ගෙන් නොපැරදුණු**
**සඟන දක්නට මේ දම් සමාමි ආමු**

එවිට අන් දෙවියෙක් භගවත් බුදු රදුන් වෙත එළඹ ඒ දහම් මගෙහි තමන් සිත එකග කළහ. තමන් සිත ඍජු කළහ. රථ හසුරුවන්නෙක් රැහැන් ගෙන රිය හසුරුවන්නා මෙන් නැණැන්තෝ ඉඳුරන් රකිත්යැයි පැවසී ය.

එකල භගවත් බුදුරදුන් වෙත තවත් දිව්‍ය පුත්‍රයෙක් සපැමිණ "ඒ තරුණ රහත් හු පසෙසි බුදුරදුන් වෙතින් මොනවට දැමුණාහු, කෙළෙස් මුල සිඳ, කෙළෙස් කණුයම ද සිඳ, රාග, ද්වේශ, මෝහ ඉන්ද්‍ර කීලය උදුරා පියා, තෘෂ්ණා නැතිව, පිරිසුදුවැ, නිර්මල වැ හැසිරත්'යි කීහ.

එකල අන් දෙවියෙක් භගවත් බුදු රජුන් වෙත එළඹ, යම් කෙනෙක් බුදු රජුන් සරණ ගියාහු ද, ඔහු අපායට නොයන්නාහ. මිනිස් කය හැර දෙව් මුළුව සපුරන්නා, හ යි කීහ.



ඉක්බිතිව භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා, 'මහණෙනි, බොහෝ සෙයින් දහසක් ලෝක ධාතුවෙහි දෙවියෝ තථාගතයන්ද භික් සඟනද දක්නට පැමිණියාහු ය. මහණෙනි, ඉකුත් කල යම් සම්මා සම්බුදු කෙනෙක් වී ද, ඒ භගවත් බුදුවරුන්ගේ ද, දැන් මේ සමයෙහි මෙන්, මෙපමණ ම වූ දෙවියෝ රැස් වූහ. මහණෙනි, අනාගත කල්හි යම් රහත් සම්මා සම්බුදු කෙනෙක් වන්නාහුද, ඔවුන්ගේ ද මෙපමණ ම දෙවියෝ රැස් වන්නා හ.

මහණෙනි, දේව සමූහයන් ගේ නම් හෙළි කරන්නෙමි. එය අසවු, මොනොවට මෙනෙහි කරවු, කියන්නෙමි'යි වදාළ සේක.

එසේය, වහන්සැ'යි ඒ භික්ෂූහු භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

යම් තැනක භූමාටු දෙවියෝ ඇද්ද, රහත්හු ඒ තැන් ඇසුරු කළාහු වෙත්. නිවන් කරා මෙහෙය වූ සිත් ඇති, සමාධිගත සිත් ඇති, ලොමු දහ ගැනුම් මැඩලූ පිරිසුදු සිතැති, නොකිළිටි වූ, වෙසෙසින් පහන් වූ, නොකැළඹුණු ඒ රහත් හු විවික්ත වූ බොහෝ සිංහයන් සේ ගිරි ගුහා ඇසුරු කළා හු වෙත්.

කිඹුල්වත් පුර අසළ වෙනෙහි දී සාශ්තෘ හු සස්නැ ඇළුණු පන්සියයකට වැඩි සවුවන් දැන, ඉක්බිති ඔවුන් අමතා, මහණෙනි, දේව සමූහයෝ පැමිණියාහ ඔවුන් දිවැස් නුවණින් දනියි වදාළහ. ඔහු ද බුදුරජුන්ගේ හස්න අසා දිවැස් උපදවා ගන්නට වැර වැඩූහ.

වහාම ඔවුනට අමනුෂ්‍යයින් දක්නා නුවණ පහළ විය. ඇතැම් මහණ කෙනෙක් අමනුෂ්‍යයන් සියයක් දටුහු, ඇතැම් මහණ කෙනෙක් දහසක් අමනුෂ්‍යයන් දුටුහු. ඇතැම් මහණ කෙනෙක් සැත්තෑ දහසක් දුටුහු.

ඇතැම් මහණ කෙනෙක් සියදහසක් දුටුහු. ඇතැම් මහණ කෙනෙක් අන්ත දෙව් බමුන් දුටුහු. සියළු දිසාවෝ දෙව් බඹුන්ගෙන් පැතිර ගත්තෝ වූහ.

පසැස් ඇති ශාස්තෘන් වහන්සේ ඒ සියල්ල වෙසෙසි නුවණින් දැන වෙන් කොට දැක ඉක්බිති සස්නෙහි ඇළුනු සිය සව්වන් අමතා, මහණෙනි, දේව සමූහයා එළඹියාහ. වචන වලින් පිළිවෙලින් ඒ යම් දෙවිකෙනෙකු හෙළි කරන්නෙමද ඔවුන් දැනැ ගනිවු'යැ යි වදාළ සේක.

කිඹුල්වත්පුර වැසි, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති සත් දහසක් බූමාටු දෙවියෝ සතුටු වන්නාහු, රහත් මහණ මුළුව දක්නට වනය කරා එළැඹියාහ.

සාතගිරි පර්වතවාසීන්, නන්වැදෑරුම් පැහැ සපුව ඇති, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති තුන්දහසක් දෙවියෝ සතුටු වෙමින් භික්ෂු සමාගමය දක්නට වනය කරා එළැඹියාහ.

විශ්වාමිත්‍ර පර්වතවාසීන්, නන්වැදෑරුම් පැහැ සපුව ඇති, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති පන්සියයෙක් දෙවියෝ සතුටු වෙමින් ඒ රහත් භික්ෂූන්ගේ සමාගමය දක්නට වනයට පැමිණියාහ.

රජගහ නුවර වැසි කුම්භීර නම් යක් සෙනෙවියෙක් වෙයි. විපුලගිරි පව්ව ඔහු වසන තැනය. සිය දහසටත් වැඩි යකුන් ඔහු ඇසුරු කෙරෙත් රජගහවැසි ඒ කුම්භීර තෙමේද භික්ෂු සමාගමය දක්නට වනයට පැමිණියේ ය.

පෙර දිගට රජ වූ ධෘතරාෂ්ට්‍ර තෙම ඒ දෙස පාලනය කරයි. ගාන්ධර්වයනට අධිපති යශස් ඇති ඒ වරම් මහ රජ ද මහ බලැති, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති ඉන්ද්‍ර යන නම ඇති බොහෝ වූ ඔහු පුත්තු ද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා එළැඹියහ.

විරූඪක වරම් රජ ඒ දකුණු දෙස පාලනය කෙරෙයි. කුම්භාණ්ඩයනට අධිපති වූ ඒ යශස්වී මහ රජ ද, මහත් බල ඇති, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති ඉන්ද්‍ර යන නම ඇති බොහෝ වූ ඔහු පුත්තුද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා එළැඹියහ.

විරූපාක්ෂ වරම් රජ ඒ පැසීම් දෙස පාලනය කෙරෙයි. නාගයනට අධිපති වූ ඒ යශස්වී මහ රජද, මහත් බල ඇති, ඉදුමත්, බබළන, පැහැපත්, යශස් ඇති ඉන්ද්‍ර යන නම ඇති බොහෝ වූ ඔහු පුත්තු ද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා එළැඹියහ.

කුවෙර වරම් රජ ඒ උතුරු දිග පාලනය කෙරෙයි. යක්ෂයනට අධිපති වූ ඒ යශස්වී මහ රජ ද, මහත් බල ඇති, ඉදුමත්, ද්‍යුතිමත්, වර්ණවත්, යශස්වී වූ ඔහුගේ ඇති ඉන්ද්‍ර යන නම ඇති බොහෝ වූ ඔහු පුත්තු ද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා එළැඹියහ.

ධෘතරාෂ්ට්‍ර වරම් රජ පෙර දිගද, විරූඪක වරම් රජ ඒ දකුණු දෙස ද, විරූපාක්ෂ වරම් රජ ඒ පැසීම් දෙසද, කුවෙර වරම් රජ ඒ උතුරු දිග ද දැයි ඒ සතර වරම් මහ රජුහු කිඹුල්වත් පුර වනයෙහි හාත්පස අතිශයින් බබළමින් සිටියාහ.



ඔවුන්ගේ මායා වී වූ වංචනික වූ ශඨ වූ කපට වූ කුටෙණ්ඩු, වේටෙන්ඩු, විටු, විටුඩ යන දාසයෝ ද, චන්දන, කාමසෙට්ඨ, කින්නිඝණ්ඩු, නිඝණ්ඩු, පාන ද, ඕපමඤ්ඤ, දෙව් රියැදුරු මාතලී යන දෙවියෝ ද, චිත්‍ර, සේන, චිත්‍රසේන යන ගඳැවු තිදෙනා ද, නළ නම් දෙව්රජ ද, ජනවසභ දෙව්පුත් ද, පන්සිළු දෙව්පුත් ද, තිම්බරු නම් ගඳැවු රජ ද, සුරියවච්චසා දෙව්දු ද යන මේ සියල්ලෝ ද, අන් ගඳැවු රජුහු ද සතුටු වන්නාහු සිය රජුන් සමග භික්ෂූන් ගේ සමාගමය දක්නට වනයට පැමිණියාහ.

තව ද ආකාශස්ථ නාගයෝ ද, විශාලා නාගපුර වැසි නාගයෝ ද තක්ෂක නම් නාගයන් කැටුව ආහ. කම්බල අසසතර යන කුල දෙකේ නාගයෝද ප්‍රයාගවාසී නාගයෝ ද නෑයන් කැටුව ආහ.

යශස් ඇති, යමුනානදී වසන නාගයෝ ද, ධෘතරාශ්ට්‍ර කුලයට අයත් නාගයෝ ද, ඓරාවන නම් ඒ මහානාගයා ද භික්ෂු සමාගමය දක්නට වනයට පැමිණියාහ.

පිරිසුදු ඇස් ඇති යම් දිව්‍ය ගරුඩ පක්ෂි කෙනෙක් නා රජුන් වහා ඩැහැගෙන යෙත් ද, ඔහු අහසින් වනයට පැමිණියාහග චිත්‍ර ද සුපර්ණ ද යනු ඔවුන්ගේ නම් ය.

එදා නා රජුනට බිය විය. බුදුරජුහු ගරුඩයන් කෙරෙන් නිරපද්‍රිතව බව තහවුරු කළහ. නාගයෝ ද ගරුඩයෝ ද මොළොක් බසින් උනුන් කැඳවන්නාහු බුදු රජුන් සරණ ගියාහ.

විදුරත් නොහොත් සක්දෙව් විසින් දිනන ලද, මුහුද ඇසුරු කළ, සක් දෙව් රජුගේ භ්‍රාතෘ වූ, ඉදුමත්, යශස් ඇති අසුරයෝ ද, කාලංජ දානවේසය යන නම් ඇති මහ බියකරු අසුරයෝ ද, වෙපචිත්ති සුචිත්ති යන අසුරයෝ ද, පහාරද (ප්‍රාහ්ලාද) නම් අසුර ද නමුචිහු කැටුව ආහ.

හැම දෙනා ම වේරොච යන නම් ඇති, බලි අසුරයා පුත් සිය දෙනා ද බල සෙන් සන්නද්ධ කොට ගෙන රාහු අසුරිඳු වෙත එළඹියාහ. ඔබට සෙත් වේවා! දැන් භික්ෂූන් ගේ සමගාමය දක්නට වනයට යන්නට කල් පැමිණියේ යැ යි ඔහු සැළ කළාහ.

අබ් දේවතාවෝ ද පෘථිවි දේවතාවෝ ද තේජෝ දේවතාවෝ ද වායු දේවතාවෝ ද එයට ආහ. වරුණ, වාරුණ යන දෙව්හු ද සෝම වේයා ද යශස් නම් දෙවියා කැටුව ආහ. යශස් ඇති මෙත්තාකායික කරුණා කායික දෙවියෝ ද ආහ.

නන් වැදෑරුම් පැහැති දස පරිද්දෙන් වූ ඉදුමත් වූ ද්‍යුමත් වූ වර්ණවත් වූ යශස්වී වූ දශ දේව සමූහයෝ සතුට වන්නාහු, භික්ෂූන් ගේ සමාගමය දක්නට වනය කරා දස අයුරෙකින් එළඹුණාහ.

විෂ්ණු දේව නිකායේ දෙවියෝ ද, සහලී නිකායේ දෙවියෝ ද, අසම නම් නිකායේ දෙවියෝ ද යම නම් දේව නිකායේ දෙවියෝ ද ආහ. සඳමඩල නිසා වසන දෙවියෝ (සඳ මඬලට අධිපති) සඳු දෙවි පුතු පෙරටු කොට ආහ.

හිරු මඬල නිසා වසන දෙවියෝ (හිරු මඬලට අධිපති) හිරුදෙව් පුතු පෙරටු කොට ගෙන ආහ. නකත් තරු ඇසිරැ වසන දෙවියෝ නකත් තරුනට අධිපති දෙවියන් පෙරටු කොට ගෙන ද ආහ. මන්දවලාහක දෙවියෝ ද ආහ.

වසු දේවතාවනට නායක වු පුරන්ද යන අපර නාමයක්ද ඇති සක් දෙවිඳු ද ආයේ ය. ඉක්බිති සහභූ නම් දෙවියෝ ගිනිසිළු මෙන් දිලිසෙන්නාහු වනයට ආහ. දියබෙරලිය මල් පැහැති අරිට්ඨක නම් දෙවියෝ ද රෝජ නම් දෙවියෝ ද, වරුණ, ධම්ම, අච්චුත, අනෝජක යන නම් ඇති දෙවියෝ ද ආහ. සුලෙය්‍ය රුචිර යන දෙවියෝ ද ආහ. වාසවනේසි නම් දෙවියෝ ද ආහ. සමාන, මහාසමාන, මානුස, මානුසුත්තම, ඛිඩ්ඩාපදෝසිත නම් දෙවියෝ ද ආහ. මනෝපදෙසික නම් දෙවියෝ ද ආහ. ඉක්බිති හරි නම් දෙවියෝද ආහ. රතුනන් හඳුනා යම් දෙවි කෙනෙක් ඇද්ද, ඔහු ද යශස් ඇති පාරග මහාපාරග නම් වු දෙවියෝ දැයි මේ දස දෙව්මුළුහු භික්ෂූන් ගේ සමිතිය දක්නට වනය කරා දස පරිද්දෙකින් ආහ.

සුක්කකරුම්භ වරුණ යන දෙවියෝ වේඛනස යන දෙවියන් හා ආහ. ඔදාතගය්හ පාමොක්ඛ විචක්ඛණ යන දෙවියෝ ද ආහ.

යශස් ඇති සදාමත්ත හා රගජ යන නමැති දෙවියෝ ද මිස්සක නම් දෙවියෝ ද ආහ. යමෙක් දිශාවන් තෙමන්නේ ද, ඒ පර්ජන්‍ය දෙවි ද අහස ගුගුරවමින් ආය.

කීර්තිමත් ඛේමිය නම් දෙවියෝ ද තුසිත යාම කට්ඨක ලම්බීත කාලාම සෙට්ඨ, ජෝති, ආසව නම් දෙවියෝ ද, නිම්මානරතී නම් දෙවියෝ ද ආහ. ඉක්බිති පරනිම්මිත නම් දෙවියෝ ද ආහ.

නන් පැහැති, මේ සියළු සැටෙක් දේව නිකායයෝ, තවද තමනට සමාන යම් අන් දෙවි කෙනෙක් ඇද්ද, ඔවුන් ද කැටුවැ නම් පිළිවෙලින් ආහ.

වැසැ නමැවු ජාති ඇති, කෙළෙස් හුල් නැති, සතර කෙලෙස් මහ වතුරු තිනු, ආසව නැති අරී සඟන ද ඕඝයන් තිනු අගතියට නොයන (නොහොත් පවු නැති) අඳුරු පැහැ ඉක්මි සඳුහු වැනි බුදුරජු ද දකුම්හ'යි ආහ.



සෘද්ධිමත් බුදුරජු ගේ ආයුෂ්‍ය ශ්‍රාවක පුත්‍ර සුබ්‍රහ්ම පරමාත්ම යන දෙවිහු ද සනත් කුමාර බඹහු හා ආහ. ඒ තිස්ස නම් බ්‍රහ්ම ද භික්ෂුන් ගේ සමාගමයට වනයට ආහ.

මහ බඹ තෙම බඹලෝ දහසක් අභිබවා සිටී. බඹලොවැ උපන්, ද්‍යුතිමත් බිහිසුණු මහකයක් ඇති, කීර්තිමත් හෙතෙමේ ද ආයේ ය.

වෙන් වෙන්වැ තම පිරිස් සිය වශයෙහි පවත්වන, ඊශ්වර වු බඹහු දස දෙනෙක් ද මෙහි ආහ. ඔවුන් මැදින් බඹ පිරිස විසින් පිරිවැරුණු හාරිත නම් බ්‍රහ්ම තෙම ආයේ ය.

එළැඹ සිටි ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ඒ සියලු දෙවියන් කරා මරසෙන්හු පැමිණියාහ. බලව මරහු ගේ මුළා වෙක සැටි!

එවු, ගනිවු, බඳිවු, මොහු හැර රාගයෙන් බඳනා ලදුවෝ ම වෙත්වා. හාත්පසින් පිරිවරවු (වටා මුර කර කොට සිටිවු) තෙපි ඒ කිසිවකු දු නොමුදවු. මෙසේ බිහිසුණු හඬ කොට, අත්ලෙන් පොළොව පැහැරැ මහසෙන් (මර දෙවුපුත්) තෙම මරසෙන් එහි යැවීය.

යම් සේ වැසි සමයෙහි වසින මේඝය ගර්ජනා කරනුයේ විදුලිය සහිත වනුයේ ද, එසේම එදා ඒ මරදෙව් පුත් ඒ දෙව්පිරිස තමා වශයෙහි පැවැත්විය නුහුණුයේ, ඉතා කිපියේ, පෙරැළා නැඟී ගියේය.

පසැස් ඇති ශාස්තෘන් වහන්සේ ඒ සියල්ල දැන, වෙසෙසා දැක, ඉක්බිති සස්නැ ඇලුණු ඒ සව්වන් බණවා, මහණෙනි, මරසෙන්හු ආහ. ඔවුන් දැනගනිවු වදාළ සේක.

ඔහු ද බුදුරදුන්ගේ අනුශාසනය අසා වැර වැඩූහ. පහ වූ රාග ඇති ඒ භික්ෂූන් කෙරෙන් මරසෙන්හු ඉවත්ව ගියහ. ඒ රහතුන්ගේ ලෝමයකුදු සොලවනු නොහැකි වූහ.

ජනයා කෙරෙහි ප්‍රකට ව වූ ඒ සියළු බුදු සව්වෝ දිනූ මර යුධ ඇතියාහු, බිය ඉක්මියාහු, එහෙයින් ම කීර්තිමත් වූවාහු, අරියසච්චන් හා සතුටු වෙත්.

## ii. සර්කානි සුත්‍රය

සුත්‍ර පිටකයට අයත් සංයුක්ත නිකායෙහි මහා වග්ගයෙහි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන කල්හි සරකානි ශාක්‍ය තෙමේ කලුරිය කළේ ය. හෙතෙමේ විවසව නොහෙන සුළු නියත වූ සම්බෝධිය පිහිට

කොට ඇති සෝවාන්" යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය. එහි බොහෝ ශාක්‍යයෝ එක්ව රැස්ව අවමන් කෙරෙත්, ගරහත්, දොස පහළ කෙරෙත්. පින්වත්නි, අසිරි පින්වත්නි, පුදුමයි. යම් සරකානි ශාක්‍යයෙක් කලුරිය කළේ ද, හෙතෙමේ විවසව නොහෙන සුළු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති සෝවාන් හි භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේ ය. මෙහි දැන් කවරෙක් සෝවාන් නොවන්නේ ද? සරකානි ශාක්‍ය තෙමේ සික පද රැකීමෙහි දුබල බවට පැමිණියේ ය. මත්පැන් පුයේ යි.

එකල්හි මහානාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෝ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසව හුන්හ. එකත්පසව හුන් මහානාම ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. වහන්ස, "මෙහි සරකානි ශාක්‍ය තෙමේ කලුරිය කළේ ය. හෙතෙමේ විවසව නොහෙන සුළු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති සෝවාන්" යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ ය. වහන්ස, එහි බොහෝ ශාක්‍යයෝ එක්රැස්ව අවමන් කෙරෙත්, ගරහත්, දොස් පහළ කෙරෙත්. පින්වත්නි, හෙතෙමේ විවසව නොහෙන සුළු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති සෝවාන් වී භාග්‍යවතුන් වහන්සේ විසින් පවසන ලද්දේය. මෙහි දැන් කවරෙක් සෝවාන් නොවන්නේ ද? සරකානි ශාක්‍ය තෙමේ ශික පද රැකීමෙහි දුබල බවට පැමිණියේ ය. මත්පැන් පුයේ යි.

මහානාම, යම් එ උවසුවෙක් දිගු කලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ දහම් පිහිට කොට ගියේ, සඟන පිහිට කොට ගියේ නම් හෙතෙමේ කෙසේ නිරයට යන්නේද? මහානාම, මැනවින් කියන්නෙක් "උවසු තෙමේ දිගු කලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ දහම් පිහිට කොට ගියේයි" ඒ යමෙකු ගැන කියන්නේ නම් මැනවින් කියන්නා සරකානි ශාක්‍යා ඇරබ කියන්නේ ය. මහානාම, උවසු වූ සරකානි ශාක්‍ය තෙමේ දිගු කලක් මුළුල්ලෙහි බුදුන් පිහිට කොට ගියේ ය. දහම් පිහිට කොට ගියේ ය, සඟන පිහිට කොට ගියේ ය, හෙතෙමේ කෙසේ නම් නිරයට යන්නේද?

මහානාම, මෙහි ඇතැම් පුඟුලෙක් "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනදු දෙව් මිනිසුන්ට, ශාස්තෘහ, බුද්ධයහ, භගත්වහ" යි බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වූයේ වෙයි. දහම්හි ලොවට අනුතුරු පින් කෙතැයි සඟන කෙරෙහි හා සබහුල ප්‍රඥා ඇත්තේ ය. ජවන ප්‍රඥා ඇත්තේ ය. විමුක්තියෙන්ද සමත්වාගත ය. හෙතෙමේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵල සමාධියනත් ඵල ප්‍රඥාවත් දිටු දැම්යෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ



වෙසේ. මහානාම, මේ පුගුල් තෙමේත් නිරයෙන් මිදුනේය. තිරිසන් යෝනියෙන් මිදුනේය. ප්‍රේත විෂයයෙන් හාත්පසින් මිදුනේය. අපාය දුර්ගති විනිපාතයෙන් මිදුනේය.

මහානාම මෙහි ඇතැම් පුඟුලෙක් "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනදු දෙව් මිනිසුන්ට, ශාස්තෘහ, බුද්ධයහ, භගත්වහ" යි බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් සමන්වාගත වෙයි. ධර්මය කෙරෙහි ලෝකයාට අනුත්තර පුණ්‍ය ක්ෂේත්‍ර යි. සංඝයා කෙරෙහි හාස බහුල ප්‍රඥා ඇත්තේ ය. ජවන ප්‍රඥා ඇත්තේය. විමුක්තියෙන් නොද සමත්වාගත් හෙතෙමේ පස් ඕරම්භාගිය සංයෝජනයන් ක්ෂය කිරීමෙන් එහි පිරිනිවෙන සුළු එලොවින පෙරළා නොඑන ස්වභාව ඇති ඕපපාතිකයෙක් වෙයි. මහානාම, මේ පුගුල් තෙමේත් නිරයෙන් මිදුනේ ය. තිරිසන් යෝනියෙන් මිදුනේ ය. ප්‍රේත විෂයයෙන් මිදුනේය. අපාය දුර්ගති විනිපාතයෙන් මිදුනේ ය.

## iii. මධු පිණ්ඩික සූත්‍රය

මජ්ඣිම නිකායෙහි දැක්වෙන පරිදි ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ බුදුන් වහන්සේ වැඩ සිටි සමයෙහි, උන්වහන්සේ දිවා විහරණය පිණිස මහා වනයට පිවිස, බෙලි වෘක්ෂයක් සෙවනේ වැඩසිටි සේක. එකල්හි විඩා නිවා ගැනීම පිණිස එම වනයට පැමිණි දණ්ඩපානි ශාක්‍ය රජුන් ද බුදුන් වහන්සේ දැක උන්වහන්සේ වෙත ගොස් එකත්පසව සිටියේ ය. අනතුරුව රජ තෙම බුදුන් වහන්සේ නැමැද,

"භාග්‍යවතුන් වහන්ස, ශ්‍රමණ තෙමේ කෙබඳු අන්දමේ දෘෂ්ටියක් දරන්නේද, කුමක් දේශනා කරන්නේද, දැයි පිළිවිසීය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය රජු අමතමින්,

"ඇවැත්නි දෙවියන් සහිත මරුන් සහිත, බඹුන් සහිත, ලෝකයෙහි මහන බමුණන් සහිත නරදෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි යම් බඳු දෘෂ්ටි ඇත්තෙක් ලෝකයෙහි කිසිවකු හාත් විවාද නොකොට සිටී ද, කාමයෙන් විසංයුක්ත කොට විහරණ කරවා විචිකිච්චා රහිත සුන් කුකුස් ඇති කුදු මහත් භවයෙහි පහළ වූ තෘෂ්ණා නැති දෘෂ්ටි ඇත්තෙක් වියි." වදාළ සේක.

එදින සවස් භාගයේ ඉහත සිදුවීම් ආශ්‍රය කරගෙන සඟහම් දෘෂ්ටිය විවරණය කරමින් භාග්‍යවතුන් වහන්සේ නිග්‍රෝධාරාමයේදී පරිවාර භික්ෂු සංඝයා වෙත මධු පිණ්ඩික සූත්‍රය දේශනා කළ සේක.

### අටවන පරිච්ඡේදය

# බුදු සිරිත හා සබැඳි ප්‍රධාන චරිත

## 21. මහා තෙරවරු හා අග්‍ර උපස්ථායකයෝ

බුද්දක නිකායෙහි බුද්ධවංශ පාලියෙහි බුදුන් වහන්සේ තම දෙමාපියන් පිළිබඳවත් උන්වහන්සේගේ අගසව්වන් හා ප්‍රධාන අනුගාමිකයන් පිළිබඳවත් සඳහන් කරයි.

"මාගේ නගරය කපිලවස්තු නමැ'පිය තෙමේ සුදොවුන් රජ යැ. මාගේ ජනිකා වූ මවු තොමෝ මායා දේවි නමැයි, කියනු ලැබේ.

මම එකුන්තිස් වසක් ගිහිගෙයි වාසය කළෙමි. රම්‍ය, සුරම්‍ය, සුභ ය යන උතුම් වූ තුන් පහයෙක් වී.

මොනවට සැරැසුනු සතළිස්දහසක් පරිවාර ස්ත්‍රීහු වූහ. භද්ද කච්චනා නම් ස්ත්‍රිය අගමෙහෙසුන් වී පුත්‍ර තෙමේ රාහුල නම් වී.

සතර පෙර නිමිති දැක අශ්වයානයකින් අභිනිෂ්ක්‍රමණය කෙළෙමි. මම සවසක් දුෂ්කර වූ ප්‍රධන්වීර්යය කෙළෙමි.

මවිසින් බරණැස ඉසිපතන්හි දී දම්සක් පවත්වන ලද්දේ ය. ගෞතම බුද්ධ නම් වූ මම හැම සත්හට සරණ යමි.

කොලිත උපතිස්ස ය යන භික්ෂූන් දෙදෙන අගසව් වෙති. මාගේ සන්තිකා වචර වූ උපස්ථායක තෙමේ ආනන්ද නම් වෙයි.

ඛේමා ය උප්පලවණ්ණා ය යන භික්ෂූණීහු අගසව් වෙති. චිත්තය, හත්ථාවලකය යන මොහු අග්‍රොපස්ථායක වෙති.

උත්තරාය, නන්ද මාතාය යන අග උවසු උවැසියෝ වෙති.

මම් අසැතු බෝ මුල් හි හිඳ උතුම් වූ සම්‍යක් සම්බොධියට පැමිණියෙමි."



## i. සැරියුත් - ශාරිපුත්ත (උපතිස්ස) තෙරුණ්

ප්‍රඥාවන්තයින් අතර අග්‍ර වූ ශාරිපුත්ත තෙරණුවෝ උපතිස් බ්‍රාහ්මණ වංශිකයෙක් රජගහ නුවරට නුදුරු නාලක බමුණු ග්‍රාමයේ වංගන්ත බමුණාට දාව රූපසාරි බැමිණියගේ කුසෙහි ඉපිද උපතිස්ස යන නම ලැබී ය. සාරි බැමණියගේ පුත්‍ර යන අර්ථයෙන් ගෞතම සාරිපුත්ත යන නමින් ප්‍රකට විය. උපතිස්ස සාරි බැමිණියගේ පුතණුවන් ය. හෙතෙම ගිහි ජීවිතය පිළිබඳ කළකිරීමට පත්ව අස්සජී තෙරුණ්ගෙන් බණ දහම් ශ්‍රවණය කර සෝවාන් ඵල ලැබී ය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඒහිභික්ෂු භාවයෙන් පැවදි උපසම්පදාව ලැබී ය.

උපතිස්ස මානවකට චාලා, උපචාලා, සිසූපචාල යයි රූමත් නැගණියන් තිදෙනෙක් ද චන්ද, උපසේන, රේවත යැයි යසෝදරයෝ තිදෙනෙක්ද වූහ. උපතිස්සයන්ට මවුපිය පාර්ශ්‍රවයෙන් අසූහත් කෝටියක ධනයක් හිමි වුව ද තරුණ අවදියෙම ඔහුගේ අභිප්‍රාය වූයේ සියල්ල අත්හැර බුදුසසුනේ පැවිද්ද ලබා ගැනීම ය. හෙතෙම තම නැගණියන් තිදෙනා ද පැවිද්ද ලබා ගැනීම පිණිස යොමු කළේ බමුණු දහම ඇදහූ සිය මවගේ බලවත් විරුද්ධතාව මධ්‍යයේ ය. සංජය පරිබ්‍රාජක සහ අස්සජී තෙරණුවන් වෙත ශාරිපුත්ත තෙරුණ් තුළ පැවතියේ අසීමිත භක්තියකි. අස්සජී හිමියන් වැඩ සිටින දිශාවට පත්කඩය එලා තෙවිටක් නමස්කාර කිරීම ශාරිපුත්ත හිමියන්ගේ දින චර්යාවෙහි එක් අංගයක් විය.

ශාරිපුත්ත හිමියන් සංජය පරිබ්‍රාජකයාගේ ශිෂ්‍යයෙකුව සිටි අවධියේ කළ දිසා නමස්කාරය බුදු සසුනේ පැවදි වීමට පසුව ද අත්හැර නැතැයි යන චෝදනාවට ද උන්වහන්සේ වෙත එල්ල විය. උන්වහන්සේ විසින් සංක්ෂිප්තයෙන් දේශිත ධර්මය සෙසු ශ්‍රාවකයින්ට විස්තර සහිතව ප්‍රකාශ කිරීමේ කාර්ය ඉටු වූයේ ද උන්වහන්සේ වෙතිනි. ශාසනයේ යහපත හා ඉදිරි පැවැත්ම උදෙසා ශික්ෂාපද පනවන ලෙස භාග්‍යවතුන් වහන්සේ ගෙන් ඉල්ලීම් කරන ලද්දේ ද ශාරිපුත්ත තෙරුණ් විසිනි.

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සූබරබථ ලෙනෙහිදී, දීගනක නම් පරිබ්‍රාජකයාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය ශ්‍රවණය කළ සැරියුත් තෙරුණුවෝ සියලු කෙළෙසුන් නසා රහත් බව ලැබී ය. ශාරිපුත්ත තෙරණුවන් එම සිදුවීම ථේරගාථා පාලියෙහි මෙසේ දක්වයි.

"භාග්‍යවතුන් වහන්සේ අනිකෙකුහට ධර්මය දේශනා කරන සඳ මා එය මැනවින් ශ්‍රවණය කළෙමි. අවසන මම රහත් ඵල ලදිමි."

භාග්‍යවතුන් වහන්සේගේ දකුණත් ශ්‍රාවක තනතුර දැරුවේ ද බුද්ධ ශාසනයේ ධර්ම සේනාධිපති තනතුර ලැබුවේ ද සැරියුත් තෙරණුවන්ය. මෙ හිමියන්ගේ ගිහි කල උපසේන, චුන්ද, රේවත නමින් වූ, සොහොයුරන් තිදෙනා සැරියුත් තෙරණුවන්ගේ මඟ පෙන්වීම මත පැවදි බවට පත්ව, පසුව අරහත් ඵල ලැබූහ. උන්වහන්සේගේ සොහොයුරියන් වූ චාලා, උපචාලා, සිසුපචාලා යන තුන් සොයුරියන් ද සස්නෙහි පැවදිව රහත් බව ලදහ.

සැරියුත් තෙරණුවන් ගේ ජීවන වෘත්තාන්තය පිළිබඳව ඇගයීමක යෙදෙන අවස්ථාවේ, උන්වහන්සේ ගේ වීතරාගී සිත තමන් වහන්සේ වැඩ සිටි අසපුව හාත්පස වන පරිසරයෙන් ප්‍රබෝධමත් වූ අයුරු පිළිබඳව විමසා බැලීම ද බෙහෙවින්ම වැදගති. ඒ මක්නිසාද යත්, එහි ගැබ්ව ඇති මධුර වූ කාව්‍යමය ගුණය නිසා වෙති.

අපදාන පාළියෙහි ශාරිපුත්ත මහරහතන් වහන්සේගේ අපදානයෙහි උන්වහන්සේ වැඩසිටි අසපුව හා ඒ අවට වන පරිසරය පිළිබඳ ව ගෙන එන තත් ධ්වනි පූර්ණ වර්ණනය පාඨක සිත් ඇඳ බැඳ ගන්නා සුළු ය.

හිමවතට නුදුරෙහි 'ලම්භක' නම් පර්වතයකි. එහි මට අසපුවක් කරන ලදී.

නොගැඹුරු ඉවුරු ඇති මනා වූ කුඩා තොටුපළවල් ඇති මනොඥ්ඥ වූ සුදෝ සුදු වැලිතලාවෙන් ගැවසී ගත් කුඩා ගඟක් මාගේ අසපුවට නුදුරෙහි විය.

බොරළු රහිත වූ ගැඹුරු ඉවුරු නැති මිහිරි ජලයෙන් යුත් දුර්ගන්ධ විරහිත වූ කුඩා ගඟ එහි මාගේ අසපුව හොබවමින් ගලා බසී.

කිඹුල්ලු ද, මෝරු ද, ගැට කිඹුල්ලු ද, කැසබුවෝ ද එහි වූ මාගේ අසපුව හොබවමින් ගඟෙහි හැසිරෙත්.

එම ගඟ දෙපස (හැම කල්හි) මල් පිපුණා වූද ඵල ගත්තා වූද වෘක්ෂයෝද දෙතරෙහි නැමුණා වූ මාගේ අසපුව හොබවත්.

අඹ, සල්, මදට, පළොල්, නික යන මේ වෘක්ෂයෝ පිපී ගිය මල් ඇත්තාහු මාගේ අසපුවෙහි හාත් පස දිව්‍යමය සුවඳ පතුරුවත්. පිපුනු මල් ඇති සපු, සළල, කොළොම්, නා, දොඹ, වැටකේ මේ වෘක්ෂයෝ ද මාගේ අසපුවෙහි හාත් පස දිව්‍යමය සුවඳ පතුරුවත්.

මාගේ අසපුවෙහි යොහොඹු වැල් ද හෝපලු රුක් ද භගිනිමාලා නම් වෘක්‍ෂයෝ ද මල් පිපී ගියාහු ය. එසේ ම රුකඟුණු රත්කරවූ යන වෘක්ෂයෝ ද සුපුස්පිත වුවාහු ය.



වැටකේ, කඳල, ගොධුක, බෝලිද්ද යන මොහුද මාගේ අසපුව හොබවමින් දිව සුවඳ හමවත්. කිනිහිරිය, සිහින් මිදිය, පියාය, කුඹුක්ය යන බොහෝ වෘක්ෂයෝ ද මාගේ අසපුව හොබවමින් දිව සුවඳ වහනය කරත්.

ඇසළ ය, කෙළිඳ ය, කොළොම් ය, මුහුණ මල් ය යන බෝහෝ වෘක්ෂයෝ මාගේ අසපුව හොබවමින් දිව සුවඳ හමවත්.

ආළකය, ඉසි මුග්ග (වන මුං) කෙසෙල්ය, ලප් නාරං ය යන මේ ගස් සුවඳ දියෙන් වැඩුණාහු ඵල දරත්, (අසපුව අසළ වූ) තඩාගයෙහි හැම කල්හි ඇතැම් පද්මයෝ පිපෙත්. ඇතැම් කෙසර පද්මයෝ හටගණිත්. ඇතැම් පිපුණු පද්මයෝ ගිලිහුණු පත් හා කෙසරු ඇත්තෝ වෙත්.

අසපුවට නුදුරෙහි මැනවින් මැවූ පිරිසිදු සිසිල් දිය ඇති මනා තොටින් යුත් මනහර වූ තඩාගයෝ වූහ.

සුදු නෙලුම්, රතු නෙලුම් හා උපුල් මලින් ආකුල වූ තඩාගයන්ගෙන් දිව සුවඳ හමයි. මෙසේ සුපුස්පිත වූ ඵල දැරුවා වූ සර්වාංග සම්පූර්ණ වනයෙහි මැනවින් කරන ලද රම්‍ය වූ ආශ්‍රමයෙහි මම එකල්හි වෙසෙමි.

සිල්වත් වූ ව්‍රත වූ සම්පන්න වූ ධ්‍යාන කරන සුළු වූ හැම කල්හි ධ්‍යානයෙහි පඤ්චාභිඥ බලයට පැමිණියා වූ සුරුචි නම් තවුසෙක් වීමි.

සුවිසි දහසක් ශිෂ්‍යයෝ මට උවටැන් කළාහුය. මේ සියලු ශිෂ්‍යයෝ ජාතිමත්, කීර්තිමත් බ්‍රාහ්මණයෝ වූහ.

නිඝණ්ඩු, කෙටුභ සහිත අඩග ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද, ඉතිහාසයෙහිද, වේදත්‍රයෙහි ද ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහි ද පරතෙරට ගියාහු, වේද පද පාඨකයෝද වූහ. එසේම ව්‍යාකරණයෙන් ද දක්ෂයෝ වූහ.

උල්කාපාත, භූමි චලන ආදිය වැඩ අවැඩ දැනගන්නා උත්පාත ශාස්ත්‍රයෙහි ද සුබ අසුබ දැනගන්නා ශාස්ත්‍රයෙහි ද ස්ත්‍රී පුරුෂයන්ගේ හා මහා පුරුෂයන්ගේ ලකුණු දන්නා ශාස්ත්‍රයෙහි ද දක්ෂ වුවාහු ය. එසේම පෘථිවිය පිළිබඳ වූ ද, අහස පිළිබඳ වූ ද ශාස්ත්‍රයන් හි මාගේ ශිෂ්‍යයෝ දක්ෂයෝ වූහ.

අල්පේච්ඡ වූ අල්පාහාර වූ ලොල් බව නොමැති මුහුකුරා ගිය නුවණැති ඔහු ලාභ අලාභ දෙකින්ම එකසේ සතුටු වූවාහු හැම කල්හි මා පිරිවරත්.

ධ්‍යාන වඩන්නා වූ ධ්‍යානයෙහි ඇලුනා වූ ධෛර්යසම්පන්න වූ ශාන්ත වූ එකඟ සිත් ඇති අකිඤ්චනභාවය (පළිබෝධ විරහිත බව) කැමැති වන්නා වූ ඒ තවුසෝ හැම කල්හි මා පරිවරත්.

පඤ්චාභිඥාවන්හි පරතෙරට පත් පරම්පරානුගත ගෝචරයෙන් ඇලුනා වූ අහසින් යාම් ඊම් කරන්නා වූ ස්ථිර ගති ඇති එම තවුසෝ හැමකල්හි මා පිරිවරත්.

සදොර සංවරණය කරගත්, තෘෂ්ණාවෙන් තොර සුරැකි ඉඳුරන් ඇති ගිහියන් සමඟ නොගැටෙන ධෛර්යවත් ඒ මාගේ ශිෂ්‍යයෝ ළං විය නොහැක්කෝ වෙත්.

පුරා සඳ වූ ඒ මාගේ ශිෂ්‍යයෝ ඇලිය යුතු දෙයහි නො ඇලෙත්. ගැටිය යුතු දෙයහි නොගැටෙත් මුළා විය යුතු දෙයහි මුලා නොවෙත්.

ඉඳුහබල ආදියෙන් කිසිවෙකු විසිනුත් ළං විය නොහැක්කා වූ මාගේ ශිෂ්‍යයෝ නිරතුරුව ම විකුර්වණ ඍද්ධිය විමසමින් පවතිත්. පෘථිවිය ද කම්පා කෙරෙත්."

බුදුන් වහන්සේ දිවමන් කල, උල්කාපාත, භූමි චලන, අභ්‍යවකාශය ආදී විද්‍යාවන් පිළිබඳව ශාස්ත්‍රය හැදෑරූ සිසුන් සිටි බව ඉහත සුත් පිටකයෙහි සඳහන් වීමෙන් ප්‍රකට වන්නේ එකල සමාජය, විද්‍යා දැනුමෙන් පෝෂිතව සිටි බව ය.

## ii. මහා මුගලන් තෙරණ් (මහා මොග්ගල්ලාන - කෝලිත)

අපදාන පාලියෙහි බුද්ධවග්ගයෙහි මහා මොග්ගල්ලාන ස්ථවිරාවදානය තුළින් අපට මහා මුගලන් තෙරුන්ගේ චරිතපදානය මැනවින් අවබෝධ කර ගත හැකි ය.

"මෙයින් අපරිමෙය්‍ය කල්පයෙහි (එකාසඞඛ්‍ය කල්පලක්ෂයකින් පසුව) ඔක්කාක කුලයෙහි උපන්නා වූ ගෝත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘන් වහන්සේ ලෝකයෙහි පහළ වන්නේ ය.

හෙතෙම (වරුණ නාගරාජ තෙම) නිරයෙන් චුතව මිනිසත් බවට යන්නේ ය. නමින් කෝලිත නම් වූ බ්‍රාහ්මණයෙක් වන්නේ ය.

හෙතෙමේ පසුව කුශල මූලයෙන් විසින් මෙහෙයන ලදුයේ පැවිදිව ගෞතම බුදුරජාණන් වහන්සේගේ ද්විතීය ශ්‍රාවකයා වන්නේ ය.

පටන් ගන්නා ලද වීර්යය ඇත්තේ, ඍද්ධියෙහි කෙළ පැමිණයේ, සියලු ආශ්‍රව ධර්මයන් පිරිසිඳ දැන (දුරු කොට) ආශ්‍රව රහිත



ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවන් පාන්නේ ය.

පාපමිත්‍රයන් ඇසුරෙන් කාමරාගය වසඟයට ගියේ දුෂට සිත් ඇත්තේ මව ද පියා ද නැසීමි.

මම නිරයෙන් හෝ නැතහොත් මිනිසුන් අතර හෝ යම් යම් යෝනියක උපදිම් නම් (එකී) පාපකර්මයෙන් යුක්ත වීම නිසා බිඳීගිය හිස් ඇත්තෙම් මැරෙමි.

මෙය මාගේ සසරෙහි අවසානයයි. අන්තිම ආත්ම භාවය වේ. මේ ආත්මයෙහි දී ද මැරෙන කල්හි මට මෙබන්දයක් වන්නේ ය.

ප්‍රකෂී විවේකයෙහි යෙදුනේ සමාධි භාවනාවෙහි ඇලුනේ සියදු ආශ්‍රවයන් පිරිසිද දැන (දුරු කොට) ආශ්‍රව රහිතව වෙසෙමි.

ඍද්ධියෙහි කෙළ පැමිණියා වූ මම ඉතා ගැඹුරු වූ ඝන වූ නොසෙල්විය හැකි පොළව ද වම් පය මහපටැගිල්ලෙන් සොළවන්නෙමි.

අසමි මානය (මම යන හැඟීම) නොදකිමි. මට මානය නැත. මම හෙරණකු පටන් කොට සියළු භික්ෂු සංඝයා කෙරෙහි ගෞරව සිත (ඇති) කරමි.

මෙයින් ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයකට (අපරිමෙය්‍ය කල්පයකට) පෙර (අගසව් බව පිණිස) යම් කර්මයක් රැස් කළෙම් ද, මම ඒ ශ්‍රාවක භූමියට පත්වීමි. ආස්‍රවක්ඛය සංඛ්‍යාත නිවනට පැමිණියෙමි.

කාලශිලා ගල්තලාවෙහි කුටියක මහා මුගලන් තෙරුණ් භාවනායෝගීව සිටි අවස්ථාවක, උන්වහන්සේට විරුද්ධවාදීන් පිරිසකගේ විවිධ අඩම්තෙට්ටම් වලට මුහුණ දීමට සිදුවිය. උන්වහන්සේ සතුව පැවති ඍද්ධි බලය උපයෝගි කර ගෙන කුටියෙහි යතුරු සිදුරෙන් කුටියෙන් බැහැරව ගොස් දිවිරැක ගැනීමට උන්වහන්සේට හැකි විය. වෙනත් දිනකදී මෙබඳුම කටුක අත්දැකීමකට උන්වහන්සේට මුහුණපෑමට සිදුවිය. එවර ද ඍද්ධි බලයෙන් වහලය සිදුරු කරගෙන ඉවතට යාමට උන්වහන්සේ ක්‍රියා කළහ. තෙවන වරටද උන්වහන්සේගේ කුටිය සොරමුලක් විසින් වටලණු ලැබිණ. නොනැවතීම තමන්ට මෙවන් අතවර වලට මුහුණ පෑමට සිදුවන්නේ මන්දැයි මුගලන් තෙරුණ් නුවණින් විමසා බැලී ය. තමන් විසින් පෙර ආත්මයක සිදු කළ මවුපියන්ගේ ප්‍රාණය නැසීමේ ආනන්තර්ය පාප කර්මයේ විපාක තමන්ගේ පසු පස ලුහුබඳින බැව් මුගලන් තෙරුණ්ට වැටහී ගියේ ය. කර්ම විපාකයට මුහුණදීමට තීරණය කළ තෙරණුවෝ සොරුන්ට කැමැත්තක් කරන්නට ඉඩ හැර කුටිය තුළ භාවනා යෝගීව

ගත කිරීමට ඉටා ගත්තේ ය. සොර මුල විසින් විවිධ වදහිංසා පමුණුවමින් මුගලන් තෙරණුවන්ට සිහි සුන්වන තුරා පහර දෙනු ලැබිණි. තෙරණුවන් ජීවිතක්ෂයට පත්වන්නට ඇතැයි සිතූ සොරු ඉවත ගියහ. ඒ අතර මුගලන් තෙරුණ් සෘද්ධි බලයෙන් නැඟී සිට භාග්‍යවතුන් වහන්සේ වැඩ සිට වේළුවණ අරම වෙත වැඩියේ පිරිනිවන් පාණු පිණිස බුදුහිමියන්ගෙන් අවසර ගැනීමේ අධිෂ්ඨානයෙනි.

භාග්‍යවතුන් වහන්සේ වැඳ නමස්කාර කළ මුගලන් මහ රහතන් වහන්සේ තමන් ඉසිගිලි පර්වත ප්‍රාන්තයේ කාලසිලා ගල්තලාවේදී පිරිනිවන් පානා බැවින් ඒ සඳහා අවසර අයැද සිටි සේක.

මුගලන් තෙරුන්ගේ ආයුසංස්කාර පිරිහී ඇති බැව් දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑමට අවසර ලබා දුන් සේක. පුණ්‍ය මහිමයෙන් අගතැන්පත් වූ භාග්‍යවතුන් වහන්සේගේ අගසව් ලෙස කටයුතු කළ මුගලන් තෙරුණ්ට සොර මුල ගෙන් පහර ලැබ අපවත්වන්නට සිදු වූයේ මන්ද යන්න පිළිබඳව වේළුවණාරාමයෙහි සිටි භික්ෂු සංඝයා අතර මෙන්ම උවසු උවැසියන් අතරද කුකුසක් ඇති විය.

රහත් වුවත් පෙර ආත්මභවයක දී මුගලන් තෙරුණ් අතින් සිදුවූ ආනන්තර්‍ය කර්මයක් හේතු කොට ගෙන මෙවැනි දුක්ඛදායී අපවත්වීමකට මුගලන් තෙරුණ්ට මුහුණ දෙන්නට සිදු වූ බැව් එහිදී භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි අතීත කථාව ද දේශනා කළ සේක. ඒ අනුව අතීතයේ බරණැස් නුවර දුගී පවුලක උපත ලැබ සිටි මුගලන් තෙරුණ් දෑස නොපෙනෙන තම දෙමාපියන් මැනවින් පෝෂණය කරමින් සිටියහ. දෙමාපියන්ගේ ඉල්ලීම නිසාම මෙම මානවකයා විවාහයක් කර ගැනීමට පෙළඹුණි. අලුත් ලේලියට අඳ දෙමාපියන් මහත් හිසරදයක් විය. ඇයගේ පෙළඹීම මත මෙම මානවකයා සිය අඳ දෙමාපියන් මහ වනයකට ගෙන ගොස් අතරමං කර මව්පියන්ට නෙත් නොපෙනෙන බැවින් තමන්ම සොරමුල සේ දෙමාපියන්ට හඟවා, පොලුවලින් තලා පෙලා ඔවුන් දෙදෙනා ජීවිතක්ෂයට පත් කරණු ලැබිණි. රහත් බව ලැබුව ද මෙම භවයේදී මුගලන් මහ තෙරුණට ආනන්තර්‍ය කර්ම විපාකය පළ දුන් බව භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයින් හා උවසු උවැසියන්ට පැහැදිලි කරදුන් සේක.



## iii. මහා කාශ්‍යප ථෙරණුවෝ

"සම්පතින් අනූන සිටු කුලයෙහි උපන්නෙමි. අසූ කෙළක් රත්හැර පැවදි වීම." - අපදාන පාළි.

උන්වහන්සේ ගිහි කළ මනා ධන සම්පතින් අනූන පිප්ඵලී සිටු නමින් ප්‍රකටව සිටියේ ය. බුදු බණ අසා පැවිදි දිවියට එළඹි මහා කාශ්‍යප ස්ථවිර නමින් ප්‍රසිද්ධියට පත් විය. මහා කාශ්‍යප තෙරුණ් ධූතාංග ධාරීන්ගෙන් අග්‍රස්ථානය ලද සේක. මෙම තෙරණුවන් පෙනුමෙන් බුදුන් වහන්සේගේ පෙනුමට බෙහෙවින් සමාන වූ බව පැවසේ.

වරක් බුදුන් වහන්සේ පිඬුසිඟා වඩින මග ම මහ කාශ්‍යප තෙරුණ් ද පිඬු සිඟා වඩිමින් සිටි සේක.

එම අවස්ථාවේ එක් දිළිඳු කාන්තාවක් බුදුන් වහන්සේට මහත් බැතියෙන් දන් වේලක් පූජා කළේය. ඉන් ස්වල්ප මොහොතකට පසු මහ කාශ්‍යප තෙරුණ්ද එම මග ම වඩිමින් පෙරකී දිළිඳු කාන්තාවගේ පැල්පත ඉදිරියේ වැඩ සිටි සේක.

'අනේ බුදුහාමුදුරුවනේ ඔබවහන්සේ යැයි සිතා මෙහොතකට පෙර මෙහි වැඩි වෙනත් රහත් නමකට මාගේ දන් වේල පූජා කළා බුදුන්වහන්සේ මොහොතක් වැඩ සිටින්න' යැයි, පවසමින් එම කාන්තාව තම දන්වේල පුද කළ භාග්‍යවතුන් වහන්සේ පසු පස ගොස් උන්වහන්සේට පිදු දාන වේල පාත්‍රයෙන් ආපසු ගෙනැවිත් මහා කාශ්‍ය තෙරුණ්ට පූජා කළ බැව් ජාතක පොතේ සඳහනි.

භාග්‍යවතුන් වහන්සේ සතුව පැවති දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අතරින් මහා පුරුෂ ලක්ෂණ සප්තකයක් මහා කාශ්‍යප හිමිට උරුමව තිබිණි. මේ නිසා මහා කාශ්‍යප තෙරුණ්ගේ හැඩරුව බෙහෙවින් ම භාග්‍යවතුන් වහන්සේගේ රුවට සමාන විය. මේ හේතුවෙන් මෙම කාන්තාවට නියම භාග්‍යවතුන් වහන්සේ හඳුනා ගැනීමට නොහැකි වීමෙන් මෙවන් ගැටළුවක් ඇතිවූවා සේ ය.

තත් සිදුවීමෙන් පසුව මහා කාශ්‍ය හිමි තම රුවට බුදුරුව යැයි සිතා උවැසි උවැසියන් රැවටීමෙන් සිදුවන අනර්ථකාරී තත්වයෙන් මිදීම පිණිස ජීවිතයෙන් වැඩි කාලක් හිමාලය පෙදෙසට ගොස් බවුන් වඩමින් සිය මුළු ජීවිත කාලය ම එහි ගත කළහ.

මහා කාශ්‍යප තෙරුණ් හිමාලය අඩවියේ බවුන් වඩමින් බොහෝ අවස්ථාවල එක දිගට දින හතක් එක ම ඉරියව්වෙන් පැන් පොදක් පවා වැළඳීමෙන් වැළකී නිරෝධ සමාපත්තියට සමවැදී සිටි බවද ත්‍රිපිටකයේ සඳහනි.

එම සමාපත්ති සුවයෙන් බිඳුණු පසුව දන් වේලක් නොලදහොත් උන්වහන්සේගේ අපවත්වීම සිදුවන බවද පැවසේ.

සමාපත්තියෙන් පසුව පළමු දන්වේල පුදන පුද්ගලයාට එහි පින් එම අවස්ථාවේ ම ඵල විපාක දෙන බවට විශ්වාසයක් පවතී.

මේ අයුරින් එක දිගට නිරෝධ සමාපත්තියෙන් වැඩ විසූ කාශ්‍යප තෙරුණ් තමන්ට දන් වේලක් පුදා ඉෂ්ඨ සම්පත්තිය ලැබීමට සුදුසු දිළිඳු පැල්පතක් සොයමින් පේෂ කර්මාන්තයෙහි නියැළි ගමකට වැඩි සේක. මෙම අවස්ථාව දිවැසින් දුටු දේව සමූහයා මහ කාශ්‍යප තෙරුණ් වඩින මඟට පිවිස උන්වහන්සේ ට දන් පිළිගැන්වීමට උත්සාහ ගත්හ.

තමන් දිළිඳු පුද්ගලයෙකුට මෙම පුණ්‍ය කර්මය අත්කර දීමට පේෂකර්මාන්ත ගමකට වඩින බැවින් දෙවියන් පිළි ගැන්වීමට සුදානම්ව දන් වේල කරුණා, සහගතව ප්‍රතික්ක්ෂප කළේ ය. මෙය දුටු සක් දෙවිඳු දිළිඳු වෙසක් මවා ගෙන පේෂකර්මාන්ත ගම්දොර පැල්පතක රැදී සිටියේ දින හතක් නිරෝධ සමාපත්තියෙහි නිමග්නව සිටි මහා කාශ්‍යප තෙරුණ්ට දන් වේලක් පිරිනමා මහා ආනිසංසයක් ලබා ගැනීමේ චේතනාවෙනි. මෙම දිළිඳු වෙස් ගත් පුද්ගලයා වසා ගෙන පැමිණි බඳුනක තිබූ ආහාර පාත්‍රයට බහා ලනු ලැබිණි. එහි දී දිව බොජුන්වල සුවඳ දැනී මහා කාශ්‍යප හිමි සෘද්ධි බලයෙන් මෙහෙයවා මොහු සක් දෙවිඳු බව හැඳින ගත් බවත් සඳහනි.

බුද්ධ පරිනිර්වාණය සිදුවන අවස්ථාවේ කාශ්‍යප හිමි හිමාලයේ වැඩ විසූහ. උන්වහන්සේ යළි කුසිනාරා නුවරට වඩින තුරු, ආදාහන දිනය කල් දැමූ බවද සඳහන් වේ. භික්ෂු සංඝයා මැනවින් සංවිධානය කර, ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට උන්වහන්සේ පුරෝගාමීව ක්‍රියා කළ සේක. කාශ්‍යප තෙරිඳුන් වසර 120 ක් ආයු සම්පත් විඳි බැව් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහනි.

සූත්‍ර පිටකයට අයත් බුද්දක නිකායෙහි චත්තාලීස නිපාතයෙහි කාශ්‍යප තෙරුණ් වහන්සේ ධන්‍යානගතව සටියදී තම මනස ප්‍රමුදිත කළ පරිසර වැනුම සහෘර්දයන්ගේ සිත් සතන් දැහැන් ගත කරවන සුළු ය.

"ලුණුවරණ රැක්පෙතින් පැතිරැගිය හිත්කළු වූ භූමිභාග ඇති, ඇතුන්ගේ ගර්ජනායෙන් රම්‍ය වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්. නිල් වලාවලට බඳු පැහැ ඇති වූ, පැහැසර වූ, සිහිල් දිය ඇති වූ, පිරිසුදු වූ, ඉඳුගොව්වන් ගැවසීගත්තා වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්. නිල් වළාකුළු වුවම් වූ ඇතුන්ගේ ගර්ජනායෙන් රම්‍ය වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්. බෙහෙවින් වට වැසි ඇති, රම්‍ය වූ තලා ඇති, ශීඝීන් (මොණරුන්) විසින් කරන ලද මධුර වූ, උනනාද ඇති සෘෂීන් විසින් සෙවුනාලද නග නම් වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්. ධ්‍යාන කරනු කැමති වූ නිවනෙහි එළ වූ සිත් ඇති වූ මට මැනැවි, තමහට වැඩ කැමැති නිවනෙහි එළවූ සිත් ඇති භික්ෂූ වූ මට මැනිවි. උමාකුසුම් (නිල්කටරොළු) බඳු පැහැ ඇති වූ, නිල් වලායෙන් වැසුණු ගුවන්තලය වැනි වූ නොයෙක් පක්ෂිගණයා විසින් ගැවසී ගත්තාවූ, ඒ පර්වතයෝ මා රමණය කරත්.

ගිහීන්ගෙන් ආකිණණී නොවූ, මුව (සිවුපා) සමූහයා විසින් සෙව්නා ලද්දා වූ, නොයෙක් පක්ෂි ගණයාගේ ආකීණි වූ, ඒ පර්වතයෝ මා සිත් ගනිත්.

පහන් දිය ඇති පුළුල් ගලතල ඇත්තා වූ ගොනගුලන (වඳුරන්) හා මුවන් ගෙන් යුක්ත වූ දිය සෙවෙල වලින් වැසුණා වූ ඒ පර්වතයෝ මා සිත් අලවත්. එකඟසිත් ඇත්තා වූ රූපාදිධර්මයන් මොනවට විදර්ශණා කරන්නා වූ මට යම් බඳු නම්, එබඳු රතියක් පසඟතුරු රැවින් මට නොවේ.

කර්ම බොහෝ කොට නොකරවුව මැනැවැ, කල්‍යාණමිත්‍ර නොවූ ජනයා දුරු කළ මැනැවැ (ප්‍රත්‍යයොත්පාදනයෙහි)."

අවසානයේ කාශ්‍යප තෙරුණ් මෙවන් උදානයකින් තමන් වහන්සේ නිවන් අවබෝධ කර ගත් බව දක්වත්, 'මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරනු ලැබිණි. බුදුන් වහන්සේගේ අනුශාසනා ශ්‍රවණය කළෙමි. මින් මතු මට පුනර්භවයක් නොමැත.'

## iv. චිත්ත ගහපති

චිත්ත ගහපති දඹදිව මච්ජිකා සන්දනම් නුවර යස ඉසුරෙන් හා ගුණ නුවණින් පරිපූර්ණ සිටුවරයෙකි. හෙතෙම නගරයෙහි සෙසු ජනතාවට පූර්වාදර්ශයක් ම විය. දිනක් පස්වග මහණුන්ගෙන් එක්නමක් වූ මහානාම තෙරුණ් සුපිළිසන්ව පිඬු සිඟා වඩින සඳ උන්වහන්සේගේ ශාන්ත ඉරියව් කෙරෙහි පැහැදුණු චිත්ත සිටු උන්වහන්සේ සිය සිටු මඳුරට වඩමවා දාන වේලක් පිරි නැමී ය. දන අවසන මාහානාම තෙරුණ්ගේ ධර්මය ශ්‍රවණය කළ හෙතෙම සෝවාන් ඵලයට පත්විණි. පසුව අචල ශ්‍රද්ධාවෙන් තමන්ගේ අම්බරැල්ල නම් වන උයනෙහි පන්සලක් තනවා සතර දිගින් වැඩි භික්ෂූන් හට පූජා කොට

එක් සුධම්ම නම් භික්‍ෂුන් වහන්සේ නමක් එහි නේවාසිකව පදිංචි කළේය. චිත්ත ගහපතිගේ සද්ධාසම්පන්න බව දැගසව්වන් හට ද ආරංචි වී මොහු සුවදුක් විමසීමට උන්වහන්සේලා මච්ඡිකාසන්දනම් නුවරට පැමිණියහ. මෙසේ පැමිණි කළ සංග්‍රහ වලින් පසු සැරියුත් මහ තෙරුන්ගෙන් බණ අසා අනාගාමී වීය.

පසුව සුධම්ම හිමි මොහු සමඟ ඇතිකරගත් සිත් තැවුලක් අරභයා බුද්ධ නියමයෙන් ගිහි උපාසකතුමාගෙන් සුධම්ම හිමිට සමාව පවා ගන්නට සිදුවිය. විනය පිටකයේ පිටිහරණීය කම්ම නොහොත් භික්‍ෂුවක් ගිහියෙකුගෙන් සමාව ගැනීමේ විනය ශික්‍ෂා පදය පැනවූයේ මෙකරුණු හේතු කොටැ ගෙන ය.

චිත්ත සිටුගේ ගුණගරුක භාවය හා ප්‍රසන්න චර්යා රටාව කෙරෙහි සතුටට පත් නගරවාසීහු නිරන්තරයෙන් ම එතුමන්ට මහත් ගෞරව හරසර දැක්වීමට උනන්දු වූහ. දිනක් දෙව්රම් වෙහෙරට පැමණෙද් දී ජනයා චිත්ත සිටු තමන්ට දක්වන ගරු සැලකිලි දුටු ආනන්ද හිමි එවන් භාග්‍යවන්තයෙකු වීමට සිටුතුමන් කර ඇති පින කුමක්දැයි බුදුරජාණන්වහන්සේ ගෙන් විමසීය. සිල්වතුන් ඇසුර, සඳහම් ඇසීමේ රුචිය, මසුරු මළ සෝදා හරින දන්දීම ආදී ගුණාංගයන් චිත්ත සිටු ජනතාවගේ ගරු බුහුමන ට බඳුන්වීමට හේතුවක් බැව් එහිදී බුදුරජාණන් වහන්සේ පහදා දුන්සේක.


මෙතුමා පෙර මුව වැද්දෙකුව සිට බොහෝ පැවදිහූ හට දන්දීමේ හේතුවෙන් දිව්‍යලෝක සැප විඳ කෙළවර මෙසේ චිත්ත නමින් ඉපිද යන යන තැන සම්පත් ලාභී කෙනෙක්ව උපත ලබා ඇත. වරක් බුදුරජාණන් වහන්සේ දක්නට 500 ක් ගැල් පුරවා භාණ්ඩ රැගෙන මහ පිරිසක් සමඟ පැමිණ දන්දීම් කළ ද, මාසයක් ගත වූවත් දෙවියන්ගේ සහ ඒ ඒ පළාත් වැසියන්ගේ සංග්‍රහ ලැබීම නිසා, ගැල්වල එකදු කැමක්වත් ප්‍රයෝජනයට ගැනීමට සිදු නොවී ය. මාසය කෙළවර යාමට සුදානම් වී ගැල් සියල්ල හිස් කර භාණ්ඩ බුදුරජුන් නියමයෙන් ආනන්ද හිමිට පවරා යන්නට සුදානම් වන විට ජනපද වාසීන් හා දෙවියන් එකතුව ගැල් 500 සත්රුවණින් පුරවාලු කථා පුවතක් අටුවාවේ සඳහනි. චිත්ත ගහපතිතුමා උපාසක ධර්මකථිකයන් අතර අගතනතුර ලාභිව අසූමහ ශ්‍රාවක ගණයටද ඇතුළත් වී ය. වරක් භික්‍ෂූන් හටද ඉදිරිපත්ව ධර්මය දෙසූ සූත්‍ර දේශණාවක් ඇත.

මෙම තොරතුරු ධම්මපද බාල වග්ගයේ 14 ගාථාවෙහි හා අටුවාවන්හි දක්වා ඇත.



## v. හත්ථාළවක

මොහු ගිහිව උපාසකව සිටිමින් අනාගාමී වූවෙකි. අලව් රජු මුවෙකු පසු පස එළවා උෟ මරා ගෙන එන අතර මඟ ගසක් යට විවේක ගනිද්දී අලව් යකුගේ ග්‍රහණයට අසුවිය. තම මාන සීමාවට එම ගස අයත් වූවෙන් රජ මරා කෑමට සුදානම් වූ විට වූ පොරොන්දුවක් මත රජ නිදහස් ලැබී ය. පොරොන්දුව වූයේ දිනපතා එක් මිනිසෙක් බැගින් ආලවක යකුගේ ආහාරයට එවීමයි. සුත්ත නිපාතයේ එන ආළවක සූත්‍ර අට්ඨකතාව මෙම සිදුවීම මැනවින් දක්වා ඇත. අවසානයේ රජුගේ ම කිරිකැටි පුතා ආලවක යකු වෙත ගෙන යයි. එම අවස්ථාවේ අලව් යකුට දහම් දෙසා සෝවාන් ඵලයට පත්කිරීමෙන් පසු ලජ්ජාවෙන් කුමරු අතට ගත් යකු බුදුරජුන්ට පූජා කළේ ය. බුදුරජුන් නැවත රාජ සේවකයන්ට දී කුමරු වැඩුණු පසු බුදුරජුන් නිසා දිවි ලැබූ හෙයින් නැවැත බුදුරජු හා සංඝයා ඇසුරට පත්කොටැ සියළු බුද්ධ වචන ඉගෙන අනාගාමී ඵලයට පත්වූයේ 500 උපාසක පිරිස සමඟ ය. මොහුගේ චරිතය තුළ දානය, ප්‍රිය වචනය, අර්ථචර්යා හා සමානාත්මතා සතර සංග්‍රහ වස්තුවෙන් බොහෝ ජනයාට සංග්‍රහ කිරීම අතුරෙන් අසුමහා ශ්‍රාවක උපාසක පිරිස අතුරින් සිවුසඟරාවකතින් පිරිසට සංග්‍රහ කිරීමේ අගතනතුර ද ලැබී ය.



තෙරණිය

# 22. මහා තෙරණියෝ හා අග්‍ර උවැසියෝ

## i. ඛේමා තෙරණිය

ඛේමා තෙරණිය ගෞතම බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකාවන් දෙදෙනාගෙන් කෙනෙකි. කල්ප ලක්ෂයකට පූර්වයෙහි පදුමුත්තර සර්වඥයන් වහන්සේ වෙතින් ධර්ම ශ්‍රවණය කර පැහැදීමට පත්ව, සතියක් පුරා දාන මාන පුණ්‍යකර්මයන්හි නිරත වූවා ය. එතුමිය එම පුණ්‍යකර්මයන් හේතුකොට ගෙන දෙව් ලොවද, පසුව මිනිස් ලොවද සමෘද්ධි සම්පන්නව උපත ලැබුවාය. ඕ තෙමෝ තවත් අවස්ථාවක කාශ්‍යප බුදුරජාණන් වහන්සේ මනු ලොව පහළව සිටි අවදියේ, බරණැස කිකි නම් නිරිඳුන්ගේ වැඩිමහල් දුව සමණි නමින් උපන්නා ය. ගෞතම බුද්ධ ශාසනයෙහි උප්පලවණ්ණා නමින් උපත ලබන්නේ සමණි රජ කුමරියගේ සොහොයුරියක වූ සමණ ගුප්තාවන්ය. එම ආත්මභවයේ දී සමණි කුමරිය විසින් කරනු ලැබූ කුසල් සම්භාරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇය ගෞතම බුදුන් දවස මගධ රට සාගල නුවර රජ මැඳුරක කුමරියක ලෙස ජන්මය ලද්දී ය. අතිශයින් රූමත් වූ රන් පැහැ සිරුරකින් යුත් ඇය ඛේමා නමින් ප්‍රසිද්ධියට පත්වූවා ය. යොවුන් වියට පත් ඛේමාවන් බිම්බිසාර රජු සිය අග මෙහෙසිය බවට පත් කර ගනී. රූප මඳයෙන් මත් ව සිටි ඇය බුදුන් වහන්සේ රූප සම්පත්තිය හෙළා දකීවියි යන අනියත බිය නිසා කිසි දිනෙක භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි වේළුවණ අරමට පියමන් නොකිරීමට වග බලා ගත් බව සඳහනි.

බිම්බිසාර රජු තම බිසව විහාරය වෙත යොමු කරවා ගැනීම පිණිස වේළුවණාරාමයෙහි පරිසරය වර්ණිත ගායනා හා වාදන වෘන්දයක් සංවිධානය කිරීමට උත්සුක විය. සංගීතය ශ්‍රවණය කිරීමේ අපේක්ෂාවෙන් ආරාමයට ගිය ඛේමාවන්ට බිම්බසාර රජුගේ නියෝගය මත බුදුන් වහන්සේ බැහැදැකීමට යාමටද සිදු විය. එහිදී රූප මඳයෙන් මත්ව සිටි ඛේමාවන්ට දර්ශනය වන පරිදි බුදුරජාණන් වහන්සේ විසින් සෘද්ධියෙන් සෙමර සළමින් සිටිනා රූමත් නව යොවුන් කාන්තා රුවක් මැවූ සේක. එකී කාන්තා රුව අනුක්‍රමයෙන් වියපත්ව දිරා පත්ව දුර්වලව කෙළින් සිටීමටවත් නොහැකිව බිම ඇදවැටෙන අයුරු පෙනෙන ලෙස සෘද්ධියෙන් මැවීමක් කළ සේක. මිනිස් සිරුරේ යථා ස්වභාවය මැනවින් පසක් කර ගන්නට මෙම දසුන ඇයට බෙහෙවින් උපකාරී විය. සත්‍ය ඇයට අවබෝධ විය. ඇය බුදුසිරි පතුල අසළ වැඳ වැටී එතෙක් රූප මඳයෙන් මත්ව බුදුන් වහන්සේ හමුවට පැමිණීමෙන් වැළකීසිටීම පිළිබඳ ව සමාව අයැද සිටියා ය.



එකල්හි ඛේමාවක් ඇමතූ භාග්‍යවතුන් වහන්සේ, ඛේමාවනි, රෝගාදියෙන් ආතුරවූ දෙතිස් කුණපයෙන් අපවිත්‍ර වූ කුණුවීම, දිරීම් මුල්කොට ගත් මේ ශරීරය දෙස බලව, ශරීරය පිළිබඳව පවත්නා ඡන්දය දුරු කරව, අසුභ විපස්සනාව වඩව යනුවෙන් මහා නිදාන සූත්‍රය වදාළ සේක.

දිවියෙහි පවත්නා නොතිර ස්වභාවය මැනවින් පසක් කර ගත් ඛේමාවන් බිම්බිසාර රජු ගෙන් නිසි අවසර ලැබ පැවදි ජීවිතයට පිවිසියා ය. පැවදි බව ලද ඕ තොමෝ, දෙසතියක් වැනි සුළු කාලයක් ඇතුළත, පහන් දැල්ලක ගති ස්වභාවය අරමුණු කර ගෙන බවුන් වඩා අර්හත් භාවයට පත්වූය. ඛේමා තෙරණියට මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතුරෙන් අග්‍රස්ථානය හිමිකර ගැනීමට තරම් ප්‍රභාෂ්වර නැණසකින් යුතු වූවා ය.

## ii. උත්පලවන්නා තෙරණිය

පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි හංසවතී නුවර ඇය උපත ලැබුවා ය. පදුමුත්තර බුදුන් වහන්සේ එක්තරා පුණ්‍යවන්ත භික්ෂුණීන් අතුරෙන් අග්‍රස්ථානය පිරිනමනු ඇයට දැක ගන්නට ලැබිණි. එයින් මහත් සතුටට පත් ඇය මම ද බොහෝ පින්කම් කොට මතු බුදු කෙනෙකුන් ගේ ශාසනයෙහි එකී අග්‍රස්ථානය ලබන්නෙමි'යි ප්‍රාර්ථනා කළාය. සිය සිත්හි අරමුණු කර ගත් පරිදිම ඇය මහත් පින් දහම් සිදු කොට දිව්‍ය සම්පත්තිය ලැබීමට හේතු වාසනා ලද්දී ය.

කාශ්‍යප බුදුරජුන්ගේ කාලයෙහි බරණැස කිකී නම් කාසි රජුගේ මාළිගයෙහි සමණගුත්තා නමින් උපත ලැබුවාය. සමණි, භික්ඛුණීදාසිකා, ධම්මා, සුධම්මා හා සංඝදාසිකා නමින් ඇයට සොහොයුරියෝ සය දෙනෙක් ද වූහ. පසුකලෙක ශාසන අඹරේ උත්පලවණ්ණා නමින් දීප්තිමත් ථෙරණියක වූයේ සමණගුත්තාය. සෙසු සොහොයුරියෝ මතු ගෞතම බුද්ධ කාලයෙහි ඛේමා, පටාචාරා, කුණ්ඩලකේෂී, කිසාගෝතමී, ධම්මදින්නා හා විශාඛා නමින් උපත ලැබුවා ය.

## iii. උත්තරා තෙරණිය

උත්තරා, රජගහ නුවර සුමණ සිටුවරයා ගේ මෙහෙකරුවෙකු ලෙස සේවයෙහි යෙදුණු පුණ්ණ නමැත්තාගේ දියණියයි. සුමණ සිටුවරයාට අයත් කුඹුරු යායක සී සෑමට ගිය පුණ්ණ දිවා ආහාරය රැගෙන ඒම සිය බිරිඳට පැවරීය. මෙදින සැරියුත් තෙරුණ් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් සත් දිනක් එකම ස්ථානයක වැඩ සිට නැඟී සිටිමින් කවරෙකුට පිහිට වන්නේ දැයි බලන්නේ පුණ්ණ දැක ඔහු සීසැමෙහි යෙදී සිටි කුඹුරට වැඩිසේක. උදෑසන ම සී සෑමේ නිරතව සිටින අතර තුර පුණ්‍යවන්ත තෙර නමක් කුඹුර අසබඩ වැඩ සිටින බැව් හේ දිටී ය. සිය රාජකාරියට මඳ විරාමයක් දුන් පුණ්ණ, තෙරණුවන්ට පසඟ පිහිටුවා වැඳ, දත් මැදීම පිණිස දැහැටි කූරක් සකසා පිළිගැන්වී ය. මුව දෝවනය පිණිස පැන් පෙරා පිළිගැන්වීමටද හෙතෙම යුහුසුළු විය.

මෙම රහතුන් වහන්සේ මුගලන් තෙරණුවන් බව ඔහු දැන නොසිටියේ ය. මුව දෝවනය කරගත් මුගලන් මහ තෙරුණ් කුඹුරෙන් මෑත් ව මහ මඟට පිවිසියහ.

(මජ්ඣිම නිකායෙහි විභංග සූත්‍ර අටුවාවේ දක්වා ඇති පරිදි සතර දානයකින් මෙලොවදීම විපාක ලැබෙන බව සඳහන්ව ඇත. එයින් එක් දනක් වනුයේ මෙසේ රහත් උතුමකු සත් දිනක් නිරෝධ සමාපත්තියෙහී පිහිටා, නැඟී සිටි අවස්ථාවෙහි ආහාර දානයක් පිළිගැන්වීමය.)

සිය සැමියාගේ දිවා ආහාර වේල රැගෙන යන පුණ්ණගේ බිරිඳට අතර මඟදී මුගලන් තෙරණුවන් මුණගැසිණි. ශ්‍රද්ධාවෙන් ඉපිළ ගිය ඇය සිය ස්වාමියාගේ දිවා ආහාර වේල මහරහතන් වහන්සේ වෙත පුද කිරීමට තරම් කාරුණික වූවා ය. ඇයට පින් අනුමෝදන් කළ මුගලන් තෙර, තමන් වෙත පිරි නැමූ දානය වැළඳූ සේක. ආපසු හැරී සිය නිවස වෙත ගිය ඇය, යළි කෑම වේලක් සකසා ගෙන සිය හිමි වෙත ගියාය. ප්‍රමාදය පිළිබඳ පුණ්ණයන් තුළ කෝපයක් ඇති වුව ද තම ආහාරය රහතන් වහන්සේට පිළි ගැන්වූ බව දැන ගත් ඔහු මහත් ම සතුටට පත් විය. දෙදෙනා ම කළ පිං අනුමෝදන් විය. දිවා ආහාරය අනුභව කළ පුණ්ණ කුඹුර අසළ ගස් සෙවනකට වී මඳ විවේකයක් ගන්නා අතර ඔහු නොදැනුවත්ව ම නින්දට ගියේ ය. කුඹුර රන් ආකරයක් බවට පත්වී ඇති සෙයක් ඔහු සිහිනෙන් දිටී. නින්දෙන් පිබිදුණු ඔහුට එම සිහිනය සැබෑවක් බවට පත්ව ඇති බව අවබෝධ විය. ඔහු තමන් දුටු දෑ කුඹුරු හිමි සුමණ සිටුවරයාට හා රටේ රජුන්ට දැනුම් දීමට ක්‍රියා කළේ ය. රන් ආකරය රජු හිමි කරගත් අතර පුණ්ණගේ



අවංක භාවය අගය කළ රජු වෙතින් ඔහුට බහු ධන සෙට්ඨි යන සිටු තනතුර ද මහත් භෝග සම්පත් ද හිමිකර දුන්නේ ය. නව සිටු මැඳුරක් ද තනවා දුන්නේය. නව සිටු මැඳුරට ගෙවදීම සඳහා සත් දිනක් පුරා බුද්ධ ප්‍රමුඛ මහ සඟනට දන් පිරිනැමී ය. එහිදී භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය අවසානයෙහි පුණ්ණ සිටු, භාර්යාව හා ඔහුගේ දියණිය උත්තරා ද සෝවාන් පලයට පත් වූහ.

පසුව මිථ්‍යාදෘෂ්ටික සුමන සිටුපුත්, පුණ්ණ සිටු දුව අකමැත්තෙන් මිථ්‍යා දෘෂ්ටික සිටු තරුණයකුට විවාහ කර දුන්නේ ය. විවාහ වූ තැන් පටන්, උත්තරාවන් හට පිනක් දහමක් කිරීමට අවස්ථාක් නොවී ය. දෙසතියකට සිරිමා වෛශ්‍ය තෙමෝ මුදල් ගෙවා පුරුෂයාට හිමිකර දී, ඒ දින කිහිපයෙහි උත්තරා බුද්ධ ප්‍රමුඛ මහ සඟනට උපස්ථාන කිරීමේ නියැළී සිටියා ය. දින 15 අවසන් වන දින ඇති වූ සිද්ධියකදී උත්තරා කෙරෙහි ක්‍රෝධ බැඳී සිරිමා මුළුතැන්ගෙට ගොස් උතුරන තෙල් හැලියකින් තෙල් හැන්දක් ගෙන උත්තරාවන්ගේ හිසට හැලීය. උත්තරාවෝ මෙහිදී කෝප නොවී, 'මේ යෙහෙළිය මේ දිනයන්හි මට කළ මහත් උපකාරයකැය' සිතමින්, යෙහෙළිය ගුණය ම සිහිපත්කරමින් මෙත් සිත් පැතුරුවා ය. ඇය සිත්හී පහළ කරුණා ගුණය නිසාවෙන්, හිස වැගිරූ උනු තෙලින් ඇයට කිසිඳු අනතුරක් නොවී ය. උණු තෙල් ඇයට දැනුනේ සිහිල් පැන් පොදක් ලෙසිනි. මෙහිදී මෙහෙකාරියෝ සිරිමා හට අතින් පයින් පහර දෙද්දී එය වළක්වාලීමට තරම් උත්තරා කුළුණුබර වූවා ය. සිරිමා සිතන්නේ මෙසේ මා ක්‍රෝධ කරද්දී මෙතුමියගේ හැසිරීම තුළ මා සමාව නොගත්තහොත් මාගේ හිස හත්කඩකට පැලෙන්නේම යැ යි සිතා සමාව ගත්තී ය. සමාව තමාගෙන් නොව බුදුරජාණන් වහන්සේගෙන් ලබා ගත යුතු බව උත්තරා ඇයට දන්වා සිටියා ය. ඒ අනුව සිරිමා දන් පිළිගන්වා බුදු පාමොක් වෙතින් සමාව අයැද සිටියාය. එතැන් සිට සිරිමා නගර සෝබනිය බණ අසා, යෙහෙළියන් 500 ක් ද සමඟින් සෝවාන් ඵලයෙහි පිහිටියාහ. උත්තරාවෝ සකෘදාගාමී වූවා ය. පසුව සුමන සිටු ද, පුතු ද සෝවාන් වී ය. ඇය පසුව තව්තිසාවෙහි ඉපිද දිව සැප වින්දා ය. ජීවක වෙදදුරුගේ නැගෙණියක වූ සිරිමා ද මිය පරලොව ගොස් නිර්මාණ රතී දෙව්ලොව උපත ලැබූ බව සඳහනි. සිරිමා නිවස සැමදා දනට වැඩි භික්ෂුවක් ඇයගේ රූපයෙහි බැඳී පසුව මැයගේ මරණයේ දී බුදුරජු නියමයෙන් මළකඳ වෙන්දේසි කළ කථා ප්‍රවෘත්තියක් ද ඇත. උත්තරාවන්ගේ මෛත්‍රීය පිළිබඳව ධම්මපද ගාථාහි ක්‍රෝධ වග්ගයේ තුන් වන ගාථාවේ හා අට්ඨකතාවෙහි තොරතුරු සඳහනි.

## iv. වෙළුකණ්ටකී නන්දමාතා උපාසිකාව

අංගුත්තර නිකායේ නන්දමාතා සූත්‍ර දේශනාවේ සඳහන්ව ඇති පරිදි නන්දමාතා ගිහිව විසූ අනාගාමී උපාසිකාවකි. දක්ෂිණාගිරියෙහි වේළුකණ්ටකී නම් ගමෙහි විසූ මෙතුමිය දිනක් අළුයම් වෙලෙහි පිබිද කුදුගත් සඟියට අයත් සුත්ත නිපාතයේ එන පාරායන වග්ගයේ පාරායන අනුගීත (නිවණට පමුණුවන) ගායනා කරන්නී, ඇයගේ මිහිරි හඬට වශී වූ උතුරු දිග සිට දකුණු දෙසට අහසේ ගමන් කරමින් සිටි සතර වරම් දෙවියන්ගෙන් කෙනෙකු වූ වෛශ්‍රවණ මහ රජු, ගාථා නිමවන තුරු අහසේ රැඳී සිට, ගාථා කීම නිම වූ පසු සාදු කාරදුන්හ. ඒ හඬ ඇසූ නන්දමාතා උපාසිකාව ඔබ කවරෙක් දැයි විමසූ විට තමා වෛශ්‍රවණ මහ රජු බව දැනුම්වත් කළ පසු මා යම් ධර්ම කොට්ඨාසයක් කියන ලද්දේ ද ඒ තුළින් ඇති වූ පින ඔබට ද ආගන්තුක සත්කාරයක් වේවායි අනුමෝදන කරවී ය. මේ අපගේ ශාසන ඉතිහාසය තුළ දෙවියන්ට පින් අනුමෝදන් කරවූ ප්‍රවෘත්තියක් සඳහන් වන එක් අවස්ථාවක් ලෙස ද සැලකිය හැකි ය.

'සොහොයුරිය ඒ පින් මට ද වේවා, හෙට දින උදේ මේ වේළුකන්ටකයට සැරියුත් මුගලන් වහන්සේලා දෙනම සමඟින් භික්ෂු පිරිසක් වැඩම කෙරෙති. ඒ අයට දන් පිළිගන්වා මට ද ඒ පින් අනුමෝදන් කෙරෙත්වා' යනුවෙන් ඉල්ලීමක් කළේය. පසු දින එසේ දන් පිළිගැන්වූ ඇයගෙන් සැරියුත් හිමි 'අප වඩින බව ඔබ කෙසේ දැනගත්තේ දැයි' ඇසූ පැනයට ඉහත විස්තර සියල්ල පැවසුවාය. සැරියුත් හිමයෝ ද මහත් සෘධි ඇති වෛශ්‍රවණ මහ රජු වැනි අයකු සමඟ නන්ද මාතාවන්ට කතා කිරීමට ලැබීම මහත් ආශ්චර්යක් යයි දේශනා කරමින් මෙහිදී ද, වෛශ්‍රවණ මහරජුට පින් අනුමෝදන් කරවීය.

තවද අනාගාමී මේ මෑණියන් විසින් මේ සූත්‍රයේදී තමා තුළ ඇති කරගත් තවත් ආශ්චර්ය කරුණු හයක් ප්‍රකාශ කර සිටින්නී ය.

උත්තරා නන්ද මාතා නමින්ද ප්‍රසිද්ධ මේ මහා උපාසිකා තුමිය ධ්‍යානයෙහි ඇලුනාහු උපාකසිකාවන් අතුරින් අගතැන්පත් වූවක් ලෙසින් අසූ මහ ශ්‍රාවිකා උපාසිකාවන් අතරට ද පත්ව ඇති බව අංගුත්තර නිකායේ සඳහනි.



## 23. නේපාලයෙහි ත්‍රිවිධ පළාත් හි ඓතිහාසික උරුමය

මහ ලුම්බිණි ප්‍රදේශ කලාපයට රූපන්දෙහි, නාවල්පරාසි සහ කපිලවස්තු දිස්ත්‍රික්ක ඇතුළති. වර්ග කි.මී. 5260 ක ප්‍රදේශයක් පුරා පැතිරි මහ ලුම්බිණි ප්‍රදේශ කලාපයෙහි ජනගහණය 2,095,640 ක් වේ. සිද්ධාර්ථ කුමාර උපත, ළමා හා තරුණ කාලය ගත කළ බිම් පෙත සිදුහත් රජ කුමාරයෙක් ලෙස වසර 29 ක් දිවි ගෙවූ ශාක්‍ය රාජධානියේ අගනුවර වූ මිලාර්කොට් පිහිටියේ ද මහ ලුම්බිණි ප්‍රදේශ කලාපය තුළ ය.

ලුම්බිණි වන්දනා කිරීමට රූපන්දෙහි ප්‍රදේශයට යන බැතිමතුන් වැඩි පිරිසක් ඉහත මහ ලුම්බිණි ප්‍රදේශ කලාපයෙහි පිහිටි බුදු සිරිත හා සබැඳි කපිලවස්තු හා නාවල්පරාසි වෙත නොයන බව නිරීක්ෂකයන්ගෙන් අනාවරණය වේ. ලුම්බිණියේ සිට ඉහත ප්‍රදේශ පිහිටියේ වැඩි ඈතක නොවන බැවින් බැතිමතුන් ඒ ප්‍රදේශ වෙත යොමු කිරීම වැදගත් වන බව ද මෙහිදී අවධාරණය කළ යුතු වේ.



ඓතිහාසික සරකූප ළිඳ

## i. කපිලවස්තු

### 01. තිලෝරාකෝට්

ශාක්‍ය රාජධානියේ අග නගරය වූ මෙහි සුද්ධෝදන රජුගේ මාළිගය පිහිටියේ ය. සිදුහත් කුමරු මෙහි වසර 29 ක් වාසය කළේ ය. රජ මාළිගයේ නටඹුන් රජුගේ හා මායා දේවියගේ ධම්මපානි ස්ථූප, සිදුහත් කුමරුන් ආරක්‍ෂා කර ගැනීමට මාළිගය වටා ඉදි කළ දැවැන්ත තාප්පයෙහි නටඹුන්, කුමරු අභිනිෂ්ක්‍රමණය කරමින් මාළිගයෙන් පිටවූ නැගෙනහිර දොරටුවේ නටඹුන්, කන්ථක අශ්වයා මිය ගිය ස්ථානය මෙහි දැකිය හැකි ය.

### 02. නිග්ලිහවා

කණකමුණි බුදුන් වහන්සේ උපන් ස්ථානය එය සිහිපත් වීමට අශෝක අධිරාජ්‍යයා ක්‍රි.පූ. 249 දී පිහිට වූ ස්ථම්භයක කංඩනයව කොටස් දෙකක් මෙහි ඇත. ස්ථම්භයෙන් අඩක් නිග්ලිසාගර් ජලාශයෙන් යටවී ඇති අතර එහි උඩ කොටස ජලාශය ඉවුරේ දැකිය හැකි ය.



නිග්ලිහවා කනකමුණි බුදුන්වහන්සේ උපත සමරමින් අශෝක රජු පිහට වූ ස්ථම්භය

### 03. අවුරොරාකො

කනකමුනි හෙවත් කෝණාගම බුදුන් වහන්සේ උපත ලද ග්‍රාමය වශයෙන් සැලකේ.



### 04. සාගර්හවා

ලුම්බුසාගර් විල පිහිටි වනාශ්‍රිත ප්‍රදේශයකි. විඩූඩභ රජු විසින් ශාක්‍යවංශිකයින් දස දහස් ගණනක් ඝාතනය කළ ස්ථානය ලෙස සැලකේ. මොවුන් සිහි වීම පිණිස ඉදි කළ ස්ථූප ගණනාවක නටඹුන් මේ ප්‍රදේශයේ විසිර ඇත.

### 05. ගොතිහවා

කකුසඳ බුදුන් වහන්සේ උපත සිදුවූ මෙම ස්ථානය හඳුනා ගැනීම පිණිස අශෝක අධිරාජ්‍යයා පිහිටවූ ස්ථම්භයක කොටස් හා ස්ථූපයක නටඹුන් මෙහි දැකිය හැකි ය.



ගොතිහවා කකුසඳ බුදුන් වහන්සේ උපත ලද ස්ථානයේ අශෝක අධිරාජ්‍යා පිහිට වූ ස්ථම්භය
මහචාර්ය හේරත් දිසානායක, සුනිල් සරත් පෙරේරා විද්වතුන් නිරීක්ෂණය කරමින්

### 06. කුදාන්

බුදුන් වහන්සේගේ ඥාති පිරිස ස්වකීය ශ්‍රේෂ්ඨ නායකයා වූ බුදුන් වහන්සේට හා භික්ෂූන් වහන්සේලාට වාසය සඳහා, නිග්‍රෝධාරාමය කරවූයේ මෙහි ය. ඔවුහු මල්, විලවුන් සහිත අත් ඇතිව පෙර ගමන් කොට, බුදුන් වහන්සේ නිග්‍රෝධාරාමයට කැඳවා ගෙන ආ බැව් චරියාපිටක අටුවාවෙහි සඳහන් වේ. කුදාන්, නන්ද කුමරු හා රාහුල කුමරු පැවදි කළ ස්ථානය වශයෙන් ද හඳුනාගෙන ඇත. වර්තමානයෙහි මෙහි කෝවිලක් පිහිටියි ය. ඊට මඳක් ඔබ්බෙන් බුදුන් වහන්සේ වෙනුවෙන් සුදොවුන් නිරිඳුන් කළ නිග්‍රෝධාරාමයෙහි අඩි තාලම දැකිය හැකි ය. එහි ඇතැම් සියුම්

කැටයම් මේ දක්වා සුරක්ෂිතව පවතී. බුද්ධත්වයෙන් පසුව බුදුන් වහන්සේ ප්‍රථම වතාවට සිය පියා, පුතු යශෝධරාවන් හමුවූයේ මෙහිදී ය. මහ ප්‍රජාපතී ගෝතමිය බුදුන් වහන්සේට සිවුරු පිරිකර පූජා කිරීම හා කඨින චීවර පූජාව ආරම්භ වූයේද මෙහිදී ය. ශාක්‍යවංශිකයන්ගේ මානය බිඳීම පිණිස භාග්‍යවතුන් වහන්සේ යමා මහ පෙළහර පෑවෙත් මේ ස්ථානයෙ හි ය. තවද කුලය පහදවන භික්ෂූන් අතරින් ප්‍රථම ස්ථානය කාළුදායි තෙරුණ්ට දී වදාළේත් මේ ස්ථානයේ දී ය.

07. **සිසාහානියා**

මයුර හා කුෂාණ යුගයන්හි ඉපැරණි විහාර නටඹුන් හා බලකොටු පිහිටි ස්ථානය ලෙසින් සැලකේ.

## ii. රූපන්දෙහි

08. **ලුම්බිණිය**

සිදුහත් උපත සිදු වූ අසිරිමත් ලුම්බිණිය, මයා දේවී විහාරය, පුෂ්කර පොකුණ ඇතුළු පැරණි නටබුන් රාශියක් මෙහිදි දැක ගත හැකි ය.

09. **දෙව්දහ**

කෝලිය රාජධානියේ අගනුවර දෙව්දහ වන අතර එය මහාමායා දේවියගේ නිජ බිම ලෙස සැලකේ. දෙව්දහ පිහිටා ඇත්තේ ලුම්බිණියට කි.මී 30 ක් පමණ නැගෙනහිරට වන්නට ය.

## iii. නාවල්පරාසි


10. **රාම ග්‍රාම**

ගෞතම බුදුන්වහන්සේගේ ධාතූන් නිදන් කළ ස්ථූපයයි. ද්‍රෝණ බමුණා වෙතින් ලද සර්වඥ ධාතු කෝලිය රජුන් රාම ග්‍රාමයෙන් ගෙන ගොස් එහි දාගැබක් තැනවීය.



**රාමග්‍රාම**






**කපිලවස්තු / රූපන්දෙහි / නාවල්පරාසි**



**ගොතිහවා අශෝක ස්මාරකයේ මයුර සලකුණ**

නව වන පරිච්ඡේදය

# සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ලුම්බිණිය

## 24. ලුම්බිණිය ලොවට හෙළි කළ අශෝක අධිරාජ්‍යයා

ලුම්බිණිය පිළිබඳව කථා කරන හැම අවස්ථාවක ම, අප මනසට සමීප වන සුවිශේෂී පුද්ගලයෙක් වෙයි. හේ අන්කිසිවෙකු නොව සිදුහත් උපත සිදු වූ නිශ්චිත ඉසව්ව ලෝකයට අනාවරණය කළ, ශ්‍රේෂ්ඨ නරපති අශෝක මහා අධිරාජ්‍යයා ය. ක්‍රි.පූර්ව 304-232 දක්වා භාරතය පාලනය කළ අශෝක නිරිඳුන් මෞර්ය වංශිකයෙකි. හෙතෙම චන්ද්‍රගුප්ත රජුගේ පුත් බින්දුසාරයන්ගේ පුත්‍රයා ය. ඔහුගේ අධිරාජ්‍යය බටහිරින් වත්මන් පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය සහ පර්ෂියාවේ කොටසක් දක්වා ද, නැගෙනහිරින් වත්මන් බෙංගාලය, අසැම් ආදී ඉන්දීය ප්‍රාන්ත දක්වා ද දකුණින් මයිසූර් ප්‍රාන්තය දක්වා ද ව්‍යාප්තව පැවතිනි.

වර්තමානයේ බිහාර් ප්‍රාන්තය ලෙසින් ව්‍යවහාරයට පත් මගධ දේශය, අසෝක අධිරාජ්‍යයාගේ පාලන මධ්‍යස්ථානය විය. රාජ්‍යත්වයට පත් මුල් යුගයේදී, දිග් විජය කිරීමේ අරමුණින් කාලිංග දේශය හා පැවති යුද්ධයේදී සිදු වූ සුවිශාල මනුෂ්‍යය සංහාරය පිළිබඳ ව කලකිරීමට පත් ඔහු, වෛදික සම්ප්‍රදාය පසෙක ලා බුදුසමය වැළඳ ගත්තේ ය.

ශ්‍රී ලංකාවට බුදුසමය හඳුන්වාදීම පිණිස සිය දරුවන් වූ, මිහිඳු හිමි හා සඟමිත් තෙරණිය මෙරටට වැඩමවීමේ ගරුත්වය හිමි වන්නේ ද අශෝක නිරිඳුන් වෙත ය.





සියොත් ඇසින් දුටු ලුම්බිණි පුද බිම

### i. අශෝක නිරිඳුන්ගේ පූර්ව භවය

අශෝක නිරිඳුන්ගේ පූර්ව භවය පිළිබඳවත්, එතුමන් සිදුහත් උපත සිදු වූ නිශ්චිත ස්ථානය සොයා ගැනීම පිළිබඳවත් කදිම, අප්‍රකට විස්තරයක් සංස්කෘත කෘතියක් වූ දිව්‍යාවදානයෙහි මෙසේ විස්තර කෙරේ.

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවන විහාරයෙහි වැඩ වාසය කරන සමයෙහි, එක්තරා දිනක පිඬුසිගා වඩිද්දී, කුඩා දරුවන් දෙදෙනෙක් වැලි කෝම්පිට්ටු තනමින් සිටියහ.

ජය හා විජය නම් වු දරු දෙදෙනා දෙතිස් මහා පුරිස් ලකුණින් බබළන ශරීරයක් ඇති බුදුන් වහන්සේ දුටහ. පළමු කොට ජය නමැති දරුවා අත්සුණු දෙමි යි යන අදහසින් මැටි දෝතක් භාග්‍යවතුන්ගේ පාත්‍රයෙහි පිදී ය. විජය නමැති දරුවා ද වැඳගෙන පින් අනුමෝදන් විය.

හෙතෙමේ භාග්‍යවතුන් වහන්සේ ට එම පූජාව කොට ඒ කුශලය හේතු කොට පෘථිවිය එක් සේසත් කොට අග්‍ර රාජයා වන්නෙමි. මේ බුදුන් ගේ සසුනෙහි ම කුශල කර්ම කරන්නෙමි’යි ප්‍රාර්ථනා කළේය.

එම අවස්ථාවෙන් භාග්‍යවතුන් වහන්සේ මද සිනා පහළ කළ සේක. යම් අවස්ථාවක බුදුවරු මද සිනා පහළ කෙරෙත්ද එකල්හි වර්ණ රශ්මීහු දන්තයන්ගෙන් හිස වටා තුන්වරක් ප්‍රදක්ෂිණා වෙති.

මෙය දුටු ආනන්ද තෙරුණ් වහන්ස ඒ බුදු සිනාවට හේතු විමසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

ආනන්දය, එය එසේම ය. තථාගත වූ සම්‍යක් සම්බුදුවරු නිකරුණේ සිනා පහළ නොකෙරෙත්. ආනන්දය යම් කෙනෙකු විසින් තථාගතයන්ගේ පාත්‍රයෙහි මැටි දෝතක් පුදන ලද්දේ ද තොප ඒ දරුවා දුටුවෙහි ද ස්වාමීණි, එසේය ආනන්ද තෙර කීහ.

ආනන්දය, මේ දරුවා ඒ පින හේතු කොටැ ගෙන අනාගතයෙහි තථාගතයන් පිරිනිවී ශතවර්ෂ ඇවෑමෙන් පාඨලීපුත්‍ර නගරයෙහි සතර මහ දිවයිනට අධිපති වූ අශෝක නම් වූ ධර්මරාජයෙක් වන්නේ ය. හෙතෙම මාගේ ශාරීරික ධාතූන් ලෝකයෙහි පතුරා හරින්නේය. බහුජන හිත පිණිස කටයුතු කරන්නේය" යි වදාළ සේක.

අනතුරුව තථාගතයන් වහන්සේ ඒ දරුවා විසින් තම පාත්‍රයෙහි පුදන ලද මැටි පිඬ ගෙන ආනන්ද තෙරුණ් අතට දුන් සේක. ආනන්ද තෙරුණ් ඒ මැටි පිඬ අමු ගොම සමඟ මිශ්‍ර කර බුදුන්ගේ සක්මන් මළුවෙහි ආලේප කළේ ය.

එකල්හි, පාඨලීපුත්‍ර නගරයෙහි බින්දුසාර නම් රජු රාජ්‍ය විචාළේ ය.

බින්දුසාර රජුට පුත්‍රයෙක් උපන්නේ ය. හේ සුසීම නම් විය. එසමයෙහි චම්පා නගරයෙහි විසූ එක්තරා බ්‍රාහ්මණයෙකුට දාව උපන් දියණිය, විශිෂ්ට රූප සෝභා ඇති පැහැපත් ප්‍රසාදය පළවන්නා වූ ජනපද කල්‍යාණියක් වූවා ය. නිමිති කරුවන් විසින් "මේ බ්‍රාහ්මණයාගේ දුහිතෘව රජෙක් හට අගමෙහෙසිය වන්නී ය. ද්විතීය පුත්‍රයා ශ්‍රමණ භූමියට පැමිණි කළ කිස නිම කළ ඇත්තෙක් වන්නේ යැයි" කියන ලදි.

මෙය ඇසූ බ්‍රාහ්මණයාගේ ශරීරයෙහි ලොමුදැහැ ගත්තේ ය. හේ තෙමේ ඒ දූහිතෘව ගෙණ පාඨලීපුත්‍ර නගරයට ගියේ ය. ඔහු විසින් ඕ තොමෝ සර්වාභරණයෙන් සරසා බින්දුසාර රජු හට පාදපරිචාරිකාව කොට දෙන ලද්දී ය. ඕ තොමෝ දේව කන්‍යා, ධන්‍යා, ප්‍රශස්තා යන නම්වලින් ද හඳුන්වනු ලැබී ය. රජ ඇය අන්තඃපුර ස්ත්‍රීන් අතරට යැවී ය. මඳකලකට පසු ඕ තොමෝ දරුවකු ප්‍රසූත කළා ය. හේ පුත්‍ර කුමාරයෙකි. උත්සව ශ්‍රීයෙන් ජාත කර්ම කොට නාම කරණ මංගල්‍යයේදී පුත්‍රයාගේ නාමය කුමක් විය යුතු දැයි බිසව විචාළා ය.

ප්‍රතිසන්ධි ග්‍රහණයේ සිට මම ශෝක තැනැත්තියක් වූවෙමි. එහෙයින් අශෝක නාමය සුදුසු යැයි ඇය කීවා ය. ඇයට දෙවැනි වරටත් පුත්‍රයෙක් උපන්නී ය. ශෝකය පහවූ කල්හි උපන් හෙයින් ඔහුට විගතාශෝක නාමය තැබී ය.



සැවැත්නුවර එක්තරා සාත්තුවාහකයෙක් (ගැල් නායක වෙළෙන්දෙක්) භාර්යාවත් සමඟ වෙළදාම් සඳහා මහ සමුදුරට පිවිසියේ ය. ඔහුගේ භාර්යාව සමුද්‍රයේදී පුතෙකු වැදුවා ය. සමුද්‍රයේදී උපන් හෙයින් හෙතෙම සමුද්‍ර යැයි නම් කරනු ලැබීය. පුත්‍ර වූ සමුද්‍ර පසුව සර්වඥ ශාසනයෙහි පැවදි විය. ජනපද චාරිකා කරන්නේ පැළලුප් නුවරට පැමිණ උදැසන පා සිවුරු හැඳ පොරවා ගෙන නුවර පිඬු පිණිස හැසිරුනේ ය. හේ ප්‍රථමයෙන් කිසිත් නොදත් හෙයින් ඉතා රමණීය මැඳුරකට ගියේ ය. එහෙත් පිටතින් රමණීයත්වය වූ නමුත් එහි ඇතුළත නිරයක් හා සමාන විය.

ඒ චණ්ඩගිරික වධකයාගේ ගෙදරයි. නැවත ආපසු ගෙයින් නික්මෙන්නට සිතූ නමුත් චණ්ඩගිරිකයා සමුද්‍ර භික්ෂුව අල්ලාගෙන මෙහි තාගේ මරණය වන්නේය යයි කීහ. ඉක්බිති භික්ෂුව ශෝකයෙන් පීඩිත වූයේ ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තේ ය.

ඔබ කුමක් හෙයින් ළදරුවෙකු මෙන් හඬන්නේදැයි චණ්ඩගිරිකයා ඇසී ය.

"මම කිසිසේත් ශරීර විනාශය නිසා නොහඬමි. මගේ මෝක්ෂාන්තරය සඳහා දුර්ලභ වූ මනුෂ්‍ය ආත්මය ලබා එසේ ම දුර්ලභ වූ පැවිද්ද ලැබූ මට අවාසනාවන්ත යළිත් බුදුසසුන හැර දා යන්නට සිදු වී යැයි" ඒ භික්ෂුව පැවසී ය.

මම රජ විසින් දෙන ලද වර ඇත්තෙක් වෙමි. ධෛර්යමත් වෙමි. මගෙන් ගැලවීමක් නම් තොපට නැතැයි චණ්ඩගිරිකයා කීහ. භික්ෂුව තමා නොමරා ටික දිනක් කල් දෙන ලෙස ඉල්ලීය. චණ්ඩගිරිකයා භික්ෂුවට සත් දිනක් කල් දුන්නේ ය. ඒ භික්ෂුව සත් දිනකින් පසු තමාට හිමි වන මරණය ගැන සිතා කළකිරී චිත්ත දමනයේ යෙදුණේ ය.

සත් වැනි දිනයෙහි රජුගේ අන්තඃපුර කාන්තාවක් තරුණ කුමාරයෙකු සමඟ සල්ලාප කරනු දැක කිපුණු රජ තෙමේ ඔවුන් යකඩ වංගෙඩියක බහා මොහොලින් කොටා ඇට පිටි කළේ ය.

ඒ අරමුණු කොට ගෙන මුළු රාත්‍රියම බුද්ධානුශාසනයෙහි යෙදුනා වූ ඒ තෙරුණ් වහන්සේ සියලු සංයෝජනයන් සිඳ උත්තම වූ අර්හත්වයට පත් වූ සේක.

රාත්‍රියට පහන් වූ කල්හි චණ්ඩගිරිකයා අවුත් මෙසේ කීහ. මහණ, රාත්‍රිය පහන් විය. සූර්යයා උදා විය. ඔබට කම්කටොළු කිරීමට කාලය පැමිණියේ ය.

"දීර්ඝායු වේවා. මට ද රාත්‍රිය පහන් විය. සූර්යයා උදා විය. පරානුග්‍රහ කිරීමට කලෙය පැමිණියේ යැයි සමුද්‍ර රහතන් වහන්සේ පැවසු සේක.

"ඔබ කියූ දෙය මට නොවැටහේ. මේ වචන විස්තර වශයෙන් කියනුයි" චණ්ඩගිරිකයා කීහ.

පංච නීවරණයෙන් වැසුණා වූ ක්ලේශ චෞරයන් විසින් සේවිත වූ ඝෝර වූ මෝහ නමැති රාත්‍රිය මාගේ හෘදයෙනුත් නික්ම ගියේ ය.

යම් ප්‍රඥාවක ගේ ප්‍රභාවයෙන් තත් වූ පරිද්දෙන් ලෝකත්‍රය දක්නේ ද මගේ මනස් නමැති ආකාශයෙහි යහපත් වූ  ප්‍රඥා නමැති සූර්යයා උදා විය. ශාස්තෘන් වහන්සේගේ පැවැත්මට අනුරූප වූ පරානුග්‍රහයට කාලය පැමිණියේ ය. මාගේ ශරීරය දීර්ඝායු ඇත්තක් නොවේ. තට කැමැත්තක් කරනු ලැබේවාය" සමුද්‍ර තෙරුණ් වහන්සේ පැහැදිලි කළේ ය.

ඉක්බිති මහ ලෝ සැළියෙහි ඒ තෙරුණ් වහන්සේ දැමී ය. බොහෝ දර වලින් ගිනි දල්වන ලදී. කොතෙක් දර වැය කළ ද ඒ ලෝසැළියේ දිය රත් නොවූයේය. ඔහු යළිත් එය රත්කිරීමට පටන් ගත්තේය. එසේ කළ නමුදු ගිනි දැල්විය නොහැකි විය. ඉක්බිති ලෝ සැළිය පරීක්ෂා කිරීමට ගියේ ය. එකල්හි ලෝසැළියෙහි පියුමක් මතුයෙහි බද්ධ පර්යංකයෙන් වැඩ හිඳිනා භික්ෂුවක් දක්නට ලැබිණි. ඔහු තමන් දුටු දෙය වහා ම රජුට සැළ කර සිටියේ ය. රජු පැමිණි කල්හි දහස් ගණන් මහජනයා ද රැස් වූහ. ඒ තෙරුණ් වහන්සේ මොහොතක් ඍද්ධියට සමවැදී සැළිය තුළ සිටියේ ජලයෙන් තෙත් වූ ගාත්‍ර ඇත්තේ බලා සිටින ජනයා අතරින් බලා සිටින හංසයකු මෙන් අහස්තලයට පැන නැංගේ ය. විවිධ වූ ප්‍රාතිහාර්යය දැක්වීමට ද පටන් ගත්තේ ය.

අශෝක රජ තෙමේ අහසට පැන නැඟුණු උන්වහන්සේ  දෙස බලා විස්මයෙන් පිරීගිය මුහුණ ඇත්තේ බඳදිළිව උන්වහන්සේ දෙස බලි මෙසේ කී ය.

"සොම් ගුණ ඇත්තාණෙනි, ඔබගේ රූපය මනුෂ්‍යයෙකුට සමාන ය. ඍද්ධි ප්‍රභාව වනාහි මනුෂ්‍යයත්වය ඉක්ම පවත්නේය. ප්‍රභූවරයාණෙනි, එබැවින් නිශ්වයකට නොයමි. පාරිශුද්ධ භාවය



ඇත්තාණෙනි, ඔබ කවරෙක් වෙහිද මට මේ කාරණය කියනු මැනවි. ඔබගේ ධර්මගුණ තත්වය දැන ශක්ති පරිද්දෙන් ශිෂ්‍යයකු මෙන් හැසිරෙන්නෙමි".

ඉක්බිති තෙරුණ් වහන්සේ මේ රජ තෙමේ ධර්මය පිළිගන්නෙක් වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් පතළ කළ හරින්නෙක් ද වන්නේ ය.

"මහජන හිත පිණිස ද වැඩ පිණිස ද හැසිරෙන්නේයැ" යි සිතා තම ගුණයන් ප්‍රකට කරමින් රජුට මෙසේ කීහ.

මහ රජ, මම වනාහි මහා කාරුණික වූ අග්‍ර වූ ධර්මාන්වය පිණිස ඇත්තාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

තවද මහරජ, මාගේ පරිනිර්වාණයෙන් වර්ෂයෙක ශතකයක්හු ගේ ඇවෑමෙන් පාඨලීපුත්‍ර නගරයෙහි චතුර්භාග චක්‍රවර්ති වූ අශෝක නම් ධර්ම රාජයෙක් වන්නේ ය. හෙතෙමේ මාගේ ශාරීරික ධාතුන් විස්තෘත කොට හරින්නේ ය. අසූහාර දහසක් ධර්මාජිකාවන් පිහිටු වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඔබ නිර්දිෂ්ට කරන ලද්දේ ය. එබැවින් ඔබ භාග්‍යවතුන්ගේ එකී අදහස් සපුරා ලීම සඳහා සියලු සත්ත්වයන්ට අභය දානය කළ යුතු ය.

ඉක්බිති ඒ රජ තෙමේ බුදුන් වහන්සේ කෙරෙහි හටගත් ප්‍රසාද ඇත්තේ බඳැදිළි ඇත්තේ ඒ ඒ තෙරුණ් වහන්සේ ක්ෂමා කරගනිමින් මෙසේ කීහ.

"දශබල ධාරීන්ගේ පුත්‍රයාණෙනි, ඔබ මට ක්ෂමා කරණ සේක්වා, බුද්ධ ඍෂිවරයන් මම සරණ කොට යමි. බුද්ධ ප්‍රකාශිත ධර්මය ද ආර්ය සංඝයා ද මම සරණ කොට යමි.

ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරව ප්‍රවණතා ප්‍රසාදයන් යුක්තව අද මම මේ පොරොන්දුව දෙමි. තව ද ජිනේන්ද්‍ර චෛත්‍යයන්ගෙන් පෘථිවිය සරසන්නෙමි.

ඒ ඇසූ සමුද්‍ර රහතන් වහන්සේ තෙමේ එම ඍද්ධියෙන්ම පිටත්ව ගිය සේක.

රජ තෙමේ වහාම රමණීයක බන්ධනාගාරය ද ඉවත් කළේ ය. සියලුම සත්ත්වයන්ට අභය දානය දෙන ලදී.

ඉක්බිති රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතුන් පතළ කර හරින්නෙමැයි, සිවුරඟ බළ සෙනඟ සමඟ ගොස් අජාතශත්‍රැ

රජු විසින් ප්‍රතිෂ්ඨාපිත වූ ද්‍රෝණ ස්තූපය විවෘත කොට ශාරීරික ධාතුහු ගත්තේ ය. එම ස්ධානයෙහි ධාතූ ස්වල්ප කොටසක් නිදන් කොට දෙවන ස්තූපයක් ද කරවීය. අනතුරුව රජ රාමග්‍රාමයට පිටත්ව ගියේ ය. නාග භවනයට ගිය රජුට නාගයෝ මෙසේ කීහ. මහරජ, අපි මෙහිම ධාතූ පූජා කරන්නෙමු. එයට අවසර දෙන සේක්වා, රජ ඒ ඉල්ලීමට එකඟ විය. රාම ග්‍රාමයෙහි වූ අටවැනි ස්තූපය නාගයෝ එතෙක් කල් ආරක්‍ෂා කළාහු ය. ඒ රජුට එම ස්තූපයෙන් ධාතූ නොලැබිණි. ශ්‍රද්ධාවෙන් පිරිපුන් සිත් ඇති රජ තෙමේ ඔවුනට ස්තූති කොට ගියේ ය.

රජ තෙමේ ස්වර්ණ රජත ස්ඵටික වෛඩූර්යමය කරඬු අසූහාරදහසක් කරවා ඒ තුළ ධාතු තැන්පත් කළේ ය. එම ධාතු කරඬු අසූහාර දහස යක්ෂයන් අත නොයෙක් පළාත් වලට යවා පෘථිවියෙහි ලොකු කුඩා සෑම නගරයක ම කෝටිය බැගින් වැය කොට ධර්මරාජිකාවන් පිහිටවිය යුතු යැයි අණ කළේ ය.

අශෝක රාජයා අසූහාරදහසක් ස්තූපයන් කරවීමෙන් පසු ධර්මරාජ යයි ප්‍රසිද්ධියට පත් විය.

ශ්‍රේෂ්ඨ වූ ඒ මෞර්ය අධිරාජ්‍යයා ජනතාවගේ හිත සුව පිණිස සකළ ලෝකය ස්තූපවත් කළේ ය. පළමුවෙන් චණ්ඩාශෝක යයි ප්‍රසිද්ධියට පත්ව සිටි හේ ක්‍රියාවෙන් ම ධර්මාශෝක යයි ප්‍රසිද්ධ විය.

අශෝක රජතුමා විහාර වන්දනාවේ යෙදෙනු වස් ඇමැතිවරුන් ද සමඟ කුක්කුටාරාමය බලා පිටත්ව ගියේ ය. එහි භික්‍ෂූන්ට නමස්කාර කොට මෙසේ විමසී ය.

ස්වාමීණි, මා පෙර ආත්මයක මාගේ යහළුවෙකු සමඟ වැලි කෙළියෙහි යෙදී සිටියදී සිත් පහදවා ගෙන බුදුවරයෙකුට වැලිකෝම්පිට්ටුවක් පිදීමේ කුසලයෙන් ගෞතම බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ දෙකක් ඉක්ම වූ කල්හි දඹදිව අශෝක චක්‍රවර්තී නමින් උපදින බව බුදුරදුන් ප්‍රකාශ කොට ඇත. ස්වාමීණි, එදා මා සමග වැලිකෙළියෙහි යෙදී සිටි මාගේ යහළුවාද අනාගතයෙහි ගෞතම බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දෙක ඉක්ම වූ කල්හි මේ දඹදිවම ඉපදී පැවදි ව රහත් වී දෙවන බුදු කෙනෙකුන් මෙන් බුද්ධ කාර්යය කරන්නේ යයි ද බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කොට ඇත. ස්වාමීණි, එම දෙවන බුදුන් වැනි උතුමා දැන් ලොව පහළව සිටී දැයි, දැනගණු කැමැත්තෙමැයි සංඝයාට දැන්වීය.

එවිට එහි සිටි සංඝස්ථවිරයන් වහන්සේ රජු අමතා, මහරජතුමනි, අප බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන අවස්ථාවෙහි අනඳ තෙරුණ් අමතා මෙසේ වදාළ සේක. "ආනන්දය, තථාගත



පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ඇවෑමෙන් ගුප්ත නම් ගාන්ධිකයෙක් (සුවඳ බඩු වෙළෙන්දෙක්) මථුරාවෙහි වන්නේ ය. ඔහුගේ පුත්‍රයා උපගුප්ත නම් වේ. හේ අවවාද දායකයන්ගෙන් අග්‍ර වූ අලක්‍ෂණ දෙවැනි බුදු කෙනෙක් වන්නේ ය. හෙතෙමේ මාගේ පරිනිර්වාණයෙන් සියවස් දෙක ඇවෑමෙන් බුද්ධ කාර්යය කරන්නේ ය".

ආනන්ද, තොපට අර ඈතින් නිල්වන් අහස් කුස්හි මතු වී තිබෙන වනාන්තරය පෙනෙනවාද?,

එසේය ස්වාමීණි,

ආනන්දය, ඒ පෙනෙන්නේ උරුමුණ්ඩ පර්වතයයි. තථාගත පරිනිර්වාණයෙන් සියවසක් ගිය තැන එම පර්වතයෙහි සමථ භාවනාවෙහි යෙදෙන්නවුන්ගේ ශ්‍රේෂ්ඨ ස්ථානයක් වන නටභටික නම් ආරණ්‍යායතනයක පිහිටන්නේ ය. අනාගතයෙහි පහළ වන උපගුප්ත භික්‍ෂු නම එහි සිට බුද්ධකාර්යය කරන්නේ යයි. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේදී අනඳ තෙරුණුවන්ට වදාළ සේක් යැයි යස තෙරණුවෝ අශෝක රජුට පැවසූහ.

ස්වාමීණි, එම ශ්‍රේෂ්ඨයා දැන් ඉපද සිටී ද, ඇසීය.

රජතුමනි, ඒ මහෝත්තමයා දැන් ඉපදී සිටී. සියලු කෙළෙස් දිනූ වීතරාගී වූ උන්වහන්සේ දැනට උරුමුණ්ඩ පර්වතයෙහි වැඩ සිටිතියි, යස තෙරණුවෝ කීය. උරුමුණ්ඩ පර්වතයෙහි වැඩ සිටි උපගුප්ත මහරතන් වහන්සේට අශෝක රජු මහ ජනකායක් සමඟ තමන් වෙත පැමිණෙන්ට සැරසෙන බව දැන ගන්නට ලැබිණි.

රජතුමා ඇතුළු මහජනකාය මෙහි පැමිණිය හොත් මේ අරණ්‍යසේනාසනයෙහි සිටින යෝගාවචරයන්ටත්, මෙහි එන රජ ඇතුළු මහජනකායටත් පීඩාවක් වන්නේ යැයි සිතූ උපගුප්ත මහරහතන් වහන්සේ තමන්ට පාඨලීපුත්‍ර නගරයට යා යුතු යැයි ඉටා ගත්තේ ය.

මේ බැව් දැනගත් අශෝක රජතුමා උන්වහන්සේලට නදිය දිගේ වඩිනු සඳහා මථුරාවත් පාඨලීපුත්‍ර නගරයත් අතර නෞකා යෙදවීය. උපගුප්ත මහ රහතන් වහන්සේ අටළොස් දහසක් භික්ෂූන් ද පිරිවරා ගෙන නැව් මගින් පාඨලී පුත්‍ර නගරය බලා වැඩම කරවන බව රාජ දූතයෙක් පැමිණ රජුට දැන්වීය.

ඒ ඇසූ රජතුමා ප්‍රීතියෙන් පිනා ගොස් තම ගෙළ පැළඳ සිටි ලක්ෂයක් වටිනා මුතු මාලය ගලවා එම ප්‍රීතිදායක ආරංචිය ගෙනා

දූතයාට පරිත්‍යාග කළේ ය. උපගුප්ත රහතන් වහන්සේ පාඨලී පුත්‍ර නගරයට නැව් මගින් පැමිණෙන බව සණ්ඨා නාද කරවා මුළු ජනතාවටම දැනුම් දෙන ලෙස ඇමැතිවරුන්ට නියෝග කළේ ය.

රජතුමා මුළු පාඨලීපුත්‍ර නගරය ම ධජ පතාක ආදියෙන් අලංකාර කරවා මල් ගඳ විලවුන් හා පුද පූජා රැගත් සියළු පුරවැසියන් සමග උගතුප්ත මහ රහතන් වහන්සේට පෙරගමන් කරනු සඳහා දෙසිය පනස් යොදුනක් මග ගෙවා ගෙන ඇතු පිටින් ගියේ ය.

අටළොස් දහසක් රහතුන් විසින් අඩ සඳ පලුවක් ලෙස පිරිවරනු ලැබ නෞකාවෙන් වැඩම කරවන උගපගුප්ත තෙරුණ් රජතුමා ඇත දී ම දුටුවේ ය. එතනදීම ඇතු පිටින් බැස පා ගමනින් ගංතෙරට ගොස් එක් පාදයක් ගං ඉවුරෙහිද, අනෙක් පාදය නැවෙහිද තබා රජතුමා තෙරුණ් ගොඩට වැඩමවා ගෙන ආයේය. අනතුරුව තෙරුණ් පාමුල කපා බිම හෙළු මහ ගසක කඳක් මෙන් දිගාවු අශෝක රජතෙමේ උපගුප්ත තෙරුණ්ගේ දෙපා සිඹ නමස්කාර කර එතැන්හි ම දෙදණ බිම ඔබා වැඳගෙන මෙසේ කීහ.

උතුම් රහතුන් වහන්ස, යම් දිනෙක මම සියලු සතුරන් නසා සමුදුර මියුල් දම් කොටැති මේ මහ පොළොව එක්සේසත් කර රජ වුයෙහිද මට එදින ඇති වු ප්‍රීතියට වඩා ලොකු ප්‍රීතියක් අද ඔබ වහන්සේ දැකීමෙන් ඇති විය.

ඔබවහන්සේ දැකීමෙන් මේ උතුම් සසුන කෙරෙහි මාගේ පැහැදීම දෙගුණ විය. සම්මා සම්බුදුන් වහන්සේ සියැසින් දැකීමෙන් ලබන ශ්‍රද්ධාව වැනි උතුම් ප්‍රසාදයක් ඔබවහන්සේ දැක්මෙන් මට ලැබිණ. උතුමාණෙනි, අද මට පිහිට වන ඕනෑම ආඥාවක් කරන්න. උතුම් රහතන් වහන්ස ලෝකයාගේ හිත සුව පිණිස මම ඔබවහන්සේ ගේ එම ආඥාව පිළිගෙන ක්‍රියා කිරීමට සැදී පැහැදී සිටිමි.

ඉක්බිති උපගුප්ත මහරහතන් වහන්සේ සිය දකුණතින් අශෝක මහරජුගේ හිස පිරිමදිමින්, "මහරජ අප්‍රමාදව කටයුතු කරමින් රාජෛශ්වර්ය පවත්වන්න. දුර්ලභ රත්නත්‍රය නිරතුරුව පුදන්නැයි වදාළ සේක.

ඒ ඇසූ අශෝක රජතෙමේ ලෝක නායක තථාගත සම්මා සම්බුදුන් වහන්සේ ඔබවහන්සේ ගේ ද, මගේ ද අතින් සිදුවන අනාගත ශාසනාභවෘද්ධිය ගැන පිරිණිවන් මංචකයෙහි වැඩ හිඳ දේශනා කොට ඇත. මම ඒ සියල්ල ඉටුකරන්නෙමි.

ස්වාමීණි මා විසින් දැනටමත් ගුවන් ගැබ වළාපෙල පිසින ධාතු



සරයන් පිහිටුවා ධජ පතාක ආදියෙන් සරසා පුද පූජා පවත්වා ඇත. මාත් මගේ අඹුදරුවන්, නිවස, මා ආධිපත්‍ය දරණ මහ පොළොව, ධන කෝෂ්ඨාගාරය යන මේවා අතුරෙන් ධර්මරාජයන් වහන්සේගේ සාසනයෙහි පරිත්‍යාග නොකරන ලද කිසිවක් නැත්තේ යැයි අශෝක රජතුමා පැවසීය.

"මහ රජ තොපගේ ඒ සියලු පුණ්‍ය ක්‍රියාවන් මම ද, අනුමත කරමි. යමෙක් බිඳෙන සුළු තම ශරීරයෙන් ද, භව භොගයන්ගෙන් ද ලෝක අභිවෘද්ධිය කෙරෙත් ද ඔවුහු පරලොව ගිය කල්හි ශෝක නොකරෙත්. ස්වර්ග මනුෂ්‍ය සැප සම්පත් භුක්ති විඳීමෙන් වාසනාව ලබත් යැයි උපගුප්ත මහ රහතන් වහන්සේ වදාළ සේක.

අනතුරුව රජතෙමේ මහ පෙළහරින් උපගුප්ත තෙරුණ් වහන්සේ රජ වාසල වෙත වැඩමවා ගෙන ගොස් මහත් ගෞරවයෙන් පනවන ලද අසුන් හි වඩා හිඳවීය.

උපගුප්ත තෙරුණ්ගේ ශරීරය මෘදුය. කපු පුළුන් ඉඹුල් පුළුන් වැනි ය. එම ස්පර්ශය ලත් රජතෙමේ විස්මයට පැමිණ උන්වහන්සේ අමතා, "උදාර සත්ත්වයාණෙනි, ඔබවහන්සේගේ ශරීරාවයවයන් ඉතා මෘදු ය. මොළොක්ය. එනමුත් මම රළු කර්කශ ශරීර ඇත්තෙක් වෙමි. ස්පර්ශයට නුසුදුසු ශරීර ඇත්තෙක් වෙමි. රළු ආශ්‍රය ඇත්තෙක් වෙමි'යි කීය.

මහරජ මා විසින් (පෙර ආත්මයෙහි) අනුත්තර වූ අප්‍රතිපුද්ගල වූ තථාගතයන් වහන්සේට ඉතා යහපත් වූ ප්‍රණීත වූ දන් පහන් පුදන ලදි. එදා ඔබ ළදරුවෙකු ව සිටියදී තථාගතයන් වහන්සේට පිදුවාක් මෙන් මා විසින් වැලි බත් (කෝම්පිට්ටු) නොදෙන ලදි යැයි ඊට හේතු දක්වමින් උපගුප්ත තෙරුණ් වහන්සේ වදාළහ.

"ස්වාමීණි, එදා මට ඒ අනුත්තර වු පුණ්‍ය ක්ෂේත්‍රය මුණ ගැසුණේ මා වැලි කෙළියෙහි යෙදෙන බාල දරුවෙක්ව සිටියදී ය. මා විසින් වැලි බත් පුදන ලද්දේ එනිසා ය", රජතුමා කීය.

"රජතුමණි, බාල දරුවෙකු වැලි කෙළියෙහි යෙදී සිටිය දී වුව ද තුන් සිත පහදවා ගෙන අනුත්තර වු පින් කෙතෙහි වැලි බත් පිදීමෙන් පවා ඔබ අද දීප චක්‍රවර්තී මහා රාජව සිටින්නහු යැයි" තෙරණුවෝ වදාළහ.



1985 දී අශෝක ස්ථම්භය සොයාගත් අවස්ථාව



අශෝක ස්ථම්භය සංවර්ධනය කිරීමෙන් අනතුරුව

## ii. උපගුප්ත තෙරුන් සිදුහත් උත්පත්ති ස්ථානය දැක්වීම.

මෙසේ තම තමන්ගේ පෙර ආත්ම භවයෙහි සිදු කළ ලද බොළඳ පින්කම් ගැන කතා කරමින් පිළිසඳරෙහි යෙදීමෙන් පසුව අශෝක රජතුමා නැවතත් තෙරුණ් වහන්සේගේ දෙපා මුල වැඳ වැටී, "ස්වාමීණි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් පරිභෝග කරනු ලැබූ සෑම ස්ථානයක් ම සියැසින් දැක බලාගෙන අනාගත ජනතාවගේ ප්‍රසාද සංවේගය දනවනු පිණිස ඒ ඒ ස්ථානයන් නම් කොට එහි සිහිවටන ගොඩගැනීමට මා තුළ බලවත් ආශාවක් තිබේයැයි" කීය.

"යහපති මහරජ යහපති, ඔබගේ එම දැහැමි සිතුවිල්ල ක්‍රියාත්මක කරවීමට අපට හැකි සෑම අනුග්‍රහයක්ම ලබාදෙන්නෙමු. ඔබට ඒ ඒ ස්ථානයන් පෙන්වන්නෙමු." උපගුප්ත තෙරණුවෝ පැවසූහ.

ඉක්බිති අශෝක රජතෙමේ සිවුරඟ බල සෙනග හා නොයෙකුත් ශිල්පීන් ද පිරිවරා ගෙන උපගුප්ත තෙරුණ් සමඟ බුද්ධ පරිභෝග චෛත්‍යස්ථානයන් සොයා පිටත්ව ගියෝ ය.

උපගුප්ත තෙරුණ් වහන්සේ රජුත් කැටුව ප්‍රථමයෙන්ම ළඟා




වූයේ ලුම්බිණිය ට ය. එහි ළඟා වූ තෙරුණ් වහන්සේ දකුණු අත දිගු කොට රජුට මෙසේ කීය.

"මහරජ මේ ස්ථානයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මව් කුසින් බිහි වූ සේක. මේ උන්වහන්සේ ගේ ප්‍රථම පරිභෝග චෛත්‍යස්ථානයයි. උන්වහන්සේ මව් කුසින් බිහිව සත් පියවරක් ගමන් කොටැ සතර දිග බලා මේ මාගේ පශ්චිම (අවසාන) උපතයි, මේ මාගේ අවසාන ගර්භාවාසය (මව් කුස විසීම) යි යන ප්‍රකාශය කරන ලද්දේ මේ ස්ථානයේදී ය".

"යම් ගසක අත්තක් එල්බී ගෙන මහාමායා දේවිය සිදුහත් කුමරු ප්‍රසූත කළාද අදත් මේ සුපුස්පිත වී තිබෙන්නේ ඒ සල් ගසයි. අචේතනික මේ සාල වෘක්ෂ රාජයා පවා මෙතන සිදුවූ බෝසත් උපත දක්නට වාසනාව ලැබී යැයි" උපගුප්ත තෙරණුවෝ කීය.

අශෝක රජතුමා උපගුප්ත තෙරුණ්ගේ ඒ වදන් ඇසෙත් ම දෙනයනින් තුටු කඳුළු දහරා වගුරවමින් කපා හෙළන ලද ගසක් මෙන් සල් ගස ඉදිරිපිට බිම දිගැදී දණ්ඩ නමස්කාරයෙහි යෙදී මෙතන බෝසත් උපත සිදුවීය යන සටහන සහිත සෙල් ටැඹක් පිහිටුවීමට නියෝග කොට ඒ සඳහා ලක්ෂයක් ප්‍රදානය කොට පිටත් ව ගියේ ය.


අනතුරුව රජුත් කැටුව කපිලවස්තුපුරය පිහිටා තිබුණ තැනට වැඩම කළ උපගුප්ත තෙරණුවෝ,



අශෝක නිරිඳුන්ගේ ටැම් ලිපියක්

"මහරජතුමනි, මෙතන් හිදී සුද්දෝධන පියරජුගේ අතට බෝසත් කුමරු වඩා භාරදුන්හ. මෙය ශාක්‍යවර්ධන නම් දේව කුලයයි. බෝසත් කුමරුන් ලවා දෙවියන් පුදනු සඳහා වඩා ගෙන යනු ලැබුවේ මේ ස්ථානයටයි. එනමුත් එහිදී සියලු දෙවි දේවතාවෝ බෝසත් කුමරුන්ට නමස්කාර කළහ. එබැවින් මෙතැන දී සුද්ධෝදන රජතුමා තම බෝසත් කුමරුන් දේවාතිදේව (දෙවියන්ගේත් දෙවි) යන නමින් හැඳීන්වීය. මෙතැන දී බෝසත් කුමරු නිමිත් පාඨක බ්‍රාහ්මණ පණ්ඩිතයන්ට දක්වන ලදි. අසිත ඍෂිවරයා විසින් මේ කුමරු අනාගතයේ සම්මා සම්බුදු වන්නේය යන්න ප්‍රකාශ කරන ලද්දේ මෙතැනදී ය. මහ ප්‍රජාපතී ගෝතමී විසින් බෝසත් කුමරුන් හදාවඩා ගන්නා ලද මාළිගය පිහිටියේ මෙතැනය. බෝසත් කුමරු ළමා වියේදී ඇතුන් පිටි අශ්වයන් පිට යාම, රිය පැදවීම, ධනු ශිල්පය ආදී තත්කාලීන ශිල්ප ශාස්ත්‍රයන් හදාරන ලද්දේ මෙතැන්හිදී ය. තරුණ බෝසත් කුමරා සතළිස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් පිරිවරාගෙන කම් සුව විඳින ලද්දේ මේ ස්ථානයෙහි ය. බෝසත් කුමරා විසින් සතර පෙර නිමිති දක්නා ලද්දේ මෙහිදී ය. සුද්ධෝදන රජු සී සෑමෙහි යෙදී සිටියදී ළදරු බෝසත් කුමරා ප්‍රථම ධ්‍යානයට සමවන් දඹරුක පිහිටා තිබුණේ මේ ස්ථානයෙහි ය. බෝසතු කුමරා අභිණිෂ්ක්‍රමණයෙහි යෙදී කපිලවස්තු පුරයෙන් කන්ථක අසු පිටින් චන්න ඇමැතියා සමග මහ රෑ පිටත්ව ගියේ මේ නගර දොරටුවෙනි.

මෙතන දී බෝසතුන් හැඳ සිටි කසී සළු දී වැද්දේ කසාවස්ත්‍ර ගෙන පැවිදි වෙස් ගත්තේ මෙතැන්හි දී ය යනාදී වශයෙන් බුදු සිරිත හා සබැඳි ආගමික ස්ථාන, උපගුප්ත රහත් තෙරණුවන් වහන්සේ විසින් අශෝක නිරිඳුන්ට, සිය දිවසින් විමසා පෙන්වා දෙනු ලැබී ය.







අශෝක ස්ථම්භය සංවර්ධනය කිරීමෙන් අනතුරුව

### දහවන පරිච්ඡේදය

# අශෝකාගමනයෙන් පසු ලුම්බිණිය

## 25. දේශාටකයින් හා ප්‍රභූන් ගේ ආගමනය

සීතල හිමව් පියසින් ලුම්බිණියෙන් සල් මල් වල සුවඳ ගෙන මඳ පවන් රැල් දඹදිව් තල දසත හමා යමින් සල් මල් කෙමි අතරේ රැඳ වූ සිහිනි වෙහෙරක් මිනිමුතු වූ පරිද්දෙන් මහසත් බුදුකුරු දූන් උපත ලබන්නාහයි වෙසමින් සෙනර ලුම්බිණි සාල වනයේ සොඳුරු රුව සිය නිලුපුල් නෙතු රුවමින් මහත් වූ මඳ නලින් යන්නී මහාමායා දේවිය දුටු සඳ සල් මලින් පිරි අත්තක් ඇය වෙතට මහ පින් කරන්නට මෙන් නමා ගත. එය ද මහ පෙළහරකි. ඒ මල් බර අත්ත සිය සුරත් ගත් සඳ වළාවෙන් මිදුණු පුන් සඳ මඬලක් පරිද්දෙන් මහමායා දේවිය මවු කුසින් මහසත්හු ලොව බිහිවූහ. එසඳ සත් සියයක් මල් පියලින් සැදී රන්මහ පියුම්, මහ සත් පා පියුම් පිළිගනිති. දියෙහි පිපෙන මල් දෙරණ ශිලා පළා නැග්ම ස්වභාවිකත්වය ද ඉක් මැ ගිය මහත් වූ පෙළහරකි.

මහ භද්‍ර කල්පය පුරා බදු, පසේ බුදු, අරහත් ශ්‍රාවක සමූහයා සැනහු, හිමව් පියස සප්ත මහ විල් ජලය එක් වැ හූ ගතව ගළා විත් ලුම්බිණි සාල වන පෙත පොකුණ සිහිල් ජලයෙන් පිරුණු සඳ, එහි බට මහමායා දේවි තොමෝ හිස පැනින් ගෙන, ගත් දොවා, රන් පියුම් පුත් අපරිමිත දයාවෙන් දෝත් ගත් තැන, ඇතැම් අසිරිමත් නන් තැන් පිළිබඳව දේශාටකයින් තැබූ සටහන් මෙම අදියරයෙන් පැනේ.



### i. චීන දේශාටකයින් දුටු ලුම්බිණිය

ක්‍රිස්තු වර්ෂ 350 - 375 ත් අතර කාලයේ ලුම්බිණිය වෙත සැපත් **ෂී සෙන්ග්සායි භික්ෂූන් වහන්සේ** එහි පැමිණි ප්‍රථම දේශ සංචාරකයා ලෙස සැලකේ. ඔහුගේ දේශාටන වාර්තාවේ මෙවන් සඳහනක් දක්නට ලැබේ.

"ඒ වන විට කපිලවස්තු පුරය අරාජිකව පැවතුණි. නගරය මෙන්ම ජල තටාකය ද බෙහෙවින් අපිරිසිදුව වල් විහිවී තිබිණි. පවුල් 20 ක් පමණ එහි පදිංචිව සිටියහ. ඔව්හු ශාක්‍ය වංශයෙන් පැවත එන්නන් විය. තැන තැන පිහිටි ස්ථූප ගරා වැටී තිබිණ. සිදුහත් උපත සිදු වූ ස්ථානයේ පිහිටි වෘක්ෂය (සල් ගස වෙනුවට මෙහි සටහන් කර ඇත්තේ අශෝක වෘක්ෂය යනුවෙනි) විනාශ වී ගොස් තිබුණ ද එම පෞරාණික වෘක්ෂයෙන් ලබා ගත් මුල් උපයෝගී කරගෙන එම වෘක්ෂය යළි හොඳින් වවා තිබුණි. එම ගස් සෙවණෙහි අශෝක අධිරාජයා විසින් සිදුහත් උපත නිරූපනය කරන කැටයමක් තනවා තිබිණි."

සිදුහත් උපත සිදු වු සැණින් තබන ලද සප්ත පියවර සිහිපත් වීම පිණිස අශෝක නිරිඳුන් එම ස්ථාන දෙපස කැටයම් පුවරුකින් ආවරණය කර තිබීණි. සැදැහැතියන් පුජා කළ සුගන්ධවත් මල් වලින් එම කැටයම් පුවරුව වැසී තිබිණි.

කුමරුන් උපත සිදුවු සැණින් පොළොවෙන් මතු වී කුමරුන් නහවනු ලැබූ උණුසුම් සහ සීතල දියවැල් ද්වයෙන් නිරතුරුව අහසට දිය විදී පවතිණු දුටිමි."

පස්වැනි සියවසේ ආරම්භයේ ලුම්බිණිය දැක බලා ගැනීමට, චීනයේ සැන්සි ප්‍රාන්තයේ සිට පැමිණි ෆාහියන් භික්ෂූන් වහන්සේගේ දේශාටන වාර්තාව ද එවකට ලුම්බිණියේ භෞතික පරිසරය අවබෝධ කරගැනීමට ලබාදෙන සහය අනල්පය. ෆාහියන් යන්නෙහි අර්ථය "ධර්ම මූර්ති" යන්නයි. උන් වහන්සේ සිය හැටපස් වන වියේදී, විනය පොත් සොයා ගැනීමේ අරමුණින් සිය දේශාටන ආරම්භ කළේ ය. "පුරවරයේ උතුරු දෙසට යොදුනක් ගිය කල්හි ශාක්‍ය මුණි බුදුන් වහන්සේ උපත ලද ලුම්මින් (ලුම්බිණිය) හමුවේ.

මායා දේවිය ස්නානය කළ පොකුණ එහි පසෙකින් දිසේ. සිදුහත් කුමරුන් බිහි වු සැණින් පෙර මඟට තැබූ පියවර 07 සිහිපත් කිරීම පිණිස තැනවූ ස්මාරක ද දැකගත හැකි ය. එතැන් සිට යොදුනක් පමණ නැගෙනහිර දෙසට පියමන් කළ විට කපිල වස්තු පුරවරය විද්‍යාමාන වේ. පුරවරයේ රජෙක් නොමැත. හාත්පස දැකගත හැක්කේ

පාළුවට ගිය නටබුන් පමණි. භික්ෂූන් ස්වල්ප දෙනෙක් සහ පවුල් දහයක් පමණ මෙහි පදිංචිව සිටින්නේ ය. ජන ශූන්‍යතාවයට හේතුව අවට ඇතුන් සහ ප්‍රචණ්ඩ සිංහයන් ගැවසීම ය.”

පාහියන් හිමියන් තවදුරටත් සිය අත් අකුරින් ම තබන ලද සටහනෙන් කියැවෙන පහත දැක්වෙන තොරතුරුවලින් එවකට ලුම්බිණිය පැවති ස්වභාවය මැනවින් නිරූපණය වේ. ‘මම සැවැතින් නික් මැ දොළොස් යොදුනක් නිරිත දෙසට ගමන් කොටැ නාපික නම් නුවරට පැමිණියෙමි. මෙය කකුසඳ බුදුරජුන් උපන්නාවූ ද, බුදුවීමෙන් පසු සිය පියාට මුලින් ම මුනගැසුනා වූ ද, පසුවැ පිරිනිවන් පෑවා වූ ද, නුවර යි. මේ හැම දැයැක් මැ සිදු වූ තැන්වලැ වෙහෙරවල් නංවන ලද්දාහු වෙත්. මෙයින් යොදුනකටත් අඩු දුරක් උතුරු දෙසට වැඩැ කනකමුණි බුදුරජුන් උපන්, බුදුවීමෙන් පසු මුලින් ම සිය පියාට හමුවූ පසුවැ පිරිණිවැ, නුවර පිහිටි පෙදෙසට පැමිණියෙමි. මේ හැම දැයැක් ම සිදු වූ තැන්වලැ කොත් නංවනු ලද්දෝ වෙති. පෙර දිගට යොදුනකටත් අඩු දුරකක් වැඩැ කිඹුල්වත් නුවරට සැපැත් වීමි. මේ නුවරැ රජෙක් හෝ මී යැරියෝ නැත්තාහ. මුළු නුවර ම පාලු බිමෙක් වැ පෙනේ. මෙහි කිහිප නමක් භික්ෂුහූත් ටික දෙනෙක් ගිහියෝත් වෙසෙති. සුදොවුන් රජුගේ මාළිගාවේ සුන්බුන් අතරැ මායා දේවියගේ පිළිමයත් බෝසතුන් ඇය කුස තුළ පිළිසිඳ ගන්නා වේලේ සුදු ඇත් පැටවෙකු කුසට වඩින්නට එන්නා සේ ඇය දුටු සිහිනය හඟවන රූ ත් දක්නා ලැබේ. සිදුහත් කුමරු නුවර පෙර දිගැ දොරින් නික්මැ උයනට යන අතරැ ලෙඩෙකු දැකැ සැරියා බණවා පෙරළා මාළිගාව අතට ම රිය පදවන්නැයි අණ කළ තැනැ නැංවුණු චෛත්‍යයක් ද ඇත. අසිත තවුසා කුමරහු ගතැ ලකුණු බැලු තැනැ ද, නන්ද කුමරු නුවර දොරටුවෙන් පැත්තකට ඇද දැමූ මළ ඇතකු සිදුහත් කුමරුන් ඔසවා ඉවතට විසි කළ තැනැ ද, නැංවුණු දාගැබ් දක්නට ඇත්තාහ. “සිදුහත් කුමරුන් සිප් දැක්වීමෙදී විදි හීයක් ගිණිකොන අතට ලී තිහක් දුර ගොස් බිම කාගෙන යැමෙන් මතු වූ උල්පතෙක් මෙහි වේ. පසු කලෙකැ මගීන්ගේ පහසුව පිණිස මිනිස්සු එහි පොකුණක් බැන්දාහ. අද ද එහි දක්නා ලැබේ. බුදුරජුන්, බුදු වීමෙන් පසු, පිය රජුහු දක්නට කිඹුල්වතට වඩනා ගමනේ නුවරට මුලින් මැ බට තැන ද, පන්සීයක් සැහැ කුමරුන් පැවිදිවැ පළමුවෙන් ම උපාලි තෙරට වැඳුම් කළ විටැ, පොළොවැ සෙලැවුණු පෙදෙස ද බුදු රජුන් දෙවියනට දම් දෙසන අතරැ සුදොවුන් රජු එහි එන්නට සැරැසෙන විටැ එය වළක්වනු වස් සිවුවරම් දෙවි රජුන් දම් හලැ සිව් දොරට වලැ මුරකෙරෙමින් සිටි තැනින් ද බුදු රජුන් නුග රැකක් මුලැ වැඩැහින්ද දී මහ පදෙව්ගොයුම්ය ඔබ වතෙකින් පිදු තැන ද ඒ නුගය තවමත් වැඩෙයි. යන මේ හැම තැන්හි ම චෛත්‍යය නංවන ලද්දාහු වෙත්. තවද



එහි විරූඪක (විඩුභ) රජු විසින් සෝවාන් වැ සිටි සැහැරජුන් මරා දැමූ තැන්හි දී පසු කලෙකැ නැංවුනු කොතක් ඇත්තේ ය.

නුවරට ලී කීපයක් දුරැ ඊසාන දිගැ සිදුහත් කුමරුන් ගසක් යටට වී රජ-කෙතැ සීසානු බලා හුන් තැන වේ. නුවරට ලී පනහන් නැගෙනහිරින් ලුම්බිණි උයන වේ. මායා දේවි නාන්නට බට පොකුණ මේ උයනෙහි ය. ඕ තොමෝ දිය සනහා පොකුණේ උතුරු පැත්තෙන් ගොඩ නැංගහ. ඉන් පසු විසි පියවරක් පමණ ගොස් ගසෙකැ අත්තක් අල්ලා ගෙනැ නැඟෙනහිර දෙසට මුහුන පා සිටින්නී ම බෝසත් කුමරහු වැදූහ. ඒ කුමර උපන් ඇසිල්ලෙහි සත් පියවරක් වැඩියේ ය. ඉන් පසු දෙදෙනෙක් නා රජුහු ඔබ නැවූහ. මෙ තැනැ පසු කලෙකැ පොකුණෙක් කරැවිණ. භික්ෂුහු මායා බිසොව නෑ යට සඳහන් වු පොකුණෙන් ද මේ බෝසතුන් නැවු තැනැ කැරැවුණු පොකුණෙන් ද යන දෙකෙන් ම පැන් බොති.

බුදුවරුන් බුදු වන තැන, දම්සක් පළමුවෙන් ම දෙසන තැන, දම් අසා අන් තොටුවන් මන් මැඩැ ලන තැන, මවට දහම් දෙසා තව්තිසාවෙන් බිමට බස්නා තැන යන සතර හැම දාම වැඳුම් පිදුම් කළ යුතු අග තැන් කොට සලකනු ලැබෙත්. සෙසු තැන් ඒ ඒ තන්හි සිදු වු වැදගත් දැයේ වැදගත් කමේ පමණින් උසස් කොටැ සලකනු ලැබේ. කිඹුල්වත් පෙදෙස දැන් පාළු වී තිබේ. සුදු ඇතුන් ද සිංහයන් ද ඇතැම් විටැ ගැවැසෙන බැවින් එහි පාරවලැ ගමන් කරන්නෝ හිඟ ය. මහත් රකවල් ඇති වැ මිස නො එසේ වැ එහි ගමන් කළ නො හැක්ක.”

හත්වැනි සියවසේ සුආන් සැංග් ද ලුම්බිණිය වෙත පැමිණි තවත් වැදගත් දේශ සංචාරකයෙකි. ඔහුගේ වාර්තා වල ලුම්බිණිය හඳුන්වා ඇත්තේ ‘ලාෆානි උද්‍යානය’ වශයෙනි. දකුණු නගර ද්වාරයෙහි පිටත, ප්‍රධාන මාවතේ දකුණු පස ස්ථූපයක් පිහිටියේ ය. ඒ සිදුහත් කුමරුන් ශිල්ප දස්කම් දැක් වු ස්ථානයයි. එතැන් සිට ගිණිකොන දිශාගතව ඔහු ශිල්ප දැක්වීමේ දී කුමරුන් වේගවත්ව විදි ඊ තලය පොළොව පසා කරගෙන ගිය ස්ථානයේ මතු වු දිය උල්පත ද මෙම දේශාටකයා දැක ඇත. එවකට එම උල්පත ප්‍රදේශවාසීන් හඳුන්වා ඇත්තේ “දුනු හී කඳුර” නමිනි. මෙම දිය කඳුරේ දිය රෝග සුව කිරීමේ ශක්තියෙන් යුක්ත වූ බවත්, ජනී ජනයා දිය පානය සඳහා නිරතුරු මෙම ස්ථානයට පැමිණි බවත් ඔහු සඳහන් කරයි. මෙම දිය කඳුරේ සිට ලී අනුවක් ඊශාන දෙසට පියමන් කළ විට ලුම්බිණි උද්‍යානය හමුවේ. එහි කැඩපතක් හා සදිසි සුපිරිසුදු ජල තටාකයක් දැකිය හැකි ය. ජලය මතු පිට නොයෙක් නොයෙක් ජලජ පුෂ්ප විකසිතව තිබිණි. මෙම පොකුණේ සිට පියවර 25 ක් පමණ උතුරු දෙසට ගිය විට අශෝක

වෘක්ෂය හමුවේ. (ඔහු පෞරාණික සල් ගස හඳුන්වා ඇත්තේ අශෝක ගස ලෙසිනි.) බුදු උපත නිශ්චිතව සිදු වුයේ මෙම ගස් සෙවනේ බව ද මෙහි සඳහන් කරයි.

සිදුහත් කුමරුන් මවු කුසින් බිහි වූ අවස්ථාවේ ම පියවර හතක් නෙලුම් මල් මත පෙරට වැඩි බවත්, ඒ තමන්ගේ අවසාන උපත බවට උදාන වාක්‍ය පළ කළ බවත් මෙම වාර්තාවේ සඳහන් ය. නාගයන් විසින් මවාලු උණුසුම් හා ශීත දිය දහරා ද්වයෙන් සිදුහත් කුමරුන් නැහැවී පිරිසුදු වූ බවත් එම ස්ථාන ස්මරණය සඳහා ස්ථූප දෙකක් ඉදිකර තිබූ බවත් වාර්තාගත ය. මෙම ස්ථානයෙන් දකුණු දෙසට වන්නට සතර වරම් දෙවිවරුන් විසින් කුමරුන් පිළිගත් ස්ථානය සනිටුහන් කිරීම පිණිස ස්ථූප හතරක් නිර්මාණය කර තිබිණ. ඒ සමීපයේ විශාල ගල් කුලුනක් තමන්ට දැකගන්නට ලැබුණු බවත් එහි මුදුනේ අශ්ව හිසක් නිර්මාණය කර තිබූ බවත් ඔහු සඳහන් කරයි. ඒ අශෝක නිරිඳුන් කළ සුප්‍රකට අශෝක ස්ථම්භයයි. මෙම පූජනීය ස්ථානයට ගිණිකොන දෙසින් තෙලර් නදිය නම් වූ ගංගාවක් ගලා බසිමින් තිබිණ. නදියෙහි නැගෙනහිරට ලී 500 ක් පමණ දුරින් ප්‍රදේශය කුඹුර යායක් හා සල් වනයකින් වැසී තිබිණි.

පාහියන් භික්ෂුව රාම ග්‍රාමයේදී තමන් වහන්සේ සියැසින් දුටු දෑ සිය චාරිකා වාර්තාවේ සටහන් කර ඇත්තේ මෙසේය.

**රාම ග්‍රාමය :-**

'බුදු රජුන් උපන් බිමෙන් පස් යොත්නක් නැගෙනහිර අතට ගිය තැනැ 'රාම ග්‍රාමය' වේ. මෙ රටේ රජ (දා බෙදුමේ දී) බුදු දා (සර්වඥ ධාතු) කොටසක් ලැබැ පෙරළා සිය රට අවුත් ඒවා නිදන් කොටැ දාගැබක් නැංවීය. එය රඹගම්-තුඹ (රාමග්‍රාම - ස්ථූප) නමින් හැඳින්වේ. මේ තුඹ අසලැ පොකුණක් වෙයි. තුඹ නිතොර රැක බලා-ගෙනැ දිවා රෑ දෙක්හි එයට වැඳුම් පිදුම් කරන නා රජෙක් ඒ පොකුණෙහි වෙසෙයි. අශෝක රජ මුල් දාගැබ් අට බිඳැ, දා ගෙනැ, සුවාසූ දහසක් දාගැබ් නංවන්නට සිතී ය. දාගප් සතක් බිඳැ දමා මේ රඹගම්-දාගබ බිඳින්නට ද හේ පැමිණියේ ය. එ විටැ නා-රජ පෙනී-සිටැ රජු තම විමනට ගෙනැ-ගොස්, සෑ පුදන්නට තමා පිළියෙල කැරැගෙන තිබන බඳුන් ඈ පුද පඬුරු හැම දක්වා, ඔබේ බඳුන් ආදිය මගේ මේ පුද බඩුවලට වඩා අගනේ නම්, මේ තුඹැ බිඳැ දා හැරැ ගෙනැ යන්න. එයට මගේ ආරෝවක් නොවෙති'යි කීය. අශෝක රජු ඒ බඩු මිනිස් අතකින් හැදූ දැ නොවන බව සළකා, තුඹ බිඳීමේ අදහස හැරැ-දමා පෙරළා සිය නුවරට ම ගියේය. මෙ කී තැන



මුළුමනින් ම පාළු වී ඇති බැවින් හමදින්නට හෝ දියෙන් තෙමෙන්නට හෝ කිස ද මිනිසෙක් දැන් මෙහි නැත. එහෙත් ඇත් රැලක් සොඬින් දිය පුරා-ගෙන අවුත් මෙහි බිමැ ඉසිති. ඉක්බිති නන් වැදෑරුම් සුවඳ මලින් දාගැබ පුදති. මේ සෑය පුදනුවට පිට රටෙකින් ආ පැවිද්දෙක් ඇතුන් දැකැ බිය ගෙනැ ගසකට මුවා වී සිටියේ ය. එහෙත් ඇතුන් මැනවින් ඒ සෑය පුදන්නනුවන් දැකැ, මේ සෑය රැකැ-බලා-ගන්නට කිසි ද පැවිද්දෙක් නැතැ යි ද එහෙයින් මැ මෙය පිරිසිදු කැරැ රැක්ම ඇතුන් පිට ම පැවැරිණැ යි ද සිතා හේ සෝ පත් විය. ඉක්බිති හෙතෙම උපසපුව පිළිකෙවු කොටැ, හෙරණෙක් වැ, කැලෑව කපා බිම සමතලා කොටැ සෑ පෙදෙස මොනොවට සැකසී ය. මෙයැ කොටැ නිමවා එහි සඟරමක් කරන්නට රජු මෙහෙයී ය. ඉක්බිති තෙමේ ම එහි දෙටු තැනට පත් වීය. දැන් එහි භික්ෂුහු වෙසෙති. මෙය සිදු වැ තව ම වැඩි කලෙක් ගත නොවීය. එ තැන් පටන් හැම කල්හි ම මෙහි සඟරමට අධිපති වනුයේ හෙරණෙකි. මෙයින් තුන් යොත්නෙකි ඈතැ නැගෙනහිර දෙසැ සිදුහත් කුමරුන් ඡන්දකායත් (සන් ඇමැත්තාත්) සිය සුදු අසුත් ආපසු පිටත් කැරැවු තැන වෙයි. එහි තුඹසක් නංවා ඇත.'

ක්‍රි.ව. 764 හි දී වූ කොං හා ෆැන්ච් නමැති දේශාටකයෙක් ලුම්බිණියට පැමිණ තමන් දුටු දේ වාර්තාගත කර ඇත. ඔහු තමා දුටු අශෝක ස්ථම්භය පිළිබඳව සටහනට නංවා ඇත. ලුම්බිණිය හා ඒ ආශ්‍රිත දේශයේ පුරාවිද්‍යා ගවේෂණයෙහි යෙදුණු පුරා විද්‍යාඥයන්ට වැදගත් ඉසව් සොයා ගන්නට මෙවන් දේශාටන වාර්තාවන් ගෙන් මහත් ම ආලෝකයක් හා මග පෙන්වීමක් ලැබේ.

## ii. රිපුමල්ල රජු හා අනගාරික ධර්මපාල තුමා ලුම්බිණිය පැදකුණු කිරීම.

බටහිර නේපාලයේ කත්මණ්ඩු ප්‍රදේශයෙහි මල්ල රාජධානියෙහි නාග්රාජ රාජ වංශයේ රිපුමල්ල රජු කි.ව. 1312 දී ලුම්බිණිය නරඹා, අශෝක කුළුනු මස්ථකයෙහි "ඕම් මණි පද්මෙ හුම් රිපු මල්ල චිරං ජයතු" යනුවෙන් සිය පැමිණීම පිළිබඳව සටහනක් කොටා ඇත. මෙම වකවානුවේ, ලුම්බිණිය හා කපිලවස්තුව රිපු මල්ල ගේ කර්ණාලි මල්ල රාජධානියට අයත්ව පැවති බව සැළකේ.

අනගාරික ධර්මපාල තුමන් 1898 අප්‍රේල් 6 වැනි දින ලුම්බිණිය වෙත සැපත් වූයේ ද බුදු උපත සිදු වූ අසිරිමත් ලුම්බිණිය යළි බෞද්ධ ලෝකයාට වැඳුම් පිදුම් කළ හැකි ස්ථානයක් බවට පත් කරලීමේ උතුම් පරමාර්ථය පෙරදැරි කර ගෙන ය. ධර්මපාලතුමා සිය අදහස් මුදුන්පත්

කර ගැනීම සඳහා අවශ්‍ය අනුග්‍රහය හා අනුබලය ලබා ගැනීම පිණිස තම ලුම්බිණි ගමනට **තායිලන්තයේ ඔටුන්න හිමි පී.සී. ජිනවරවම්ස කුමරා** ද සම්බන්ධ කර ගත්තේ ය. ධර්මපාලතුමා එහිදී සියැසින් දුටු දෑ ආශ්‍රයෙන්, සිය දින පොතේ මෙවන් සටහනක් තැබී ය.

"ඉපැරණි නටඹුන් පඳුරුවලින් වැසී තිබිණි. තුරු වැල් වලින් ඝණ ලෙස ආවරණය වී තිබූ අශෝක ස්ථම්භය අඩි 8 ක් 10 ක් පමණ උසින් යුක්ත විය. ස්ථම්භයේ සිට නැගෙනහිර දෙසට මායා දේවියගේ සිතුවම නිරූපිත කැටයම අසළ කුඩා කුටියක තැන්පත් කර තිබිණි. චීන බෞද්ධ ලාමාවරයෙක් කුටිය අසළ රැඳී සිටියේ එහි භාරකරු ලෙසිනි. නේපාලයේ ගුර්කා රැකවලෙක් ද මෙහි ආරක්ෂාවට සේවයෙහි යොදවා තිබිණි. හින්දු බැතිමතුන් මෙම පිළිරුව ධුර්ගා දේවියගේ වේෂයක් වූ රුමින්දේවී ගේ ලෙස සලකා ඒ අසළ සත්ත්ව බිලි පූජා සිදු කර තිබෙනු දුටු අපට මහත් සංවේගයක් ඇති නූනා නොවේ."

ධර්මපාලතුමා පවසන පරිදි 1898 අප්‍රේල් මාසයේදී කල්කටාවේ මහබෝධි සංගමයේ නේවාසිකව සිටි **පූජ්‍ය එන්. සද්ධානන්ද හිමි** ද එහි සිදු කරන ගවේෂණ කටයුතු දැක බලා ගැනීම පිණිස ලුම්බිණියට වැඩි බව සඳහනි.

## iii. වනයෙහි සැඟව ගිය ලුම්බිණිය

රිපුමල්ලගේ ලුම්බිණි සංචාරයෙන් පසුව ලුම්බිණිය විවිධ ස්වභාවික ව්‍යසනයන්ට බඳුන් වෙමින් රාජ්‍ය අනුග්‍රහයෙන් තොරව, වන ගතව පැවතිණි. ලුම්බිණි යන නාමය පවා අභාවයට පත්විණි. එම පුද බිම නාමය රුම්න්දෙහි යන්නටත් අනතුරුව දිස්ත්‍රික්කයේ නාමය වන රූපන්දේහී යන්නටත් පරිවර්තනය වීය. ප්‍රදේශය භූ කම්පන වලට හා නිරන්තර ගංවතුර උවදුරු වලට ලක්වූ බවට සාධක සොයා ගැනීමට පුරාවිඥයින් සමත් වූහ.

ගිනිකොණ දිශාගතව ගලනා දනෝ හා නිනාවු සුවිශාල ගංගා යුග්මයන් ද නැගෙනහිර හා බටහිර දිශාගතව ගලනා තෙර් හා කෝකි ගංගා යුග්මයන් ද ජුනි ජූලි මාසවල එළඹෙන ධාරානිපාත වැසි සමයේ පිටාර ගැලීම නිසා ලුම්බිණි ප්‍රදේශයට ද වාර්ෂිකව ගංවතුර උවදුරට මුහුණ පෑවේ ය. මෙම ප්‍රදේශය වනගත වීමට එය ද ප්‍රබල හේතුවක් වූවා විය හැකි ය.

ලුම්බිණිය පරිහානියට දේශපාලනික හේතූන් ද බලපා ඇති බවට ප්‍රධාන් වැනි විද්වතුන් මත පළ කරති. ලුම්බිණි ප්‍රදේශයට



ආසන්නයේ ම පිහිටි උත්තර ප්‍රදේශය මුස්ලිම්වරුන්ගේ දේශපාලනික කේන්ද්‍රස්ථානයයි. මුස්ලිම් පාලකයින් ලුම්බිණිය ආරක්ෂාව සහ සංවර්ධනය උදෙසා නිද්‍රාශීලී ප්‍රතිපත්තියක් අනුමනය කිරීම මෙම පුද බිම වල් බිහිවී ලෝකයාගේ අවධානයෙන් ඈත්වීමට ප්‍රධන හේතුවක් වූවාට සැක නැත. (ක්‍රි.ව. 1489-1517) සිකන්දර්ලෝඩ් සහ (ක්‍රි.ව. 1668-1701) අවුරන්ග්සෙබ් වැනි මුස්ලිම් පාලකයින් ලුම්බිණියේ හා කපිලවස්තු පුර ආගමික උරුමයන් සංරක්ෂණය සඳහා කිසිඳු උනන්දුවක් දක්වා නොමැති බව ද විද්වත් ප්‍රධාන් පෙන්වා දෙයි. (ක්‍රි.ව. 1782-93) කාලය තුළ රාජ්‍ය පාලනය කළ මුකුන්ද සේන වෙතින් ද ලුම්බිණිය සංවර්ධනය උදෙසා දායකත්වය ලැබී නොමැත.



සුදොවුන් රජ මාළිගයේ නටඹුන්

### එකළොස්වන පරිච්ඡේදය

# ලුම්බිණිය ආශ්‍රිත ගවේෂණ

## 26. පූර්ව පුරාවිද්‍යා ගවේෂණ

1895 දෙසැම්බර් 01 වන දින පල්පානි ආණ්ඩුකාර ජනරල් කහඩ්යා ෂම්ෂර් රණා සහ ඇමරිකානු ගවේෂණ ආචාර්ය ඇන්ටන් ෆ්‍යුරර් ලුම්බිණියෙහි ගවේෂණයක නිරතවූයේ වනගතව පැවති බෞද්ධ උරුමය පිරික්සා බැලීමේ අදිටනකින් යුක්තව ය. ඔව්හු වල්බිහිවී තිබූ අශෝක ස්ථම්භය යළි සොයා ගත් අතර එහි කොටා තිබූ ශිලාලේඛන ය ද කියවා තේරුම් ගැනීමටද සමත් වූහ.

ආචාර්ය ඇන්ටන් ෆ්‍යුරර් නේපාල් ගුන්ජ් ප්‍රදේශයේ රැඳී සිටියදී එහි ස්වදේශීය ගැමියන් ගෙන් නිග්ලිහාවා ග්‍රාමයේ නිග්ලිසගා පොකුණ තෙර බිඳී ගිය ඉපැරණි කුළුණක කැබලි විසිරී පවත්නා බව දැන ගන්නට ලැබිණි. ඒ අනුව හෙතෙම එහි ගොස් කරනු ලැබූ ගවේෂණයේදී අනාවරණය වූයේ අශෝක අධිරාජ්‍යයා විසින් කණකමුණි හෙවත් කෝණාගමන බුදුන් වහන්සේ උපන් ස්ථානය හඳුනා ගැනීම පිණිස මෙම ස්ථම්භය පිහිටුවා ඇති බව ය.



අශෝක ස්ථම්භයේ කැඩී ඇති අශ්ව හිස

ජනරාල් කහඩ්ගා ෂම්ෂර් හා ආචාර්ය ෆ්‍යුරර් ගේ ගවේෂණ ප්‍රතිඵල ලොව නන් දෙස පැතිරීම ලුම්බිණීය ගවේෂණය පිණිස විද්වතුන් බොහෝ දෙනෙක් මෙම පුදබිම වෙත ඇදී ඒමට පෙළඹවීමක් වූවා සේ සැලකේ.



1899 බාබු පූර්ණ චන්ද මුඛර්ජී විසින් කළ කැණීම් වලදී සිදුහත් උපත නිරූපිත මූර්තිය හා ඒ අවට වූ ව්‍යුහමය නෂ්ටාවශේෂ පැහැදිලි ව හඳුනා ගනු ලැබිණි. අශෝක ස්ථම්භයට නැගෙනහිර දිශාභිමුඛව පිහිටි රුම්න්දේහි (මායා දේවී) විහාරය ආශ්‍රිත කැණීම් වලදී විහාර අභ්‍යන්තරයෙහි දකුණු පස බටහිර හා උතුරු දිශාගත කැටයම් කළ ඉදිරියට නෙරා ගිය ගල් බැම් 07 ක් සොයා ගනු ලැබිණි. ඒ අනුව මායා දේවී විහාරය 'සප්තරථ' යන නමින් ද අතීතයේ හැඳින්වී ඇති බව ඔහු තහවුරු කළේ ය. වැඩිදුර සිදු කරන ලද කැණීම්වලදී මායාදේවිය සල් අත්තක් අල්ලා ගෙන සිටිය දී සිදුහත් කුමරුගේ උපත දැක්වෙන 'වජ්‍ර වරාහි' ඓතිහාසික කැටයම ද මතුකර ගැනීමට හේ සමත් විය. මායා දේවී විහාරය පිටත විසිරී පැවති නටඹුන් හා කුඩා ස්තූපයන් සමූහය ද ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය.

මොහු විසින් සිදු කරන ලද ගවේෂණයන් මඟින් තිලෝරාකෝට්, අතීත කපිලවස්තු පුරය වශයෙන් නිසැක ලෙස හඳුනා ගන්නා ලදී.

1912 දී ලුම්බිණිය වන්දනා කිරීමට සපැමිණි එකාසි කවාගුඩ් නම් ජපන් ජාතික භික්ෂුව හින්දු භක්තිකයින් ලුම්බිණියෙහි සිදු කරන සත්ත්ව බිලි පූජා නැවැත්වීම පිණිස එරට අග්‍රාමාත්‍යවරයා වෙත කරනු ලද ඉල්ලීම මත එහි බිලි පූජාව රජය මඟින් අත්හිටවනු ලැබිණි.

1933 - 1939 අතර වූ වසර 6 ක කාලයක් තුළ ජනරාල් කහඩ්යා ෂම්ෂර් රණා දෙවැනි වතාවට ද ලුම්බිණිය ආශ්‍රිත ප්‍රදේශයෙහි පුරාවිද්‍යාඥ ගවේෂණ කටයුතුවල නිරත වූහ. අවිධිමත් ලෙස කරනු ලබන කැණීම්වලින් පුරාවස්තුවලට වන හානිය ඔහු පෙන්වා දුන්නේ ය. මායා දේවී විහාරය තුළ කැණීම් කිරීමේදී බිත්තිවලට හානි නොවන පරිදි උස් පීඨිකාවක් නිර්මාණය කරන ලද්දේද රණා විසිනි.

1956 කත්මන්ඩුහි දී පවත්වන පද සිව්වැනි ජාත්‍යන්තර බෞද්ධ මහා සම්මේලනයේ දී නියෝජිතයින් කිහිප දෙනෙකුන් විසින්ම ලුම්බිණියේ ඇති ඓතිහාසික වටිනාකම සැලකිල්ලට ගෙන එම පූජනීය ප්‍රදේශය සංවර්ධනය කර සංරක්ෂණය කිරීමේ වැදගත් කම පෙන්වා දෙනු ලැබිණි. මෙහිදී ලුම්බිණිය සංවර්ධනය සඳහා නිසි පියවර ගැනීමට මහේන්ද්‍ර රජතුමා විසින් සිය එකඟතාව පළ කරන ලදී.

1962 දී ඩෙවෙලා මිත්‍රා බාබු, ක්‍රිෂ්ණා රිජාල් ආදී පුරාවිද්‍යාඥ ගවේෂකයින් රාශියක් ලුම්බිණිය පුද බිම කැනීම් කර වැලලී ගොස් තිබූ නටඹුන් සොයා එය තහවුරු කිරීමට ක්‍රියා කළහ.

බුදු උපත සිදුවූ අසිරිමත් ලුම්බිණි පුරවරය මෙන්ම ඒ ආශ්‍රිතව පිහිටි කපිලවස්තු පුරය ද බොදුනුවන්ගේ වන්දනාමානයට අනිවාර්යයෙන් ම පාත්‍ර විය යුතු ය. ඒ මන්ද යත් බුදු සිරිත හා සබැඳි ස්මාරකයන් එම පුරවරයෙහි දක්නට ලැබීමයි.

**පුරාවිද්‍යාඥ ඇලෙක්සැන්ඩර් කනිංහැම්** ප්‍රධාන විද්වතුන් පිරිසක් කිගිලිහාවාහි පිහිටි කෝණාගම බුදුන් වහන්සේ උපත ලද ස්ථානය, ගොටීහවාහි කකුසඳ බුදු උපත සිදුවූ ස්ථානය, සගරහවාහි පිහිටි විඩුඩබයන් විසින් ශාක්‍යවංශිකයින් සමූලඝාතනයට ලක් කළ ස්ථානය පුරාවිද්‍යාත්මක සාක්ෂි මඟින් හඳුනගෙන ඇත.

පුරාවිද්‍යා කැනීම් මඟින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද මයාදේවී ආරාමය, සම්බුදු උපතේ 2547 වැනි සංවත්සරය යෙදුණු 2003 මැයි මස 16 වැනි වෙසක් පුන් පොහෝ දින මහජනතාව වෙනුවෙන් විවෘත කරනු ලැබිණි. එම ආරාමයේ අත්තිවාරමේ නෂ්ටාවශේෂ බිම්මහලේ දැකිය හැකි ය. ආරාමය තුළ අශෝක ස්ථම්භයට සමාන්තරව පොළවෙන් මතුකර ගන්නා ලද, පින්වන් කුමරු මව්කුසින් බිහිවන අවස්ථාව නිරූපිත මූර්තියක් පිහිටියේ ය. මෙහි ආරක්ෂාව සඳහා තද ඝනකමින් යුත් වෙඩි නොවදින වීදුරුවකින් ආවරණය කර ඇත. සතර වරම් දෙවි වරුන් විසින් කුමරුන් පිළිගැනීම සිදු වූ ස්ථානය ස්මරණය කිරීමට ඉදිකළ ථූප සතරක නටඹුන් ද මේ ආසනයේ දැක ගැනීමට හැකි වේ.

ඉතා මෑතකදී එංගලන්තයේ ඩර්හැම් විශ්ව විද්‍යාලයේ රොබින් කනිංහැම් ප්‍රධාන පුරාවිද්‍යා කණ්ඩායමක් විසින්  මයාදේවී ආරාමය ඇතුළත භූමියෙහි කරන ලද කැනීම් වලදී විෂ්මිත තොරතුරු ගණනාවක් අනාවරණය විය. දැනට පවතින මයාදේවී විහාරයේ අඩිතාලමට යටින් භූගර්භයේ පැරණි විහාර ගෘහයක් මෙම කැනීම් වලදී සොයා ගෙන ඇත.

භූගර්භයෙන් මතු වූ ගොඩනැගිල්ල මහමායාවන් සිදුහත් කුමරුන් බිහි කරන අවස්ථාවේ තිබුණායැයි සැලකෙන ඓතිහාසික සල් ගස ආවර්ණය කර තැනූ වහලයකින් හෝ බෝධිඝරයක් විය හැකි බව ඔව්හු ප්‍රකාශ කරති. එහි ගරාදි වැටක නටඹුන් හමු වී ඇත. ඒ මධ්‍යයෙහි තිබූ වලේ සල් වෘක්ෂයේ දිරා ගිය කොටස් මතු කර ගැනීමටද ඔව්හු සමත් වී ඇත. හමුවූ පුරාවස්තු කාබන් සමස්ථිතකය යොදා පරීක්ෂණයට බඳුන් කළ අවස්ථාවේ එහි අතීතය ක්‍රි.පූ. 550 තරම් ඈතට දිව යන බව අනාවරණය විය. මේ පිළිබඳව වැඩි විස්තර මතු පරිච්ඡේදයකදී සාකච්ඡාවට බඳුන් කැරේ.






මායාදේවි අරම - පුරාවිද්‍යා ගවේෂණ මගින් සොයාගත් මුල් යුගයේ



මායාදේවි අරම - වර්තමානයේදී

# ලුම්බිණි කාල රාමුව.










මහාචාර්ය රොබින් කනිංහැම් ලුම්බිණි මායා දේවි ආරාමයේ ගවේෂණයේ යෙදෙමින්

### දොළොස්වන පරිච්ඡේදය

# ලුම්බිණිය ප්‍රතිනිර්මාණය වීම.

## 27. ලුම්බිණියේ නවමු යශෝරාවය

ලුම්බිණි පුදබිම පිහිටි ස්මාරක සියල්ල අතුරින් බොදුනුවන් හදවත බැඳගන්නේ මායාදේවී විහාර සංකීර්ණයයි. ශත වර්ෂ ගණනාවක් පුරා ඉදිකිරීම් ස්තර ගණනාවක් එහි යොදා ඇති බවට ද මෙම සංකීර්ණය සාක්ෂි දරයි. මෙහි ඇති වන්දනීය ප්‍රධාන පූජ්‍ය වස්තුව වූ කලී උත්පත්ති කථාවට සම්බන්ධ ප්‍රතිමාවයි. ප්‍රතිෂ්ඨාපනය කරන ලද මායාදේවී පන්සල බුදුන් වහන්සේගේ 2547 වැනි ජන්ම සංවත්සරය යෙදුණු 2003 මැයි මස 16 වැනි දින නැවත විවෘත කරන ලදි. නේපාල රජය හා ලුම්බිණි සංවර්ධන භාරය එකතුව විහාරය ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. පැරණි මායාදේවී පන්සලේ අත්තිවාරමේ නෂ්ටාවශේෂ බිම්මහලේ අඩංගුව ඇත. ඒවා ක්‍රි.පූ. 3 වැනි සියවසට අයත් බවත්, අතිපූජනීය වූ මෙම ස්ථානය බුදුන් වහන්සේගේ උපත සිදුවූ ස්ථානය බවත් පුරාවිද්‍යා ගවේෂණ මඟින් තහවුරු කර ඇත. පුදබිමේ ගැඹුරටම යටවී තිබූ ගල්කැබලි එක්වී සැදුණු කුඩා පාෂාණ උද්ගතය බුදුන් වහන්සේගේ උපත සිදුවූ නියම ස්ථානය පැහැදිලිව පෙන්නුම් කරයි. මායාදේවී පන්සල් පෙදෙස 1992 -1995 දක්වා ඉතා පරීක්ෂාකාරී ව කැණීමේදී එය සොයාගන්නට ලැබුණි. සලකුණු කරන ලද ශිලාව සෙන්ටිමීටර් 70 x 40 x 10 ප්‍රමාණයේ වූවකි. එය දැනට බිම් මහලේ කුටියක වෙඩි නොවදින වීදුරුවකින් ආවරණය කර ඇත.


මායා අරමේ සිදුහත් උපත සිදුවූ ස්ථානය පිහිටි භූගත කුටිය




සිදුහත් කුමරු මෙලොව බිහි වූ නිශ්චිත ස්ථානය දැක්වෙන පාෂාණමය සංකේතය
මායාදේවී අරමේ පොළොව ගැබෙහි ආරක්ෂිතව

උත්පත්ති කථාවට සම්බන්ධ ප්‍රතිමාව යන නමින් ද හැඳින්වෙන මායා දේවියගේ පිළිරුව ක්‍රිස්තු පූර්ව 4 වැනි සියවසට අයත් වූවකි. මායාදේවිය සිය සුරතින් වෘක්ෂ ශාඛාවක් අල්වා ගෙන සිටින අයුරු එහි චිත්‍රාකාරව දක්වා ඇත. ඇගේ ම සොහොයුරිය වන මහ ප්‍රජාපතී ගෝතමිය උපස්ථම්භක ඉරියව්වෙන් මායාදේවීයට දරු උපත සිදුවන අවස්ථාවේ ඇය අසළ ම සිටගෙන සිටින්නී ය. බිහි වූ ළඳදරු සිදුහත් කුමරු නෙළුම් මලක් මත සිටින අතර එතුමන් පිළිගන්නා අයුරින් දේවරූප දෙකක් ද එහි නිරූපිත ය.

මීට අමතරව මායාදේවී විහාරය තුළින් හමුවූ කැඩී බිඳී ගිය පාෂාණමය මූර්තිය සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය දක්වයි. මහ මායා දේවිය තම දකුණතින් සල් අත්ත අල්ලා සිටින අතර ඇයගේ වම් අත ඉණ මත්තෙහි ය. දකුණු පසින් නිරූපණය වන්නේ ප්‍රජාපතී ගෝතමියයි. සක් දෙවිඳුන් අත සිදුහත් කුමරු දැක් වේ. පසු පසින් ඇති රූපය මහා බ්‍රාහ්මයා විය හැකි බවට මතයක් පවතී. **පී.සී. මුඛර්ජි** එය ඉඳු


නටඹුන් අතරින් මතුකරගත් සිදුහත් ජන්මය නිරූපිත පාෂණමය කැටයම

දෙවියාගේ බව ප්‍රකාශ කරයි. ක්‍රි.පූ. 1-4 සියවස දක්වා වූ කුෂාණ යුගයේ මථුරා කලා සම්ප්‍රදායට මෙම මූර්තිය නෑකම් කියයි.

මහමායා දේවියගේ ප්‍රතිමාව සමීපයේ තිබී සිද්ධාර්ථ කුමරුගේ හා යශෝධරාවන්ගේ විවාහ මංගල්‍ය නිරූපිත මූර්තියක් ද හමු වී ඇත. නේපාලයේ හින්දු බැතිමතුන් රූපා දේර්, රූපා දේවී, රුම්මින දේවී, යන ගෞරවනීය නම්වලින් දෙවඟනක් ලෙස සලකා මායාදේවී ආරාමයට වැඳුම් පිඳුම් කරනු ලැබේ. මෙම විහාරයේ පැවති සිදුහත් කුමරුන්ගේ උත්පත්තිය නිරූපිත ඉහත විස්තර කළ කැටයම් ගල, අසළ ඇති පුෂ්කරණිය පොකුණේ ජලයෙන් උරගා පානය කිරීමෙන් දරු සම්පත් ලැබෙන බවට ද හින්දු ජනතාව තුළ දැඩි විශ්වාසයක් පවතී. මේ නිසා සිදුහත් උපත දැක්වෙන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ගල් කැටයම බොහෝ දුරට ගෙවී ගොස් තිබිණි.

මෙම මූර්තිය ආරක්ෂා කර ගැනීම පිණිස වන්දනා කරුවන්ට අත තැබිය නොහැකි ලෙස ආරාමයේ සිද්ධාර්ථ බෝසතාණන්ගේ පා සටහනට ඉහළින් බිත්තියේ සවි කිරීමට නේපාල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

මායාදේවී අරමට දකුණු පසින් පිහිටි පුෂ්කරණීය පොකුණ, මහමායා දේවිය ස්නානය කළ ඓතිහාසික පොකුණ වශයෙන් ද සැලකේ. අශෝක ස්ථම්භයට හා මායාදේවී අරම ආසන්නයේ පිහිටි වැලිගලෙන් නිර්මිත බුදු සිරස, මථුරා සම්ප්‍රදායට අයත් කලාත්මක නිමැවුමකි. ඒ ආසන්නයේ ම පිහිටි මංජු ශ්‍රී මෛත්‍රීය අවලෝකිතේෂ්වර ප්‍රතිමාවද බැතිමතුන්ගේ සම්භාවනාවට බඳුන්වූ නිමැවුම්ය. ලුම්බිණියෙහි අමිල අතිපූජනීය ස්මාරක ලෙසින් සැලකිය හැකි යථෝක්ත පුරාවස්තූන් හා ඒවා නිමැවූ කාල වකවානු පිළිබඳව ලුම්බිණියේ ඒ ධවලමය යශෝරාවය අපට නිසැක වශයෙන් ම සාක්ෂාත් කරගන්නට මේ නොබෝදා අපට අවස්ථාව සැලසිනි. ලුම්බිණියේ පුරාණ තතු ලොවට අණාවරණය කිරීමේ ප්‍රයත්නයක නිමග්න සිටින පුරාවිද්‍යාඥයින් පිරිසකගේ ගවේෂණයන් පිළිබඳව ශාස්ත්‍රීය ලිපියක් **නැෂනල් ජෝග්‍රෆිකල් සඟරාවේ** පළවී තිබිණි. **ඩැන් වර්ගැනෝ** නම් ලේඛකයා විසින් පළකර තිබූ මෙම ගවේෂණ පිළිබඳ වාර්තාව මුළු මහත් ලෝකයේ ම මහත් අවධානයට බඳුන් විය.



ඉතිහාසයට එක්වන - ලුම්බිණි සාලවන පුෂ්කර පොකුණ





නිශා යාමයේ මායාදේවි අරමේ නිසල සුන්දරත්වය

## i. ලුම්බිණිය මිහිපිට ඉපැරණිම බෞද්ධ උරුමය බැව් තහවුරු වෙයි.

මෑතක් වන තුරු ම බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ ව මෙන්ම ලුම්බිණිය ආශ්‍රිතව ද පුරාවිද්‍යාත්මක සාක්ෂි පැවතියේ ක්‍රි.පූර්ව 3 වැනි සියවස දක්වා වූ කාල පරාසයක් සඳහා පමණි. සිද්ධාර්ථ කුමාර උපත ලුම්බිණියේදී සිදුවූ බවට මෙතෙක් තිබූ ප්‍රධානතම පුරාවිද්‍යාත්මක සාධකය වූයේ ක්‍රි.පූර්ව 3 වන සියවසේ අශෝක නිරිඳුන් පිහිටවනු ලැබූ සෙල්ලිපිය සහිත ලුම්බිණි කුළුණ පමණි.

නැෂනල් ජෝග්‍රෆිකල් සඟරාව වාර්තා කරන පරිදි ඩර්ගැම් **විශ්වවිද්‍යාලයේ මහාචාර්යය රොබින් කනිංහැම් මහතාගේ** මූලිකත්වයෙන් ලුම්බිණියේ සිදු කෙරුණු විද්‍යාත්මක කැණීම් කිහිපයක් මඟින් සිද්ධාර්ථ කුමාර උත්පත්තිය හා එය සිදුවූ කාල වකවානුව පිළිබඳව නවතම තොරතුරු සමුදායක් නිශ්චිත වශයෙන්ම තහවුරු කරණු ලැබිණි.



ලුම්බිණි මායා අරමෙහි සිදුහත්
උපත සිදු වූ ස්ථානය නරඹන බැතිමතුන්...

මෙම කැණීම් කටයුතු සඳහා නේපාල ජාතික පුරාවිද්‍යාඥයින් වන **ආචාර්ය කෝෂ් ප්‍රසාදි බසන් බිලාරි මෙන්ම ශ්‍රී ලංකාවට ගෞරවයක් ලබාදෙමින් කැළණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යය ප්‍රිශාන්ත ගුණවර්ධන මහතාද මහාචාර්යය රොබින් කනින්හැම්ට** සහාය වූහ.

ඔව්හු ලුම්බිණියෙහි ගවේෂණාත්මක කැණීම් සඳහා ඉතාමත් කටුක දේශගුණික තත්ත්වයක් පැවති ශීත ඍතු තුනක් ඇතුළත් තෙවසරක් කැණීම් කටයුතුවල නිරත වූහ. සත්‍ය සනාථ කිරීමේ කැණීම් ව්‍යාපෘතියෙහි පළමු අදියර ඓතිහාසික ලුම්බිණියේ මායාදේවී ආරාමය මුල් කර ගෙන සිදුවිය.

මායාදේවී ආරාමයෙහි මධ්‍යයෙහි ඇති විවෘත කොටසෙහි සිද්ධාර්ථ කුමාර උපත සිදුවන්නට ඇතැයි, යන උපකල්පනය පාදක කොට ගෙන ඔව්හු මුලින් ම කැණීම් ආරම්භ කළේ එම කොටසෙහි ය. ඔව්හු ඉතා පරීක්ෂාකාරීව එම කොටසෙහි මීටර් දෙකක් පමණ යටට පස් ස්ථරයක් ඉවත් කරණු ලැබිණි. එහිදී ආශ්චර්යාත්මක නටඹුන් සමුච්චයක් මතුකර ගැනීමට ඔව්හු සමත් වූහ. ඒ ගඩොල් හා දැවයෙන් කළ චතුරස්‍රාකාර ගරාදි වැටක අති පෞරාණික නෂ්ටාවශේෂ සමූහයකි. තවදුරටත් කැණීම් කිරීමේදී පොළව මතුපිට අප දකින මායාදේවී ආරාමයේ ආකෘතියකට ම සමාන විහාර මන්දිරයක් එහි භූගර්භයේ තිබී හමුවිය. මහාචාර්යය කනිංහැම් ගේ නිරීක්ෂණයට අනුව භූගර්භයෙන් මතුවූ ගොඩනැගිල්ල ඉපැරණි වෘක්ෂයක් වටා ඉඳි කරන ලද්දකි. එම වෘක්ෂය නිසා ගොඩනැගිල්ල මධ්‍යයේ පියස්සක් ඉඳිකොට නොතිබූ අතර වෘක්ෂයට අතු පතර ලියලා වැඩීමට අවකාශයක් සලසමින් වහල ඉඳි කොට තිබෙන්නට ඇත්තේ ගස වටා වූ මායිම ඔස්සේ පමණි. කැණීම්වලදී මතුකර ගත් වෘක්ෂය වටා පිහිටි ලී සැකිල්ල කාබන් සමස්ථිතිය යොදා පර්යේෂණයට භාජනය කරනු ලැබිණි. **එංගලන්තයේ ස්ටර්ලින් සරසවියේ මහාචාර්ය ඉයන් සිම්සින්** කාල නිර්ණය සහ විද්‍යාත්මක සාධක ගොඩනැංවීම පිණිස මෙම කාර්යයේදී පුරෝගාමීව ක්‍රියා කළේ ය. ඔහු විසින් මෙම නෂ්ඨාවශේෂයන්හි කාල නිර්ණය නිශ්චිතවම අණාවරණය කර ගැනීම පිණිස විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේද ද්විත්වයක් භාවිතා කළේ ය. කාබන් දින නියමය හා osl දින නියමය නිර්ණය කිරීම එම ක්‍රමවේද දෙක වශයෙන් සැලකේ. කාබන් අංශු සහිතව පොළොවෙන් ලබාගත් නියැදි විද්‍යාත්මක රසායනාගාර පර්යේෂණ මඟින් කාල වකවානු ලබාදීම කාබන් දින නියම ක්‍රමවේදයයි. osl දින නියමය සිදු කෙරෙන්නේ



කැණීම් කල ස්ථානයේ පස් නියැඳි විද්‍යාගාරය තුළ විශ්ලේෂණය කර දින වකවානු ලබාදීමයි. මෙම පර්යේෂණයන් ගෙන් අනාවරණය වූයේ සොයා ගනු ලැබූ ඉපැරණි නෂ්ඨාවශේෂ ක්‍රි.පූර්ව 06 වැනි සියවසට අයත්වන බව ය.

මෙම සොයාගැනීම් භාග්‍යවතුන් වහන්සේගේ ජීවමාන කාලවකවානුව පිළිබඳව සංවාදයකට ශක්තිමත් පදනමක් වනු නිසැකය. බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍ර වල නිරන්තරයෙන් සඳහන් වන මහ මායාදේවිය ලුම්බිණි සල් උයනේ සල් ශාකයක් අල්ලා සිටියදී සිදුහත් කුමරුන් බිහි වූවාය යන පුවත ද්‍රව්‍යමය සාක්ෂි මඟින් තහවුරු කිරීමට මෙම කැණීම් උපයෝගි වේ. එපමණක් ද නොව බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍ර බොහොමයක් සිද්ධාර්ථ කුමාර උත්පත්තිය සිදු වූයේ ක්‍රි. පූර්ව 06 වැනි සියවසේ බැව් පැහැදිළිව සඳහන් වූ කාල වකවානුව ද නිවැරදි බැව් නව කැණීම් මඟින් අනාවරණය වී තිබේ.

1970 දී ඉන්දීය පුරාවිද්‍යාඥ මුඛර්ජි ලුම්බිණියේ තමන් කළ ගවේෂණ වාර්තා ඉදිරිපත් කරමින් ක්‍රී.පූර්ව 249 දී අශෝක අධිරාජ්‍යයා ලුම්බිණියට සම්ප්‍රාප්තව පිහිටවූ සෙල්ලිපිය හැරෙන්නට සිද්ධාර්ථ කුමාර උපත තහවුරු කරන ඊට පූර්වයෙන් වූ පුරාවිද්‍යාත්මක සාධක කිසිවක් නොමැති බවට කර තිබූ ප්‍රකාශය මෙම නව සොයා ගැනීම් මඟින් බිඳ වැටිණි. සිදුහත් උපත නියත වශයෙන්ම ක්‍රි.පූර්ව 6 වැනි සියවසේ සිදුවූ බැව් නව කැණීම් මඟින් තහවුරු වේ.

ලී ගරාදි වැට මධ්‍යයේ පිහිටි වලක් හා එහි රෝපණය කර තිබූ වෘක්ෂයක දිරා ගිය කොටස් ද මෙම ගවේෂණාත්මක කැණීම් වලදී සොයා ගැනීමට හැකි විය. ඒ අනුව අනාවරණය කර ගනු ලැබූ නෂ්ඨාවශේෂ පුරාණ බෝධි ඝරයක් විය හැකි බව මහාචාර්ය කනිංහැම්ගේ මතයයි. සිදුහත් උපත හා සබැඳි සල් වෘක්ෂය මෙම බෝධි ඝරය තුළ බැතිමතුන්ගේ පුද පූජා වලට ලක් වෙමින් අනාදිමත් කාලයක් පවතින්නට ඇති බවට විශ්වාසය පළ කෙරේ. ඉන්දියාවේ සාංචි, අමරාවති, කැටයම් වලින් නිරූපිත බෝධිඝර මෙන්ම ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානියේ පිහිටි බෝධිඝර පිළිබඳව මහාචාර්ය කනිංහැම් මහතා තුළ පුළුල් අවබෝධයක් පැවති බව ප්‍රකාශ වේ. එතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ගවේෂණවලට සහභාගී වූ කාලයේ ලද අත්දැකීම් ඇසුරින් තත් අවබෝධය ලබාගත් බව සිතිය හැකි ය.

## ii. ඉපැරණි කපිලවස්තු පුරය, වත්මන් කපිලවස්තු පුරය යටින් මතුකර ගනී.

මහාචාර්ය කනිංහැම් ප්‍රධාන පුරාවිද්‍යා ගවේෂණ කණ්ඩායමේ මීළඟ අවධානය යොමු වූයේ ලුම්බිණියේ සිට කි.මී. 15 ක් දුරින් පිහිටි කපිලවස්තුපුර ආශ්‍රිත ප්‍රදේශයේ පුරාවිද්‍යා කැනීම් ආරම්භ කිරීම කෙරෙහිය. වර්තමානයේ තිලාරාකෝට් යනුවෙන් හඳුන්වන පැරණි කපිලවස්තු පුරය අතීතයේ පිහිටියේ පොළව මට්ටමට වඩා මීටර් ගණනාවක් පහතින් බව හෙළිවේ.

සිදුහත් කුමරුන්ගේ දිවියේ ළදරු, ළමා, යොවුන්, අවධි මෙන් ම පාරිසරික, සමාජයීය හා සංස්කෘතික විශේෂතා සහ එවකට පැවති ශිෂ්ටාචාරය පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීම, මෙම කැණීම් සිදු කිරීමේ මූලික අභිප්‍රාය විය.

දැනට අප දකින කපිලවස්තුපුරයේ මතුපිට ගොඩනැගිලි අයත්වන්නේ ක්‍රි.පූර්ව 3 වැනි සියවසට ය. එම ඉදිකිරීම් සිදුව ඇත්තේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු කාලයක දී ය.

සිද්ධාර්ථ උපත සිදු වූ ක්‍රි.පූර්ව 6 වැනි සියවසේ පැවති කපිලවස්තු පුරයට යටින් මීටර් 5 ක් පමණ පොළව අභ්‍යන්තරයට වන්නට පිහිටි බැව් නව කැණීම් වලින් අනාවරණය වී ඇත. දැනට විද්‍යාමාන වන කපිලවස්තු පුර නගර ආරක්ෂක ප්‍රාකාරය අයත් වන්නේ ද සිද්ධාර්ථ කුමාර උත්පත්තියෙන් ශතකයකට පමණ පසුව ඉදි කරන ලද්දක් බව ය. දැනට විද්‍යමාන ප්‍රාකාර බැම්ම ඔස්සේ පහළට කළ කැණීම් වලදී පොළවේ මීටර් 5 කට යටින් පැරණි ආරක්ෂක ප්‍රාකාරය පිහිටි බව නිරීක්ෂණය විය. එහිදී ප්‍රාකාර බැම්මෙහි වූ කණු සිටුවා තිබූ වලවල් 10 ක් හමුවූ බව ද වාර්තා වේ. මේ අනුව පුරාවිද්‍යාඥයින් උපකල්පනය කරනුයේ ලුම්බිණියෙහි දැවයෙන් නිමැවූ බෝධිඝරය මෙන්ම, නගරය වටා වූ ප්‍රාකාරය ද ශක්තිමත් දැව කණු භාවිතා කර ඉදිකරන්නට ඇති බවය. ඒවා ක්‍රි.පූර්ව 5 හෝ 6 වන සියවස් වල ඉදිකළ බවද තහවුරු වේ.

මහාචාර්ය කනිංහැම් ප්‍රධාන ගවේෂක කණ්ඩායම කැණීම් ආරම්භ කිරීමට පෙර අති නවීන තාක්ෂණ උපකරණ උපයෝගී කර ගෙන කපිලවස්තු පුර පොළෝ ගැබ අභ්‍යන්තරය සිතියම් ගත කර ගනු ලැබිණි. එහිදී ඔවුනට නගරයේ කි..මී. 5 ක් පොළව අභ්‍යන්තරයේ ක්‍රි. පූර්ව 6 වැනි සියවසේ පැවති කපිලවස්තු රාජධානියේ නගර සැලැස්ම නිවැරදිව අධ්‍යනය කිරීමට අවස්ථාව සැලසිනි.



සිදුහත් කුමරුන් මහා අභිනික්මණය කළ නගරාරක්ෂක ප්‍රාකාරයේ නැගෙනහිර දොරටුව වත්මන් ප්‍රාකාර බැම්මේ සිට මීටර 5 ක් පමණ පොළව යටට කැණීමේදී සොයා ගත හැකි වීය. මෙම කැණීම් වලදී 5 වැනි සියවසට අයත් වලං කැබලි, විවිධ වර්ණයෙන් යුත් බඳුන්වල කැබලි සහ වර්ණවත් පබලුද සොයා ගැනීමට හැකි විය. එවකට ගෘහ නිර්මාණ ශිල්පය දියුණුව පැවති බවද, කපිලවස්තු පුරය කේන්ද්‍ර කර ගත් විධිමත් මාර්ග පද්ධතියක් පැවති බවද පුරාවිද්‍යා ගවේෂණයන් ගෙන් හෙළි වී ඇත.

කපිලවස්තු නගරයෙන් පිටත ගවේෂණාත්මක කැනීම් කටයුතු ද කඩිනමින් ආරම්භ කිරීමට මහාචාර්ය කනිංහැම් මහතා විසින් සැලසුම් කර ඇති බව වාර්තා වේ. ධම්මහවා හී පිහිටි සුදොවුන් රජු හා මහමායා දේවිය ආදාහනය කළ ස්ථානය පැහැදිළි වශයෙන්ම අනාවරණය කර ගැනීමට කනිංහැම් සමත් විය. එහි ඉදිකර ඇති දාගැබ් දෙක හා කපිලවස්තුපුර දකුණු ද්වාරයට නුදුරින් පිහිටි නටඹුන් පිළිබඳව, නුදුරු අනාගතයේදී පුළුල් ගවේෂණයක් කිරීමට අපේක්ෂිතය.

සිදුහත් කුමාරයාගේ වියෝවින් කම්පනයට පත්ව මිය ගිය කන්ථක අශ්වයා සිහිපත් වීම පිණිස, ආරක්ෂක ප්‍රාකාරයේ නැගෙනහිර දොරටුවෙන් මීටර 100 ක් පමණ ඔබ්බෙන් ඉදි කළ ඉපැරණි චෛත්‍යයක් ද දැකිය හැකිය. ඉදිරි ගවේෂණ වලදී කන්ථක අසුගේ අස්ථි සොයා ගැනීමට හැකි වන බවටද ඔව්හු විශ්වාසය පළ කරති.

සිදුහත් කුමරුන් යශෝධරාවන් දිනා ගැනීම පිණිස දුනු ශිල්ප දැක්වූ අවස්ථාවේ ඔහු විසින් සිය දුන්නෙන් මුදා හල ප්‍රබල ඊතලය වැදීමෙන් පොළවෙහි කුහරයක් ඇති වූ ස්ථානය, වර්තමානයේ බොහෝ දෙනා සරකූප ළිඳ ලෙස හඳුන්වන ස්ථානය බවද නව ගවේෂණයන් මගින් නිසැක වශයෙන් අනාවරණය කරගෙන ඇත.

ඉදිරි ගවේෂණ වලදී පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ඉහත සඳහන් ස්ථාන පිළිබඳව අප්‍රකට, සත්‍ය තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට අවස්ථාව සැලසෙනු නිසැක.

## 28. කෙන්සෝ ටැන්ගේ ලුම්බිණිය සංවර්ධන සැලැස්ම


1970 වර්ෂයේදී, ලුම්බිණි සංරක්ෂණ, සංවර්ධන හා පරිපාලන කටයුතු විධිමත් කිරීම පිණිස, **'ලුම්බිණි සංවර්ධන ජාත්‍යන්තර කමිටුව** පිහිටවනු ලැබිණි. (I.C.D.L.) ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 16 ක් මෙම කමිටුවේ සාමාජිකත්වය දරති. 1978 වසරේදී **කෙන්සො ටැංගෝ** සැලසුම් කළ, ලුම්බිණි සංරක්ෂණ හා සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වූයේ මෙම කමිටුවේ අධීක්ෂණය යටතේය.

1961 සිට 1971 දක්වා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ලෙස කටයුතු කළ **බුරුම ජාතික යූ තාන්ට් මහතා 1967 වසරේදී ලුම්බිණියට සැපත් විය.** එම අවස්ථාවේ, ලුම්බිණිය එහි ඉපැරණි නෂ්ඨාවශේෂ සහ පිහිටීමට බාධාවක් නොවන පරිදි සංවර්ධනය කර, සංරක්ෂණය කර, මතු පරපුර උදෙසා පවත්වා ගෙන යාමෙහි වැදගත් කම කෙරෙහි, හෙතෙම ලොව විද්වතුන්ගේ අවධානය යොමු කළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලුම්බිණියට පැමිණි කෙන්සෝ ටැංගේ 1972 සිට 1978 දක්වා වසර හයක කාලයක් තුළ ලුම්බිණියෙහි ව.සැ. 25 ක් ප්‍රදේශයක් පුරා සමීක්ෂණය කර, ලුම්බිණිය සංරක්ෂණාත්මක සංවර්ධනය සඳහා වූ පුළුල්, මූලික සැලැස්මක් පිළියෙල කළේය.

කෙන්සො ටැංගෝ, ලුම්බිණි මූලික සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම ඇරඹියේ 1978 වසරේදී ය. එම සංවර්ධන සැලැස්මට අනුකූලව ලුම්බිණිය පූජා භූමිය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය ප්‍රධාන කලාප 3 කට වෙන් කරනු ලැබිණි.

i. ලුම්බිණි ග්‍රාමය
ii. ලුම්බිණි පූජනීය උද්‍යානය
iii. ආරාමික කලාපය

වශයෙන් එම කලාප 3 නම් කෙරිණි.






### i. නව ලුම්බිණි ග්‍රාමය

වර්ග සැතැක්ම 3 ක ප්‍රදේශයක් පුරා පැතිරී නව ලුම්බිණි ග්‍රාමය, ලුම්බිණිය වන්දනය සඳහා පැමිණෙන බැතිමතුන් පළමුවෙන් ම පිවිසෙන කලාපය සේ සැලකිය හැකි ය. බැතිමතුන්ට සහ සංචාරකයන්ට අවැසි සෑම යටිතල පහසුකමකින්ම මෙම ග්‍රාමය සමන්විත වේ. මෙහි සංචාරක හොටෙල්, ලුම්බිණි කෞතුකාගාරය, ලුම්බිණි ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය, යුතාන්ට් අනුස්මරණ ශ්‍රවණාගාරය, සංචාරක පරිපාලන මධ්‍යස්ථානය, සෞඛ්‍යය මධ්‍යස්ථානය, පොලීසිය සහ බැංකු ස්ථාපනය කර ඇත්තේ නව ලුම්බිණි ග්‍රාමයේ ය.

2014 නොවැම්බර් මස අග භාගයේ විවෘත වන ලුම්බිණි ශ්‍රී ලංකා වන්දනා නිකේතනයද පිහිටියේ නව ලුම්බිණි ග්‍රාමයේ ය.

### ii. ලුම්බිණි පූජනීය පුදබිම

තෙලර් ගංගාව අසබඩ පිහිටි පූජනීය උද්‍යානයටල, අශෝක ස්ථම්භය මැදි කරගෙන මායාදේවී ආරාමය, පුෂ්කරණි පොකුණ හා ඒ අවට පිහිටි නටඹුන් සහිත ප්‍රදේශය ඇතුළති. යුනෙස්කෝ ලෝක උරුමයට අයත් වන ඓතිහාසික ඉදිකිරීම් හා නටඹුන් පිහිටියේ මෙම කලාපයේය. මායා දේවි ආරම, සිදුහත් උපත නිරූපිත කැටයම් මුද්‍රාව, අශෝක ස්ථම්භය, සිදුහත් ජන්ම සංකේතය (Nativity) පුෂ්කරණීය පොකුණ, කුඩා දාගැබ් සමූහය හා නටඹුන් පිහිටියේ මෙම කලාපය තුළය.

නව සංවර්ධන සැලැස්මට අයත් යථෝක්ත කලාප තුන ම මීටර් 2 ක් පමණ පුළුල් වූ ඇල මාර්ගයකින් සම්බන්ධ කර ඇත. එන්ජින් රහිත නිහඬ යාත්‍රාවන් මගින් බැතිමතුන්ට නව ලුම්බිණි ග්‍රාමයේ සිට සෙසු කලාප සඳහා ඇළ මාර්ගය ඔස්සේ යාත්‍රා කිරීමට මෙහි පහසුකම් සලසා ඇත. ඇළ මාර්ගයට සමාන්තරව මගීන්ට ඇවිද යා හැකි ගල් ඇතිරූ මාවතක් ද සකසා තිබේ.

මෙම ඇළ මාර්ගය ආරම්භ වන ස්ථානයෙහි සිද්ධාර්ථ කුමරුන්ගේ ප්‍රතිමාවක් සහ පීඨිකාවක් මත පිහිටා ඇත. සෑම ප්‍රාර්ථනාව ද්විතික කෙරෙන වසර මුළුල්ලේ නොනිවී දැල්වෙන පහන ද දුටු දුටුවන්ගේ සිත් සතන් පහන් කරන සුළු ය.

## iii. ලුම්බිණි ආරාමික කලාපය

යුනෙස්කෝ ආයතනය මගින් ඓතිහාසික ලුම්බිණි පූද බිම කේන්ද්‍ර කර ගනිමින් ඒ හාත්පස පිහිටි භූමි භාගය විවිධ රටවල සංස්කෘතීන්ට අනුකූලව ආරාම ඉදිකිරීම පිණිස වෙන් කර දී ඇත.

ජාත්‍යන්තර වන්දනා කලාපයක් ලෙසින් සැලකෙන බිම් කැබලි 42 කින් යුත් මෙම කමණීය භූමි භාගය, වන සතුන්, සියොතුන් ගැවසී හරිත වන ගහණයක් මධ්‍යයේ පිහිටියේ ය. විවිධ රටවලින් පැමිණෙන වන්දනාකරුවන්ට, ඓතිහාසික ලුම්බිණි පූදබිමට පිවිසීමට පෙර තම රටට ආවේණික තමනට හුරු තමන්ගේ රට විසින් ඉදිකළ විහාරස්ථානයට ගොස් විවේක සුවය හා අධ්‍යාත්මික පාරිශුද්ධිය ලබාගැනීමට අවකාශ සැලසීම මෙවන් ආරාම කලාපයක් ස්ථාපනය කිරීමේ මූලික අරමුණ බැව් සැලකිය හැකි ය. මෙම ප්‍රදේශය හරහා ගලා බස්නා ප්‍රධාන ඇල මාර්ගයේ බටහිර දෙසට පැතිරුණු ආශ්‍රමික කලාපය මහායාන බෞද්ධ ආරාම 29 ක් සඳහා වෙන් කර ඇත. ඇළ මාර්ගයෙන් නැගෙනහිර දෙසට පැතිරුණු භූමි භාගය ථේරවාද බෞද්ධ ආරාම 13 ක් සඳහා වෙන් කර දී තිබේ. පහතින් දැක්වෙන්නේ ආරාමික කලාපය තුළ විවිධ රටවල සංස්කෘතියට අනුව දැනට ඉදිකර ඇති ආකර්ෂණීය විහාරස්ථාන පද්ධතියයි.

**බටහිර කලාපයේ පිහිටි මහායාන ආරාම**

චීන බෞද්ධ සංගමය
ජපාන සොක්යෝ සංවිධානය
වියට්නාමයේ පාට්ක්‍යුඕතු සංගමය
නේපාලයේ ධර්මෝදය සභ
ජර්මනියේ ඩුසොල්ඩොප් නාරා පදනම
ප්‍රංශයේ ලින් සොන් බෞද්ධ සංගමය
ඔස්ට්‍රියාවේ ගදන් ජාත්‍යන්තරය
නේපාලයේ චනංග් සංගමය
ඉන්දියාවේ ලඩාක් භාවනා මධ්‍යස්ථානය
මහජන කොරියා මහබෝධි සංගමය
කොරියාවේ ක්වාන් උම් සා විහාරය
නේපාලයේ කානයිං පෙඩ්රුප් ලිං ආරාමය
නේපාලයේ මෙන්ඩොල් ඩොග්නා ආරාමය
නේපාලයේ එක්සත් වෘන්ග්‍රම් බෞද්ධ පදනම
ප්‍රංශයේ ප්‍රංශ බෞද්ධ සංගමය
සිංගප්පූරුවේ අර්ජන් දෝජි බෞද්ධ මධ්‍යස්ථානය
නේපාලයේ සාම්ප්‍රදායික බෞද්ධ සංගමය
කැනඩාවේ වජ්‍ර විද්‍යා බෞද්ධ සංගමය

**නැගෙහිර කලාපයේ පිහිටි ථේරවාද ආරාම**

තායිලන්ත ආරාමය
බුරුම ආරාමය
ශ්‍රී ලංකා විහාරය
නේපාල ජාත්‍යන්තර භික්ෂුණී ආරාමය
ඉන්දීය මහබෝධි ආරාමය
කොරියන් මහබෝධි ආරාමය
කාම්බෝජ ආරාමය
කැනඩා ආරාමය
නේපාල ආරාමය.



ලුම්බිණි ජපන් සාම ප්‍රදීපය



සිත් සමාධිගතකරවන ශ්‍රී ලංකාරාම සෑරජු





ශ්‍රී ලංකාරාමය පිවිසුම් තොරණ



හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා ලුම්බිණි දුටුගැමුණු විශ්‍රාම ශාලාව සඳහා
මුල්ගල තැබීමට පෙර අවස්ථාවක පොල්තෙල් පහන දල්වමින්....

දහතුන්වන පරිච්ඡේදය

# ලුම්බිණිය ශ්‍රී ලංකා විහාරය ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය

## 29. ලුම්බිණි ශ්‍රී ලංකාරාමයේ හා විශ්‍රාම ශාලාවේ විකාශනය

### i. ලුම්බිණි සංවර්ධන කටයුතු ආරම්භය

අතිතය අනාගත පරපුරට හිමි කිරීම වත්මන් සමාජ දේශපාලන හා ආගමික නායකයින්ගේ එක් අසාහයක කාර්ය භාරයකි. එක් සුළු පියවරකින් අරඹන දිගු ගමන දූවැන්ත, යෝධ පියවරයන් රැසකින් අප අපූර්වත්වයෙන් නිමග්ග කරනු නිසැක. ඊට දායක වූ කවුරු හෝ වෙත්ද ඔවුහු එනිසා ම අනාගතයේ ජීවත් වන්නාහ. අනෙක් අතට අවසන් පියවර වූ කලී අවසන් නොවන පියවරකි. එහෙත් සමාජ සම්මතයට අනුව යෝධ පිම්මක් නිම කරන්නට පරපුර කිහිපයක් ම අවැසි වනු නියති. ඒ අයුරින් ලුම්බිණි සංවර්ධනය මෙදා, මතුදා, පරම්පරා තුනක අනුපමේය උදෙසා දායකත්වය හිමිවන අයුරු අප මනසින් දකිමු.

1988 වසරේදී එවකට ශ්‍රී ලංකා ජනාධිපති පදවිය හෙබ වූ ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතතුමාගේ මැදිහත් වීම මත, ඓතිහාසික ලුම්බිණි සිද්ධස්ථානය ආශ්‍රිතව ශ්‍රී ලංකාරාම විහාරය හා දුටුගැමුණු විශ්‍රාම ශාලාව ඉදි කිරීම පිණිස භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත බදු පදනම මත ලබාගැනීමේ අවස්ථාව උදා විය. මුලින් ම ආරම්භ වුයේ දුටු ගැමුණු විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් ය.

ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව මගින් මෙහි ඉදිකිරීම් කටයුතු වසර 06 ක් ඇතුළත සම්පූර්ණ කර 1992 දී නේපාල ලුම්බිණි සංවර්ධන



මණ්ඩලයට භාරදෙනු ලැබිණි. එම මණ්ඩලය විසින් නේපාල සමින්දාර් සමාගමට විශ්‍රාම ශාලාව දස අවුරුදු බද්දක් මත ලබාදෙන ලදි. එහෙත් කළමනාකරණ ගැටලු කිහිපයක් මතු වීම නිසා නොබෝ කලකින් එම ගිවිසුම අවලංගු කර විශ්‍රාම ශාලාව හූත් වෝල් හි රේන්බෝ හෝටලයට බදු දීමට සිදු විය. එම සමාගමේ පාලනය ද අසහනයක් වු හෙයින් 1994 වසරේ මැද භාගයේ දී එම බද්ද ද අවලංගු කිරීමට ලුම්බිණි සංවර්ධන මණ්ඩලය පියවර ගනු ලැබිණි. මෙවන් පරිපාලනමය ගැටලු නිසා දුටුගැමුණු විශ්‍රාම ශාලාව මෙන්ම ශ්‍රී ලංකාරාමය ද වල් බිහි ව වන්දනාකරුවන්ගේ මතකයෙන් ගිලිහී ගොස් තිබිණි.

1995 දී එවකට ජනාධිපති ධූරය හෙබවූ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ හා හිටපු බුද්ධ ශාසන අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ මැදිහත් වීම මත, අතර මඟ ඇනහිට තිබූ ශ්‍රී ලංකාරාමයේ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත පවරා ඉදි කිරීම් ආරම්භ කරනු ලැබිණි. විහාරය ඉදි කිරීමේ භූමි භාගය භූ කම්පන ප්‍රදේශයක පිහිටා තිබීම නිසා, ඉංජිනේරු සංස්ථාව භූ චලන වලට ඔරොත්තු දෙන පරිද්දෙන් ගොඩනැගිලි වල බෝධිඝරයේ හා චෛත්‍ය පාදම අධික පිරිවැයක් දරා ඉතා ශක්ති සම්පන්න ලෙස ඉදිකිරීමට පියවර ගත්තේ ය. 2005 වසර වන විට රුපියල් දසලක්ෂ 50 ක පමණ වියදමක් දරා මෙහි ඉදිකිරීම් වලින් කොටසක් නිම කිරීමට ඉංජිනේරු සංස්ථාව සමත් විය. අනතුරුව නේපාල ලුම්බිණි සංවර්ධන මණ්ඩලයෙහි අවධානය මෙන්ම ශ්‍රී ලංකා රජයේ මැදිහත් වීමද සිදු නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන් යළි ශ්‍රී ලංකාරාමයේ වල් බිහි වන්නට විය. දුටුගැමුණු විශ්‍රාම ශාලාවද ක්‍රමවත් කළමනාකරණ ක්‍රමවේදයක් නොවූයෙන් වසර ගණනාවක් වසා දමා තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ගොඩනැගිලි සංකීර්ණය ද කැඩී බිඳී ගොස් වන ගතව තිබිණි.



ගරු කතානායක තුමන් සධාතුක කරඬුව වැඩම වූ මොහාත, ගෞතම බුද්ධ ගුවන් තොටේදී...



ලුම්බිණි භාරයේ නිල මඩුල්ල කමිටු රැස්වීමකින් අනතුරුව

## ii. ලුම්බිණි ශ්‍රී ලංකාරාමය හා දුටුගැමුණු විශ්‍රාම නිකේතනයේ නවෝදය

ලුම්බිණිය ශ්‍රී ලංකාරාමය සංවර්ධනයට යළි මග සැලසුනේ 2006 වසරේ අහඹු සිදුවීමක් පාදක කරගෙන ය. සුවිසල් සමාජ මෙහෙවරක නිමග්න පුද්ගලයෙක් ලුම්බිණිය වැඳ පුදා ගැනීමට ගියේ ය. ලුම්බිණිය පුද බිම පැදකුණු කිරීමෙන් අනතුරුව සිය නවාතැන් පළ වෙත පියමන් කරමින් සිටි එම පිරිසට අමුතු, නුහුරු දසුනක් දැක ගන්නට ලැබිණි. ඒ කරත්තයක පිටිපස අසුන් ගෙන යමින් සිටි සිංහල භික්ෂූන් වහන්සේ නමකි. විදේශයක දී සිංහල භික්ෂූන් වහන්සේ නමක් මුණගැසීමෙන් සතුටට පත් පිරිස භික්ෂූන් වහන්සේගේ ආරාධනයෙන් උන්වහන්සේ වැඩ සිටි පන්සල වෙත පිය නැගූහ. පුද්ගලයා අනුරාධ වික්‍රමසිංහයන් ය. ස්වාමීන් වහන්සේ රඹුක්වැල්ලේ චන්දරත්න හිමියන් ය. පන්සල ලුම්බිණි පුදබිම ආශ්‍රිතව පිහිටි ශ්‍රී ලංකාරාමයයි. එම අවස්ථාව වන විට ශ්‍රී ලංකාරාම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඇනහිටිව තිබිණි. සංඝාවාසයේ අඩක් ඉදිකළ නිරාවරණ ගඩොල් බැමි පාසි බැඳී, වන ගහණයට යට වෙමින් පැවතිණි. ස්වාමීන් වහන්සේ ලැගුම් ගෙන සිටි කුටියෙහි ද අඩුපාඩු රැසක් විය.

අසන්නට ලැබුණු තොරතුරුත්, දැකගන්නට ලැබුණු දර්ශනයත් අනුරාධ වික්‍රමසිංහයන් තුළ දැඩි කම්පනයක් ඇති කළේ ය. හේ ලුම්බිණි ශ්‍රී ලංකාරාමයෙන් පිටත් වුයේ දැඩි අදිටනින් වෙළුණු මානසික තත්ත්වයකිනි. සිය රටට පැමිණි ඔහු එවකට ශ්‍රී ලංකා ජනාධිපති පදවිය හෙබවූ මහින්ද රාජපක්ෂ මැතිතුමා හමුවිය.

නේපාල ලුම්බිණි සංවර්ධන භාරය මඟින් ආරාමික කලාපයෙහි ඉඩම් බදු පදනම යටතේ ජපානය, කොරියාව, බුරුමය, ජර්මනිය, වැනි රටවල් ගණනාවකට ලබා දී ඇති බවත් එම රටවල් තම සංස්කෘතියට අනුකූලව විහාරස්ථාන ඉදිකර ඉතා දැකුම්කළු අන්දමින් පවත්වාගෙන යන බවත් ඔව්හු ජනාධිපතිතුමාට සැළ කර සිටියහ. එහෙත් එම පදනම යටතේ ශ්‍රී ලංකාව බඳු පදනම මත ලබාගත් භූමිභාගයෙහි 1998 දී ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව මඟින් ආරම්භ කළ ශ්‍රී ලංකාරාමය ඉදිකිරීමේ කටයුතු අතරමඟ අත්හිටුවා ඇති බව ද, ඔව්හු ජනාධිපතිතුමාට පෙන්වා දුන්හ. සෙසු රටවල් තමනට වෙන් කර ගත් ලුම්බිණි ආරාමික කලාපයෙහි භූමිභාගයක් අගනා අලංකාරවත් ලෙස විහාර අරාම ඉදිකර තිබියදී ශ්‍රී ලංකාවට වෙන් කර ගත් භූමිභාගයෙහි වූ ශ්‍රී ලංකා ආරාම ඉදිකිරීම් නිම කළ ද, වල්බිහි වී තිබීමේ පුවත ඇසූ ශ්‍රී ලංකා ජනපතිදුන්ද මහත් කම්පාවට පත්වී අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට නොපැකිලිව ඉදිරිපත් විය.



## iii. ගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාව

එවකට හිටපු අතිගරු ජනාධිපතිතුමා විසින් මේ සඳහා චමල් රාජපක්ෂ මැතිතුමාගේ සභාපතීත්වයෙන් යුත් ලුම්බිණි ශ්‍රී ලංකාරාම විහාර සංවර්ධන අරමුදලක් පිහිටවූයේ ය. එම අරමුදලේ සෙසු සාමාජිකයන් වුයේ එස්.ඩී. පතිරණ, කරුණාසේන හෙට්ටිආරච්චි, අනුරාධ වික්‍රමසිංහ, ජී. පියසේන, ලක්ෂ්මන් නිරෝධවර්ධන යන මහතුන්ය.

ශ්‍රී ලංකා ලුම්බිණි සංවර්ධන භාරකාර අරමුදලේ සාමාජිකයන්ගේ දැඩි කැපවීම නිසා 2009 පෙබරවාරි 25 දින මෙහි ඉදිකිරීම් වැඩ ආරම්භ කැරිණි. 2009 මැයි 25 වන විට මාස හතරක කාලයක් තුළ ඉතිරි වැඩවලින් වැඩි ප්‍රමාණයක් අවසන් කිරීමට හැකි විය. 2009 වසරේ මැයි 5 දින වෙසක් උත්සවය නිමිති කර ගෙන ලුම්බිණි ශ්‍රී ලංකා මහා විහාරස්ථාන තුළ පිංකම් මාලාවක් සංවිධානය කරනු ලැබිණි.

01. ශ්‍රී ලංකා මහා විහාරයට සර්වඥ ධාතූන් වහන්සේ නමක් වැඩමවීම.
02. සිද්ධාර්ථ කුමාරයාගේ ප්‍රතිමාවක් විවෘත කිරීම.
03. අති පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමිපාණන්ගේ උපාධ්‍යාත්වයෙන් නේපාල ජාතික ශාක්‍ය වංශික කුල දරුවන් 07 දෙනෙක් සසුන් ගත කිරීම.
04. ප්‍රවීන චිත්‍ර ශිල්පි ජයසිරි සේමගේ මහතා විසින් ජීවමාන ලෙසින් චිත්‍රණය කළ සිද්ධාර්ථ කුමාර උත්පත්තිය හා සබැඳි සිද්ධීන් ඇතුළත් විහාර ගෙය විවෘත කිරීම.

2011 වසර වන විට සර්වඥ ධාතු තැන්පත් අභිනව චෛත්‍ය රාජයානන් ඉදිකිරීම, තුන් මහල් භාවනා මධ්‍යස්ථානයක් හා පුස්තකාලයක් ඉදිකිරීම ආදී කටයුතුද අවසන් කරනු ලැබිණි.

අනතුරුව ප්‍රවේශ ස්ථානයෙහි බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයට අනුව මකර තොරනක් හා විහාර පරිශ්‍රයෙහි නෙළුම් විලක් සහ අලංකෘත උද්‍යායක් ද සකස් කැරණි.

මෙතෙක් ශ්‍රී ලංකාරාමය ඇතුළු ථේරවාද ආගමික සිද්ධස්ථාන වෙත යැම සඳහා බැතිමතුනට විශාල දුරක් පා ගමනින් යා යුතු විය.

කෙටි මගක් ඔස්සේ ඔවුනගේ ගමන පහසු කිරීම පිණිස තෙලර් නදිය හරහා නව පාලමක්ද ඉදිකරනු ලැබිණි. මෙම නව පාලම හා එහි සිට ශ්‍රී ලංකාරාම විහාරස්ථානයට විහිදී දුෂ්කර මාර්ගය ගල් අතුරා කාපට් කිරීම පිණිස ශ්‍රී ලංකා රජය ලුම්බිණි භාරය රුපියල් දසලක්ෂ 80 ක පමණ පිරිවැයක් දරනු ලැබිණි. ශ්‍රී ලංකාරාමයේ ඉදිකිරීම් සඳහා වර්ෂ 2013 දෙසැ. වන විට මිලියන රු. දසලක්ෂ 90ක් වැය කර තිබේ.

## iv. සමාධිය තුළ ගන්වන ශ්‍රී ලංකාරාමයේ සැලසුම...

මෙම අරම සැලසුම් කර ඇත්තේ ඉතා සියුම් අන්දමින් බෞද්ධ දර්ශනය සංකේතවත් වන පරිද්දෙනි. ඒ තුළින් සැදැහැවතුන්ගේ සිත්සතන්හි බෞද්ධ දර්ශනයේ මූලික ඉගැන්වීම් ද්වය එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය හා පටිච්ච සමුප්පාද ධර්මය තුළ ගැන්වීම අපේක්ෂිතය. භාවනා මධ්‍යස්ථානයක් වශයෙන් සැලසුම් කර ඇති භූමිභාගය බුදු දහම ප්‍රගුණ කිරීමට හා ප්‍රායෝගිකව පුහුණු කිරීම (ප්‍රතිපත්ති පූජා) සඳහා වන අතර, අනෙක් භූමිභාගය ස්ථූපයක් හා සංඝාවාසයක් සඳහා මෙන්ම තෙරුවන් වන්දනා කිරීම (ආමිස පූජා) පිණිස සැලසුම් කර ඇත. මෙමඟින් වන්දනා කරුවන්ට, භාවනායෝගීන්ට හා විද්‍යාර්ථීන්ට ඉමහත් සෙතක් සැලසෙනු ඇත.

තිත් බුබුලක් සේ අහස් ගනිමින් මේ මහ දෙරණ තලයේ මහ සෑ ඉදිවෙත්දී හැම හදවතක්ම මහ වෙහෙරක් කළ සිහල බුදුනුවන් දඹදිව බුද්ධ භූමියේ නැංවූ ලුම්බිණි සාලවන යොදුන් දුර කළ ශ්‍රී ලංකාරාමය ගොඩනැගූ හුදු මහත් නුවන් රැස් ගෙන එමින් ඔබ ද එහිලා සහභාගි කරගනු රිසියෙමි.



ශ්‍රී ලංකාරාමයට පිවිසෙන,
තෙලර් නදිය හරහා ඉදිකළ පාලම





සිරිලක් අරමේ මෙත්සිලිලාර



**භාවනා මධ්‍යස්ථානය :-**



උතුරේ පිහිටි උද්‍යාන සංචිතයේ සිට මීටර් 4 ක් පළල පිවිසුම් මාවතක් ඔස්සේ මෙම භූමිභාගයට ළඟා විය හැකි ය. ජනප්‍රවාදගත දෙවිවරුන්ගේ රූපවලින් හා සාම්ප්‍රදායික ආරුක්කු සහිත දොරටුවකින් යුත් මකර තොරණක් ඔස්සේ දකුණු දෙසට නැඹුරු වූ මාවතෙන් වන්දනාකරුවන් මෙම සංකීර්ණයට පිවිසිය හැකිය. මකර තොරණේ දෙපැත්තේ අලංකාර සිංහ කණු ද්වයකි. ඒ එක් එක් කණු මුදුනෙහි සිංහයින් තිදෙනෙක් නිර්මාණය කර ඇත. ආරුක්කු සහිත පිවිසුම් දොරටුවේ ඇති පියගැට පෙළ් මඟින්, මධ්‍යයෙහි පරාවර්තන තටාකයකින් (Reflecting pond) ද, සිදුහත් කුමරුගේ උපත සිහිගන්වන සල් උයන සංකේතවත් කරමින් දෙපස පිහිටි සල්ගස් දෙකකින් ද යුත්, භාවනා මධ්‍යස්ථානයේ පහතින් ම පිහිටි බිම්කඩට වන්දනාකරුවන් යොමු කැරේ. මහපොළව දෙබෑ වී මතු වූ පියුම් මත්තෙහි පියවර සතක් තබා, "අග්ගෝ හමස්මි ලෝකස්ස....." යන ශ්‍රේෂ්ඨ ප්‍රකාශය කරනු ලබන සිදුහත් කුමරුගේ ප්‍රතිමාවක් පරාවර්තන තටාකය පසුපස කුඩා වේදිකාවක් මත ස්ථානගත කර ඇත. සත්වැනි පියුම මත වැඩ සිටින සිදුහත් කුමරුවනුන්, කිරිගරුඬ පාෂාණයක් මත කුමරුවන්ගේ ප්‍රකාශය කොටා ඇති අයුරුත් චිත්‍ර මඟින් සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය පසුබිමේ දැක්වෙන අයුරුත් වන්දනාකරුවන්ට දැකගත හැක. සිද්ධාර්ථ මණ්ඩපය නමින් යුත් සාම්ප්‍රදායික ද්විපථ වහළකින් සැරසුණු කුළුණු පෙළින් යුත් විවෘත මණ්ඩපයක් මඟින් කුඩා වේදිකාවට ආවරණය සලසයි.

භාවනා මධ්‍යස්ථානයේ ප්‍රමුඛ ලක්ෂණය වන්නේ බෝධීන් වහන්සේ සෙවනෙහි සමාධි මුද්‍රාවෙන් වැඩ සිටින බුදුන් වහන්සේයි. බෝධි වෘක්ෂය පහත් ම පොළෝ මට්ටමේ සිට අඩි 30 ක් පමණ උසින් පිහිටුවා ඇති අතර, ප්‍රවේශ මාර්ගය වන ආරුක්කුව සහිත දොරටුවෙන් ඇතුළු වන බැතිමතෙකුට එකම මොහොතක ක්ෂණික ව සිදුහත් කුමරුගේ සහ බුදුන් වහන්සේගේ ප්‍රතිමා දර්ශනය වන අන්දමේ උස ප්‍රමාණයකින් සමාධි බුදු පිළිමය උන්නතාංශයකින් ද පිහිටුවා ඇත.

තමන් වඩ වඩා ළං වන විට, සිද්ධාර්ථ මණ්ඩපය පිටුපසින් පිහිටි උන්නතාංශයේ කේන්ද්‍රයට උපස්තම්භක වූ උස් පනා බැම්ම

හේතු කාට ගෙන බුදුන් වහන්සේගේ ප්‍රතිමාව දෘශ්‍ය පථයෙන් ක්‍රමයෙන් නොපෙනී යන අයුරු දකින සැදැහැවතතුන් මහත් කුහුලට පත්වනු නිසැක. බුදුන් වහන්සේගේ ප්‍රතිමාව නැවත දැකගැනීමට නම් සිද්ධාර්ථ මණ්ඩපයේ දෙපසින් සමමිතිකව පිහිටි, සිදුහත් කුමරු බුද්ධත්වය ලබා ගැනීම සඳහා අනුගමනය කළ ආර්ය අෂ්ටාංගක මාර්ගය සංකේතවත් කරන ඉණී මං පෙළ ඔස්සේ වන්දනාකරුවන් ඉදිරියට යා යුතුය. සෑම තරප්පු පේළියක්ම කෙළවර වන ස්ථානයෙහි ගරාදි වැට අසළ, අලංකාර කරන ලද බිත්තිවල අභිලේඛන කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඒ ඒ පියවර මඟින් බුදුන් වහන්සේ වැඳපුදා ගැනීමට තමන් මෙම ආර්ය මාර්ගයේ පිය නඟන බැව් තමන්ට හැඟීයන බවක් පඩිපෙළ නැග යන අවස්ථාවේ සැදැහැවතතුන්ට වැටහෙනුයේ නිරායාසයෙනි. සම්මා සමාධි යන්න සටහන් කරන ලද අටවැනි පියවරේදී බෝධීන් වහන්සේගේ සෙවනෙහි තමා ඉදිරියෙහි එක එල්ලේ ම සමාධි මුද්‍රාවෙන් වැඩ සිටින බුදුන් වහන්සේ සැදැහැවතුන්ට දිස්වනු ඇත.

මීළඟට සැදැහැතියා සිටිනුයේ භාවනානුයෝගීව සිටීම සඳහා සැලසුම් කරන ලද අර්ධ කවාකාර හා විවෘත වූත් කුළුණු පෙළින් යුත් බෝධිඝරයක් සහිත ඉඩකඩ ඇති භූමි ප්‍රදේශයක ය. බෝධීන් වහන්සේ පිහිටියේ ද ඒ ආසන්නයෙහි ය. සංකීර්ණයේ උස ම මට්ටම වෙත දිවෙන පටු පියගැට පෙළකි. තුරු සෙවනෙහි ගඩොල් ඇතිරූ වේදිකා සහිත අර්ධ කවාකාර වූ පහත් මට්ටමේ පිහිටි බිම් පෙදෙස් දෙකක් ද භාවනානුයෝගීන් වෙනුවෙන් සකස්කර ඇත. සෑම බිම්කඩක්ම පහසු සෝපාන පංක්ති මඟින් එකිනෙකට සම්බන්ධ කර ඇත. භාවනා මධ්‍යස්ථානයට මණ්ඩපයක් සහිත පසුපස දොරටුවක්ද ඇත. මෙම මණ්ඩපය හරහා ප්‍රවේශ වන සැදැහැතියන්ට ගල් ඇතිරූ මාර්ගයක් ඔස්සේ දොරටුව කරා ළඟා විය හැකිය.



**ශ්‍රී ලංකාරාමයේ පැවිදි කළ ශාක්‍ය සාමණේර මෙහෙනවර ආගමික වතාවතෙහි...**



ලුම්බිණිය වැඳ පුදා ගැනීම පිණිස සපැමිණෙන ශ්‍රී ලාංකීක වන්දනාකරුවන්ට ඓතිහාසික පුදබිමට පිවිසීමට පෙර තෙලර් ගංගාවේ නව පාලම පියමන් කර ශ්‍රී ලංකාරාමය වෙත ළඟා වීමේ භාග්‍ය උදා වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාරාමයෙහි ප්‍රධාන ශාලාවේ හා උද්‍යානයෙහි රැඳී ගමන් විඩාව දුරු කර ගෙන, විහාරස්ථානයෙහි නේවාසික භික්ෂූන් වහන්සේලාගෙන් අවැසි උපදෙස් ද ලබා ගෙන සිදුහත් උපත සිදුවූ ඒ ඓතිහාසික මායා දේවි පාසල වෙත සමීප වීමේ අවස්ථාවේ උදාවේ. මීට අමතරව වන්දනා කරුවනට ශ්‍රී ලංකාරාමයෙහි ආගමික වතාවත් ඉටු කිරීමටත්, එහි ස්ථාපිත සදහම් පුස්ථකාලය පරිශීලනය කිරීමටත් අවස්ථාව හිමිවේ.

වන්දනා නඩ සමඟ පැමිණෙන භික්ෂූන් වහන්සේලාට විවේක ගැනීම පිණිස මෙම විහාරස්ථානයෙහි අවශ්‍ය ලැගුම් පහසුකම් ද සලසා ඇත.



**ශ්‍රී ලංකාරාමය**

## v. ලුම්බිණි ශ්‍රී ලංකා වන්දනා නිකේතනය

අති දුෂ්කර ගමන් මඟක් ගෙවා ලුම්බිණියට සැපත් වන වන්දනා කරුවන් ප්‍රධාන වශයෙන් මුහුණපාන ප්‍රශ්නයක් වනුයේ නවාතැන් පහසුකම් සලසා ගැනීමයි. ලුම්බිණි පුදබිම ආසන්නයෙහි හෝටල් රාශියක් පැවතිය ද ඒවායෙහි ඉහළ මිල ගණන් දැරීමට වන්දනාකරුවන් ගෙන් වැඩි පිරිසකට හැකියාවක් නොමැත. මෙම ගැටලුව හඳුනාගත් ලුම්බිණි භාරය මගින් වන්දනාකරුවන්ට නවාතැන් පහසුකම් සැලසීම පිණිස කලින් ගරා වැටී පැවති දුටුගැමුණු විශ්‍රාම ශාලාව මේ වන විට මුළුමුණින් ම පිළිසකර කර අවසන් කර ඇත. සුවපහසු කාමර 40 කින් සමන්විත මෙම විශ්‍රාම ශාලාව සුවිසල් හෝටලයක සිරි උසුලයි. වායු සමීකරණ කළ සියළු පහසුකම් වලින් සමන්විත කාමර, වන්දනා නඩ සඳහා පුළුල් ශාලා පහසුකම්, අංග සම්පූර්ණ මුළුතැන් ගෙය, ආපන ශාලා හා සදහම් පුස්තකාලයකින් ද නව ලුම්බිණි ශ්‍රී ලංකා වන්දනා නිකේතනය සමන්විත ය.

වල් බිහිව පැවති පැරණි දුටුගැමුණු විශ්‍රාම ශාලාව







ශ්‍රී ලංකා වන්දනා නිකේතනය



## 30. ශ්‍රී ලංකා සමාජ සංවර්ධනය පිළිබඳ භික්ෂු පුහුණු ආයතනය

ලුම්බිණි සංවර්ධන භාරය යටතේ භික්ෂූන් වහන්සේලාගේ සමාජයීය කාර්ය භාරය හා අද්‍යතන ශ්‍රී ලාංකීය සමාජය තුළ භික්ෂුවකගේ භූමිකාව සංවර්ධනය කිරීමේ හා නිවැරදි දෘෂ්ටියකින් යුතුව සමාජගත කිරීමේ ජාතික අවශ්‍යතාවය සපුරා ගැනීම, මෙවන් ආයතනයක් ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වේ.

පුරාතන ශ්‍රී ලංකාවේ ඓතිහාසික හෝ සමාජමය හෝ ගැටලු හා ගැටුම්වලදී ද සංකල්පනාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලදී ද භික්ෂූන් වහන්සේගේ කාර්ය භාරය පුළුල් ලෙස "සමාජ අර්ථචර්යාවන් හා බැඳී පවතී. විජාතික ආක්‍රමණ, ආගම විරෝධි ක්‍රියා, දේශීය භාෂා පරිහානිය, සාරධර්ම පිරිහීම, සංස්කෘතික පරිහානිය, සාමය බිඳවැටීම, සමාජාර්ථික සංවර්ධනය යනාදි සමාජමය ගැටලුවල දී අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ හැකි මනා පෞරුෂයකින් යුත් භික්ෂුවක් මෙම ආයතනයෙන් බිහි කිරීමට අපේක්ෂිතය.

ථෙරවාදී සුපසන් භික්ෂුවක් ලෙස ශ්‍රී ලාංකේය භික්ෂු පෞරුෂය දැනුමෙන් සන්නද්ධව ලෝකය වෙත ගෙන යාමත්, මෙම ආයතනය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කැරේ.

බෞද්ධ මනෝවිද්‍යාවේ මූලධර්ම, මූලිකාංග සහ නව ලොවට ගැලපෙන සමාජ වැඩ පිළිබඳ අනුශාංගික වු සියලු විෂයන් ද මෙම ආයතනය මගින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙත ලබාදීමට සැළසුම් කර ඇත. පාඨමාලාව අවසානයේ ජපානයේ "Japan Collage of Social Works" විශ්වවිද්‍යාලයේ අනුමැතිය හා අධීක්ෂණය මත ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති "සමාජ අර්ථචර්යාව පිළිබඳ සමාජෝපාධ්‍යය" නම් සහතිකය පිරිනැමෙනු ඇත.

සහතිකපත්‍ර පාඨමාලාවේ සිට උපාධි පාඨමාලාව දක්වා අදියරෙන් අදියර කුසලතා පදනම් කරගත් අධ්‍යයන ක්‍රමවේදයක් මෙහි ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

සහතික පත්‍ර ඩිප්ලෝමා පාඨමාලාවක් හා අනතුරුව උපාධිය දක්වා පියවර තුනකින් සමන්විත අධ්‍යයන වැඩපිළිවෙලක් ලෙස මෙය ක්‍රියාත්මක වේ.

මෙහි ආයතනය උපසපන් හා සාමණේර භික්ෂූන් වහන්සේලාට පමණක් සීමාවේ. උන්වහන්සේලාට සිය හැකියාව හා

අධ්‍යාපන සුදුසුකම් මත අදියරෙන් අදියර ඩිප්ලෝමා උපාධි සුදුසුකම් සපුරා ගැනීමට අවකාශය සලසා දීමත් සිදු කෙරෙන අතර ආයතනයෙහි ශාස්ත්‍රෝද්ග්‍රහණයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේලා අනිවාර්ය ප්‍රායෝගික ක්‍රියාවලියකට යොමු කෙරෙන අතර තවද ප්‍රායෝගික අදියර සම්පූර්ණ කිරීමට අපොහොසත් වන්න්නට අධ්‍යාපනික හිමිකම අහිමි වේ.

යථෝක්ත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා උපාය මාර්ග කිහිපයක් දියත් කිරීමට නියමිතය. ප්‍රායෝගික කාලසීමාවන්හිදී ආයතනය මගින් ලබාදෙන වැඩසටහනක හෝ ව්‍යාපෘතියක පර්යේෂණ කාර්යයන් හි නිරතවීම මෙම එක් උපාය මාර්ගයකි.

වෘත්තීය හා ප්‍රායෝගික ගැටලු අවමකර ගැනීම සඳහා මහා සංඝරත්නය සමඟ සාකච්ඡා කර නිර්දේශ ලබා ගැනීම, කලින් කලට හඳුනාගන්නා ආයතනික අවශ්‍යතා අනුව පාඨමාලා නවීකරණය කිරීම හා අභ්‍යන්තර පාලන උපායමාර්ග යෙදීම ද සිදු කිරීමට අපේක්ෂිතය.



ලුම්බිණි භික්ෂු පුහුණු ආයතනය

රාජ්‍ය සහයෝගීතාවය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාව මේ සඳහා නිබඳව ලබා ගැනීමට නියමිතය.

බෞද්ධ සමාජ උපාධ්‍යාය පිළිබඳ, වාර්ෂික ඩිප්ලෝමා පාඨමාලාව විෂයයන් 10කින් සමන්විතය.



- DSW 01 - සමාජ අර්ථ චර්යාව හැඳින්වීම.
- DSW 02 - බෞද්ධ සමාජ දර්ශනය, ඓතිහාසික සාරධර්ම පද්ධතිය සහ විවිධත්වය
- DSW 03 - මානව චර්යාව, (උපදේශනයේ මනෝවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අංශයන්)
- DSW 04 - සමකාලීන සමාජය
- DSW 05 - සමාජ ප්‍රතිපත්ති, සමාජ සංවර්ධනය සහ සමාජ සම්පත්
- DSW 06 - සමාජ අර්ථචර්යාව පිළිබඳ පර්යේෂණ ක්‍රමවේදය
- DSW 07 - ව්‍යාපෘති කළමනාකරණය, සැලසුම්කරණය, පසු විපරම සහ අගය කිරීම.
- DSW 08 - සමාජ අර්ථචර්යාව පිළිබඳ ස්වදේශීය සහ ජාත්‍යන්තර එළඹුම්
- DSW 09 - සමාජ අර්ථචර්යාව භාවිතය, පුද්ගලයා, පවුල සහ සමූහ
- DSW 10 - භාෂාව, සන්නිවේදනය සහ පරිගණක සාක්ෂරතාව

මීට අමතරව සමාජ අර්ථචර්යා ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වස් තුන් මාසය තුළදී ස්වකීය පන්සල ආශ්‍රිත ගැමියන්ගේ සමාජ, ආර්ථික ගැටලු විසඳීමට යෝග්‍ය පැවරුම් නිබන්ධනයක් අධ්‍යාපන අධිකාරියට භාරදීමෙන් ඩිප්ලෝමාව ලැබීමට සුදුස්සෝ වෙති.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සහ 14(1) වැනි වගන්ති මගින් පවරා දී ඇති සියලු ම ආගම් සඳහා වන අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් 9 වැනි ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම උදෙසා යෝග්‍ය වැසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම යන ඡේදය ප්‍රකාරව මෙම ආයතනය

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ කොටසක් ලෙස එහි අනුදැනුම හා එකඟතාවය සහිතව පිහිටුවා ඇත. තවද ශ්‍රී ලංකා ලුම්බිණි සංවර්ධන භාරය පිහිටුවීමේ පනත ප්‍රකාරව

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිදු වූ නේපාලයේ ලුම්බිණි නුවර සාලවනෝද්‍යානය පාදක කොට ගෙන කපිල වස්තු, දෙව්දහ, රාම්ග්‍රාම් ආශ්‍රිතව ලුම්බිණි සංවර්ධන ව්‍යාපෘතියට සමාන්තරව ථේරවාදී, බෞද්ධ ධර්මායතනයක් පිහිටුවා නේපාලය සහ තදාසන්න රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය දියුණු කිරීම මෙන් ම භික්ෂූන් වහන්සේ පුහුණු කිරීම, භික්ෂූන් වහන්සේ ධර්ම ප්‍රචාරය සඳහා යොමු කිරීම සහ භික්ෂූන් වහන්සේලා නේපාලයේ සමාජ සංවර්ධනය සඳහා යොමුකිරීමට ද අපේක්ෂිතය.

(ආ) ශ්‍රී ලංකා රජය මගින් ලුම්බිණි නුවර පිහිටා ඇති "ශ්‍රී ලංකා විශ්‍රාම නිකේතනය" මනා කළමනාකරණයකින් පවත්වා ගෙන යාම, ඒ ආශ්‍රිතව උපදවා ගන්නා මූල්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකාරාමය ඇතුළු ථේරවාදී බෞද්ධ ධර්මායතන පවත්වා ගෙන යාම, ථේරවාදී විහාරාරාම දියුණු කිරීම යන උත්තරීතර අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය නීතිමය බලය මෙමගින් භික්ෂු පුහුණු ආයතනයට ලබාදී ඇත.

## ජාත්‍යන්තර සම්බන්ධතා

ලෝකයේ බෞද්ධ රටවල් 20 ක් පමණ පවතින අතර එම රටවල් සමඟ ඍජු අධ්‍යයන සම්බන්ධතා පැවැත්වීමටත්, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා හුවමාරු කර ගැනීමටත් අවශ්‍ය ක්‍රමවේද ඉදිරියේදී සැකසීමට ද අපේක්ෂිතය.

## දිස්ත්‍රික් සම්බන්ධීකරණය

ආයතනීය අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණය සඳහා ස්වාමීන් වහන්සේලා තෝරා ගැනීම හා උන්වහන්සේලා මේ පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා දිවයිනේ පළාත් මට්ටමින් වැඩමුළු සංවිධානය කිරීමට ද සැළසුම් කර ඇත.

සිද්ධාර්ථ කුමාර උත්පත්තිය සිදු වූ අසිරිමත් ලුම්බිණි පුද බිම කේන්ද්‍ර කර ගනිමින්, ශ්‍රී ලංකාවේ ඇරඹෙන මෙම භික්ෂු පුහුණු ආයතනය, මතු නිර්මල බුදු දහම ලොව පුරා පැතිරවීමේ ප්‍රධානතම මධ්‍යස්ථානය වනු නිසැක. මෙම ආයතනයෙහි ප්‍රධාන කාර්යාලය කොළඹ බුද්ධ ශාසන අමාත්‍යාංශය පිහිටි ගොඩනැගිල්ලෙහි ස්ථාපිතය.





ලුම්බිණි ශ්‍රී ලංකා විශ්‍රාම නිකේතනය

## දහහතර වන පරිච්ඡේදය

# සමාප්තිය

## 31. නව ඇරඹුමක සටහනක්

වෙහෙරක් නැති බිම වෙහෙරක් ඉදි කිරීම ආදි සිංහල බෞද්ධ සම්ප්‍රදාය විය. නේපාලයේ ලුම්බිණියේ ශ්‍රී ලංකාරාමය එවන් වෙහෙර ඉදිකිරීමකි. එකී වෑයමට ශ්‍රී ලංකා රජය උර දුන්නේ ඉතිහාසයට එකතුවීම සඳහා නොවේ. හැම බුදුනු හදක්ම වෙහෙරක් කොට ඊට නමස්කාර කිරීමට අවකාශ සලසාලීම ලක් රජයේ යුතුමකමක් කොට ගත් බැවිනි. හැම හදවතක් ම වෙහෙරක් වී පිවිතුරු වන විට නිවී පහන් වී ළය සැනහෙනු නිසැක.

සමුද්‍ර ගුප්ත රජුගේ කාලයේදී ලක්දිව ශීලා මේඝ වණ්න රජු සිහසුන දැරූ බවත්, එතුමා (කිත්සිරි මෙවන් රජු) සමුද්‍ර ගුප්ත රජු හා සංවාදයකින් පසු බුද්ධගයාවේ සිංහල වන්දනාකරුවන් උදෙසා විහාරයක් තැනූ බවත් චීන වාර්තා වලින් දිස්වේ. දළදා පුවත හා සබැඳෙන කිත්සිරි මෙවන් රජු මෙතුමා ම බව රාජාවලියට අනුව ද කිව හැකි ය. මේ බව සමුද්‍ර ගුප්තගේ අලහබාද් ප්‍රශස්තියෙහි ද සඳහනි. මහාවංශය ඊට සාක්ෂි දරයි. ඉන්දියාවට හා නේපාලයට බුද්ධ වන්දනාව සඳහා වන්දනාකරුවන් යෑම මෑතක දී ආරම්භ වූවක් නොවන බව ඉන් පැනේ.  ඒ පිළිබඳව ගවේෂණයක් කළ යුතු අතර, ලුම්බිණි සාලවනයේ ශ්‍රී ලංකාරාමය අපේ කාලයේ වෘතාන්තයකි.

නිසැකව ම භාරතය බුද්ධ භූමි වන අතර ශ්‍රී ලංකාව ධර්ම භූමි වෙයි. ඒ වූ කලී ඓතිහාසික සත්‍යයකි. එහෙයින් ම ඒ සත්‍යය අතීතයට වඩා අද්‍යතනයේ සක්‍රීය කිරීමේ වගකීම ද වත්මන් පරපුරට පැවරී ඇත. ඒ කෙසේ ද යත්, දුරාතීතයේ දී භාරත මහ රාජ අශෝක මහාධිරාජ්‍යයා



විසින් ඉටු කරන ලද දේශාන්තර සදහම් ව්‍යාප්තික දූවැන්ත මෙහෙවර ඊටත් වඩා පුළුල් ලෙසින් ශ්‍රී ලංකාව විසින් කළ යුතු වන බැවිනි. මන්ද? අශෝකයන් බුදුනු සදහම් සිය පුත් අනුබුදු මිහිඳු හිමියන් මගින් අපට ලබාදුන් නිසා ම නොවේ. සිදුහතුන් බිහි වූ සාල වනය එතුමන් විසින් ලොවට විවෘත කරන ලද නිසා ම ද නොවේ. යළිත් එම මහ පින් බිම, මහ පුදබිම ලොවට විවර කර දීමට අප රට ගත් මහා ප්‍රයාමය නිසා ද වෙයි.

අපට බුදු සමය ලබා දුන් භාරත මහා දේශයට, අද බුදු දහම මතක් කර දීමට අපට සිදුවීම දෛවමය භාග්‍යයකි. එතැන් පටන් කොට ලුම්බිණියේ ශ්‍රී ලංකා මහ වෙහෙරේ සිට සමස්ත ලොකයට ම බුදු සමය දායාද කිරීමට අප වෙහෙසිම වැදගති, මන්ද? වත්මන් ලෝකය අන්ත කාම සුඛල්ලිකානු යෝගයෙන් සන්තර්පණය වෙමින්, සම්පත් සූරා ගැනීම සඳහා බලයෙන් මුසපත්ව, ගෝලීය ආධිපත්‍යය තමන් වෙත ම පවරා ගැනීමට යුද්ධය ඇතුළු විවිධාකාරිය ක්‍රමෝපයන් හි නිමග්නව කටයුතු කරන හෙයිනි. විටෙක සාමය ද ඔවුන්ගේ ක්‍රම වේදයකි.

ලුම්බිණි සාල වනය ආශ්‍රේයව කරන ලද කැනීම් වලින් ගෞතම බුදුන් වහන්සේ ඓතිහාසික උත්තරීතර පුද්ගලයකු බව අපට සනාථ විය. එතුමාගේ අසිරිමත් උපතේ සිට පරිනිර්වාණය දක්වා ජීවන තොරතුරු නිර්මාණනීය වෘතාන්තයක් හෝ ගොතන ලද කතාන්දරයක් හෝ නොවි ය. අපට එබඳු අන් ශාස්තෘවරයකු පිළිබඳව කතා කළ හැකිදැයි මම නොවිමසමි. මන්ද සත්‍යය සනාථ වී ඇති හෙයිනි. එමෙන් ම සිදුහතුන් උපන් මොහොතේ දී ම පා පොඩිති ඔසවා සත් පියවරයක් ගමන් කිරීම කුකුසක් ඇති කරගත යුත්තක් ද නොවේ. එය සාහිත්‍යකරුවන් ගේ නිර්මාණනීය නමනීයකරණ ඉදිරිපත් කිරීමක් ද නොවේ. ස්වභාව ධර්මයා ඉක්ම යන්නේ කවරක් ද? ඒ ප්‍රාතිහාර්යයෙකි. මහත් මැ පෙළහැරකි. මන්ද? දියෙහි පිපෙන පියුම් දෙරණ පළා සුපිපුන බැවිනි.

අතීතයට සැඟවී සිටිය නොහේ. මන්ද? සත්‍යයෙහි ම රඳා සිටින බැවිනි. එදා බෞද්ධ භාරතය හා නේපාලය නටබුන් තුළින් නැගී සිටිමින් අද ඉතිහාසය තුළ සුරක්ෂිතවනු ඇත. සිද්ධාර්ථ ගෞතම නමැති අසිරිමත් මිනිසා විශ්වීය මහා විරයාණන් කෙනෙකු වශයෙන් මෙම සිය වස උකුත් වීමට පෙරාතුව ලෝකය හඳුනාගනු නියති. ඒ වන විට අප ජීවතුන් අතර නොමැති බැවින් අපට කළ හැක්කේ අසිත තවුසා මෙන් සිනාසී හැඬීම පමණි.

යුග අවශ්‍යතාවක් ඉටු කිරීමට සහය වීමට හා දායක වීමට හැකිවීම පිළිබඳව මම උදක් ම මහත් වූ සොම්නසින් පසුවෙමි. සංසාරය

යනු නොනැවති සරණ ගමනකි, ඒ අතර බුදුනු දහම දිවමන්ව පවත්නා කලෙක ඉපදීමට ලැබීම ද වාසනාවකි. එය වාසනාවක් වන්නේ මෙවන් කාර්යයකට සහභාගීවීමට ලද අවස්ථාව නිසා බව අපට පසක් වේ. කිසියම් දිනක බවය උදුරා දමමින් ජීවිතයේ පරම විමුක්තිය ලබා ගැනීමට මෙම කාර්යය ද හේතු වනු නිරනුමානය. එහෙයින් ඔබ ව ද ඊට සහභාගී කරවා ගැනීමට අපි ක්‍රමවේදයන් සොයා බලමින් සිටිමු. එතෙක් මෙම කෘතිය කියවමින් ඔබ නිරාමිස ආත්මීය සුවයක් ලබන බව මම දනිමි.

ලොව කවර තරම් ආගම් දහම් තිබුණද විද්‍යාවේ කල්පිතයනුත්, ආගම්වාදී ඇදහීම් හා විශ්වාසයනුත්, බැහැර කරමින් දර්ශනයක් ද මාර්ගයක් ද ඉදිරිපත් කරමින්, ශාස්තෘවරයා පත් වූ තැනට ම සැම පුද්ගලයෙකුට ම පත්විය හැකි බව පෙන්වා දෙන ලද්දේ බුදු සමය ම පමණකි. නිර්වාණය අනිර්වචන වෙයි. ඒ වූ කලී පරම නිෂ්ඨාවකි. මෙය ලබා ගත හැක්කේ යාඥාවෙන් ආයාචනයෙන්, දෑත් අහසට ඔසවා කරනු ලබන වන්දනයෙන් හෝ නොවේ. එසේ ම තවකෙකු විසින් ඔසවා තැබීමෙන් ද නොවේ. ඔබ ඔබ ම ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙනි. බුදු මග පියමං කිරීමෙනි. මෙම පුද්ගල විමුක්තිය යතාර්ථවාදයක් කොට ලොව පිළිගන්නා දින, අහස යුද ගිනි දුමාරයෙන් වැසී නොයනු ඇත. එසේ නොවී තවත් සියක් වසක් කල් ලොව ගමන් කරන්නේ නම් න්‍යෂ්ටික හීම සමයකින් ජීවයෙන් තොර ග්‍රහ වස්තුවක් වශයෙන් ලොව හිරු වටා පරිභ්‍රමණය වනු නිසැක. එහෙයින් අද සිට ම සදහම් සහන සේවාවක් නේපාලයේ ශ්‍රී ලංකාරාමය කේන්ද්‍ර කරගනිමින් නිපන් වනු නියති.

මෙම ලෝක ව්‍යාප්තික සදහම් සේවාව අප ආරම්භ කළ යුත්තේ බුදුන් වහන්සේගේ අතීත දේශනාවක් වූ කාලාම සූත්‍රයෙන් යැයි මට සිතේ. මන්ද? මිනිසා සිතිවිලි දරන්නෙක් වන හෙයිනි.

තම මව් බිමේ ඉතිහාසය අතීතයේ සිට ම ලියන ලද්දේ ලෝක ජාතීන් තුනක් විසිනි. ඒ වූ කලී අති සුවිශේෂතාවකි. මන්ද? ඔවුන් එක ම මූලයකට අයත් වන හෙයිනි. ඒ අතීත ජාතීන් නම් ග්‍රීක්වරුන්, භාරතීයයන් හා සිංහලයන් වන අපි වෙමු. මෙම ජාතීහු ආර්යයෝ ම වෙති. ග්‍රීකයන් හා භාරතීයයන් යුද කතා විස්තරයෙන්ම ස්වීය ඉතිහාසය වර්ණවත් කළ අතර බුදු සමයේ අනිත්‍ය ධර්මතාව අපේ ඉතිහාස රචනයෙහි ද පදනම විය. අනෙක් අතට එමගින් පැනෙන්නේ සමස්ත ජාතියම බුදුනු සමයෙන් ශික්ෂණය ලද බවකි. මිහිපිට සිංහල බෞද්ධ සංස්කෘතියක් ගොඩනඟා ගත් බවකි. එහෙයින් ජාතිය වර්ණවත් කළ විවිධාකාරි ක්ෂේත්‍ර ද වංශකතා වශයෙන් අප අතින්



ලියැවිණි. එදා අප මහා වංශය වුයේ ලොව අසම සම වු බැවිනි. එහෙයින් ජාතික දේහය පෘෂ්ටිමත් කරන සැම ක්ෂේත්‍රයක් ම ආවරණය කරමින් වංශකතා පරපුරක් බිහිවිනි. මහා වංශය (සිංහලයින්ගේ), දීපවංශය (දිවයිනේ), ථූපවංශය (දාගැබ් පුරාණය), බෝධිවංශය (මහා බෝධි කතාන්තරය) යනාදි වශයෙනි. මෙම වංශකතා පරපුරට එක් වු නවතම වංශකතාව ''ලුම්බිණි වංශය'' යි. මෙය අනාගතයේදි ලුම්බිණිය පිළිබඳ ඓතිහාසික මූලකෘතියක් වනු නිසැක.

ඉන්දියාවට ද බුදු සමය යළි මතක් කරදීමට කාලය උදාවී ඇතැයි මට සිතේ. මන්ද? අප ධර්ම භූමි වන බැවිනි. එය ශ්‍රී ලංකාරාමය ප්‍රමුඛ කොට සිදුවනු නිසැක. කාලාම සූත්‍රය අනුසරින් මා ලියන්නේ මසිත නිවහල් හෙයිනි. ප්‍රශ්න මතු වන්නේ හේතුඵල සමවාය පිළිබඳ ගැඹුරින් සිතන විට ය. එම අඹුරින් ම ඊට පිළිතුරු සපයා ගත යුතුව ඇත. ප්‍රශ්න අපව උණුසුම්ව තබන අතර අපේ වේගවත් ක්‍රියාකාරිත්වයට ද හේතු පාදක වේ. ලොවකට බුදු සමය බෙදා දීමට පෙර ශ්‍රී ලංකාව තුළ තව දුරටත් බුදු දහම ව්‍යාප්ත කළ යුතු නොවේදැයි කෙනෙකු අසනු ඇත. ''ඔව්'' ''නැහැ'' යන කෙටි පිළිතුර මෙයට ප්‍රමාණවත් නැත. බස්, දෙබස්, තෙබස්, සිව්බස් වී මේ පිළිබඳව ද කතිකාවතක් නුදුරු අනාගතයේ දී ම ගොඩනැගෙනු ඇතැයි මට සිතේ.

නේපාලයේ ශ්‍රී ලංකාරාමයේ අනාගත අභිමතාර්ථ බෙහෙවි. ඒවා එකින් එක ඉටු කරගත යුතුව ඇත. ලුම්බිණි වංශය සමාප්ති සටහන තබන මෙම මොහොතේ දී, මුළුමහත් බෞද්ධ ලෝකය වෙනුවෙන්ම අප ධර්මද්වීපය මගින් ඉටුකළ යුතු සුවිශල් මෙහෙවරක් වෙත රජයේ ක්ෂණික අවධානය යොමු කරලනු රිසියෙමි.

නේපාලයෙහි,

කපිල වස්තු
රූපන්දෙහි
නාවල් පරාසි

යන තෙපලාතේ ඓතිහාසික නටබුන් වල් බිහිව, විනාශයට පත්වීමේ දැඩි අවධානමකට මුහුණපාමින් පවත්නා අයුරු සියැසින් දුටු අප සිත් සතන් දැඩි ප්‍රකම්පනයකට, සසල වීමකට බඳුන් විය.

ජීවමාන සම්බුද්ධ චරිතය හා සබැඳි, සම්බුදු පහස ලද ඓතිහාසික ස්ථාන මැනවින් සංරක්ෂණය හා සංවර්ධනය කිරිමෙහිලා ජාත්‍යන්තර බෞද්ධ ජනමතයක් ගොඩනැංවීම ශ්‍රී ලංකා රජය වෙතින් ඉටුවිය යුතු ම වූ සුවිශල් ජන මෙහෙවරකි.





බුදු පා පියුම් පහස ලද නිග්‍රෝධාරාමයේ සියුම් බිතු කැටයම් වර්ෂාවෙන් සේදී ගෙවී යාමේ ශෝකාන්තය....

දෙව්දහ ස්මරණ සංකේතය වනගත වී...



සුදොවුන් රජ මාළිගයේ නටබුන් වල් බිහිව



මහාබිණික්මන් කළ ප්‍රාකාර ද්වාරය වැස්සට සේදී ගොස් ඇති අයුරු.

ලුම්බිණි මායා දේවී ආරාමය ආශ්‍රිත අසිරිමත් පුද බිම යුනෙස්කෝ ආයතනයෙහි මැදිහත් වීමෙන් මැනවින් සංරක්ෂණය කර සංවර්ධනය කර පවත්වාගෙන යන බැව් අපි දනිමු. එනමුදු සිද්ධාර්ථ කුමාරයන් මහබිනික්මන කරමින් සිය රජමැඳුරෙන් පිටතට පැමිණි පුළුල් ප්‍රාකාරය, සම්බුදු පා පියුම් පහස ලද නිග්‍රෝධාරාමය, රාහුල හිමි පැවිදි බව ලද ඓතිහාසික කුටිය, සුදොවුන් මහමායා රජ යුවල භස්මාවශේෂ තැන්පත් කළ ස්ථූප සහ බුදු සිරිත හා සබැඳි පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ඓතිහාසික ස්ථාන රාශියක් අව්වට වේලෙමින් වැස්සට තෙමෙමින් අනාරක්ෂිතව පරිහානියට පත් වන අයුරු අපට සියැසින් දක ගන්නට ලැබිණි. බුදුන් දිවමන් කළ නිග්‍රෝධාරාමයෙහි බිත්ති සැරසූ අගනා කැටයම් අද දවසේ පවා සුපැහැදිළිව දකින බැතිමතුන් සිත බුද්ධ ගෞරවයෙන් ප්‍රමුදිත වන සුළුය. එවන් අති සියුම් කලාත්මක පුරා වස්තු නිරන්තර වැස්සට



නිරාවරණය වී තිබීමෙන් මඳ මඳව සේදී ගොස් කාලයක් තුළ අවිද්‍යමාන වන තත්ත්වයකට පත්වනු නිසැක ය. ලුම්බිණි මායා දේවි අරම දනට මැනවින් ආවරණය කර ඇති පරිදිම, නිග්‍රෝධාරාමය ද උස් වහලකින් ආවරණය කිරීම නොපමාව කළ යුතු සෙයක් හැඟේ. නිග්‍රෝධාරාමය වසා පැතිරෙමින් පවත්නා වල් පැළ ඉවත් කර, එහි භූමි දර්ශන මැනවින් සැකසිය යුතු වේ.

බෞද්ධ නෂ්ටාවශේෂයන් යනු බුදු සිරිතේ අතීත වෘත්තාන්තයේ ස්මාරකයන් බව අමුතුවෙන් කිව යුතු නැත. තත් ස්ථානයන් ලුම්බිණිය සේම ඓතිහාසික වූ ද, ගවේෂණයට පාත්‍ර වන්නා වූ ද, අනාගත පරපුර වෙනුවෙන් දායාද කළ යුතු වූ ද ස්ථානයෝ වෙති.

ඉහත සඳහන් ස්ථාන නිසි පරිදි නඩත්තු කෙරෙන බවක් ද නොදිස්වේ. බොහෝ ස්මාරක වල් බිහිවී ගොසිනි. රාත්‍රී කාලයේ ඝනඳුරෙන් වැසී පවතී. එම ස්ථාන හැඳින්වීම සඳහා යොදා ඇති නාම පුවරු ද හඳුනාගත නොහැකි ලෙස දුර්වර්ණිතය. මෙම නාම පුවරු අලුතින් සවි කිරීමේදී ශ්‍රී ලාංකීය වන්දනා කරුවන් වෙනුවෙන් සිංහල භාෂාවෙන් ද ස්ථාන නාම හැඳින්වීමක් කළ හැකි නම් එය ශ්‍රී ලංකාවේ අභිමානයට හේතුවක් වනු නිසැකය.




මායාදේවිගේ නිජබිම - දෙව්දහ

සුදොවුන් හා මහමායා දේවි ස්ථූපයන් හැඳින්වීමට යොදා ඇති දුර්වර්ණ වූ නාම පුවරු




ශ්‍රී ලංකා රජයේ බුද්ධ ශාසන, සංස්කෘතික හා විදේශ අමාත්‍යාංශවල මැදිහත්වීම මත, ඉහත සනිටුහන් කළ කරුණු නේපාල රජයට හා යුනෙස්කෝ ආයතනයට නිල මට්ටමින් ආයාචනාත්මකව දනුම් දීම කෙරෙහි ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ හා බුද්ධ ශාසන අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මැතිතුමාගේ අවධානය යොමු වන්නේ නම් එය මුළුමහත් බෞද්ධ ලෝකය වෙනුවෙන් එතුමන්ලා අතින් ඉටුවන, සදානුස්මරණීය මෙහෙවරක් වන්නේම ය.

*"මා නිවත්ත අභික්ඛම"*

## ii. ආශ්‍රේය ග්‍රන්ථ

මෙම ග්‍රන්ථය සම්පාදනයේදී ප්‍රධාන වශයෙන් පරිශීලිත මූල


(අ) i. විනය, අභිධම්ම, සූත්‍ර ඇතුළත් ත්‍රිපිටිකය (ලබුගම ලංකානන්ද නාහිමි ප්‍රධාන ත්‍රිපිටක මණ්ඩලයක් විසින් සිංහලට පරිවර්තනය කළ, පූජ්‍ය බෝදාගම චන්දිම නාහිමි විසින් ප්‍රකාශයට පත් කළ ත්‍රිපිටක පොත් පෙළ)

ii. පාලි දම්පියා අටුවා ගැටපදය

iii. මහාවංශය

iv. බුද්ධ වංශ අට්ටකථා - බුද්ධදත්ත හිමි

**(ආ) වෙනත් ඉපැරණි කෘතීන්**

i. අමාවතුර - ගුරුළුගෝමීන්

ii. බුත්සරණ - විද්‍යාචක්‍රවර්තීන්

iii. පූජාවලී - මයුරපාද පිරිවෙන් පති බුද්ධ පුත්‍ර හිමි

iv. සද්ධර්මරත්නාවලී - දඹදෙණියේ ධර්මසේන හිමි

v. සද්ධර්මරත්නාකාරය - විමලකීර්ති සිද්ධාර්ථ හිමි

vi. නෛශ්ක්‍රම්‍ය වර්ණනාව - කර්තෘ අවිනිශ්චිතයි

vii. බෝධි වංශය - විල්ගම්මුල මාහිමි

viii. ලලිත විස්තරය - කර්තෘ අවිනිශ්චිත

ix. සිංහල දිව්‍යාවදානය - සිංහල පරිවර්තනය අකුරටියේ ශ්‍රී අමරවංශ නාහිමි

**(ඇ) වෙනත් කෘතීන්**

1. ශාක්‍ය සිංහාවදානය හෙවත් බුද්ධ චරිතය
   ආනන්ද මෛත්‍රී නාහිමි
2. බුද්ධ මාතා
   ආර්.ඒ.ඩී. ධර්මසිරි
3. බුද්ධ චරිතය
   මහාචාර්ය සුචරිත ගම්ලත්
4. සම්බුදු සිරිත
   කේ.ඩී.පී. වික්‍රමසිංහ
5. ධර්මාශෝක ධර්මවිජයෙහි ආභාශය හා ආදර්ශය
   ආචාර්ය ආනන්ද ඩබ්.පී. ගුරුගේ
6. මහරහතුන් වදාළ බුද්ධ චරිතය
   පූජ්‍ය වල්පොල පියනන්ද හිමි සහ ස්ටීවන්ග් ලෝන්ග්
7. ජිනරාජවංශය
   ඩී.එච්.එස්. අබේරත්න
8. දස පෙරුම්දම්
   නාරද ස්ථවිර
9. ජයසිර මහ බෝ වරුණ
   සංස්කරණය, කේ.එච්.ජේ. විජේදාස
10. පිංබර ලුම්බිණියෙන් කපිලවස්තුවට
    ආචාර්ය රඹුක්වැල්ලේ චන්ද්‍රරතන හිමි
11. Lumbini – A heaven of Sacred refuge
    Basanta Bidari
12. The Complete book of Buddhas Lists.
    David N Snyder
13. Siddartha
    Herman hesse
14. Buddhism plain and simple
    Steeve Hagen
15. Buddha
    Karen Armstrong
16. The Life of the Buddha
    Bhikkhu Ghanamoli.
17. Historical Buddha
    Hans Wolfgang Schumann
18. Wake up life of the Buddha
    Jack Kerouac
19. The life of the Buddha
    Edved J Thomas
20. Gauthama Buddha
    Higimi Nakamura
21. Life of Buddha
    Rockhill
22. Buddha, his life
    herman oldenberg.
23. lumbini – a heaven of sacred refuge.
    the sacred garden of lumbini.
    axel plathe.

***"Wherever the Buddha's teachings have flourished,***

***either in cities or countrysides,***

***people would gain inconceivable benefits.***

***The land and people would be enveloped in peace.***

***The sun and moon will shine clear and bright.***

***Wind and rain would appear accordingly,***

***and there will be no disasters.***

***Nations would be prosperous***

***and there would be no use for soldiers or weapons.***

***People would abide by morality and accord with laws.***

***They would be courteous and humble,***

***and everyone would be content without injustices.***

***There would be no thefts or violence.***

***The strong would not dominate the weak***

***and everyone would get their fair share."***

**~THE BUDDHA SPEAKS OF**
**THE INFINITE LIFE SUTRA OF**
**ADORNMENT, PURITY, EQUALITY**
**AND ENLIGHTENMENT OF**
**THE MAHAYANA SCHOOL~**

## DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**
南無阿彌陀佛

《斯里蘭卡文：藍毗尼的歷史，LUMBINI VANSHAYA》
財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org
**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
2,000 copies; April 2017
SR068 - 15014